# අඟ ගිය

දිල්හානි වික්‍රමරත්න

Dilhani Wickramarathna

Shaakya Publications

The Reader's Place Novels

## මගේ පොත් කියවන දයාබර ම ඔබට...!!!

මගේ අකුරු අතරේ හැමදාමත් සෙනෙහසින් දැවටෙන ඔබගෙන් යමක් උදෙසා සමාව අයැදීමට සිදුව තිබේ. තවමත් මූලික අවධියේ ලේඛිකාවක ලෙස පසුවන මා 'දිල්හානි වික්‍රමරත්න' නමින් ඔබගේ හදවත් තුළ සනිටුහන් කර ගත්තේ, ඔබ තුළ වන උත්තම මිනිස් ගුණ මහිමයෙනි. 2009 වසරේ සිට ගෙවී ගිය වසර හයක පමණ කෙටි කාලය තුළ මා මේ තරම් දිගු ගමනක් ආවේ ඔබගේ පවිත්‍ර සහෘදභාවයට පින් සිදු වන්නට ය. ඔබගේ ආදරණීය ප්‍රතිචාරයේ ශක්තියෙනි.

කෙටි පණිවිඩ, ලිපි, දුරකතන ඇමතුම්.. ඔබගේ ඒ ආදරණීය, හෘදයාංගම හැඟීම් රැගෙන නිරන්තර මා වෙත ගලා එන්නේ ය. අතීත දිනවලදී නම්, මට ඔබේ ළෙන්ගතුකම හදවතින් දරාගෙන, නිසැකව ම ඔබට පිළිතුරක් එවීමට ඉඩ හසර සොයා ගත හැකි ව තිබිණි. එහෙත්, විවාහයෙන් මතු සියල්ල වෙනස්ව ගියේ නොසිතූ විරූ ලෙසිනි. වසර එක හමාරක් වියැති කුඩා දියණිය රැක බලා ගනිමින්, නොපිරිහෙළා ඉටු කෙරෙන ගෘහ කටයුතු අතරේ, ඔබගේ කෙටි පණිවිඩයට, ලිපියට පිළිතුරු අමුණන්නට හෝ දුරකතන ඇමතුමකට පිළිතුරු දෙන්නට අවස්ථාවක් සොයා ගත නොහැකි වීම මා ඔබට කළ බලවත් වරදක් බව මම දනිමි. එහෙත්, එය මා ඔබට, ඔබේ ආදරණීය ප්‍රතිචාරයට සිතා මතා කළ අගෞරවයක් වශ බව ඔබ වටහා ගන්නා බව මම දනිමි.

මගෙන් සිදුවන අතපසුවීම් කෙරෙහි මට කමා කරන්න. මගේ ජයග්‍රහණය ඔබේ ආදරණීය ප්‍රතිචාරය ම ය. අතීතයේ සේ ම ඔබගේ හෘදයාංගම ප්‍රතිචාරය දැන ගැනීමට මම මග බලා හිඳිමි. ලේඛිකාවක ලෙස, ඒ හැර මට ලැබෙන්නට වෙනත් දිනුමක් ද නැත.

ඔබට.. යහපතක් ම වේවා..!!!

**දිල්හානි වික්‍රමරත්න**

**දුර : 077 - 3596233**





## මේ වැයම... මගේ ලොව වසා ගත් අඳුර ඉරා දමන්නට ය.

ලිවීම.. අද මගේ ජීවිතයේ ඇති සුවිසල් ම අරගලයයි. දැවැන්ත ම අභියෝගයයි. එයට එරෙහිව කළ හැකි පිළියම් ද නැත. එය, මගේ දෛවයෝගය තීන්දු කළ උරුමයයි. එහෙත්, කවරක් කෙසේ සිදු වුවත්, මගේ දෛවයේ තීරකයා විය යුත්තේ මා මිස මගෙන් පරිබාහිර කිසිවෙකු නොවේ. එබැවින්, මම මගේ අයුක්ති සහගත දෛවයට එරෙහිව නොබියව අරගල කරමි. **අඳුර ඉරා..** එම අරගලයේ එක් උත්සාහක දිනුමක් පමණි.

මේ සෑම අකුරක් ම මා ඇමිණුවේ සෑම රාත්‍රියක ම අලුයම එකත් දෙකත් අතර, මුළු වටපිටාව ම නිදි ගත් අඳුරේ ය. මවක, ගෘහණියක වශයෙන් අංශු මාත්‍රයකුදු අත නොහැර ඉටු කරන එදිනෙදා ගෘහීය යුතුකම්, වගකීම් අතරේ, කාලයෙන් ඉඩක් වෙන් කර ගැනීමට අවකාශ නොලද්දේ, මගේ ලිවීම වෙනුවෙන් පමණි. මට කරන්නට ඉතිරිව තිබුණේ දවසේ පැය විස්සක වෙහෙස අවසානයේ කඩා වැටෙන දෑස් පියන්වලට අසීරුවෙන් අගුළු දමා සිර කර ගන්නට පමණි. **අඳුර ඉරා..** නොනිදා පහන් කළ රාත්‍රීන් ගණනාවක, වේදනාබර සිතට චක්කාසු වූ සිතිවිලි සමුදායක එකතුවකි. අප්‍රමාණ දුක් වේදනා දරා ලියූ පොත ඔබට සතුටක් ම වේවා යන්න මගේ එකම ප්‍රාර්ථනයයි.

අදටත්.. මගේ ලෝකය සුරකින ආරක්ෂක පවුර.. මගේ අම්මා, තාත්තා, මල්ලී, නංගිලා තිදෙනා සේ ම නිලානි නංගි, ඉන්දික මල්ලි, අසන්ත මල්ලි හා හසිත මල්ලි යන මගේ පවුලේ සියල්ලෝ ම ය. තමාගේ සියලු කටයුතු පසෙකලා අවසාන දින කිහිපයේදී පැමිණ, මෙම පොත ලියා අවසානයක් දකින්නට උපකාර කළ මගේ චූටි නංගිට විශේෂ ගෞරවාදරය පුද කළ යුතුම ය. අතිශය කාර්ය බහුල රැකියාවක නිතර වන මුත් ලද මොහොතකට හෝ උපකාර කරන මගේ සැමියා - රොෂාන්ට ද, හැකි සෑම විටම දියණිය සමග රැඳෙන රොෂාන්ගේ අම්මාට ද, තාත්තාට ද තුති පුද කරමි. එසේ ම, දුරින් හිඳ හෝ වදනකින් හෝ සිතට දිරි දෙන ඥාතී, හිත මිතුරු, සහෘද.. සියල්ලන්ට ම හද පිර කෘතවේදීත්වය පුද කර සිටිමි. වමෙන්ම ලැබෙන සෑම අවස්ථාවකම



The Reader's Place Novel

උදව්, උපකාර කරන යාබද නිවෙස් හි ජීවත් වන සඳුනි නංගී හා සුමුදු නංගීට ද සදාදරණීය සිතින්, නිතින් සිහිපත් කරමි.

අඳුර ඉරා.. මා සැලසුම් කළේ.. මීට මදක් දීර්ඝ නවකතාවක් ලෙසිනි. එහෙත්, සිතන පතන කිසිවක් ම ඉටු නොවන දෛවයක් හමුවේ, මට මගේ සියලු ප්‍රාර්ථනා හකුලා ගැනීමට සිදුවී තිබේ. නවකතාවේ අවසාන අර්ධය මදක් කෙටියෙන් ලියා, ඔබේ රස විඳදනය බිඳ දැමුවා නම්, ලක්ෂ වාරයක් මම ඔබෙන් සමාව අයැද සිටිමි. අනුවේදනීය සිදුවීම් මාලාවක අවසානය ඔබේ දැන ගැනීම උදෙසා පමණක් කෙටියෙන් සටහන් කර තැබුවෙමි. එසේ කොට, මා ඔබට කළේ බරපතල වරදක් නම්, යළි යළිත් මම ඔබෙන් සමාව ම අයදිමි.

මෙතරම් කරදර, වේදනා, දුෂ්කරතා විඳිමින් කරන මගේ මේ ලිවීම.. මගේ ආදරණීය අම්මාත්.. තාත්තාත් උදෙසාම ය. කුසට අහර, නෙතට නිදි, ගතට සළු පිළි.. මේ සියල්ල ම අපගේ අභිවෘද්ධිය උදෙසා ම කැප කොට.. අපගේ නුවණැස පාදා, ලෝකයක් දිනන්නට නියත විවරණ දුන්නේ මගේ අම්මාත්, තාත්තාත් ය. පරාජයේ අළු දූලි මතින් නැගී සිටීමට දරන මේ සියලු වැර වෑයම්.. මගේ අම්මාගේත්, තාත්තාගේත් සතුට උදෙසා ම ය. එසේම, මගේ දියණියගේ හෙට දවස උදෙසා ම ය. වෙනත් කිසිදු අරමුණක් මට මගේ ලෝකයේ දැන් නැත.

මගේ අකුරු අතර දැවටෙන.. ඔබ සැමට.. යහපතක් ම වේවා...!!! ඔබේ ලෝකය ඒකාලෝක වේවා....!!!

**දිල්හානි වික්‍රමරත්න**
**දුර : 077 - 3596233**





# 01



නිවැසි අබියසම නතර වූ බස් රියෙන් බැස, කිසිදු කලබලයකින් තොරව නිවස දෙසට ඇවිද එන තම බාලම දියණියගේ දසුන තුළ වර්ණවීර යුවළ එකම අයුරින් කිමිදී උන්හ. ප්‍රධාන නගරයක සියලු පහසුකම් සහිත පරිසරයක ජීවත් වුවත්, තම දියණිය තමාගේ දෙවන සේවා කාලය වෙනුවෙන් ද ප්‍රත්‍යන්ත පාසලක් තෝරා ගැනීම පිළිබඳව, විශ්‍රාමික ගුරු යුවළක් වූවා වුවත්, වර්ණවීර යුවළගේ සිත් තුළ වූයේ මද නොපැහැදීමකි. අතීත දිනවල ඒ නොපැහැදීම විටින් විට වචන බවට පත්වී මාපියන්ගේ මුවින් පිටවන සැම අවස්ථාවකම, අනුපමා, වර්ණවීර තම මාපියන්ගේ සිත නොරිදවා පිළිතුරක් බැඳ ගන්නට බොහෝ විට සමර්ථ වූවාය.

"විංගීස් අයිත්මාතව්ගෙ ගුරු ගීතයෙ දුයිෂෙත් වගේ වෙන්න ඔයාට ඕන උනත්, මේ රටේ අද තියෙන තත්වෙත් එක්ක ඒක කවදාවත් කරන්න බෑ වූටි දුව.. මෙච්චර මේ ළඟ ඉස්කෝලෙකට පත්වීම ලැබිලත් ඔච්චර දුර යන එකට මගේ නම් කැමැත්තක් නෑ දරුවො.."



The Reader's Place Novel

අතීතයේදී, ඒ මොහොතේ අනුපමා තම පියාගේ දැස දෙස බැලුවේ විසල් කරුණාවකිනි.

"මට දුයිෂෙන් වෙන්න පුළුවන් උනත්.. අද යුගයෙ හැටියට අල්තිනායිලා බිහිවෙනවා අඩුයි අප්පච්චි.. සේවයක් කියලා කියන්නෙ ප්‍රත්‍යුපකාර බලාගෙන කරන දෙයක් නෙමෙයිනෙ අප්පච්චි.. මට පුළුවන් දේ මම මට පුළුවන් උපරිමයෙන් කරනවා.. කුඹුරක් වපුරන්නෙ ගොවියෙක් අන්තිමේදී සරු අස්වැන්නක් බලාගෙන තමයි.. ඒත් ඒ කුඹුර වල් බිහිවෙයිද.. ගංවතුරට විනාශ වෙයිද.. සත්තු ඇවිල්ලා පාළු කරලා දායිද.. මොනවා වෙයිද කියලා ගොවියා දන්නෙ නැනෙ අප්පච්චි.. ගුරුවරයත් ඒ වගේ තමයි.. තමන්ගෙ ශිෂ්‍ය පරපුරේ අනාගතේ ගැන ගුරුවරයට කියන්න බෑ.. මම මගේ යුතුකම් කොටස අකුරට ඉටු කරනවා අප්පච්චි.. මගේ සේවය වෙනුවෙන් ඉන් එහා බලාපොරොත්තු මට නෑ.."

බස් රථ තුනකට මාරු වෙමින්, හෝරා තුනකටත් අධික කාලයක් මහ මගට වැය කරමින් පැමිණියත්, කිසිදු වෙහෙසක් නොඇදි තමාගේ දියණියගේ මුහුණ දුටු විට මාපිය යුවළට හැමදාමත් සේ දැනුණේ සැනසීමකි. බාල දියණිය.. සැබැවින්ම තමාගේ ලෝකයට නිවීම රැගෙන ආ බව මාපිය යුවළ කවදත් විශ්වාස කළහ. උඩරට ඔසරියෙන් සැරසුණු කල තම දියණිය පමණටත් වඩා රූමත් බව වර්ණවීර මහත්මිය හැමදාමත් සිහිපත් කළේ නිහඬව විඳ ගත් අභිමානයකිනි.

මාපියන් දෙදෙනාම එකම බැල්මකට හසුකර ගත් අනුපමා, දෙදෙනා වෙත ම සම සමව, දෙතොලතර පීදුණු සෙනෙහෙබර හසරැල්ල තිළිණ කළාය.





"අම්මයි අප්පච්චියි අද බාප්පලාගෙ දිහා යනවා කිව්වා නේද..? ඇයි ගියෙ නැත්තෙ...? මම හිතුවෙ ගිහිල්ලත් ඇති කියලා අම්මා.."

දියණිය වෙත මෘදු මදහසක් පෑ මාපියෝ, මොහොතකට ඔවුනොවුන් දෙස නෙත් හෙලූහ. දෙදෙනා, දැසින් රහසේ කුමක් හෝ කතිකා කර ගත් අයුරු නම් අනුපමා නුදුටුවාය.

"ඒ ගමන අද වැරදුණා චූටි දුව.. අපි හෙට යනවා.. චූටි දුවටත් පුළුවන් නම් නිවාඩුවක් දාගන්න.."

"අනේ බෑ අප්පච්චි.. හෙට ළමයින්ගෙ ප්‍රොජෙක්ට් රිපෝට්ස් බාර ගන්න තියෙනවා.. හෙට නම් මම ඉස්කෝලෙ යන්නම ඕන.."

බාල දියණියගේ ගති ස්වභාවයත් හොඳාකාරවම හඳුනන මාපියන්, දියණියගේ වදන්වලට පක්ෂව හෝ විපක්ෂව කරුණු විමසීමට උත්සුක නොවූහ.

නිවසට ගොඩ වී නොබෝ වේලාවකින් හැඳ උන් ඔසරියෙන් මිදුණු අනුපමා, නාන කාමරයට නොගොසින්, නිවසින් පිටුපස මිදුලේ පිහිටි විසල් කොට්ටම්බා ගස පාමුල වන ළිඳෙන් වතුර බාල්දි කිහිපයක් ඇද, ඇඟපත දොවා ගත්තාය. කිසිදු කලබලයකින් තොරව ඇඟ පත දොවාගන්නා දියණිය දෙස මුළුතැන්ගෙයි දොරකඩ හිඳ වර්ණවීර මහත්මිය නිහඬවම බලා සිටියාය. දීර්ඝ නිහැඬියාවක වෙලී තමා දෙස බලා හිඳින මව, නෙතු කොණකට හසුවූ මොහොතේ, හිස හරවා බැලූ අනුපමා, ඈ වෙත මෘදු එහෙත් ජීව ගුණයෙන් පිරී මදහසක් පෑවාය.



The Reader's Place Novel

"ඇයි අම්මා.. මට පේන්නෙ අද අම්මයි අප්පච්චියි ලොකු කල්පනාවක වගේ.."

"එහෙම දෙයක් නෑ වුටි දුව.. ඔයා ඇහ හෝදගෙන එන්නකො.. මෙව්වර මේ ගේ ඇතුළෙ බාත්රූම් හදලා තියෙද්දි මහන්සි වෙලා මහන්සි වෙලා ඇවිත් ඔයා ළිඳෙන් වතුර අදිනවා.."

සුභාෂිණී වර්ණවීරට තම බාල දියණියගේ දෛවය මහ මෙරක බරක් වුවත්, අනුපමා නම් තමාගේ දෛවය පිළිබඳව සැලකුවේ භාග්‍යයක් ලෙසිනි. ඈ සුපුරුදු සැහැල්ලුවෙන් වචන ඇමිණුවාය.

"අත පය බැරිව ගිය කාලෙක.... මොර සූරන වැස්ස වගේ බාධාකාරී පාරිසරික සාධකයක් තියෙන වෙලාවට.. හදිසි අවස්ථාවකට.. බාත්රූම් එක හොඳ පහසුකමක් තමයි අම්මා.. හිත නිදහස් නිවහල්, ගත සැහැල්ලු.. මේ කාලෙට බාත්රූම් මොනවට ද අම්මා.. අනික මුළු ඇඟේම මාංශපේශී ක්‍රියාකාරී වෙන්න.. මේ වතුර අදින එක හොඳ එක්සයිස් එකක්.. මේ දැනෙන හැඟීමට මං ආසයි අම්මා.."

"ඔයාගෙ ඔය නිදහස් හැඟීම්.. අපිට නම් මහ විශාල බරක් වුටි දුව.. දැන් ඔයාට අවුරුදු විසි අටක්..!"

තමාගේ මව එල්ල කළ සුපුරුදු චෝදනාව, අනුපමාගේ සිත තුළ එතෙක් රජ කළ සැහැල්ලුවෙන් බිඳක් කොහේදෝ නොදන්නා ලොවකට පලවා හැරියේය. එහෙත්, ඒ බව නොපෙන්වා මව වෙත මෘදු හසරැල්ලක් පෑ අනුපමා, මදක් ඉක්මන් කොට ඇඟපත දොවා අවසන් කළාය. පුරුදු පරිදිම





ඈ දිවා ආහාරය ගැනීම සඳහා කැම මේසයට හිඳගන්නා විට පස්වරු පහට ආසන්න වී තිබිණි. ඈ තම මව දෙස බැලුවේ නොදැරියකගේ අභිනයන් පාමිනි.

"අම්මා.. තේ එක මගේ..?"

වර්ණවීර මහත්මිය ද හැමදාමත් සේ තමාගේ බාල දියණිය වෙත ව්‍යාජ තෝක්කාඩුව පෑවාය.

"කැම කන්න පැය දෙකකට කලින්වත් කාලා පැය දෙකක් යනකල්වත් තේ, කෝපි වගේ දේවල් බොන්න හොඳ නෑ.. කැමවල තියෙන යකඩ ශරීරයට අවශෝෂණය වෙන්නෙ නැතිලු කියලා අනිත් අයට නම් පණ්ඩිතකම් කියලා දෙනවා මට අනන්ත ඇහිලා තියෙනවා.. අවවාදයට වඩා ආදර්ශය උතුම් කියලා අහලා නැද්ද වුටි දුව..?"

අනුපමා, නොදැරියක සේ සැහැල්ලුවේ හිනැහුණාය.

"අම්මා.. ඔයාට කියන්නෙ ගුරුන්ටත් අකුරු වරදී කියලා.. සාමාන්‍ය මනුස්ස දුවක් අතින් ඒ වගේ පුංචි වරදක් උනාට කමක් නැනෙ අම්මා.. අනේ අම්මා... මගේ එකට එකක්ම ඕන.. දවසටම බොන එකම එක තේ කෝප්පෙනෙ අම්මා.."

කිසිවක් නොකියා දියණිය දෙස නෙත් කොණින් බැලූ වර්ණවීර මහත්මිය මුළුතැන්ගෙය දෙසට ඇවිද ගියා ය. තේ කෝප්පයක් පිළියෙල කරගෙන, යළි තම දියණිය වෙත පැමිණි වර්ණවීර මහත්මිය එය දියණිය අබියස තැබුවේ, සෝපහාසී සිනාවක් දෙතොලතර ඇඳගෙනය.



The Reader's Place Novel

"ඔවා දෙනු පරහට
තමා සම්මතෙහි පිහිටා සිට
දුසිරිත් දනන් දෙන
ඔවා වැද්දන් දෙසන බණ වැනි.."

ඇහට පතට නොදැනී කියා දැමූ වර්ණවීර මහත්මිය, දියණියට යාබදව තිබූ පුටුවක් ඇද හිඳගත්තේ, දියණියගේ මුහුණ දෙස සෘජුව නොබලමිනි. තම මවගේ සෙනෙහෙබර අභිනය අනුපමාගේ හදවතට ගෙනාවේ ඉමිහිරකි.

"අනේ අම්මා.. මාව දුර්ජනයන්ගෙ ගොඩට දාන එක හරිම අසාධාරණයිනෙ.. කෑම කාපු ගමන් ප්ලේන් ටිකක් බොනවා වගේ පුංචි වරදක් ඇරුණම මගේ අතින් සිද්ධ වෙන වෙන වරදක් නැනෙ.. ඒ හින්දා වැදි බණ කියලා මගේ අවවාදවලට අපහාස කරන එක හොඳ මදි නේද..?"

වර්ණවීර මහත්මියට පිළිතුරකට ඉඩක් නොවූයේ, වර්ණවීර මහතා ද ආලින්දයේ හිඳ කෑම කාමරයට පැමිණි බැවිනි. කිසිවක් ම නොකියා බිරිඳත්, දියණියත් දෙස බැලූ වර්ණවීර මහතා කෑම මේසයේ වූ ඔහුගේ සුපුරුදු අසුනේ හිඳ ගත්තේය. එහෙත්, තම පියාගේ දෑසේ ඇඳී තිබුණු කල්පනාකාරී බව අනුපමාගේ හදවත අහේතුකව තිගැස්සුවේය. ඈ, තමාගේ මවත්, පියාත් දෙදෙනා දෙස ම එකම ප්‍රශ්නකාරී බැල්මක් හෙලුවා ය.

"අප්පච්චි.. ඇයි මේ..? මට ආව වෙලාවෙ ඉඳලම මොකක්දෝ වෙනසක් දැනුණා... ඇයි අප්පච්චි.. මොකක්ද ප්‍රශ්නෙ..?"

අනුපමා විමසුවේ සිහින් හඬිනි. දින කිහිපයක සිට ඇගේ





හදවත තිගැස්සෙන අනුමානය, ඈ පියාගේ පිළිතුරෙන් මතු වවන බවට පත් කර ගත්තේ බෙහෙවින්ම අසිරුවෙනි.

"ප්‍රශ්නයක්මත් නෙමෙයි චූටි දුව.. ඒත්.. උත්තරයක් නොයන්න වෙලා තියෙනවා.."

"ඇයි අප්පච්චි.. අක්කා ආයෙමත් කෝල් කළාද..? එයා දැන් බල කරලම කියනවා නේද බබාලා දෙන්නව බලාගන්න අම්මටයි අප්පච්චිටයි ඕස්ට්‍රේලියා එන්න කියලා.. අම්මයි, අප්පච්චියි, රිටයර් වෙනකල් බලන් හිටියෙ තමන්ගෙ වැඩ ටික කරගන්න අම්මයි, අප්පච්චියි එහෙට ගෙන්න ගන්නද අම්මා.. එතකොට.. එතකොට.. අම්මයි අප්පච්චියි ගියාම.. මට කවුද ඉන්නෙ.. මම තනි වෙනවනෙ අම්මා.. මාව තනියෙන් දාලා යන්න පුළුවන්ද අප්පච්චි..?"

හඬ බිඳී ගොස්, ඒ මොහොතේ අනුපමාගේ දෑස කඳුලින් පෙනී යන්නට විය. ඈ, දෑස උස්සා, තම මාපියන් දෙස බැලුවේ අසිරුවෙනි.

"බෑ චූටි දුව.. බෑ.. ඔයාව තනියම දාලා අපිට යන්න බෑ.."

මිනිත්තු දෙක තුනකට නිහඬව ගෙවී යන්නට ඉඩ දුන් අනුපමා, බිඳී ගිය හඬින් උවත් යථාර්ථයට හිස නැමුවාය.

"මං දන්නවා.. මේ වෙලාවෙ අම්මයි අප්පච්චියි හොඳටම අසරණයි කියලා.. අම්මයි අප්පච්චියි කැමති තීරණයක් ගන්න.. මොකද.. මේ වෙනකොට අක්කගෙ හිතේ මං ගැන තිබුණ ඉවසීම ඉවර වෙලත් ඇති.. අම්මයි අප්පච්චියි මම නිසා නම් ඒ ගමන නොයන්නෙ.. ඒකෙන් අන්තිමට සිද්ධ වෙන්නෙ මට



The Reader's Place Novel

මගේ සහෝදරිය නැතිවෙන එක විතරයි.. ඒක එහෙම වෙනවට මං කැමති නෑ අම්මා.."

අනුපමා කීවේ දැඩි සංයමයකිනි. එහෙත්, ඒ සංයමය වර්ණවීර මහත්මියගේ සිතට ගෙන ආවේ නොරිස්සුමකි.

"පිස්සුද වුටි දුව.. ඔයාව මෙහෙම තනියම දාලා අපි රට යන්න..? ඔයාට පිස්සුද..?"

එතෙක් සාවධානව සවන් දෙමින් උන් වර්ණවීර මහතා මැදිහත්කරුවා බවට පත්වෙමින්, සංවාදයට එකතු වූයේ ඒ මොහොතේය.

"සුභා.. කේන්තියෙන් කතා කරලා දරුවගෙ හිත තරක් කරන්නෙපා.. අපි මේ ගැන හෙමින් නිදහසේ කතා කරමු.. වුටි දුව.. කෑම කාලා ඉවරයිනේ.. එන්න.. අපි ටිකක් එළියට ගිහිල්ලා නිදහසේ කතා කරමු.."

වෙනදාට අනුපමාගේ සිත, ගත නිවා සනසාලන උණුසුම් තේ කෝප්පය කෑම මේසය මත ඇල්වෙමින් තිබිණි. මව, පියා, දියණිය.. තිදෙනා උනුන් වෙත සම්මුඛව විවෘත ආලින්දයේ අසුන් ගෙන උන්හ. වර්ණවීර මහතා තම බාල දියණිය වෙත බැලුවේ අපරිමාණ කරුණාවකිනි. දැනට විදේශගතව හිඳින වැඩිමහල් පුතණුවන් සේ ම දියණියට ද වඩා වර්ණවීර මහතාගේ ඇල්ම රැඳී තිබුණේ තමාගේ බාල දියණිය කෙරෙහි ය. අනුපමා, නිර්ව්‍යාජත්වයේ උපරිම තලයක හිඳ, අතිශය සරල දිවි පෙවෙතක් ගත කළාය. කීකරු දියණියක වශයෙන් ගෙවී ගිය ජීවිත කාලයම ගත කළ ඈ, මාපියන්ගේ පැතුම් සපුරා ලූ දියණියක වූවාය.

"අප්පච්චි.. දැන් මම මොකද කරන්න ඕන..?"





මාපියන්ගෙන් ලැබෙන පිළිතුර පිළිබඳව දැන දැනම අනුපමා විමසුවේ බොහෝ වේලාවක් නිහඬව ගත කිරීමෙන් අනතුරුවය.

"ඔයා දැන් කාව හරි බඳින්න ඕන වුටි දුව.."

උවමනාවටත් වඩා නිවී ගිය පියාගේ හඬ අනුපමාගේ හදවත මොහොතකට කොහේදෝ නොදන්නා ලොවක අතරමං කර දැමුවේය.

අනුපමා වෙත ගලා එන විවාහ යෝජනාවන්හි නිමාවක් නොවිණි. ඒ යෝජනාවන් අතර ගැළපෙනවා යැයි සිතිය හැකි කොතෙකුත් යෝජනාවන් තිබුණ ද, ඒ එකදු තරුණයකු හෝ කෙරෙහි අනුපමාගේ සිත නොනැමිණි. එපමණක් නොව, විවාහයක් කරා එකහ කර ගැනීමේ සිතක් ද ඇයට නොවිණි.

"මොකක්ද දුව ඔයාට වෙලා තියෙන්නෙ.. හැම එකටම බෑ කියනවා.. මොකක්ද ඔයාට තියෙන අඩුපාඩුව කසාදයක් බඳින්න බෑ කියන්නෙ..? අපි දෙන්නා හෙට අනිද්දා මැරිලා ගියාම කවුද ඔයාට කියලා ඉන්නෙ..?"

අතීත දිනවලදී නම් මවගේ මුවින් පිටවූ එවන් දෝෂාරෝපණයන් සුලබ වුවත්, ඒ මොහොතේ මුනිවතින්ම පසුවන තම මව පිළිබඳව අනුපමාගේ සිත තුළ පිළිසිඳුණේ විසල් දුකකි. වසර තුනක් හතරක් මුළුල්ලේ විවාහයකට එකහ නොවී, තමාගේ දෙමාපියන්ට එල්ල කළ මානසික පීඩනය අනිසි එකක් නොවේදැයි අනුපමාගේ සිත ප්‍රථම වතාවට පසුතැවෙන්නට පටන් ගත්තේය.

"අම්මා.. ඇයි ඔහොම ඉන්නෙ.. අම්මගෙ නිහඬකම මට දරාගන්න අමාරුයි.. වෙනදට අප්පච්චි වෙනුවට මේ දේවල්



The Reader's Place Novel

කතා කරන්නෙ අම්මා.. ඒ හින්දා වෙන්නැති.. අම්මගෙ නිහඬබව මට මේ තරමටම අසාමාන්‍ය බරක් විදියට දැනෙන්නෙ.."

වෙනදා දොඩමලු වන සුහාෂිණී වර්ණවීර මහත්මියගේ මුව ගොළු වී, ඒ මොහොතේ දෙනයන කඳුළින් පිරී ගොස් තිබිණි. ඒ දුටු අනුපමාගේ දැස ද කඳුළින් තෙත් වන්නට විය.

"ඇයි අම්මා..?"

"ඔය කාරණාව ගැන ඔයාට තවත් තේරුම් කරන්න දෙයක් මට ඉතිරිවෙලා නෑ චූටි දුව..!"

අනුපමා, මවත්, පියාත් දෙදෙනා දෙසම බැලුවේ අසරණ දැසිනි.

"මට ඒ ගැන කියලා කියලම.. අම්මට එපාම උනාද අම්මා..?"

දියණියගේ බිඳුණු වදන්, වර්ණවීර මහත්මියගේ සිත බෙහෙවින් ම පාරවන්නට විය.

"චූටි දුව.. රට, ලෝකය ගැන හැම දෙයක්ම වගේ දන්න ඔයාට.. මේ අම්මගෙයි අප්පච්චිගෙයි හිත් තේරුම්ගන්න බැරිකමක් නැනෙ.. ඕස්ට්‍රේලියා ගමන නෙමෙයි චූටි දුව ඇත්තම ප්‍රශ්නෙ.. විවාහ වෙන වයස පහුවෙලා යන දුවෙක් ඉන්නවා කියන්නෙ.. දෙමව්පියන්ගෙ හිතට ලොකු බරක් චූටි දුව.."

අනුපමාගේ ළය අමුතුම ආකාරයේ ආත්මානුකම්පාවකින් නිරි වැටී ගියේය. කුරා කුහුඹුවකුට හෝ කරදරයක්, හිරිහැරයක් නොවී ජීවත් වූ තමා, තම මාපියන්ගේ ලෝකයට මෙතරම් බරක් වී උන් බව ඇ අතීතයේ කිසිදු මොහොතක අල්ප මාත්‍රිකව හෝ සිතා තිබුණේ නැත. දෙමාපියන්ගේ ලෝකයේ පවුරු බැඳන්





උන් ඇ, ජීවිතයේ පළමු වතාවට මදකට ඒ හැඟීමේ වනල්භාවයෙන් මිදුණාය.

"අම්මා.. අප්පච්චි.. කියන්න මට.. මං දැන් මොනවද කරන්න ඕන..?"

අනුපමා, දැසේ නළියන කඳුළු වියළා ගන්නට අසිරු වැයමක නිරත වෙමින්, සිහින් හඬින් විමසුවාය. දියණියගේ සිත අසීමිතව වංචල වී ඇති බව වටහා ගත් වර්ණවීර මහතා වචන තෝරා බේරා ගත්තේ ප්‍රවේසමෙනි.

"අපි ඔයාට නරකක් කරන්න හදනවා නෙමෙයි චූටි දුව.. විශේෂයෙන් ගැනු ළමයෙක් නිසි වයසෙදි විවාහ වෙන්නම ඕන.. නැත්නම් ගොඩක් ප්‍රශ්නවලට මුණ දෙන්න සිද්ධ වෙනවා චූටි දුව.."

"අද කාලෙ කසාද බැඳලත් මිනිස්සු ගොඩාක් දුක් විඳිනවා අප්පච්චි.."

"බැඳපු මිනිස්සුන්ට වඩා නොබැඳපු මිනිස්සු දුක් විඳිනවා චූටි දුව.. බඳින මිනිස්සුන්ගෙ ජීවිත විචිත්‍රයි.. විවිධයි.. එයාලගෙ ජීවිතවලට අපේ අවධානය යොමු වෙන හින්දා තමයි අපිට එයාලගෙ ජීවිත ඇතුළේ තියෙන ප්‍රශ්න පේන්නෙ.. විවාහ නොවුණ.. තනිකඩ මිනිස්සු හරියට අවලංගු කාසි වගේ.. එයාලගෙන් ගොඩක් දෙනෙකුගෙ අවසාන කාලෙ ඉරණම පිල්කඩේ ලගින බල්ලන්ගෙ ඉරණම වගේ.. විවාහකයෙක්ගෙ ප්‍රශ්නයක් දිහා සානුකම්පිතව බැලුවට.. මේ සමාජය තනිකඩ මිනිස්සු ගැන ඒ තරම් තැකීමක් කරන්නෙ නෑ.. ලෞකික



The Reader's Place Novel

ජීවිතයක් ගෙවනවා නම්.. අපි ශක්තිමත් බැඳීම් හදාගත්තු
ඕන වුටි දුව.. එහෙම නැති උනොත් අපිට පැවැත්මක් නෑ."

පියාගේ දීර්ඝ විවරණය අවසානයේ අනුපමා, තමාගේ
පෞද්ගලික ලෝකය වෙනස් කර ගන්නට තීරණයකට එළඹුණාය.
තවදුරටත්, මාපියන්ගේ ලෝකයට ප්‍රශ්නයක් නොවී ජීවත් විය
යුතු යැයි ඇගේ ඇතුළාන්තයට ම පහදා දුන්නාය.

"අප්පච්චි.. අම්මටයි අප්පච්චිටයි හොඳ කෙනෙක් බලන්න
අප්පච්චි.. මං එයාව මැරි කරන්නම්.. මාව අම්මගෙ
අප්පච්චිගෙයි හිතට තවත් කරදරයක් කරගන්න එපා.."

පූර්වයේ කනිකා කර ගත්තාක් සේ, මවගේත්, පියාගේත්
දෙදෙනාගේම මුවින් දිගු සුසුමක් ගිලිහෙනු අසා, අනුපමා යළිත්
නිගැස්සුණාය.

"විශේෂයෙන් බලන්න නම් දෙයක් නෑ වුටි දුව.. අ
යෝජනාව ආපහු ඇවිත්.."

අනුපමා, තම මව දෙස බැලුවේ ප්‍රශ්නාර්ථයෙනි.

"මොන යෝජනාවද අම්මා..?"

"අර ලෝයර්.. දේවක රන්මුතුගල.. ගම්පහ උසාවියෙ වැ
කරන්නෙ.. මේ ඒ පණිවිඩේ අහලා එවපු පස්වෙනි වතාව වු
දුව.."

අනුපමා, යළිත් තම මාපියන් දෙස බැලුවේ අසරණ දෑසිනි.

"අද ද ඔය පණිවිඩේ ආවෙ අම්මා..?"

"ඔව් වුටි දුව.. මිස්ට සිරිවර්ධන ගෙදරටම ආවා..





ලෝයර් මිස්ටර් සිරිවර්ධනගෙ ලෝයර් වෙලා ඉන්නෙ අවුරුදු
පහක ඉඳලලු.. හරිම හොඳ කෙනෙක්ලු වුටි දුව.. මිස්ට සිරිවර්ධන
අහනවා මෙච්චර හොඳ යෝජනාවක් වෙලත් මේ ගැන හොයලා
බලන්නෙ නැත්තෙ ඇයි කියලා..?"

මොහොතක් කල්පනාවේ ගැලී උන් අනුපමා, සිය
සිතැඟියාවන් හෙළිදරව් කරන්නට පටන් ගත්තාය.

"අප්පච්චි.. මට තියෙන ප්‍රශ්නෙ.. ඒ ලෝයර් ඇයි ඔය
තරමටම මං ගැන බලාපොරොත්තු තියාගෙන ඉන්නෙ කියලා..
මම නිකම්ම නිකම් ගුරුවරියක්.. අපි සාමාන්‍ය පවුලක්.. එයා
හොඳ නමක් දිනාගත්ත ලෝයර් කෙනෙක් විතරක් නෙමෙයි
වළව්කාරයෙක්.. එයා වගේ ලොකු කෙනෙක් මං වගේ සාමාන්‍ය
කෙනෙකුට එච්චර කැමැත්තෙන් ඉන්න එකම මට පුදුමයක්.."

"ඇයි වුටි දුව එහෙම වෙන්න බැරිද..?"

"කියම විශේෂ හේතුවක් නැතුව..? මට ඒක විශ්වාස කරන්න
ටිකක් අමාරුයි අප්පච්චි.. එයාගෙ සමාජ, ආර්ථික තත්වය
එක්ක ගත්තම අපි නිකම්ම නිකම් සාමාන්‍ය මිනිස්සු.."

සුහාෂිණී වර්ණවීර මහත්මිය තම දියණිය දෙස බැලුවේ
තීරණාත්මක දෑසිනි.

"ඔය කොයි තරාතිරමෙත් හොඳ මිනිස්සු ඉන්නවා වුටි
දුව.. අපි විශේෂයි කියලා හිතන මිනිස්සු තුළ අතිශයින් සාමාන්‍ය
මනුස්සයෙක් ජීවත්වෙන්න පුළුවන්.. මං මේ කියන්නෙ ඔයා
නොදන්න දේවල් නෙමෙයි.. ඔයාගෙම චින්තනයෙන් මං
අහුලගත්ත දේවල්.."



The Reader's Place Novel

බොහෝ දිගු දුර කල්පනා කරන්නට අනුපමාට උවමනා උවත්, ඇගේ දෛවය එතරම් කාලයක් ඇයට ලබා දී තිබුණේ නැත.

"මම නම් කැමති බොහෝම සරල, සාමාන්‍ය කෙනෙකුටයි අප්පච්චි.. ඒත් කමක් නෑ.. අම්මයි අප්පච්චියි කැමති දෙයක් කරන්න.. වෙලාවෙ හැටියට අපි එන විදියට මුණ දෙමු අම්මා.."

තමාගේ ජීවිතය පිළිබඳව ඒකපාර්ශවීය තීන්දු තීරණයන්ට එළඹිය හැකි කාල සීමාව අවසන්ව ඇති වග අනුපමා තමාට ම අවබෝධ කරවන්නට අභ්‍යන්තර අරගලයක නිරත වූවාය. තමාගේ මවගේත්, පියාගේත් මානසික සුවතාවය උදෙසාම විනා, විවාහයක් කෙරෙහි එකහ වන්නට තරම් සුපහන් ප්‍රාර්ථනා ඇගේ ළයෙහි පීදී තිබුණේ නැත.

"චූටි දුව.. ඔය විදියට කියන්නෙ.. අපි ගැන හිතලද..?"

ළයාන්විත හඝරැල්ලක් පමණක්ම මාපියන් වෙත පිළිතුරු ලෙසින් පෑ අනුපමා, හිඳ උන් අසුනින් නැගී සිටියාය.

"සිරිවර්ධන අංකල්ට කියලා.. ඒගොල්ලන්ට මෙහෙ එන්න දවසක් කතා කරගන්න අම්මා.."





# 02



අනුපමා ඒකාත්මික වී සිටියේ සාමාන්‍ය පෙළ විභාගයට සූදානම් වන සිසු දරුවන්ගේ පැවරුම් සටහන් සමූහයක් සමඟිනි. දොර තිරය මැත් කර බැලූ අනුපමාගේ මව, දියණිය දැහැනින් මුදවන්නට ලෝබකමින් මෙන් මොහොතක් බලා සිටියාය. එහෙත්, අනුපමාගේ කාමරයේ වූ බිත්ති ඔරලෝසුවේ තත්පර කටුව නගන 'ටික් ටික්' හඬින් පියවි ලොවට පැමිණි ඇ තමා දියණිය සොයා පැමිණි කාරණය සිහිපත් කර ගත්තාය. සුහාෂිණී වර්ණවීර මහත්මිය තම දියණියට ඇමතුවේ බෙහෙවින් ම මෘදු හඬිනි.

"චූටි දුව.."

මවගේ හඬින් දැහැන් බිඳී ගිය අනුපමා, අත රඳවාගෙන උන් පැවරුමෙන් නෙත, සිත දෙකම ඉවතට ඇද ගත්තාය. කොයි කවර මොහොතේත් අනුපමාගේ දෙතොලතර ඇදෙන මෘදු මන්දහාසය, ඒ මොහොතේත් ඇගේ දෙතොල් මත සිත්තම්ව තිබිණි.



The Reader's Place Novel

"ඇයි අම්මා..?"

"දුව.. හදිසි වැඩක්ද..?"

සුහාෂිණී, තම දියණියගෙන් එය විමසුවේ පමණටත් වඩා කාලය ගනිමිනි. අනුපමාට දැනුණේ තම මවගේ ස්වරය තුළ වූයේ පැහැදිලිවම ආයාචනයක් බවයි.

"ඇයි අම්මා.. මම මේ ඕලෙවල් ක්ලාස් එකේ අසයින්මත්ව්ස් වගයක් බලනවා.. හදිස්සියක් නෑ.. තව ටිකයි තියෙන්නෙ.. කියන්නකෝ.. ඇයි අම්මා..?"

"චූටි දුව.. අර ළමයා කතා කරනවා.. ටිකක් ඇවිල්ලා කතා කරනවද..?"

පළමුව, අනුපමාගේ නළලත ප්‍රශ්නාර්ථයෙන් රැළි විණි. එහෙත්, මොහොතකින් ඈ යළිත් යමක් සිහියට කැඳවා ගත්තාය.

"අර ළමයා...? කවුද අම්මා..???"

"දේවක පුතා චූටි දුව.. මේ දවස් තුන හතරෙම කෝල් කළා.. චූටි දුවත් එක්ක කතා කරන්න ඕන කිව්වා.. දුව පාඩම් කරනවා කිව්වම මේ දවස් ටිකේම එහෙනම් කරදර කරන්න එපා කියලා ෆෝන් එක තිබ්බා.. ඉරිදට මෙහෙ එන්නත් ඉන්න එකේ.. කවදාවත් මීට කලින් කතා කරලත් නැති හින්දා.. පුංචි වෙලාවකට කතා කරන්න පුළුවන්ද ඇහුවා.. පව් නේද චූටි දුව.. පොඩ්ඩක් කතා කරනවද ඇවිල්ලා...?"

එතෙක් කල් නිවී තිබුණු අනුපමාගේ සිත නුහුරු හැඟීම් ගොන්නකින්ම තිගැස්සී ගියේ ඇසිල්ලකිනි. සම්ප්‍රදායන්ට මුහුණ නොදී පැන යා හැකි සීමාවන් තවදුරටත් තමාට වලංගු නොවන





බව අවබෝධ කරගෙන උන් අනුපමා, පැවරුම් කඩදාසි කිහිපය මතින් කඩදාසි බරුවක් තබා, හිඳ උන් අසුනින් නැගී සිටියාය.

"චූටි දුව.. ඒ ළමයගෙ හිත නොරිදෙන විදියට කතා කරන්න.."

අනුපමා දොර තිරය අසලදී මව දෙස බැලුවේ මදක් පුදුමයෙනි.

"එයා මට ගෙනාවෙ විවාහ යෝජනාවක්.. ඇයි අම්මා මම එයාගෙ හිත රිදෙන විදියට කතා කරන්නෙ..? අනික.. කාගෙ උනත් හිත රිද්දන එක මගේ පුරුද්ද නෙමෙයි.. අම්මා බයවෙන්න එපා.."

තම මවගේ මුහුණේ ඇදුණු සැනසිලිදායක හසරැල්ලේ පරිමාණය දුටු අනුපමාගේ හදවතට දැනුණේ විසල් අස්වැසිල්ලකි. සුහාෂිණී, තම දියණිය දෙස බැලුවේ මද සිනා සපිරි කෘතවේදී දැසිනි.

"ඔයා එහෙම කරනවට නෙමෙයි.. මං එහෙම කිව්වෙ නිකම් චූටි දුව.. යන්න.. ගිහින් පොඩ්ඩක් කතා කරන්න.."

සිත බර කළ නුහුරු හැඟීම් ගොන්න ම, මොහොතකට සිත පතුලටම තල්ලු කර දැමූ අනුපමා, ආලින්දයේ කොණක තබා තිබූ දුරකතනය වෙත ඇවිද ගියේ සුපුරුදු සන්සුන් ගමනිනි. ඈ, රිසීවරය කන තබා ගත්තේ ද ඒ සන්සුන් ස්වභාවයෙන්මය.

"හෙලෝ.."

පෙර කටහඬක් හෝ අසා නොමැති, එතෙක් දිනක් අසන්නට



The Reader's Place Novel

පෙරුම් පුරමින් බලා හිදි යුවතියගේ හඬ දෙසවනට වැටෙත් ම, නීතිඥ දේවක රන්මුතුගල මහතාට මොහොතකට තමාගේ මුළු ලෝකයම අමතක වී, මුව ගොළු වී ගියේය. විත්තිකරුවන්, පැමිණිලිකරුවන් ඉදිරියේ අභීතව හඬ නගන ඔහුගේ සිංහ නාදය, ඒ මොහොතේ නිහඬ වී ම ගොස් තිබිණි. අනුපමාව යළිත් වතාවක් අමතන්නාට ආමන්ත්‍රණය කිරීමට සිදුවූයේ, අනෙක් පස නිහඬව ම තිබූ බැවිනි.

"හෙලෝ.. හෙ..ලෝ.."

"අනු..පමා..!"

ආගන්තුකයාගේ ස්වරයෙහි වූ සසැලීම අනුපමාට දරාගත් නොහැකි තරමේ සංවේදනාවක් විය. තමාට විවාහ යෝජනා රැගෙන ආ නීතිඥ මහතාගෙන්, ඈ අසන්නට අපේක්ෂා කළේ ඊට වඩා බෙහෙවින් ප්‍රතාපවත් කටහඬකි. එහෙත්, ගරු ගාම්භීරබවට ම මුසු වූ කුමක්දෝ නොතේරෙන ළයාදරණීය බවක් දේවකගේ හඬෙහි අනන්‍යව තිබිණි. කිසිදා තරුණයෙකුගේ හඬකින් සසලව නොතිබුණු අනුපමාගේ නිසසල හදවත, දේවකගේ එකම වදනින් බිඳක් සසැලිණි.

"ඔව්.. කියන්න.."

අනුපමාගේත්, දේවකගේත් සංවාදය තුළ වැඩිපුර තිබුණේ නිහඬව ගෙවී යන තත්පර ය. නොදැනීම දෙදෙනා ම මුහුණ පා සිටියේ එකම ආකාරයේ ඉරණමකට ය. එතෙක් කල් කිසිසේත්ම නොහඳුනන්නන් බවට පත්වී සිටි ඔවුහු, ඔවුනොවුන්ගේ හදවත් තුළින් කුමක්දෝ සමීප බවක් නිරුත්සාහිකව ම ගොඩ නගාගෙන උන්හ.





"මේ වෙලාවේ කතා කරලා.. මං අනු..පමාට කරදර කළාද මන්දා.. කරදරයක් උනා නම් සමාවෙන්න අනුපමා.."

දේවකගේ පමණටත් වඩා අවංක බව පිරුණු වදන්, අනුපමාගේ සිතට දැනුණේ අනිසි බරක් ලෙසිනි. ඇයටත් නොදැනී ම ඇගේ සිත තුළ වූ සැහැල්ලුවෙන් හරි අඩක් පලා ගොස් තිබිණි.

"නෑ මට කරදරයක් නෑ දේවක.. කියන්න.."

සංවාදය ඉදිරියට ගෙන යාමට සුදුසු වදන් සොයා ගැනීම අනුපමාට නම් කිසිසේත් ම පහසුවක් නොවිණි.

"අපි ඉරිදට එනවා අනුපමා.."

"මං දන්නවා දේවක..."

යළිත් දෙදෙනා අතර පැතිර ගියේ නිහැඬියාවකි.

"අනු..පමා.. ගොළුවෙන්නෙ.. මාත් එක්ක කතා කරන්න දෙයක් නෑ වගේද..?"

දේවකගේ ස්වරයේ දැවටී තිබුණු මෘදු බවට, පළමු වතාවට ඇගේ සිත තුළ අනුකම්පාවක් උපන්නේය.

"අනේ නෑ දේවක.. පළවෙනිම වතාවට කෙනෙක් කතා කළාම.. කතා කරන දේවල් ගොනු කරගන්න ටිකක් අපහසුයි.. දේවක මොනවා හරි මගෙන් අහනවා නම්.. මට උත්තර දෙන්න පහසු වෙයි.."

අනුපමාගේ පිළිතුරු දීමේ රටාව, තරුණ නීතිඥවරයාගේ සිත පමණටත් වඩා උදුරා ගත්තේය. පෙර සිවි වතාවේදී මෙන්



The Reader's Place Novel

ම, අනුපමා තම විවාහ යෝජනාව ප්‍රතික්ෂේප කරතැයි දේවකගේ සිතෙහි ඒ වන තෙක්ම පැවති දෙගිඩියාව මදක් දුරු වී ගියේ මොහොතේ ය. අනුපමාගේ එම පිළිතුරින් මතු, දේවකගේ සිත අපූරු සැහැල්ලුවක වෙලී, ඈ ඉදිරියේ විවෘත වන්නට පටන් ගත්තේ ය.

"ඇත්තටම මං අදත් ටිකක් බයෙන් ගත්තෙ අනු..පමා.. ඔයා මගේ කෝල් එකට ආන්සර් කරන්න එන එකක් නැද්ද කියලා.."

දේවකගේ පැනයට පිළිතුරු දීමට වඩා, ඊට ප්‍රථමයෙන් ඇයට ඔහුගෙන් විමසා දැන ගැනීමට පැනයක් හමුවී තිබිණි.

"දේවක.. ඇයි මගේ නම දෙකට කඩලා කියන්නෙ.. දේවක ඒක කියන්නෙ හරියට බර කරලා.."

දේවක, පළමු වතාවට තමාගේ සිත් ගත් යුවතිය ඉදිරියේ මදක් උස්, සැහැල්ලු සිනාවක් පෑවේය.

"අනුපමා.. ඒ නම ගොඩක් ලස්සන නමක්.. ඒ හින්දා.. ඒ නම සම්පූර්ණයෙන් ම කියන්න.. මං ආසයි.. කෙටි කරන්න ලෝබයි.. ඒත්.. ඒ නම දිග වැඩියි.. ඒ හින්දා.. මං හැදුවෙ කෙටි කරලා කියන්න.. ඒ උනාට.. මට ආයෙම හිතුණා කතා කරන මුල්ම වතාවෙම එහෙම කළොත් ඔයා මාව වරදවා තේරුම් ගනියි කියලා.."

දේවක, අනුපමාගේ සිතිවිලි ලෝකය ගෙන ගියේ ඈ කිසිසේත් ම නොසිතූ ඉසව්වකට ය.

"දේවක.. එච්චර දුර හිතුවද..?"





"මට එහෙම හිතන්න නිකම්ම සිද්ධ උනා අනුපමා.. මං ඕට කලින් හතර වතාවක් අනුපමාට මගේ කැමැත්ත කියලා එව්වත්.. අනුපමා මීට කලින් ඒ එකක්වත් කෙයා කළේ නැනෙ.. අඩුම තරමෙ අනුපමා ඒ එකම සැරේකවත් මං එක්ක පොඩ්ඩක් කතා කරන්නවත් කැමති උනේ නැනෙ.."

දේවක විමසුවේ කිසිසේත් ම චෝදනා මුඛයෙන් නොවූවත්, අනුපමාට දැනුණේ පසුතැවීමකි.

"දේවක.. මට ඒ කළේ.. චෝදනාවක්ද..?"

"නෑ අනුපමා.. මං දැන් ඔයා එක්ක කිව්වෙ.. මගෙ හිතට දැනුණ දුක ගැනයි.."

අනුපමාගේ සිත.. මොහොතකට හිරිවැටිණි. ජීවිත කාලයක් මුළුල්ලේ දැන හඳුනා ගත්තකු සේ, සිතිවිලි වමාරන තරුණයා පිළිබඳව ඈ පළමු වරට පුදුම වූවාය. තමාගේ සිත තුළ එක මත එක ගොඩගැසෙන ප්‍රශ්නාර්ථයන් වචන බවට පත් කිරීමට සුදුසු වචන තමාගේ වචන කෝෂයේ නොවීම පිළිබඳව, අනුපමා සිත යටින් දුක් වන්නට වූවාය.

"දුක දැනුණා කිව්වෙ.. දේවක මං ගැන ඒ තරමටම බලාපොරොත්තු තියාගෙන හිටියද..?"

"යෝජනාවක් කියන්නෙම බලාපොරොත්තුවක් තමයි අනුපමා.."

වෘත්තියෙන් නීතිඥයකු වූ දේවක රන්මුතුගලගෙන් එවන් සුසංවේදී ප්‍රකාශයන් අනුපමා කිසිසේත් ම අපේක්ෂා නොකළාය.

"දේවකගෙ තත්වයයි මගේ තත්වයයි ගොඩක් දුරස්ථයි



The Reader's Place Novel

දේවක.. මං බොහොම සරල සාමාන්‍ය ජීවිතයක් ගත කරන කෙනෙක්.."

"ඔයාගෙ ඒ සරල සාමාන්‍යකමට තමයි මං පළවෙනියටම කැමති උනේ අනුපමා.. ජීවිතේ බරක් කරගත්ත කෙනෙක් අපේ ජීවිතේට එකතු කර ගත්තොත්.. මේ ජීවිතේ තවත් බරක් වෙනවා.. සරලව, සතුටින්, සැහැල්ලුවෙන් ජීවත්වෙන කෙනෙක් ජීවිතේට එකතු කරගන්න ලැබෙන එකම ලොකු පිනක්.. වාසනාවක් අනුපමා.. ඔයා ගැන හොයලා බලපු හැම වෙලාවකම මට දැනගන්න ලැබුණා අන්න ඒ වාසනාවන්තයා තාම ඔයාට මුණගැහිලා නෑ කියලා.. මට හිතුණා හතර වතාවක්ම පැරදුණත් මේ වතාවෙත් ඒ වාසනාව උරගාලා බලන්න..."

දේවකගේ මුවින් පිටවූ වදන් අදහාගත නොහැකිව අනුපමා යළිත් ගල් ගැසුණාය. පමණටත් වඩා ජීවිතය ඉදිරියේ සංයමයෙන් ජීවත් වූ අනුපමාට තමාට සහමුලින් ම ආගන්තුක වූවෙකුගේ මුවකින් ගිලිහෙන එවදන් දරා ගැනීම පහසු වූයේ නැත. ඇයට උවමනා වූයේ විගසින් සංවාදයට තිත තබන්නට ය.

"දේවක.. ඔයා කියන කිසිම දෙයක්.. ඇත්තටම මට තේරුම් ගන්න බෑ.."

"තේරුම් ගන්න බැරිද.. නැත්නම් හිතාගන්න බැරිද..?"

"සමහරවිට.. ඔය දෙකම වෙන්න ඇති දේවක.. අපි එහෙනම්.. මුණ ගැහුණට පස්සෙ කතා කරමු දේවක.."

"ඔව්.. මේ දේවල් ෆෝන් එකෙන් කතා කරනවට වැඩිය.. මුණ ගැහිලා කතා කරනවට මමත් කැමතියි අනුපමා.. මොකද ෆෝන් එකෙන් කතා කරනකොට අපි අතරෙ හුවමාරු වෙන්නෙ





වචන විකරයි. ඒත්.. මුණගැහිලා එකිනෙකා දැක දැක කරන කතාබහේදි අපි අතර ඊට වඩා හෘදයාංගම දේවල් ගොඩක් හුවමාරු වෙයි කියලා මට හිතෙනවා අනුපමා.. ඇත්තටම මම හිතුවෙ නෑ ඔයා මේ තරම් වෙලාවක්වත් මාත් එක්ක කතා කරයි කියලා... අනුපමා කියන්නෙ වැඩි කතා බහක් නැති නිහඬ කෙනෙක් කියලා මං හොඳටම දන්නවා.."

අනුපමාට සිහින් හඬින් සිනාවක් නැගුණේ නොදැනුවත්වම ය. එසේම, ඇගේ සිතට දැනුණේ කිසිදා නොදැනුණු තරමේ අපූර්ව සැහැල්ලුවකි. ඒ සැහැල්ලුව වචන බවට පත්වී මුවින් පිටවූයේ ද අනායාසයෙනි.

"මං කතා කළේ නෑ.. උගත් නීතිඥ මහත්මයා මාව කතා කෙරෙව්වා.."

අනුපමාගේ පිළිතුරෙන් සැණෙන් සිතට පිවිසි සතුට කොතෙක් ද යත්, මොහොතකට දේවකගේ මුව ගොළු විය. දිය යුතු පිළිතුරක් තෝරා බේරා ගත නොහැකිව ඔහු මදක් ලතැවුණේය.

"ඒ කතා කළේ ඇත්ත අනුපමා නම්.. මට ගොඩක් සන්තෝසයි.. ඒ කටහඬ ඇතුළෙ ගොඩක් සැහැල්ලු ගැනු ළමයෙක් හැංගිලා ඉන්නවා.. අනික.. වරද්ද ගන්න එපා.. මං කාට උගත් නීතිඥ මහත්මයා උනත්.. අනුපමා ළඟ මම නිකම්ම නිකම් දේවක විතරයි.. අනුපමා ළඟ මට පදවි, තානාන්තර, තරාතිරම.. මේ කිසිම දෙයක් වැදගත් නෑ.."

අනුපමාගේ දෑස බිත්තියේ රඳවා තිබූ හෝරා යන්ත්‍රය දෙසට යොමු වූයේ සංවාදය අතරිනි. හෝරා බාගයකටත් එහා



The Reader's Place Novel

ගිය ප්‍රශ්නෙත් සංවාදය දිගු වැඩි යැයි අනුපමාට සිතිවුයේ ඒ නිසාවෙන් ය.

"නැවතපන්.. මං එහෙනම් තියන්නම්.. හෙට යද්දි ළමයින්ගෙ පුරවැසි විසා ටිකත් අරගෙන යන්න ඕන.."

අම්මා රන්මුතුගල පසු වුයේ නොසිතූ මොහොතක සිහිනයක් දැකීමේ ප්‍රීතියෙනි. අනුපමා ඇමතුමෙන් සමුගෙන ගිය පසු, ඔහු ප්‍රකාශනයට ආසන්නයේ ම වූ සැටි පුටුවේ පහසුවෙන් දිග දැද්දී දෙක් වේලා ගත කළේය. පුතුගේ දුරකතන ඇමතුම අවසන් වූ බව දැනී, ඇතුළු ආලින්දයේ උන් රන්මුතුගල මහත්මිය හෙමින් හෙමින් පුතු කරා ඇවිද ආවාය.

"පුතා.. කවුද ඒ... අර ඉස්කෝලෙ ළමයද කතා කෙරුවෙ..?"

"මූව් අම්මා.. බලාගෙන ඉඳලා ඉඳලා හිතුවෙවත් නැති වෙලාවක.. අනුපමාගෙ කැමැත්ත ලැබුණා.. අපිට ඉරිදට බලාපොරොත්තුවක් ඇතුව ඒ ගමන යන්න පුළුවන් දැන්.."

පුත්‍රයා රන්මුතුගල මහත්මිය තම වැඩිමහල් පුතු දෙස බැලුවේ පතුට මුසු වූ වේදනාවකිනි. පුතු ගෙන ආ ආරංචිය අයුරේ සැබෑම සතුටක් වුවත්, ඒ සතුට පූර්ණ වශයෙන් සතුටක් ඇදිත් බාර ගන්නට නොහැකි කරුණු කාරණා අනන්තයක් පෙළ ගැසී තිබිණි.

"සී එහා බව කිව්වම.. ඒ ළමයගෙ විරුද්ධත්වයක් පෙන්නුවෙ නැද්ද පුතා..?"

"නෑ අම්මා.. මට දැනුණ විදියට.. මොකක් හරි දේකින් අනුපමා හිත හදාගෙන.."





රන්මුතුගල මහත්මියගේ මුවින් ගිලිහුණේ දිගු සුසුමකි. ඒ සුසුමේ අරුත දැන උන් දේවක, මවගේ පසුතැවීම කුමක් අරබයාදැයි විමසන්නට වෙහෙස දැරුවේ නැත.

"එහෙම හිත හදාගෙන නම්.. ඒ දරුවගෙ හිත අපි හින්දා කැඩෙයිද පුතා..?"

විත්තිකරුවෙකු වී, වරදකරු බවට පත්වන තමාගේ සේවාදායකයකු ඉදිරියේවත් දේවක කිසිදා එයාකාරයෙන් අසරණ වී තිබුණේ නැත. මවගේ ප්‍රකාශයෙන් ඔහුගේ සිත අනන්තයටම සසල වී තිබිණි.

"මම.. කසාදයක් නොබැඳම ඉන්නද අම්මා..? එහෙම උනොත් ඒ ප්‍රශ්න හැම එකකටම උත්තර ලැබෙයි.. අම්මා අනපු ප්‍රශ්නෙ මට බරපතල වැඩියි.. අනිත් මොන දෙයින් ශක්තිමත් උනත් තවත් ගෑනු ළමයෙක්ගෙ සම්පූර්ණ අනාගතයක් බාරගන්න මොහොතෙදි මේ තියෙන ප්‍රශ්න දිනා බැලුවම.. ඒ වගකීම දරාගන්න තරම් මම ශක්තිමත් නෑ අම්මා.."

තම වැඩිමහල් පුතුගේ වදන් තුළ තැවරී තිබුණු ආත්ම පරාජය දරා ගැනීම, රන්මුතුගල මහත්මියට පහසු වූයේ නැත. ඇගේ දෑස කඳුළු විලක් බවට පත් වූයේ මොහොතකිනි.

"ලොකු පුතා.. කවදාවත් කසාද නොබැඳ ඉන්න..???"

"ඒකනෙ අම්මා.. මං දන්නවා අවුරුදු හතක් අටක් තිස්සෙම අම්මා මගේ අනාගතේ ගැන හිත හිතා මොන තරම් වදයක් වේදනාවක් විඳිනවද කියලා.. ගෑනු ළමයි තිහ හතලිහක් බැලුවත්.. ඒ සේරම කිසිම බලාපොරොත්තුක් ඇති නොවුණ ගානට අතැරලා දැම්මත්.. මට කිසිම බලාපොරොත්තුවක් නොදුන්න අනුපමා



The Reader's Place Novel

ගැන මගෙ හිතට මං මේ තරම් බලාපොරොත්තු ගොඩ
ගහගත්තෙ.. අම්මගෙ හිතේ පිරිලා තියෙන අන්න ඒ වේදනාවට
සහනයක් වෙන උත්තරයක් හොයන්නයි.."

දේවක සිහින් හඬින් කියවාගෙන ගියේ, තම මව කෙරෙහි
උපන් අසීමාන්තික කරුණාවකිනි. රන්මුතුගල මහත්මියට කවදත්
දරාගත නොහැකි වූයේ, තම පුතුගේ හදවත සුසැදි ඒ මහා
පරිමාණ ආදරය ම ය.

"මගෙ පුතා.. මේ ලෝකෙ ඉන්න හොඳම දරුවන්ගෙත්
එක්කෙනෙක්.. මගෙ පුතාට කවදාවත් වරදින්නෙ නෑ.. තාත්තෙක්
වගේ මේ පවුල රැක බලාගත්තු මගෙ පුතාට.. එහෙම වරදින්න
විදියක් නෑ. දෙවයේ සරදමක්ද.. දෙවයේ හාස්කමක්ද කියන්න
මම දන්නෙ නෑ.. කොහොම හරි මේ රන්මුතුගල පරම්පරාවේ
අන්තිම බලාපොරොත්තුව මගෙ පුතා.. ඒ හින්දා උඩ ඉන්න
දෙවියොවත් මගෙ පුතාගෙ මූණ බලන්නම ඕනෑ..."

සුජාතා රන්මුතුගල මහත්මියගේ කටහඬ බිඳී ගොස්, නාසය
බරවී තිබිණි.

"අම්මා අඬන්න එපා.. අනුපමා හොඳ කෙනෙක්.. එයා
අපේ බලාපොරොත්තු නැති කරන එකක් නෑ.."

රන්මුතුගල මහත්මිය තම පුතු දෙස බැලුවේ අතීතයේ
කිසිදා නොවූ තරමේ උපේක්ෂා සහගත බැල්මකිනි. මවගේ
දෑසේ ඇඳී තිබුණු බැල්මේ අරුත වටහා ගත නොහැකිව,
දේවක දෑස නොසලා මව දෙසම බලා සිටියේය.

"මෙහෙ ආවට පස්සෙ.. ඒ දරුවගෙන් මොකක් හරි
අඩුපාඩුවක් උනත්.. ඒ දරුවා දිනා කරුණාවෙන් බලන්න මට





පුළුවන් පුතා.. මගෙ පුතා මං වෙනුවෙන් ඉෂ්ට කරන හැම
යුතුකමක් වෙනුවෙන්ම.. මගෙන් ඉෂ්ට වෙන්න ඕන යුතුකමක්
කියලා හිතාගෙන.. මොන දේ සිද්ධ උනත්.. මම ඉවසනවා
ලොකු පුතේ.. මගෙ පුතා බයවෙන්න එපා.."

දේවක තම මව දෙස බැලුවේ අතිශය කෘතවේදී දැසිනි.

"මගේ අම්මා.. කොහොමත් ශ්‍රේෂ්ඨ ගැහැනියක් කියන්න
මං දන්නවා අම්මා.. අම්මා ළඟ ඒ ඉවසීම තියෙනවා නම්
අනුපමා අතින් නොදැනුවත්ව හරි වරදක් සිද්ධ උනත්.. එයා
ඉක්මනටම ඒ වැරදි නිවැරදි කරගෙන ගොඩක් හොඳ කෙනෙක්
වෙලා අපේ ජීවිතවලට අරක් ගත්ත අඳුරට පහන් එළියක් වෙයි
අම්මා.. එයා මේ ගෙදරට එන ලේලි නෙමෙයි අම්මගෙම දුව
කියලා හිතාගෙන එයාව බාර ගත්තොත්.. එයා ගොඩක් ආදරෙන්
අපිව බලාගනියි අම්මා.. මට ඒක හොඳටම විශ්වාසයි.."

කිසිදා නොහඳුනනා යුවතියකට, කිසිදා ඇසුරු නොකළ
යුවතියකට එතරම් විසල් සහතිකයක් දෙන්නට තරම් ඇ කෙරෙහි
තමාගේ සිත තුළ ගොඩ නැගී තිබුණේ කවරාකාරයේ
විශ්වාසයක්දැයි දේවක පුදුමයෙන් කල්පනා කරන්නට වූයේ ය.
ඔහුගේ දැනැන බිඳ වැටුණේ උඩු මහලට පිවිසෙන තරප්පු
පෙළ දෙසින් නැගී ආ ගෝරනාඩු හඬත් සමගිනි.

"ඇයි.. ඇයී.. මොකද මේ දෙන්නා කෑගහන්නෙ..?"

පැනයට පිළිතුරු නැගී ආවේ පිරිමි හඬිනි.

"අයියා.. මේ අක්කා.. මගෙ පාට පෙට්ටිය ගත්තා.. දෙන්න
කියන්නකො.."



The Readers Place Novel

දේවක, මොහොතක් තම බාල සොයුරාත්, සොයුරියත් දෙස බලා සිටියේ හැඟීම් විරහිත දෑසිනි. ගෝරනාඩුව දුර දිග යන්නට මත්තෙන් නවතා ගත යුතු වූයෙන්, දේවක වැඩිපුර කාලය නොගත්තේ ය.

"හරි.. හරි.. දැන් දෙන්නා පාට පෙට්ටියට රණ්ඩු කරගන්න එපා.. අක්කා ඒක තියා ගත්තාවෙ එහෙනම්... කෝ.. මල්ලි එන්න අලුත් පාට පෙට්ටියක් දෙන්නම්.."

මිනිත්තු කිහිපයක ඇවෑමෙන් සොයුරාගේත්, සොයුරියගේත් ගැටුම සමථයකට පත් කිරීමට දේවකට හැකිවිණි.

✣ ✣ ✣ ✣ ✣ ✣ ✣ ✣ ✣

පෙරදින රාත්‍රියේ අනුපමා සමඟ කළ සංවාදයෙන් පසු සිත තුළ ගොඩ නැඟී තිබුණු සැනසීම සහමුලින් ම බිඳ වැටී දේවකගේ සිත අනාගතය පිළිබඳ කුමක්දෝ අවිනිශ්චිත බියකින් වෙළී තිබිණි. එහෙත්, එම දුක්බර කල්පනාවන් සමඟ ඉමක් කොතක් නොදන්නා ඉසව්වකට යා නොදී දේවකගේ සිතට ආපසු හැරෙන්නට සිදුවූයේ, ඔහුගේ දේපළ සම්බන්ධ පරිපාලකවරයා වූ සේනාරත්න මහතා දේවක සමීපයට පැමිණි බැවිනි. සේනාරත්න මහතා දේවකට ඔහුගේ පිය පාර්ශවයෙන් ඥාතියෙකු ද වූයේ ය. එබැවින් රන්මුතුගල පවුලෙන් ඔහු වෙත පැවරුණු වගකීම් ඉටු කිරීමට ඔහුට පමණටත් වඩා අවස්ථාව හා බැඳීම් ඉතිරිව තිබිණි.

"මාමෙ ඇයි..?"

"පුතා.. මාවතගම එස්ටේට් එකේ පඩි ගෙවන දවස ඉරිදා..





පුතාලා අර ගමන යන හින්දා මේ වතාවෙ යන්න වෙන්නෙ මට විතරයි නේද..?"

"ඔව් මාමෙ.. මාමට පුළුවන්නෙ..? ඇයි මොකක් හරි ප්‍රශ්නයක්ද..?"

"අර මැනේජර්ගෙ ඕ.ටී. ප්‍රශ්නෙට මොකද කරන්නෙ පුතා.. මිනිහා ආයෙත් ලියුමක් එවලා තියෙනවා.."

දේවක, සේනාරත්න මහතා දෙස බැලුවේ තීරණාත්මක දෑසිනි.

"මැනේජර්ස්ලට ඕ.ටී. ගෙවන තැන් කොහේවත් නෑ මාමෙ.. අපි එයාට ඒවට හරියන්න හැමදේටම අලවන්සස් දීලා තියෙනවා.."

"මිනිහා මේ ගමන කියලා එවලා තියෙනවා මේ වතාවෙත් ඒ ගැන සලකා බැලුවෙ නැත්තන් මිනිහා අස්වෙලා යනවලු.."

දේවකගේ මුහුණේ නිරායාසයෙන්ම ඇඳුණේ සෝපහාසි සිනාවකි.

"යන්න කියන්න මාමෙ.. එක්කෙනෙක් යනකොට ඒ හිස්තැන පුරවන්න එන්න බලාගෙන දාහක් ඉන්නවා.. ඉස්සර වගේ නෙමේ.. එක්ස්පීරියන්ස්ඩ්, කොලිෆයිඩ් මිනිස්සු ඉන්නවා රස්සා පෝලිම්වල.. මනුස්සකම ගැන හිතන හින්දා මට මනුස්සයව අස්කරලා දාන්න බෑ.. එයා කැමැත්තෙන් යනවා නම්.. කිසිම ප්‍රශ්නයක් නෑ.. යන්න කියන්න මාමෙ.."

සේනාරත්න මහතාගේ මුහුණේ ඇඳුණේ ද, දේවකගේ සිනාව මෙන් ම උපහාසාත්මක සිනාවකි.

The Readers Place Novel

"ඔය කිව්වට එහෙම යන්නෙ නෑ පුතා.. මිනිහා දන්නවා අපෙන් අයින් වෙලා ගියොත් මිනිහට යන එන මං නෑ කියලා.. වැඩ කරන තැනින් අස්වෙලා යනවා කියලා ඩිමාන්ඩ් කරන එක පඩි වැඩි කරගන්න සේවකයෝ කරන උප්පරවැට්ටියක් තමයි.. ඒත් මේ මෝඩ මිනිහා දන්නෙ නෑ එහෙම ඩිමාන්ඩ් කරන්න පුළුවන් සුදුසුකම් තමන්ට නෑ කියලා.. මට තේරුණ හැටියට නම් පුතා.. මිනිහා කාගෙ හරි දාර ලණුවක් කාලා.."

සේනාරත්න මහතාගේ කතාවට දේවකට පමණක් නොව රන්මුතුගල මහත්මියට පවා සිනා නැගිණි.

"මාමටත් හිතෙන දේවල්.."

"විහිළු නෙමෙයි පුතා.. ඒක තමයි ඇත්ත කතාව.. මේ පාර පොල් මුරේ ටිකක් අඩුවෙලත් තියෙනවා පුතා.."

"ඇයි මාමෙ මොකද වෙලා තියෙන්නෙ..?"

"මේ ගමන තිබිලා තියෙන්නෙ පොල් ගෙඩි දහ දාහක් විතර.. ගිය වතාවට වැඩිය දෙදාහක් විතර ම අඩුයි.."

දේවක එය එතරම් බරපතල ප්‍රශ්නයක් ලෙස සැලකුවේ නැත.

"මොකක්ද මාමෙ ඒකට හේතුව වෙන්න පුළුවන්..?"

සේනාරත්න මහතාගේ නළලේ ඇදුණේ බරපතල කල්පනාවක සලකුණු ය. ඔහු, දේවක දෙස බැලුවේ ඒ තීරණාත්මක බැල්මෙන් ම ය.

"පුතා.. වොචර් සිරිසේන කියනවා.. සිරිසේන නිවාඩු ගිය



දවස් දෙකේ කවුරුහරි හොරෙන් පොල් කඩන්න ඇතිලු.. මැනේජර් කියනවා ඒක සිරිසේනගෙ වැඩක්ලු.. කොහොම හරි.. වත්තෙ වැඩ කරන අය කියනවා අලුත් මැනේජර් කෙනෙකුයි අලුත් වොචර් කෙනෙකුයි දෙන්නෙක්ම එනවා නම් හොඳයි කියලා.."

දේවක මොහොතකට කල්පනාවකට වැටුණේය.

"එහෙමත් එකක්ද..? හොඳයි අපි මොනවා හරි කරන්න බලමු මාමේ.. වැඩේ වෙලා තියෙන්නෙ.. මේ තියෙන වැඩත් එක්ක මට ඕවට වෙන් කරන්න වෙලාවක් හොයාගන්න අමාරු එකනෙ.."

සේනාරත්න මහතා තම ඥාති පුතු දෙස බැලුවේ අනුකම්පාව මුසු අතිශය හිතෛෂීවන්ත බැල්මකිනි. සේනාරත්න මහතා දෙවනුව බැලුවේ, එතෙක් ඔවුන් දෙදෙනාට සාවධානව සවන් දෙමින් සිටි උන් රන්මුතුගල මහත්මිය දෙස ය.

"නේද අක්කෙ.. දැන් ඉතින් මේ ගමන යෝජනාව නම් ස්ථිරෙටම සිද්ධවෙයි නේද..? එහෙම උනොත් නම් පුතාට රාජකාරියට පරිබාහිර මේ වගේ වැඩවලට ඒ දරුවව සම්බන්ධ කරගන්න පුළුවන් වෙයිනෙ.. මේ වස්තු සම්භාරයට විනාශ වෙලා යන්න දෙන්න නරකයි.. මේ වත්තෙ විතරක් නෙමෙයි.. අනික් වතුවලත් එක එක ප්‍රශ්න.. මේවා ගැන හොයලා බලන්න පවුලෙම තවත් කෙනෙක් ඉන්නම ඕනෑ.."

රන්මුතුගල මහත්මිය තම හිතෛෂීවන්ත ඥාතියාගේ වදන් දරාගත්තේ උපේක්ෂාවෙනි.

"බලමුකො මල්ලියෙ.. ඒ දරුවා මේ පවුලක බොහොම

The Readers Place Novel

හුරතලේට හැදිච්ච.. කිසිම බරක් පතලක් හිතට ගත්තෙ නැති.. ඉස්කෝලෙ හාමිනේ කෙනෙක්.. ඒ දරුවට ඔය ව්‍යාපාර කෙරුවිලව් හරියන එකක් නෑ.."

සේනාරත්න මහතා හිනැහුණේ සැහැල්ලු ලෙසිනි.

"එහෙම කියන්නෙපා අක්කෙ.. ගුරුවරියො කියන්නෙ අමුතුම විදියෙ කාර්යශූරත්වයක් තියෙන කොට්ඨාශයක්.. එයාලගෙන් බොහොම දෙනෙකුට ජීවිතේ ගොඩක් දේවල් කළමනාකරණය කරන්න පුළුවන්.."

දේවක, මවටත්, ඥාතිවරයාටත් දෙදෙනාටම පොදුවේ මදහසක් පා හඬ අවදි කළේ දෝලනය වන සිතිනි.

"අනුපමා මේ වතාවෙ මට කැමති උනා තමයි.. ඒත්.. අම්මවත්, මාමාවත් එයා ගැන උවමනාවට වඩා බලාපොරොත්තු තියාගන්න එපා.. විස්තර හොයලා බලලා.. මං අදුනගත්ත අනුපමා නම්.. ඇත්තටම වස්තුකාමය අත්හැරපු ගෑනු ළමයෙක්.. එයා කැමති උනොත්.. ආදරය කළොත්.. සෙනෙහස ඇල්ම දැක්වුවොත්.. ඒ අපිට ම්ස.. මේ අපේ වළව්වටවත්, දේපළ ඉඩකඩම් වස්තුවටවත්, පරම්පරාවටවත් නෙමෙයි.."

වැඩිහිටියන් දෙදෙනාම උනුන් දෙස බැලුවේ මවිතයෙනි. දේවකගේ සංයමය සපිරි වදන් ඔවුනට අතිශය ආගන්තුක විය.

"එහෙනම් පුතා ඒ ළමයට කැමති උනේ..?"

රන්මුතුගල මහත්මියගේ මුවින් වවන බවට පත්වී පිටවූයේ ඇගේ සිතට නැගි සැබෑ පැනය නොවේ. ඇයට විමසා දැන ගැනීමට අවශ්‍ය වූ කාරණය තත්වාකාරයෙන් වවන බවට





පරිවර්තනය වූයේ නැත. ඇගේ සිත පළමු වතාවට දෙගිඩියාවට පත්වී තිබිණි.

"එයා ගොඩක් හොඳ ගෑනු ළමයෙක් අම්මා.. අපිට උවමනා වෙන්නෙ අන්න ඒ හොඳ විතරයි.. භෞතික දේවල් අපිට මේ ලෝකෙන් ඕන තරම් උපයන්න පුළුවන්. මනුස්සකම පිරිච්ච මිනිස්සු උපයගන්න එකයි මේ ලෝකෙ කරන්න අමාරු.. මනුස්සකම නැති කෙනෙක් මේ ගෙදරට ආවොත්.. අපිත් විනාශ වෙයි.. මේ ධන සම්පත් සේරමත් විනාශ වෙලා යයි.."

දේවක කියවාගෙන ගියේ පුදුමාකාර කල්පනාකාරී බවකිනි. යළිත් ඔවුන්ගේ හැනීම්බර ලෝකය බිඳ දමමින්, තිදෙනා මැදට පැමිණියේ දේවකගේ බාල සොයුරිය සමනලී ය.

"අනේ සෙනා මාමෙ.. මාව ඔන්චිලි පද්දන්නකෝ.."

කාරුණික වැඩිහිටියා නොදරුවෙකු වන් තරුණිය දෙස බැලුවේ අතිශය අනුකම්පා සහගත ලෙසය.

"දුවා.. අද මට දුවාව ඔන්චිලි පද්දන්න වෙලාවක් නෑ.. අද මට ගොඩක් වැඩ තියෙන දවසක්.. දුවා අද නාලත් නැනේද තාම.. යන්න.. දැන් මැණිකෙ අම්මා උයන වැඩ ඉවර වෙලා ඇති.. හොඳ දුවා වගේ ගිහිල්ලා මැණිකෙ අම්මත් එක්ක නාගන්න.."

සේනාරත්න මහතා කීවේ බෙහෙවින් ම මෘදු ලෙසය. දේවකගේ බාල සොයුරිය සමනලී වැඩිහිටියාගේ අණට කීකරු වී ඇතුළු නිවසට ඇවිද ගියේ අතැතිව උන් බෝනික්කා ද සිප සනසවමිනි. සේනාරත්න මහතා හිඳ උන් අසුනින් නැගී සිටියේ පිටත්ව යන්නට ය.



The Reader's Place Novel

"මම ඔහිස් රූම් එකට යනවා පුතා.. උවමනාවක් උනොත් කතා කරන්න.."

"හොඳයි මාමේ.."

සේනාරත්න මහතා අනුව ම දේවක ද නැඟී සිටියේය. දේවකගේ මව ඔහුට අමතකව ගිය යමක් සිහිපත් කළාය.

"පුතා.. ලොකු මාමටයි නැන්දටයි ආපහු කෝල් එකක් දෙන්න ඉරිදා ගමන ගැන අහලා.."

"හරි අම්මා.. මං කතා කරන්නම්.."

සතුටට යටින් පැමිණෙන කුමක්දෝ පසුතැවිල්ලක් මගින් දේවකගේ ඇතුළාන්තය කළඹවමින් තිබිණි. නමක් නොදන්නා රික්තකයක් විසින් ඒ පසුතැවිල්ල නිර්මාණය කොට තිබිණි. තනිකඩව ගෙවී යන නීරස ජීවිතයට වඩා එළඹෙන අනාගතයේදී තවකෙකු සමග බෙදා හදාගන්නට යෙදෙන්නා වූ ගැටළු සහිත ජීවිතයක් වුවත් යහපත් නොවේදැයි, පළමු වතාවට දේවක තමා සමග ම, තර්ක කරන්නට වූයේය. තමාගේ ලේ ඥාති සබඳතාවය වූවා වුවත්, තම සොයුරාගේත්, සොයුරියගේත් විපරීත දෛවය මත්තේ, තමාගේ සමස්ත ලෝකය දිය කර හරින්නට නොහැකි ලෝබකමක් ජීවිතයේ පළමු ම වතාවට දේවකගේ සිත තුළ ලියලා වැඩෙමින් තිබිණි. එම සිතිවිල්ල, තමන්ගේ ලෝකයක් ගොඩ නගා ගැනීමේ ආත්මාර්ථකාමී සිතක් නොවූවත්, අනුපමා කෙරෙහි බැඳුනු සිතෙහි උපන් ලෝභී හැඟීමේ ප්‍රතිඵලය විය.

අනුපමා කෙරෙහි ම යොමු වූ සිතින් දුරකතනය සවනෙහි





හොවා ගෙන ඉන්නා අතර වාරයේ දුරකතනයේ එනා ඉමෙන් ඇමතුම හා සම්බන්ධ විය. හෙලෝ යන වචනය ඇසෙන පමාවට අමතන්නා හඳුනාගත් ට්‍රිලිෂියා සිරිවර්ධන තම ඥාති පුතු ඇමතුවේ පස්වනක් ප්‍රීතියෙනි.

"ලොකු පුතා.. මං මේ හිත හිතා හිටියෙ ලොකු පුතා දවස් දෙක තුනක්ම කතා නොකෙරුව හින්දා අදත් කතා නොකෙරුවොත් පුතාට කතා කරලා බලන්න ඕන කියලා.. ඇයි පුතේ කතා නොකෙරුවෙ.. අසනීපයක්වත්ද..?"

දේවකගේ සිත තුළ තම නැන්දණිය කෙරෙහි උපන්නේ විසල් අනුකම්පාවකි. ධන, බල, කිත්, යසස් ආදී සියලු සම්පත්තීන්ගෙන් ආඪ්‍ය වුවත්, ඔවුහු දාරක සම්පත්තියට උරුම නොලද්දෝ ය. එබැවින් ඔවුන්ගේ නොබෙදුණු සෙනෙහසට පූර්ණ වශයෙන් උරුමකම් කීවේ ඔවුන්ගේ ඥාති පුතු දේවක ම ය. තමා කෙරෙහි අප්‍රමාණ ආදරයකින් බැඳී උන් ඥාතින් විෂයයේ ද දේවකගේ සිත තුළ පිළිසිඳී තිබුණේ එවන් ම මාතෘ - පිතෘ සම ප්‍රේමයකි.

"කෝච්චි වැකේෂන් ඉවර උනා විතරනෙ ලොකු නැන්දෙ.. පහුගිය දවස් ටිකේ නොසැහෙන්න වැඩ තිබුණා.. ගෙදර එනකොටත් රෑ එකොළහ දොළහා උනා.."

"අද සිකුරාදා.. ඉරිදා කියන්නෙ.. තව එක දවසනෙ පුතේ.. දැන් පුතා ඒ ගමනට ලෑස්තිද..?"

"මම මේ කෝල් කළේ නැන්දයි මාමයි ගමනට ලෑස්තිද අහන්න.. මට නම් ඉතින් විශේෂයෙන් ලෑස්ති වෙන්න දෙයක් නෑ.. අනික.. අපි මීට කලින් වතාවකුත් ගිය ගමනක්නෙ නැන්දෙ.."



The Reader's Place Novel

"ඒක නම් ඇත්ත තමයි පුතා.. අර ළමයගෙ කැමැත්තක් නොතිබුණ එකනෙ ප්‍රශ්නෙකට තිබුණෙ.. මට නංගි කිව්වා ඒ ළමයත් දැන් කැමතියිලු කියලා.. ඉතින් මේ ගමන අපිට ආගන්තුක නැති බොහොම සාමාන්‍ය ගමනක් වෙයි නේද පුතේ..?"

නැන්දණියගේ වදන් දේවකගේ සිතට ගෙන ආවේ අස්වැසිල්ලකි.

"එහෙම හිතාගෙන ඉන්න මාත් කැමතියි නැන්දෙ.. බලමුකො.. කවුද දන්නෙ මොනවා වෙයිද කියලා.."

තම ඥාති පුතු ව්‍යංගයෙන් කියූ දෑ වැටහුණු මොහොතේ ට්‍රිලිෂියා සිරිවර්ධනගේ ළය රිදුම් දෙන්නට විය. ඔහුට අවැඩක් වනු දකින්නට ඇයට බිඳක් හෝ හැකි වූයේ නැත.

"එහෙම කියන්නෙපා ලොකු පුතේ.. අපි සේරම හොයලා බැලුවනෙ.. ඒ දරුවා නරක දරුවෙක් නෙමෙයිනෙ.. දෙවියන්ගෙ පිහිටෙන් මේ පාර අපේ පුතාට නරකක් වෙන දෙයක් සිද්ධ වෙන්නෙ නෑ.."

තම නැන්දණිය කෙරෙහි දේවකගේ සිත තුළ පිළිසිඳුණේ පුදුමාකාර කරුණාවකි.

"ලොකු මාමයි නැන්දයි මට මොන තරම් ආදරෙයිද කියලා මම දන්නවා නැන්දෙ..?"

දේවකගේ පිළිතුරු ස්වරය ඇගේ දෑසට කඳුළු නැංවීමට තරම් ළයාදරණීය විය.

"අපිට කියලා ආදරේ කරන්න වෙන දරුවො ඉන්නවයැ





පුතේ.. අපි හැමෝගෙම ආදරේ ඉතින් පුතාට තමයි.. තවත් කවුරු හරි හිටියොත් ඉතින්.. ඒ ඉතින්.. පුතාගෙම දරුවෙක් තමයි.."

නැන්දණිය එය දේවකට පැවසුවේ කඳුළු සලමිනි. ඒ වදන් පෙළෙහි ගැබ්වී තිබුණු වගකීම් සමුදාය දේවකගේ හදවතට බෙහෙවින් ම බර විය.

"ඔන්න ඉතින් අදත් මගේ නැන්දා අඬන්න පටන් ගත්තා.. ලොකු නැන්දයි මාමයි මට ආදරේ කොව්වරද.. ඒ තරමටම මමත් මාමටයි නැන්දටයි ආදරෙයි.. ඒ හින්දා අඬන්න අවසර නෑ.. කෝ නැන්දෙ ලොකු මාමා..? ගෙදර නැද්ද..?"

දේවකගේ ඇමතුම තම සැමියාට ලබා දිය යුතු බව ට්‍රිලිෂියාට සිහිවූයේ ද දේවක ඒ පිළිබඳව විමසූ පසුවය. ඈ පිටත්ලෙන් කඳුළු පිසදා ගෙන අවට බැලුවාය.

"මට කෝල් එක මාමාට දෙන්නත් මතක නැතුව ගියා පුතේ.. මාමා අද ප්‍රජා සංවර්ධන සමිතියෙ රැස්වීමට යන්න ලැස්ති වෙනවා.. ඉන්න මං කතා කරන්නම් පුතේ.."

දේවක, නැන්දණිය වෙත අතුරු ප්‍රශ්නයක් යොමු කළේ සැහැල්ලුවෙන් හිනැහෙමිනි.

"ලොකු මාමත් පුළුවන් තරම් සමාජ සේවයට ම කැපවෙලා ඉන්නෙ.. ඉස්සරහට ජන්දෙවත් ඉල්ලන්න හිතාගෙනද දන්නෑ නේද ලොකු නැන්දෙ..? පිරිමි දරුවො තුන්දෙනයි.. ගෑනු දරුවො දෙන්නයි.. දරුවො පස් දෙනෙක් හදලත් සීයා තාත්තට එයාගෙ දේශපාලන ගමන් මග ඉදිරියට ගෙනියන්න අනුප්‍රාප්තිකයෙක්



The Reader's Place Novel

හදාගන්න බැරි උනානෙ.. ලොකු මාමාවත් ඒ පාරෙ යයිද මන්දා.."

ට්‍රිලිෂියා, දුරකතන සංවාදය අතරතුර පළමු වතාවට මදක් හඬින්, සැහැල්ලු ලෙස හිනැහුණාය.

"ඒක නම් කීයටවත් වෙන එකක් නෑ පුතේ.. පුතා දන්නවනෙ ඉතින් ලොකු මාමාගෙ දර්ශනේ.. සමාජයට සේවය කරන්න දේශපාලන බලය අවශ්‍ය නෑ, සිවිල් පුරවැසියෙකුට තියෙන්න ඕන මානුෂීය ගුණාංගයි, නොසැලෙන පෞරුෂයයි තිබුණාම නොදටම ඇති කියලයි මාමා කියන්නෙ.."

"ඒවා ඇත්ත උනත්.. මේ කාලෙ නම් සමාජය ඉදිරියේ හොඳ දේවල් කරන්න නම්.. ගහ ඉහළට පීනන ආත්ම ධෛර්යය අනිත් හැමදේටම වැඩිය තියෙන්න ඕන ලොකු නැන්දෙ.. නැත්නම් අනිත් දේශපාලඥයො ඇවිත් එක්කොම අපේ බෙල්ල කපයි නැත්නම් මුල් උදුරයි.."

"ඒක නම් සහතික ඇත්ත පුතේ.."

ප්‍රායෝගික සත්‍යය පිළිබඳව පමණටත් වඩා අත්දැකීමෙන් දැන උන් ට්‍රිලිෂියා, කෙටි පිළිතුරකින් ප්‍රතිචාර දැක්වීම අවසන් කළාය.

"ඔහොම ඉන්න පුතේ.. මම මාමාට කතා කරන්නම්.."

රිසීවරය මදක් සවනින් මෑත් කර ට්‍රිලිෂියා, මදක් උස් හඬින් නිවස තුළ උන් තම සැමියාට ආමන්ත්‍රණය කළාය.

"එඩී.. ඔයා ලෑස්ති වෙලා ඉවරද..? මෙන්න ලොකු පුතා කතා කරනවා.."





"ඔව්.. ඔව්.. මේ ඉවරයි.. ඔයා කතා කරන්න තිබුණ සේරම කතා කරලා ඉවර නම් විතරක් මට ටෙලිෆෝන් එක දෙන්න.. නැත්නම් මම කතා කරන අතර මගින් මගට අරක මේක මතක් කර කර මගෙන් ටෙලිෆෝන් එක ඉල්ලන්න එපා.."

එඩ්වඩ් සිරිවර්ධන දුරකතනය වෙත පැමිණියේ, ආදරය සහවා සරදම මුසු කළ වචන ගොන්නක් තම බිරිඳ වෙතට මුදා හරිමිනි. ට්‍රිලිෂියා තම සිතට දැනුණු ලැජ්ජාශීලී හැඟීම සහවාගෙන සැමියාට නොදෙවෙනි ලෙස පිළිතුරක් අමුණා ගත්තා ය.

"අනේ මං ඉල්ලන්නෑ.. එන්න.. එන්න.."

දුරකතනයේ එහා ඉම උන් මාමණ්ඩියගේත්, නැන්දණියගේත් සංවාදය ඇසී දේවකට සිනා පහළ වූයේ ඉබේටමය. දාරක ස්නේහය.. එය කෙතරම් ප්‍රබල බන්ධනයක්දැයි ඔහු හඳුනා ගත්තේ ඊට බොහෝ කලකට ඉහතදී ය. දේවක හිනැහෙනු ඇසී එඩ්වඩ් සිරිවර්ධනත් ඒ සිනාව සමග එක්වූයේ තම බිරිඳට සරදමට තවත් මොන මොනවාදෝ කියමිනි.

"මොකද ලොකු මාමෙ.. ඉතින් දෙන්නා එක්ක මාව බෙදාගන්න හදනවා.."

දේවකගේ සැහැල්ලු වදන් යට අප්‍රමාණ සෙනෙහස් බැඳීමක් සැඟවී තිබිණි. සදාකාලිකව හදවත තුළ සහවා ගත් වේදනාවක් ඒ මොහොතේ ද, සහවාගෙන එඩ්වඩ් සිරිවර්ධන ද තම ඥාති පුතුගේ සිනහවට සම්මාදම් වූයේය.

"උඹව බෙදනවා නම් පුතේ තව පවුල් තුනකට උඹව බෙදන්න එපායැ.. අම්මගෙ අයියා වෙච්ච මටත් දරුවෙකුගෙ



The Reader's Place Novel

මුණ බලන පිනක් නැතුව ගියා.. උඹේම ලොකු තාත්තටයි බාප්පටයි දෙන්නටත් දරුවෙකුගෙ උරුමයක් නැතුව ගියා.. පරම්පරාවෙම සේසත ඉතින් උඹ තමයි කොල්ලො.. මේ තියෙන හැමදේකම උරුමක්කාරයා උඹයි.. ඊට පස්සෙ කවදහරි උඹේම දරු පැටියයි තමයි.. උඹේම දරු පැටියෙකුගෙ මුණ බලන එක තමයි ආයෙ අපිට දකින්න තියෙන එකම හීනෙ ලොකු පුතේ.."

දුරකතන සංවාදයේ දිගානතිය නොසිතූ ඉසව්වකට හැරී තිබිණි. තම මාමණ්ඩියගේ සංවේදී වදන් දරාගත නොහැකිව දේවකගේ දෑසේ ද කඳුළු පිරී තිබිණි.

"ගොඩක් දේවල් හිතන්නෙපා ලොකු මාමෙ.. ජීවිතේ යථාර්ථය තේරුම් ගන්න එක ලෙහෙසිත් නෑ.. පහසුත් නෑ.. මම මේ අහන්න ගත්තෙ.. ඉරිදා ගමනට ලොකු මාමා ලෑස්තිද කියලා.."

එඩ්වඩ් සිරිවර්ධනට දිගු සුසුමක් හෙලුණේ, හදවතට හදිසියේ ගොඩ වැදුණු අනපේක්ෂිත බියක් හේතුවෙනි.

"හෙට හැන්දෑවට අපි එනවා පුතේ.. එතකොට අපිට ගමනට පහසුයි.. තව කවුද පුතේ ගමනට සහභාගී වෙන්නෙ..?"

අම්මා ඇරුණාම බාප්පයි පුංචි අම්මයි විතරයි ලොකු මාමෙ.. ගොඩක් පිරිස මොකටද..? අපි අවශ්‍ය කාරණාව ඉෂ්ට කරගෙන එමු ගිහිල්ලා.. නේද..?"

එඩ්වඩ් සිරිවර්ධනගේ මුවින් යළිත් ගිලිහුණේ දීර්ඝ සුසුමකි.

"මේ වතාවෙවත් අපේ අරමුණ ඉෂ්ට කරගන්න ලැබුණොත් ලොකු දෙයක් පුතේ.."





"අනුපමා මට කැමතියි ලොකු මාමේ.."

එඩ්වඩ් සිරිවර්ධන තම ඥාති පුතු ඉදිරියේ වචන තෝරා බේරා ගෙන පරිහරණය කිරීමට ප්‍රවේසම් විය.

"මීට කලින් ගැනු ළමයිනුත් පුතාට අකමැති උනේ නැනෙ පුතේ.."

දේවකට තම මාමණ්ඩිය ඉදිරියේ ගොනු කර ගැනීමට උචිත පිළිතුරක් පවා තිබුණේ නැත.

"ඒක නම් එහෙම තමයි ලොකු මාමෙ.."

"ප්‍රශ්නයක් ඇති නොවෙන තැනට වග බලා ගන්න නම්.. මේ වතාවෙ අපි අලුත් සැලසුමක් හදාගන්න ඕන ලොකු පුතේ.."

"සැලසුම් මොකුත් නෑ ලොකු මාමෙ.. මම අනුපමාට අපේ ගෙදර පරිසරය ගැන කියන්න ගියේ නෑ.. හැමදාම වැරදුණ තැන එතනනේ.. මේ පාර ඒ වරද නිවැරදි කරගත්තම හරිනෙ ලොකු මාමෙ..."

දේවකගේ මුවින් පිටවූ හැඟීම් පූර්ණ ආර්මාර්ථකාමී භාවයෙන් පිරී පැවතියත්, දේවක කෙරෙහි සෙනෙහස පිරුණු එඩ්වඩ් සිරිවර්ධනගේ හදවතට, පුතුගේ අර්ධය මිස, අනෙක් අන්තය පිළිබඳව දිගු දුර හිතන්නට ඉඩ කඩ ඉතිරිව නොතිබිණි. එහෙත්, ඔහුගේ සිත දෙගිඩියාවෙන් දෝලනය වෙමින් පැවතිණි.

"එක අතකින් ඒ ගැනු දරුවට ඇත්ත තත්වය නොකියා අපි ඒ දරුවට කරන්නෙ වරදක්ද මන්දා ලොකු පුතේ.."



The Reader's Place Novel

දේවක, දීර්ඝ සුසුමක් ඉහළට ඇද ගත්තේය. එම සුසු
ආපසු හෙළන්නට ඔහුට සුසුම ඉහළට ගැනීමට ගතවූ කාල
වඩා බෙහෙවින් වැඩි කාලයක් ගත වූයේ ය.

"ලොකු මාමෙ.. මීට කලින් හතර වතාවක්.. මට අහුවු
මග ඇරුණා.. මගෙ හිත එයාට කොච්චර කැමැත්තෙන් හිටි
කියලා මං හරියටම දන්නෙ දැන්.. මට ආයෙමත් අනුපමා
ගැහුණා.. ඒ විතරක් නෙමෙයි.. කිසිම දෙගිඩියාවක් නැතු
එයා මගෙ යෝජනාවට කැමති උනා.. මට එයාව මේ වතාව
මග ඇරගන්න බෑ ලොකු මාමෙ.. මගේ ජීවිතේටම.. මේ
ගෑනු ළමයෙක් ගැන බලාපොරොත්තු තියාගන්න අන්තිම වා
මේක තමයි ලොකු මාමේ.."



# 03

එළිය ඉරිදා දිනයේ අරුණ නැගුණේ වෙනදාට වඩා කලිනුයි අනුපමාට සිතිණි. විවාහ යෝජනාව ස්ථිර කර ගැනීමට පැමිණෙන දේවක ඇතුළු පිරිස පිළිගන්නට, අනුපමාටත් වඩා පුදුමාකාර උද්යෝගයකින් ඇගේ දෙමාපියෝ සූදානම් වූහ.

"මාව දාලා සත් සමුදුරින් එතෙර පියාඹන්න මගෙ අම්මටයි අප්පච්චිටයි තියෙන උනන්දුවක්..???"

මාපියන් දෙදෙනා පමණටත් වඩා වෙහෙස වනු දුටු අනුපමා විහිළු කරන්නට වූවාය. ඇගේ මව සුභාෂිණීගේ දෑසේ ඇඳුණේ තරවටුව මුසු ප්‍රශ්නාර්ථයකි.

"දැන් වුටි දුව හිතාගෙන ඉන්නෙ එහෙමද..? අපිට පිටරට යන්න හදිස්සි හින්දා වුටි දුවව බන්දලා දෙන්න හදනවා කියලද පුතේ ඔයා හිතන්නෙ..?"

The Reader's Place Novel

මවගේ දෑසේ ඇදී තිබුණු විසල් ප්‍රශ්නාර්ථය දුටු අනුප
තමා කළ විහිළුව පිළිබඳව දැනුණේ පසුතැවිල්ලකි.

"අනේ අම්මා.. මං විහිළුවක් කළේ.. මොනවා උනත්..
දේවකව මැරි කළත්.. අම්මයි අප්පච්චියි මාව දාලා
දුර යනවා කියලා දැනෙනකොට.. මගෙ හිතට දුකයි.. ඒකා

වචන පෙළ අවසානයේ අනුපමාගේ දෑසට කඳුළු
තිබිණි. දියණියගේ වදන් සුහාෂිණීගේ හදවත ද පෙර කි
නොවූ විරූ ලෙස තිගැස්සුවේය. ඇය, කරමින් හිඳ කා
අතරමග නවතා, මුළුතැන්ගෙයි තබා තිබූ හාන්සි පුටුව
උන් තම දියණිය අබිමුවට විත් සිට ගත්තාය.

"වුටි දුව.. එහෙම දෙයක් ඔයාට දැනෙයි කියල
මොහොත වෙනකල් මට දැනුණෙ නෑ පුතේ.."

අනුපමා තමා ඉදිරියේ හිඳ උන් මව දෙස හිස
බැලුවේ, පෙර කඳුළු පිරුණු දෑසින් ම ය.

"අයියයි අක්කයි වගේ නෙමෙයි.. මම කවදාවත්ම අම්
අප්පච්චියි ළඟ නැතුව ඉඳල නෑ.. මට මගේ ජීවිතේ ගැ
හදාගන්න කියලා ළඟම ඥාතියොවත් හොඳම යාළුවොව
නෑ.. දේවකගෙ පවුලෙ අයට හුරුවෙන්නත් මට ටික කාල
යයි.. අම්මයි අප්පච්චයි ළඟ නෑ කියලා කියන්නෙ.. නන්නාදුන්
මිනිස්සු ගොඩක් මැද්දෙ.. ටික කාලෙකට හරි මං තනිවෙන
කියන එක නේද අම්මා..?"

හුදෙකලා වීමට සිදුවීමේ වේදනාව සිත තුළ සහවාගෙ
නිදුක් සිතින් තම මාපියන්ට දුරු රට යන්නට ඉඩ සලසා දී



ඈ ඒ මොහොත දක්වාම හිත හදාගෙන උන්නත්, නොසිතූ ම
මොහොතක ඇගේ සිත බිඳී ගොස් තිබිණි. සුහාෂිණීගේ දෑසින්
ද කඳුළු උතුරා ගලා යන්නට විය.

"අප්පච්චියි මමයි පුළුවන් ඉක්මනට ආපසු එනවා වුටි
දුව.. අක්කා හැම තිස්සෙම අපිට චෝදනා කරනවනෙ අපි
හැමදාම එයාට සැලකුවෙ අඩුවෙන් කියලා.. ඒකයි වැඩියෙන්ම
අපි මේ ගමන ගිහිල්ලා එන්න තීරණය කළේ.. අප්පච්චව
මෙහෙ තියලා මම විතරක් ගිහිල්ලා එන්න හැදුවම වුටි දුව
ඔයාමනෙ පුතේ එකහෙළාම කියලා හිටියෙ අපි දෙන්නටම
යන්න කියලා.."

සුහාෂිණී තම දියණිය දෙස බැලුවේ අප්‍රමාණ වූ
වේදනාවකිනි.

"අනේ අම්මා.. ටික කාලෙකට මං තනි උනාට නම් කමක්
නෑ.. ටික කාලෙකටවත් අම්මයි අප්පච්චියි වෙන්වෙලා ඉන්නවා
දකින්න මම කැමති නෑ.. අම්මයි අප්පච්චියි තරම් එකිනෙකාට
සහයෝගයෙන් දුක සැප බෙදාගෙන ජීවත් උන හස්බන්ඩ්
කෙනෙකුයි වයිෆ් කෙනෙකුයි මං ජීවිතේටම දැකලා නෑ..
මරණයෙන් කෙළවර වෙන මේ ජීවිතේ.. ඒ අවසන් ගමනෙදි
එකිනෙකාට මොන විදියට වෙන්වෙන්න සිද්ධ වෙයිද දන්නෑ..
ඒත්.. ඒ වෙනකල් මගේ අම්මයි අප්පච්චියි එක මොහොතකටවත්
ඈත් වෙනවා දකින්න මම කැමති නෑ අම්මා.."

මුළුතැන්ගෙයට පිවිසෙන ඇතුළු දොරටුව දෙසින් දීර්ඝ
සුසුම් හඬක් සවන් වැටෙන තුරුම මවගේත් දියණියගේත් සියලු
සංවේදනාවන් නිහඬව දරාගෙන, වර්ණවීර මහතා ද දෙදෙනා



The Reader's Place Novel

අසලම වූ වග, දෙදෙනාම නොදැන සිටියහ. මවත්, දියණියත් දෙදෙනාම වර්ණවීර මහතා දෙස බැලුවේ අප්‍රමාණ වේදනාවකිනි.

"අප්පච්චි.."

තම දියණියගේ හිස ද අතගා ගෙන, බිරිඳත්, දියණියත් අසලට පැමිණි වර්ණවීර මහතා, අනුපමා හිඳ උන් අසුනා යාබදව තබා තිබූ උස් පුටුවේ අසුන් ගත්තේ ය. මොහොතකට හාත්පස පැතිර ගියේ නිහඬතාවයකි.

"චූටි දුව.. ඔයාව දේවකට බාරදීලා ටික කාලෙකට හරි අපි යන්නෙ සතුටින් නෙමේ පුතේ.. අක්කට උදව් කරන්න ඕනමයි කියන තත්වෙට එයා අපිව පත් කරපු හින්දයි.. අක්කා හදන්නෙ අපේ ආදරේ උරගාලා බලන්න... එයා අපිව දාලා තියෙන්නෙ එයා වෙනුවෙන් කිසිම යුතුකමක් ඉෂ්ට නොකළ දෙමව්පියෝ ගානට.."

අනුපමා, අලුත් වන්නට දහලන තම දැසේ කදුළු ආයාසයෙන් දරා ගත්තාය. ඈ, පියාගේ දෝත මත දැත තැබුවේ අප්‍රමාණ කරුණාවකිනි.

"ඒ සිතිවිල්ල අක්කට වෙච්ච වැරැද්දක් අප්පච්චි.. උසස් අධ්‍යාපනයට කියලා ස්කූල් අවුට් වෙනකොටම අක්කව පිටරට කැම්පස් එකකට යවලා අම්මයි අප්පච්චියි විඳපු දුක දැක්කෙ මගෙ ඇස් දෙකයි, හිතයි විතරයි.. අම්මයි අප්පච්චියි ගිහිල්ලා ටිකක් විතරවත් අක්කගෙ ජීවිතෙත් පිළිවෙලක් කරලා එන්න උත්සාහ ගන්න.. අම්මයි අප්පච්චියි ගැන එයාගෙ හිතේ ගොඩගැහිලා තියෙන වැරදි අදහස් ටිකවත් පිරිපහදු කරල





එන්න මේක අවස්ථාව කරගන්න අප්පච්චි.. අම්මයි අප්පච්චියි ළඟ නැති අඩුව මට නම් තව කාගෙන්වත් කවදාවත් පුරවාගන්න බැරිවෙයි.. ඒ උනත්.. අලුත් ජීවිතේට ඉක්මනට පුරුදු වෙන්න, හැඩ ගැහෙන්න මමත් මහන්සි වෙන්නම් අම්මා.."

කම්මුල් මතට ගිලිහුණු කඳුළු දෙපේළිය පිටත්ලෙන් පිසදා ගනිමින් අවසානයේදී අනුපමා කීවේ පොරොන්දුවක ස්වරූපයෙනි.

"හරි.. අපි ඉතුරු වැඩ ටික කරමු අම්මා.. නැත්නම් දන්නෙම නැතුව වෙලා යයි.. කියන්න.. මට මොනවද මෙතන කරන්න තියෙන්නෙ..?"

අනුපමා විමසන්නට වුයේ මවාගත් උද්‍යෝගයෙකිනි. සුහාෂිණී දෙපසට හිස සැලුවේ පුදුමාකාර වේදනාබර සංවේදනාවත් ගොන්නක්ම හද තුළ තෙරපවාගෙන ය.

"චූටි දුව.. ඔයා මොකුත්ම කරන්න එපා.. මේ හැමදේම මට මගේ අතින්ම කරන්න ඕන.. අයියා සුදු ගෑනියෙක් කසාද බැඳගත්තා.. අක්කා සුද්දෙක් වගේ මිනිහෙක්ව කසාද බැඳගත්තා.. ඇස් දෙක වගේ පරිස්සම් කරලා හදපු දරුවො එයාලගෙ ජීවිතේ වැදගත්ම තීරණ අරගෙන තිබුණෙ අම්මටයි අප්පච්චිටයි ආරංචියක්වත් නොදී.. දරුවො දෙන්නෙක් ම කසාද බඳිනවා ඇහැට දකින්නවත් වාසනාවක් දෙමව්පියො විදියට අපිට තිබුණෙ නෑ.."

සුහාෂිණීගේ දැසින් යළිත් කඳුළු වැගිරෙන්නට වූයේ, අනුපමා සේ ම වර්ණවීර මහතා ද සසල කරවමිනි.



The Reader's Place Novel

"අම්මා.. අනේ අම්මා.. අඬන්න එපා.. ඒ හැමදේම අතීතයේ අයිති දේවල්.. ඒවා මතක් කර කර දැන් අඬන්න එපා අම්මා.."

"නෑ පුතේ.. අයියටයි අක්කටයි වඩා ඔයාගෙ දෙව්වෝ හාත්පසින්ම වෙනස්.. ඔයාගෙ ඉරණම්කාරයා හොයලා දෙන්නෙ අපි.. අවුරුදු විසි අටක් තුරුලෙම තියාගෙන හදපු ඔයාව දැවි දේවකට සදහටම අයිති කරලා දෙන්නයි හදන්නෙ.. කසාද බැන්දට පස්සෙ ගෑනු දරුවෙක් එයාගෙ දෙමව්පියන්ට අයිති නෑ.. අපි මේ ලෑස්ති වෙන්නෙ අපිට අයිති වස්තුවක් පිටු කෙනෙකුට සදහටම පවරලා දෙන්න.. ඒකට ලෑස්ති වෙන මේ මොහොතෙ.. ඔයා වෙනුවෙන් කරන්න තියෙන හැමදේම.. මගේ අතින්.. අපේ අතින් කෙරෙන්න ඕන චූටි දුව.. ඒ හින්දා ඔයා පැත්තකට වෙලා ඉන්න.. මේ හැම දෙයක් ම අම්මගෙ අතින් කෙරෙන්න ඕන.."

අනුපමාගේ දෑසට ද යළි කඳුළු උනා එන්නට ඇයිල්ලූ හෝ කාලයක් ගත නොවිණි.

"අම්මා.. ඇයි මේ.. මේ තරමටම මේ දේවල් ගැන දුර හිතන්නෙ..?"

සුභාෂිණී, මෘදු ලෙස තම බාල දියණියගේ හිස අත ගැඹි අප්‍රමාණ ආදරයකිනි. වර්ණවීර මහතා ද මුනිවත බිඳ දැමුවේය.

"අපි ඔයාව දාලා යනවා කියලා හිතන්නෙපා පුතේ.. අපි දෙන්නා පුළුවන් තරම් ඉක්මනට ආපහු එන්න බලනවා චූටි දුව.. දුක හිතන්නෙ නැතුව චූටි දුව ඒ ටික කාලෙ දේවක එක්ක සන්තෝසෙන් ඉන්න ඕන.. ඔයාගෙ දරු පැටියව බලාගන්න අම්මයි අප්පච්චියි ආපහු ලංකාවට එනවා.."





අනුපමා, තම පියාගේ සුරත් බානුවට හිස බර කළාය. දෙවනුව, ඈ දැතින්ම මවගේත්, පියාගේත් දෙදෙනාගේම සුරත් අල්වා ගත්තාය.

"මම කවදාවත් අම්මටයි අප්පච්චිටයි බොරු පොරොන්දු දීල නෑ.. පොරොන්දු වෙනවා.. මම දේවක එක්ක සන්තෝසෙන් ඉන්නම්.. අම්මයි අප්පච්චියි සන්තෝසෙන් ඒ ගමන ගිහිල්ලා එන්න.."

ඈ, මාපියන් දෙපළගේම අල්ලාගෙන උන් දැතෙහි පිටත්ල මෘදු ලෙස ස්පර්ෂ කරමින් සඵථ කළාය. ගුණ යහපත් දියණියක හැදූ වැඩූ ප්‍රහර්ෂය මාපියන් දෙදෙනාගේ ම හදවත් තුළ නොඅඩුව පිරී පැවතිණි. අනුපමා සියල්ල අමතක කර දමා සැහැල්ලුවක් මවා ගන්නට වෙර දැරුවාය.

"ඒ කියන්නෙ.. මේ වෙලාවෙ.. අම්මට මේ වැඩවලට මගෙන් කිසිම උදව්වක් එපා..?"

සුභාෂිණී, යළිත් හිස දෙපසට වැනුවේ තිර බැල්මක් දැසේ ඇඳගෙන ය. ඒ දැසෙහි කිසිදා කිසිවෙකුට වචන බවට පෙරළිය නොහැකි මාතෘ සෙනෙහස, දාරක සෙනෙහසට සහසම්බන්ධ වූ කෝටියක් සංවේදනාවන් තැවරී තිබිණි.

"මගෙ චූටි දුව.. මේ දවස් ටිකේ කිරිල්ලියක් වගේ නිදහසේ පුළුවන් තරම් සැහැල්ලුවෙන් ඉන්න.. අම්මා අප්පච්චි ළඟදි ඔයා අත් විඳින ඒ ලස්සන නිදහස, සැහැල්ලුව, නිවහල් බව.. කසාද බඳින මොහොතෙන් මගෙ දුවට අහිමිවෙලා යනවා.. ඊට පස්සෙ පුදුමාකාර වගකීම් ගොන්නක් ඔයාගෙ උර මත



The Reader's Place Novel

පැවරෙනවා.. කැමති උනත්.. අකමැති උනත්.. අනිවාර්යයෙන්ම මගෙ දුවට ඒ යුතුකම් වගකීම් ඉෂ්ට කරන්නම වෙනවා. ඕනෑම විවාහක කාන්තාවකට.. තමන්ගෙ පවුල් ජීවිතේ සාර්ථකව ගත කරන්න නම්.. ඒ යුතුකම්, වගකීම් ගොන්න හදවතට ගන්නම සිද්ධ වෙනවා.. ඒ හින්දා අම්මගෙයි, අප්පච්චිගෙයි තුරුළට වෙලා ඉන්න මේ අන්තිම දවස් කීපයේ.. මගෙ දුව සතුටින්, සැහැල්ලුවෙන්, නිදහසේ ජීවත්වෙන්න.. ඒක තමයි මගෙ ලොකුම සතුට වුනේ.."

තම මවගේ ආදරය උතුරා යන වදන් දරාගෙන හිදිය නොහැකිව, ඉකිබිඳෙන්නට යන මුව, අනුපමා, ගොළු කර ගත්තේ අසීරුවෙනි. නොදැනීම කාලය පැන ගොස් තිබිණි.

"නවත් දුවව අඬවන්නෙපා දුහා.. අපි දැන් ඉතිරි වැඩ ටික කරමුකෝ.. හත හමාරත් වෙලා.. මං හිතන්නෙ නව්‍ය දහය වෙනකොට ඒ ළමයි එයි.."

වර්ණවීර මහතා, තම බිරිඳටත්, දියණියටත් සිහිපත් කළේ, සංවේදනාවන් ඔස්සේ සංවාදයකට යා හැකි දුරට ඉමක් නිමක් නොවන බව දන්නා බැවිනි.

"හරි අම්මා... අම්මගෙ සතුට ඒක නම් මං එන්නෙ නෑ උදව්වට.. ඕනකමක් උනොත් මට කතා කරන්න.. මම එහෙනම් ගාඩ්න් එකට යනවා මල් පැළ ටිකට වතුර දාන්න.."

"අන්න හොඳයි.. චූටි දුව ඒ ටික කරන්න.. උදව්වක් ඕන උනොත් අප්පච්චි මට උදව් කරයි.. මම පෙරේදා සමන්පිච්චි පැළ හයක් ගෙනාවා අර යූත් එකේ තිබුණ එක්සිබිෂන් එකෙන්.



අද දවස මතක් වෙන්නත් එක්ක චූටි දුව ඒ පැළ ටිකත් හිටවන්න ඉස්සරහා අඹ ගහ වටේට.. පස්සෙ හෙමින් සැරේ අප්පච්චි මැස්සක් ගහයි.."

අනුපමා, හිනැහී හිස සලා, හිඳ උන් අසුනින් නැඟී සිටියාය. තමාට මතක ඇති කාලයේ පටන් ඇ නිරන්තර දුටුවේ නිවසේ කුදු මහත් කාර්යයන් තම මවත්, පියාත් සහයෝගීව ඉටු කර ගන්නා අන්දම ය. එය ඔවුනොවුන්ගේ අසිරිමත් සෙනෙහසට උරුම ගුණාංගයක් විය. විවාහයකින් දෙදෙනෙකු බැඳීම යනු එකිනෙකාගේ ජීවිත එකිනෙකා සමග සමානව බෙදා හදා ගැනීමකි. පවුල් ජීවිතයක පූර්ණ සන්තුෂ්ටිය ළඟා කර ගැනීමට නම් එම බෙදා හදා ගැනීම අත්‍යවශ්‍යය. එහෙත්, ලෝකයේ පවත්නා අසාධාරණ සම්මතය එය නොවේ. විවාහයකින් පසු බොහෝ පුරුෂයන් ඔවුන්ගේ බිරින්දෑවරු නොමරා මරති. යුතුකම්, වගකීම් හා සමස්ථය ගැහැණිය මත ම පටවති. එනයින්, විවාහ ජීවිතය මුඛ්‍යාර්ථය අමු අමුවේ ම මරා දමති. ගැහැණිය සදාකාලික වහලියක, දුක් විඳින්නියක බවට ම පත් වන්නී ය. එවන් ලොවක, තමාගේ මවත්, පියාත් යනු සසර මග දිගු දුරක් එකටම බැඳී යන්නට පාරමී පුරන, බෝධිසත්ව ගුණැති ස්ත්‍රී-පුරුෂ සුසංයෝගයක් නොවේදැයි අනුපමා කල්පනා කරන්නට වූවාය.

දේවක හා බැඳුණු පසු, තමා ද එම ගුණ වගාව සහිතව යහපත් බිරිඳක ලෙස, තමාගේ මාපියන්ගේ ගුණය ද රැකගෙන ජීවත්විය යුතු බවට ඇ ඒ මොහොතේ අධිටන් කර ගත්තාය. ඊට පෙර කිසිදා නොදැන උන් තරුණයෙකු උදෙසා වරින් සහතික ලිවීමට තමාට නොහැකි බව දැන උන් අනුපමා,

The Readers Place Novel

පැවරෙනවා.. කැමති උනත්.. අකමැති උනත්.. අනිවාර්යයෙන්ම මගෙ දුවට ඒ යුතුකම් වගකීම් ඉෂ්ට කරන්නම වෙනවා. ඕනම විවාහක කාන්තාවකට.. තමන්ගෙ පවුල් ජීවිතේ සාර්ථකව ගත කරන්න නම්.. ඒ යුතුකම්, වගකීම් ගොන්න හදවතට ගන්නම සිද්ධ වෙනවා.. ඒ හින්දා අම්මගෙයි, අප්පච්චිගෙයි තුරුළට වෙලා ඉන්න මේ අන්තිම දවස් කීපයේ.. මගෙ දුව සතුටින්, සැනැල්ලුවෙන්, නිදහසේ ජීවත්වෙන්න.. ඒක තමයි මගෙ ලොකුම සතුට පුතේ.."

තම මවගේ ආදරය උතුරා යන වදන් දරාගෙන හිඳිය නොහැකිව, ඉකිබිඳෙන්නට යන මුව, අනුපමා ගොළු කර ගත්තේ අසීරුවෙනි. නොදැනීම කාලය පැන ගොස් තිබිණි.

"තවත් දුවව අඬවන්නෙපා සුභා.. අපි දැන් ඉතිරි වැඩ ටික කරමුකෝ.. හත හමාරත් වෙලා.. මං හිතන්නෙ නවය දහය වෙනකොට ඒ ළමයි එයි.."

වර්ණවීර මහතා, තම බිරිඳටත්, දියණියටත් සිහිපත් කළේ, සංවේදනාවන් ඔස්සේ සංවාදයකට යා හැකි දුරට ඉමක් නිමක් නොවන බව දන්නා බැවිනි.

"හරි අම්මා... අම්මගෙ සතුට ඒක නම් මං එන්නෙ නෑ උදව්වට.. ඕනකමක් උනොත් මට කතා කරන්න.. මම එහෙනම් ගාඩින් එකට යනවා මල් පැළ ටිකට වතුර දාන්න.."

"අන්න හොඳයි.. වුටි දුව ඒ ටික කරන්න.. උදව්වක් ඕන උනොත් අප්පච්චි මට උදව් කරයි.. මම පෙරේදා සමන්පිව්ව පැළ හයක් ගෙනාවා අර යුත් එකේ තිබුණ එක්සිබිෂන් එකෙන්..





අද දවස මතක් වෙන්නත් එක්ක වුටි දුව ඒ පැළ ටිකත් හිටවන්න ඉස්සරහා අඹ ගහ වටේට.. පස්සෙ හෙමින් සැරේ අප්පච්චි මැස්සක් ගහයි.."

අනුපමා, හිනැහී හිස සලා, හිඳ උන් අසුනින් නැඟී සිටියාය. තමාට මතක ඇති කාලයේ පටන් ඇ නිරන්තර දුටුවේ නිවසේ කුදු මහත් කාර්යයන් තම මවත්, පියාත් සහයෝගීව ඉටු කර ගන්නා අන්දම ය. එය ඔවුනොවුන්ගේ අසිරිමත් සෙනෙහසට උරුම ගුණාංගයක් විය. විවාහයකින් දෙදෙනෙකු බැඳීම යනු එකිනෙකාගේ ජීවිත එකිනෙකා සමග සමානව බෙදා හදා ගැනීමකි. පවුල් ජීවිතයක පූර්ණ සන්තුෂ්ටිය ළඟා කර ගැනීමට නම් එම බෙදා හදා ගැනීම අත්‍යවශ්‍යය. එහෙත්, ලෝකයේ පවත්නා අසාධාරණ සම්මතය එය නොවේ. විවාහයකින් පසු බොහෝ පුරුෂයන් ඔවුන්ගේ බිරින්දෑවරු නොමරා මරති. යුතුකම්, වගකීම් හා සමස්ථය ගැහැණිය මත ම පටවති. එනයින්, විවාහ ජීවිතය මුඛ්‍යාර්ථය අමු අමුවේ ම මරා දමති. ගැහැණිය සදාකාලික වහලියක, දුක් විඳින්නියක බවට ම පත් වන්නී ය. එවන් ලොවක, තමාගේ මවත්, පියාත් යනු සසර මග දිගු දුරක් එකටම බැඳී යන්නට පාරමී පුරන, බෝධිසත්ව ගුණැති ස්ත්‍රී-පුරුෂ සුසංයෝගයක් නොවේදැයි අනුපමා කල්පනා කරන්නට වූවාය.

දේවක හා බැඳුණු පසු, තමා ද එම ගුණ වගාව සහිත යහපත් බිරිඳක ලෙස, තමාගේ මාපියන්ගේ ගුණය ද රැකගෙ ජීවත්විය යුතු බවට ඇ ඒ මොහොතේ අදිටන් කර ගත්තා ඊට පෙර කිසිදා නොදැන උන් තරුණයෙකු උදෙසා වැ සහතික ලිවීමට තමාට නොහැකි බව දැන උන් අනුප

The Reader's Place Novel

දෙවක ද යහපත් තරුණයෙකුම වේවා යැයි ඉත සිතින් ප්‍රාර්ථනා කළාය. ගෙවී ගිය අතීත ජීවිතය තුළ කිසිදා ප්‍රාර්ථනා කොට කිසිවක් බදා වැළඳගෙන පුරුද්දක් නොතිබුණු ඈ, ඒ කළේ ජීවිත කාලය තුළදී කළ බරපතල ම ප්‍රාර්ථනාව ය. එක අතකින්, කිසිදා දැන නොසිටි තරුණයකු හා සර්ව කාලීනව බැඳෙන්නට යන මොහොතක, එවන් ප්‍රාර්ථනාවකින් හෝ හිත සනසා ගනු විනා, යුවතියක් වෙන කුමක් නම් කරන්නද..?

මල් වගාව දියෙන් නහවමින් උන් අනුපමාට කාලය ගතව යනු දැනුණේ නැත. කල්පනා ලොව සැරිසරමින්, මල් වගාව තුළ සරමින් උන් ඈ පියවි ලොවට පැමිණියේ පියාගේ හඬිනි.

"වූටි දුව.. අට හමාරයි වෙලාව.. දැන් එන්න.. කාලා ලෑස්තිවෙලා ඉම්මු නේද පුතේ...?"

පියාගේ හඬ පවා වෙනදාට වඩා බෙහෙවින්ම මෘදුව ඇතැයි අනුපමාට සිතිණි. තමාගේ ආදරණීය දියණියගේ ජීවිතය තුළ සිදුවන්නට යන සුවිසල් පරිවර්තනය ඉදිරියේ, ඇගේ පියාගේ හදවත පවා සසලව තිබිණි.

"හරි අප්පච්චි.. එන්නම් මම.."

අනුපමා, දිය වත් කිරීමට අතැතිව උන් මල් බාල්දිය නිසි ස්ථානයේ රඳවා, පැළ දොරින් නිවසට ගොඩ වූවාය. ඒ වන විට ඇගේ මව මුළුතැන්ගෙයි වැඩ කටයුතු සියල්ල නිම කොට, අතු ගා, අස්පස් කිරීම් ආදිය ද අවසන් කර තිබුණා ය.

"අම්මා.. වැඩ ඉවරද..?"



"ඔව් වූටි දුව.. අපි තුන් දෙනාටම දැන් ලෑස්ති වෙන්න පුළුවන්.."

තම මව, මීට ටික වේලාවකට ප්‍රථම තමාට සැහැල්ලුවෙන් හිඳින ලෙසට කළ ආයාචනය, අනුපමාගේ සිත තුළ සැණෙන් අරක් ගත්තේය. කවර අවස්ථාවකට වුවද සිනාවෙන් යුතුව, සරලව මුහුණ දෙන්නට ඈ තරයේ සිහි තබා ගත්තා ය.

"අම්මා.. මම වොෂ් එකක් දාගෙන එන්නම් ඉක්මනට.. මොකක්ද මං අඳින්න ඕන අම්මා.. සාරියක්ද අඳින්න ඕන..?'

ඇගේ මව නැතැයි කියන්නට හිස සැලුවා ය.

"වූටි දුව වැඩිපුරම කැමති සාමාන්‍ය ඇඳුමක්.. මම තම් ආසයි අර දේදුන්නෙ පාට හත තියෙන ස්කර්ට් එකටයි ඒකට අඳින කොලර්ස් තියෙන ටී ෂර්ට් එකටයි.."

අනුපමා දෑස් සිහින් කර තම මව දෙස බැලුවේ අතිශය පුදුමයෙනි.

"අම්මා.. ඔය ඇත්තමද..?"

"හ්ම්.."

සුහාෂිණී වර්ණවීර මහත්මියගේ ස්වරයෙහි වූයේ අනුපමා පුදුම හිතෙන තරමේ සැහැල්ලුවකි.

"එහෙම හොඳද..? එයාලා ලොකු වළවිකාරයොලු නෙ අම්මා..?"

අනුපමා යළිත් විමසුවේ, තම මවගේ ප්‍රතිචාරය පිළිබඳ

The Reader's Place Novel

වනවිටත් පහව නොගිය පුදුමයෙනි. සුහාෂිණී තම දියණිය දෙස බැලුවේ නිරණාත්මක දෑසිනි.

"ඔව් චූටි දුව.. මට උවමනා වෙලා තියෙන්නෙ දේවක පුතාගෙ පැත්තෙන් දුවට ලැබෙන ප්‍රතිචාරය බලා ගත්තයි.. එයාලා මොන තරම් ලොකු මිනිස්සු උනත්.. අපේ දරුවට සතුටින් ජීවත්වෙන්න පරිසරයක් ඒ වළව්ව ඇතුළෙ නැත්තම්.. අපි අපේ දුවව ඒ ගෙදරට බන්දලා දෙන්නෙ නෑ. මහා ලොකු දේවල් ජීවිතේ වටේ පටලාගෙන ඔයාට සතුටින් ඉන්න බෑ කියලා අප්පච්චියි මමයි දන්නවා චූටි දුව.. එයාලා ඔයාගෙ සරල බව, වාම් බව දකින්න ඕන.. එයාලා ඔයාගෙ සැබෑ ස්වරූපයට කැමති වෙන්න ඕන පුතේ.. දේවක පුතාලා මීට කලින් වතාවක චාරිත්‍රානුකූලව ඇවිල්ලා ගියානේ.. ඒ හින්දා අපි මේක සාමාන්‍ය එහෙත් විශේෂ අවස්ථාවක් කරගනිමු.."

අනුපමා දෙබැම රැළි කර ගත්තාය.

"ම්.. ඒක අලුත් අවස්ථා වර්ගයක්ද..?"

"එහෙම කියලා චූටි දුව හිතාගන්නකොා.."

"ඒකද මේ සාමාන්‍ය දවසට අම්මා මහුල් ගෙදරකට වගේ ලෑස්ති වුණේ..?"

"ගෙදරකට එන අමුත්තෙකුට පුළුවන් උපරිම විදියට කෑමෙන් බීමෙන් සංග්‍රහ කරන එක සිංහල අපේ උසස්ම සිරිතක්නෙ පුතේ.. ඒගොල්ලො අපේ ඥාතියො උනා උනත් ආයෙ කවදා ඒ විදියට කට්ටිය එකට එකතු කරලා කෑම වේලක් දෙන්න ඉඩක් ලැබෙයිද කියලා කවුද දන්නෙ..? ලැබෙන අවස්ථාවේදි සතුට



බෙදා හදාගත්තම ඉවරයි.. මේ තේ මේසෙයි.. දවල්ට කෑම මේසෙයි.. සේරම කෑම වර්ග ටික හැදුවෙ අම්මගෙ අත් දෙකෙන්.. මගේ චූටි දුව වෙනුවෙන්.. ඒ සන්තෝසෙ හිතට දැනෙන්නෙ ගොඩක් ලොකුවට පුතේ.."

මුළුතැන්ගෙයට විත් යළි එබී බැලූ වර්ණවීර මහතා, එවර නම් මවත්, දියණියත් දෙදෙනා දෙස බැලුවේ තරවටු දෑසිනි.

"ආයෙමත් අම්මගෙයි දුවගෙයි කතාව පටන් අරගෙන.. දැන් අර ළමයි ගෙදරට එනකල් දෙන්නට ලෑස්ති වෙන්න බැරිවෙනවා.."

නැගෙන්නට ආ ලොකු සිනාව වළකා ගනිමින්, එකිනෙකා දෙස හොරැහින් බැලූ මවත්, දියණියත් දෙදෙනා, නොදරුවන් මෙන් එකිනෙකාට ඉහි පා දෙපසට වෙන්ව ගියෝය.

"අම්මලා දුවලා සේරම නිකම් පොඩි ළමයි වගේ.. ඔකට තමයි කියන්නෙ පොඩි උන් නැති ගෙදර නාකි දණගානවා කියලා.."

වර්ණවීර මහතා, තමාගේ සිත තුළ නොනැගුණු, එහෙත් වචනවල දවටා බිරිඳටත්, දියණියටත් එල්ල කළ ව්‍යාජ නෝක්කාඩුවට සමච්චලය ද මුසු කළේය. තිදෙනා අතර සංවාදයකට හෝ කිසිවෙකුටත් පිළිතුරකට ඉඩ ඉතිරි නොකර ආලින්දය දෙසින් දුරකතනය හැඩවෙනු ඇසුණේ ඒ මොහොතෙය.

"ටක් ගාලා ලෑස්ති වෙන්නම් අප්පච්චි.. අන්න ෆෝන් එ රිං වෙනවා.. අප්පච්චි බලනවා නේද..?"

The Reader's Place Novel

වර්ණවීර මහත්මිය කියූ අන්දමට අනුපමා සරල ලෙස සූදානම් වූවාය. ඇඳුමේ වූ දේදුනු වර්ණ සේ ම ඇගේ සිත තුළ වූයේ ද දේදුනු පැහැති සැහැල්ලුවකි. ඇඳී මැකී යන දේදුන්නක් සේ ම තමාගේ සිත පුරා මෙතෙක් අරක් ගෙන තිබූ ද හදිසි විවාහයත් සමග බොදවී යා දැයි ඇගේ සිත තුළ සැහැල්ලුව අවිනිශ්චිත සිතිවිල්ලක් පහළ වූයේ නොදැනුවත්ව ම ය. එහෙත්, අනුපමා එවන් අසුබ සිතිවිලිවල එල්ලී තම සිතට දුර යන්නට නොදී නවතා ගත්තා ය.

කැඩපත ඉදිරියේ හිඳ හිස පීරමින් උන් අනුපමා ආපසු හැරී බැලුවේ පියාගේ හඬිනි.

"චුටි දුව.. කෝල් එක ඔයාට.."

අනුපමා, පියා දෙස බැලුවේ කුහුලින් පිරී ගිය දෑසිනි. ඇයට දුරකතන ඇමතුමක් පැමිණීම යනු විරල ගණයේ සිදුවීමකි. ජංගම දුරකතනයක් පවා භාවිතා කිරීමට උනන්දු නොවූ ඇ, දුරකතනය සමඟ එතරම් සබඳකම් නොපැවැත්වූවාය. පුදුමය නම්, ඈ හිතෙෂීවන්තයන් සමඟ හැඟීම් හුවමාරු කර ගැනීමට වඩාත්ම ප්‍රිය කළේ, සන්නිවේදනයේ සීඝ්‍ර දියුණුවත් සමඟ මුළු ලොවෙන් ම අභාවයට යමින් පවතින ලිපි ලිවීමේ මාධ්‍යය හරහා ය. ලිපියක ලියැවෙන වචන තුළ, මුවින් පිටවන වචනවලට වඩා හෘදයාංගම හා සුසංවේදී බවක් තැවරී ඇති වග, ඈ විශ්වාස කළා ය.

"කවුද අප්පච්චි මට කතා කරන්න ඉන්නෙ..?"

අනුපමාගේ දෑසේ වූ පුදුමයට ම සමාන පුදුමයක් වර්ණවීර මහතාගේ දෑසේ ද ඇඳී තිබිණි.



"දේවක පුතා කතා කරන්නෙ.. චුටි දුව එක්ක කතා කරන්න ඕනලු.."

අනුපමාගේ දෑසේ පැහැදිලිවම ඇඳුණේ ප්‍රශ්නාර්ථයකි. ඒ වනවිට ඇගේ මව ද එතැනට පැමිණ සිටියා ය. තිදෙනාගේ ම දෑස්වල රැඳී තිබුණේ අවිනිශ්චිත බව මුසුවූ විසල් ප්‍රශ්නකාරී බවකි.

"ඇ..යි.. අප්පච්චි.. මේ වෙලාවෙ.. එයාලා එන්නෙ නැල්ලුද..?"

අනුපමා ක්ෂණිකව විමසුවේ ඇගේ හදවතට පළමුව ම නැගුණු ප්‍රශ්නයයි. එම පැනයෙන් ඇගේ පියාගේ දෑසේ වෙනසක් නොවුණ ද, ඇගේ මවගේ දෑස නම් නොමනා ලෙස තිගැස්සිණි.

"නෑ.. නෑ.. එහෙම දෙයක් නම් කිව්වෙ නෑ.. මග ඉන්නෙ කියලත් කිව්වා.. පොඩ්ඩකට චුටි දුවට කතා කරන්න කියලා විතරයි කිව්වෙ.."

වර්ණවීර මහතා එසේ පැවසුවා වුවත්, තිදෙනාගේ ම සිත් තුළ පිළිසිඳුණු ප්‍රශ්නාවලියට නම් එය සැනුණු පිළිතුරක් නොවිණි.

"හරි පුතේ.. ගිහිල්ලා බලන්නකො ඇයි කියලා.."

පියවි සිහියට පැමිණි වර්ණවීර මහත්මිය තම දියණියට පැවසුවාය. අනුපමා දුරකතනය වෙත ඇවිද ගියේ කල්පනාකාරී බැවින් බිමටම බර වූ නෙතිනි. ඈ දුරකතන රිසීවරය සවනට ළංකර ගත්තේ ද විසල් දෙගිඩියාවකිනි.

"හෙලෝ.."



The Reader's Place Novels

"හෙලෝ අනු..පමා.."

දේවකගේ හඬ, පෙර දිනයේ සේ ම සජීවී බවින් තිබෙන බව දැනුණු මොහොතේ ම, ඇගේ සිත තුළ වූ අවිතිරයිවිත දෝමනස්සයන් සියල්ලම පාහේ සැණෙන් දුරු වී ගියේය. එහෙත්, දෙගිඩියාව පහව ගොස් හිස් වූ සිතට පුදුමය ඒ තරමින් ම රිංගා ගත්තේය. එහෙත්, ඈ සහනශීලීත්වය රැඳුණු දෑස මාපියන්ට වෙත යොමු කිරීමට අමතක නොකළේ, මොහොතකට පෙර ඔවුන්ගේ සිත් තුළට අස්ථානයේ කඩා වැටුණු අනියත බිය මදක් දුරු කරනු පිණිස ය.

"දේවක.. ඇයී..?"

අනුපමාගේ හඬ පමණටත් වඩා මන්දගාමී වී තිබිණි.

"අනු.. පමා.. ඇයි මේ බයවෙලා වගේ.. අපි මේ එන ගමන්.."

"ඔව් ඒක තමයි දේවක.. ඇයි.. මගදි මොකුත්.. කරදරයක්වත් උනාද..?"

"අයියෝ නෑ.. මොකුත් ප්‍රශ්නයක් නෑ.. අපි තව පැය බාගයක් යන්න කලින් එනවා.."

ඇය ද නොදැනුවත්ව ම ඇගේ මුවින් ගිලිහුණේ, සිත තුළ වූ බරක් යමක් නිදහස් වී ගිය කලෙක ගිලිහෙන්නා වූ අන්දමේ සහනශීලී සුසුමකි.

"එහෙනම් මේ වෙලාවෙ කෝල් කළේ..?"





අනුපමාගේ සිත තුළ වූ සියලු ප්‍රශ්නාර්ථයන් දිවැසින් දුටුවා සේ, දේවක, මොහොතින් හඳුනා ගත්තේ ය.

"අනුපමා බය උනේ.. මම මේ විදියට කෝල් කරපු නිත්දද...? බයවෙන්නෙපා.. අපි දැන් ඉන්නෙ කඩවත ටවුන් එකේ.. ඔයාට ගේන්න තැග්ගක් ගන්නයි මම ආපහු හැරිලා ටවුන් එකට ආවෙ.. මොන වගේ දෙයක්ද ගේන්න ඕන කියලා කිසිම අයිඩියා එකක් ආවෙ නෑ.. හිතලා හිතලා බැරිම තැනයි මම මේ ඔයාට කෝල් කළේ..?"

දේවකගේ වදනක් වදනක් ගානේම, අනුපමාගේ සිත නුහුරුම හැඟීම් ගොන්නකින් නිරි වැටෙන්නට විය. ඈ, පළමුව තවමත් දෙගිඩියාවෙන් තමා අසල ම පසුවන මාපියන්ගේ මුහුණු දෙස බලා මද හසරැල්ලක් පැවේ, පළමුව මාපියන්ගේ බරවූ සිත් ඉහිල් කර හිඳිය යුතු බැවිනි.

"අනේ මට තැගි එපා දේවක.. ඔයා එන්නත් කලින් ඔයාගෙන් තැගි බලාපොරොත්තු වෙන්න මට බෑ.. අනික ඒක සම්මතයට විරුද්ධයි නේද දේවක..?"

අනුපමාගේ ගති ස්වභාවයන් පිළිබඳව පූර්වයේ දී හොඳින් ම අධ්‍යයනය කර තිබුණු බැවින්, දේවක ඇයට දිය යුතු පිළිතුරු තෝරා බේරා ගත්තේ ප්‍රවේසමෙනි.

"අනුපමා.. මොනවද ඔය කියන්නෙ.. දැන් අපි නාදුනන අය නෙමෙයිනෙ.. මීට කලින් වතාවල්වල හැමදේම කතා බහ කරලා තියෙන එකේ, අද අපි මේ ගමන එන්නෙ සම්ප්‍රදායක් හැටියට විතරයි.."



The Reader's Place Novel

අනුපමාගේ මුව මත සැහැල්ලු හසරැල්ලක් පිපිණි. ඒ යළිත් වතාවක් එම සැහැල්ලු හසරැල්ල ද සමග ම, මාපියන දෙස බලා දේවකට පිළිතුරු දීම ඇරඹුවා ය.

"දේවක.. යහපත් විවාහක් කියන්නෙ ම ගැහැනියකට ලැබෙන උතුම් තැග්ගක්.. විවාහයකින් පස්සෙ ගැහැනියකට තමන් ප්‍රාර්ථනා කරන ජීවිතේ අහිමි වෙන්නෙ නැත්නම්.. සැමියෙකුට තමන්ගෙ බිරිඳට දෙන්න පුළුවන් සදාකාලික තිළිණය ඒක තමයි.. දේවක හිත කරදර කරගන්න එපා.. ඉස්සර වෙලාම ඇවිල්ලා යන්නකො.. අනිත් ඒවා පස්සෙ බලමු අපි.."

දේවක, දුකතනයේ එහා ඉම හිඳ මදක් උස් හඬින් සැහැල්ලු සිනාවක් පාන අයුරු අනුපමා අසා සිටියා ය.

"දේවක ඇයි හිනාවෙන්නෙ..?"

"මං හිතුවා නරී.. මං හිතුවා ආඩම්බරකාර ඉස්කෝලෙ නාම්තේගෙන් මට ඒ වගේ මහා පරිමාණ උත්තරයක් ලැබෙයි කියලා.."

දේවක හිතැහුණේ අනුපමා අපේක්ෂා නොකළ තරමේ සැහැල්ලුවකිනි. ඒ සිනාව ඔස්සේ, එතෙක් ජීවිතයේ කිසිදු දිනෙක අනුපමා නොහඳුනාගෙන උන් කුමක්දෝ ජීවන රිද්මයක් ද හඳුනා ගත්තාය.

"මම ආඩම්බර නෑ.. ඒ උත්තරේ මහා පරිමාණෙත් නෑ.. දේවක මට හැම ගැහැනියක් ම විවාහයෙන් පස්සෙ ප්‍රාර්ථනා කරන.. ලස්සන ජීවිතේ තැගි කරන්න.. මම මේ ඉල්ලන්නෙ ගොඩක් වටින තැග්ගක්.. ඒ තැග්ග සල්ලි දීලා කඩ සාප්පුවල්වත්



ගන්න පුළුවන් තැග්ගක් නෙමෙයි.. භෞතික සැප සම්පත් ඕනවටත් වැඩිය ඔයා ළඟ තියෙනවා කියලා මම දන්නවා.. ඒ හින්දා.. ඒ වගේ තැගි කිසිම දෙයක් මට එපා.. මැරි කළාට පස්සෙත්.. මම කැමති මගේ ජීවිතේ මට දෙන්න.. ඒක තමයි ඔයා මට දෙන උතුම් ම තැග්ග.."

අනුපමා.. දේවකගෙන් අයැදුවේ.. තමාගේ මුළු ජීවිතය ම ය. සමස්ත අනාගතය ම ය. පැතුම් සපිරි හෙට දවස ම ය. අනුපමාගේ ඉල්ලීමෙන් දේවක ඇතුළාන්තයෙන් දැඩි සේ තිගැස්සිණි. එයින් මතු, ඇයට දිය යුතු පිළිතුරක් දේවකගේ මුවට ගොනු වූයේ නැත.

"නරී අනූ.. මම ඔයාට එහෙනම් දැන් කිසිම දෙයක් අරගෙන එන්නෙ නෑ.. අපි ඇවිල්ලම කතා කරමු.. එහෙනම් මම තියන්නම්.."

"හොඳයි දේවක.. පරිස්සමට එන්න.."

දේවක ඇමතුමෙන් සමුගත් පසු අනුපමා මොහොතක් රිසීවරය දෙසම බලාගෙන සිටියා ය. ඇගේ මුවින් ගිලිහුණේ අනේතුක දිගු සුසුමකි. ඇගේ මවත්, පියාත් දෙදෙනා ම යළි ඇ අසලට සමීප වූහ.

"ඇයි පුතේ.. දේවක තැගි ගේන්න ඇහුවද..?"

"ඔව් අම්මෙ.. මම කිව්වා මට තැගි එපා කියලා.."

"මටයි අප්පච්චිටයි හැමදේම ඇහුණා පුතේ.."

අනුපමා තම මවත්, පියාත් දෙස බැලුවේ කල්පනාකාරී දැසිනි.

The Reader's Place Novel

"මම දේවකගෙන් ඉල්ලුව දේ බරපතල වැඩි ඇති අම්මා ඒත්.. මේ වෙලාවෙ මම ඒ දේ කිව්වෙ අපිට තීරණ ගන්න වෙලා තියෙන්නෙ ගොඩක් හදිසියේ හින්දා අප්පච්චි.. මම දේවක ඇසුරු කරලා.. එයා මොන වගේ කෙනෙක්ද කියල දැන අඳුනගෙන එයත් එක්ක විවාහයක බැඳෙන්න කාලා ඉතිරිවෙලා නැනෙ.. මම මගේ හිතේ තියෙන දේ කිව්වම දැ තරමෙ දේවක ඒ ගැන කල්පනා කරලවත් බලයි.. මාව බැන්දා පස්සෙ මගේ ඉල්ලීම ඉෂ්ට කරන්න උත්සාහයක්වත් ගනී නේද අප්පච්චි..?"

වර්ණවීර මහතා තමා අසලම උන් දියණියගේ හිස අ ගෑවේ කරුණාවෙනි.

"මේ ලෝකෙ ජීවත්වෙන හැමෝම.. අපි වගේ සුන්දර විදි හිතන පතන.. ජීවත්වෙන.. අය වෙන්න ඕන කියලා.. ලෝකු ගැන අවබෝධයෙන් පිරුණ අය වෙන්න ඕන කියලා.. අ ප්‍රාර්ථනා කරනවා තමයි චූටි දුව.. ඒත්.. අපේ හිත්වලින් අ දකින ලෝකය තරම්.. ප්‍රායෝගික ලෝකයවත්, ඒකෙ ජීවත්වෙ මිනිස්සුවත් සුන්දර නෑ.. විශේෂයෙන් ම ප්‍රාර්ථනාවක් කරනවා නම්.. හොඳ හෝ නරක.. ඉටුවීම හෝ ඉටු නොවීම.. මේ ඕන ප්‍රතිවිපාකයක් දරා ගන්නත්.. අපි හිත ශක්තිමත් කරගෙ ඉන්න ඕන.."

"ඒ ඇත්ත මමත් දන්නවා අප්පච්චි.."

"මිනිස්සු කියන්නෙ කොයි වෙලාවකවත් පිටින් පේන කෙනා නෙමෙයි.. පිටින් පෙනෙන මිනිස්සුම ඇතුළෙන් ඉන්නෙ කලාතුරකින් චූටි දුව.."





"ඔව් අප්පච්චි.. මට තේරෙනවා.."

දියණියගේත්, සැමියාගේත් සංවාදයට කිසිදු සම්මාදමක් නොකළ වර්ණවීර මහත්මිය සාවධානව ඇහුම්කන් දිගෙන පමණක් සිටියාය. තමාගේ දියණියගේ ජීවිතයේ වැදගත් ම තීරණය ගැනීමට සූදානම් වන මොහොතේ, සොම්නස සේ ම දොම්නස ද මුසු වූ දහසක් සංවේදනාවන්ගෙන් ඇගේ සිත දෝලනය වෙමින් පැවතිණි. දැස සේ සුරකිමින්, ආදරයෙන් හදා වැඩූ දියණියක කරකාර බන්දා, පිටගම් යවන්නට සූදානම් වන මොහොතක, මාතෘ ළයකට දැනෙන ඒ සංවේදනාවන් අනන්තය, කිසිදා වචන බවට පත් කිරීමට නම් කිසිවෙකුටත් හැකියාවක් නොලැබෙනු ඇත.

"අම්මා.. ඔය තරම් කල්පනා කරන්නෙපා.."

"කල්පනා කරනවා නෙමෙයි චූටි දුව.. අනාගතයෙ වෙන්න තියෙන දේවල් නම් කාටවත්ම කල් තියා දැනගන්න විදියක් නෑ.. එක වෙලාවකට මටත් බය හිතෙනවා ඒ තරමට ලොකු පවුලක උදවිය වෙලත් ඇයි අපි වගේ බොහොම සාමාන්‍ය පවුලක් එක්ක සම්බන්ධ වෙන්න හිතුවෙ කියලා.."

වර්ණවීර මහතා තම බිරිඳ දෙස බැලුවේ කල්පනාකාරී දැසිනි.

"දැන් ආපස්සට කල්පනා කරන්න යන්නෙපා සුභා.. දේවක පුතත් බලාපොරොත්තු අලුත් කරගත්තා.. මේ විවාහයට බැඳෙන්න අපේ දුවත් හිත හදාගත්ත වෙලාවෙ.. අපි අසුබවාදී සිතිවිලිවලින් පුළුවන් තරම් දුරස්වෙලා ඉන්න බලමු සුභා.."



The Reader's Place Novel

අනුපමා තමාගේ මවත්, පියාත් දෙදෙනා ම දෙස බැලුවේ මෘදු මදහසක් ඇඳගත් නිවුණු දෑසිනි.

"අම්මයි අප්පච්චියි කිසිම දෙයක් ගැන උවමනාවට වැඩිය හිතන්න එපා.. මමත්.. කවදා හරි කවුරුම හරි කසාද බඳින්නම ඕනනෙ.. මිනිස්සුන්ගෙ සැබෑ වටිනාකම් රැඳිලා තියෙන්නෙ එයාලගෙ භෞතික ලෝකවල නෙමෙයි.. සමහර විට දේවක ගොඩක් හොඳ කෙනෙක් වෙන්න ඇති.. පුළුවන් තරම් හොඳින් ජීවිතයට මූණ දෙන්න මම උත්සාහ කරන්නම් අම්මා.. මගේ දෛවය මම වෙනුවෙන් තීරණය කරලා තියෙන දේවල් බාරගන්න.. මම මගේ හිත ලැස්ති කරගන්නම් අප්පච්චි.. අම්මයි අප්පච්චියි හිත්වල කිසිම බරක් තියාගන්න එපා.."

අනුපමා, තමාට දෙපසින් හිඳ උන් තම මවගේත්, පියාගේත් දෑත, දෑතින් අල්ලා ගත්තේ, සඳාතනික දාරක සෙනෙහසක් දැසේ ඇඳගෙන ය. හදවතට දැනෙන සියලු වේදනාවන් සිත යට ම සඟවාගෙන, ඈ ඒ අධිෂ්ඨානය පිරුණු ආදරණීය බැල්ම දැසේ ඇඳ ගත්තේ, ඔවුන් දෙදෙනාගේ හදවත් තුළ සඟවා ගත් වේදනා අනන්තය මදක් හෝ දුරු කරවනු පිණිස ම ය.





# 04

දේවක ඇතුළු පිරිස රැගත් මෝටර් රථය වර්ණවීර නිවසේ ගේට්ටුවෙන් ඇතුළු වී, දෙපස වූ පොල්ගසින් සෙවණ වූ කෙටි මාවත දිගේ නිවස දෙසට ඇදී එන්නට විය. අනුපමා ආලින්දයට පිවිසෙන දොරටුව අසල රැඳී සිටියදී, වර්ණවීර යුවළ විවෘත ආලින්දය පසුකොට මදක් ඉදිරියට ඇදී අමුත්තන් පිළිගන්නට මිදුලට වන්හ. පරිසරය පුරා ම පැතිර තිබුණේ අමුතුම මිහිරියාවකැයි, වදනින් නොකී මුත් සියල්ලන්ගේම සිත් තුළ ලියැවී තිබිණි. ඔවුනු පැමිණ තිබුණේ සබඳකම් අලුත් කර ගැනීමේ ගමනක් විනා, අමුත්තන් ලෙස නොවේ. එබැවින්, සියල්ලන්ගේම සිත් සැනසුමෙන් පිරී තිබිණි. වර්ණවීර යුවළ, රන්මුතුගල පවුලේ සාමාජිකයන් පිළිගත්තේ හෘදයාංගම බව පිරී ඉතිරී යන සාදර සිතිනි. ඔවුහු, දෑත් එක්කොට එකිනෙකාට ආචාර කර, හමුවීමේ පළමු පියවර චාරිත්‍රානුකූලව සනිටුහන් කළහ. ඔවුහු සංවාදයට මුල පිරුවේ ම දිගු කාලයක් මුළුල්ලේ දැන හඳුනාගෙන උන් පැරණි ඥාතීන් තරමට සමීපව ය.



The Reader's Place Novels

"ඔන්න අපි කියපු වෙලාවට ම ආවා මල්ලියේ.."

දේවකගේ ලොකු මාමා පැවසුවේ, වර්ණවීර මහතාගේ උරහිසක් උණුසුම් ලෙස වැළඳ ගනිමිනි. අනුපමාගේ පියා ද ප්‍රතිචාර දැක්වූයේ ඊට කිසිසේත් ම නොදෙවෙනි හෘදයාංගමව බවකිනි.

"යමු මහත්තයෝ ඇතුළට.. අපි මේ එනකල් මග බලාගෙන හිටියෙ පැයක් විතර ම.."

වර්ණවීර මහතාගේ වචන තුළ තැවරී තිබුණු සතුටේ ප්‍රමාණය නිවස තුළ උන් අනුපමා පවා හැඳින්නා ය. දේවක පිළිබඳව තවත් කිසිවක්ම නොසොයා, නොබලා.. එම විවාහයේ බැඳී, තම මාපියන්ගේ සිත් තුළ තමා වෙනුවෙන් ගොඩ ගසාගෙන සිටින්නා වූ සියලුම වගකීම් සම්භාරයන්ගෙන් ඔවුන් නිදහස් කිරීමට, අනුපමා ඒ මොහොතේ එකඟ සිතින් තීරණය කළාය.

"පැයේ ප්‍රමාදයට නම් මල්ලියේ අපිට වග කියන්න බෑ.. ඒකට දේවක පුතා උත්තර බඳියි.."

පැමිණ සිටි සියල්ලෝ ම එකම සිනාවකට එක්වූහ. දේවකගේ මව ඒ වනවිටත් සිටියේ, අනුපමාගේ මවගේ සුරතින් අල්ලා ගෙන ය.

"හරි.. හරි.. මින් ඉදිරියට සේරට ම උත්තර බඳින්න වෙන්නෙ දේවක පුතාට ම තමයි.."

මොහොතකට.. යළින් පිරිස අතර රස ගුලාවක් මැවිණි. මේ කිසිවකට සම්මාදම් නොවී පසෙකින් බලා හිඳි අනුපමාගේ සිත තුළ ද කුමක්දෝ සතුටක් ඉහිරී තිබිණි. පිරිස අතරින්





රහසේ තම දැස මුදවාගත් දේවක, සියල්ලන්ගේ ම දැස වසා අනුපමාගේ දැස සොයා ගත්තේ ය. සිව් නෙත් හමුවූ මොහොතේ.. ඇගේ දැසේ සොඳුරු ම මදහසක් පමණක් ඇඳිණි ද, දේවකගේ දැසේ ඇදුණු මදහස හා දැසට අහේතුකව උනා ආ කඳුළු කැට කිහිපයක් ද මුසුවී තිබිණි. ඔහුට මේ හමුවී තිබුණේ පෙර සිව් වතාවකදී ම මග හැරුණු දැසකි. ඒ මොහොතේ ඔහුට.. මුළු ලොවම අමතක වී අනුපමා කෙරෙහි බැඳි ප්‍රේමවන්ත සිත අවදි වී තිබිණි.

සියල්ලෝ ම.. වර්ණවීර නිවසට ගොඩවූයේ අප්‍රමාණ වූ සොම්නසක් පුරවා ගත් සිත්වලිනි. වර්ණවීර යුවළගේ ආරාධනයෙන් මතු පිරිස ආලින්දයේ අසුන් ගත්හ. ඉන් පසු අනුපමාගේ මව තම දියණිය සමීපයට පැමිණියාය.

"යමු පුතේ.. කතා කරන්න අම්මලාට.."

එවදන් මුවින් පිටවන මොහොතේ, අනුපමාගේ මවගේ දැස කඳුළින් තෙත්වී තිබිණි. ඒ.. එළඹෙමින් තිබුණේ ඇයට මෙතුවක් උන් එක මවක් වෙනුවට, මව්වරුන් දෙදෙනෙකු හිමිවීමට යන දෙවයේ අතිශය තීරණාත්මක මොහොතකි. දේවකගේ මව, තම දියණියට කිසිදා නැන්දම්මා කෙනෙකු නොව මවක් ම වේවා'යි ප්‍රාර්ථනා කරන්නට, අනුපමාගේ මව ඒ කලබලකාරී මොහොතේ හෝ අමතක කළේ නැත.

සුභාෂිණී, අල්ලාගෙන උන් තම දියණියගේ සුරත අත හැර, ඇගේ නිස මෘදුව පිරිමැද්දා ය. එතෙක් කල්, තමාගේ මව ආදරයෙන් අල්ලාගෙන උන් අත, ඒ අත හැරියේ, සදහට ම බව දැනුණු මොහොතේ, දැසට උනාගෙන එන කඳුළු වළකාගන්නට අනුපමා දැන සිටියේ නැත. තම මවගෙන් ගිලිහුණු සුරත



The Reader's Place Novel

අතහරින්නට ලෝබකමින් මෙන් අනුපමා යළි තම මවගේ සුරතේ වෙලුණා ය. තමාගේ සිත තුළ මෙන් ම දියණියගේ සිත තුළ නළියන වේදනාව ද හොඳින් හඳුනාගෙන උන් සුභාෂිණී, යළිත් වරක් මහා දයාර්ද බවකින් තම දියණියගේ හිස පිරිමැද්දේ, ඇගේ දෑසට රොක් වූ කඳුළු දෑසින් ගිලිනී දෙකම්මුල් මතට කඩා හැලෙද්දී ය.

"යන්න මගෙ පුතේ.. හැම දුවෙක්ම මේ විදියට තමන්ගෙ අම්මගෙ අත අතැරලා දවසක යන්නම ඕන පුතේ.. හැම අම්මා කෙනෙක් ම මේ විදියට තමන්ගෙ දුව්ව දවසක තමන්ගෙ අත අතැරලා අලුත් අතකට බාර දෙන්නම ඕන.. යන්න පුතේ.. ගිහිල්ලා ඉස්සර වෙලා ම දේවක පුතාගෙ අම්මට කතා කරලා ඉන්න.."

අනුපමා, තම මවගේ සුරතින් තම සුරත මුදාගෙන, දැහිලි අගින් කම්මුල් මතට කඩා වැටුණු කඳුළු පිස දමා ගත්තා ය. ඈ සෙමින් අඩි තබා දේවකගේ මව වෙත පැමිණියාය. කාරුණික දෑසක් හිමිව තිබූ දේවකගේ මව, අනුපමා සමීප වත්ම, හිඳ උන් අසුනින් නැඟී සිටියේ මදක් දෙපයට හා කොන්දට වාරු ගනිමිනි. දේවකගේ මවට, මෘදු මදහසක් තිළිණ කළ අනුපමා, ඈ ඉදිරියේ දණ බිම ඔබා නමස්කාර කළාය.

"තෙරුවන් සරණයි පුතේ.."

දේවකගේ මව, අනුපමාගේ හිස පිරිමැද, ඈ නැඟී සිටි පසු දෙකම්මුල් ද සිපගෙන, ඇගේ සෙනෙහස පුදු කළා ය.

"කොහොමද පුතේ..?"

"හොඳයි අම්මා.."





"අපි ගොඩක් කල් ඔයා වෙනුවෙන් බලන් හිටියා පුතේ.."

"මට සමාවෙන්න අම්මා.."

"හරි පුතේ.. දැන් සේරම හරි.."

දේවකගේ මව යළිත් වතාවක් අනුපමාගේ හිස අත ගැවාය. ඈ වෙත යළිත් මෘදු හසරැල්ලක් තිළිණ කළ අනුපමා, වැඩිහිටි අනුපිළිවෙල නොවරදවා, දෙවනුව දේවකගේ ලොකු මාමා වෙත හැරුණා ය.

"තෙරුවන් සරණයි දුවේ.. දැක්කා නේද බඹා කෙටූ හැටි..???"

ලොකු මාමාගේ ආදරණීය විහිළුව පිරිස අතරේ මොහොතකට පෙර පැතිර ගිය නිහඬ බව හිඳ බිඳ දමා සිනාවක් පතුරුවාලීය. ඉන් පසුව දේවකගේ ලොකු නැන්දාට, බාප්පාට හා පුංචි අම්මාට දණ නමා වැඳ ආචාර කළ අනුපමා, අවසානයේ තමාගේ ඉරණම්කරු ඉදිරියේ සිට ගත්තාය. ආත්ම ගණනාවක් පතා ආවාක් සේ, අවස්ථා ගණනාවකදී මග හැරී මග හැරී ගොස් යළි හමුවූ තරුණයා දෙස අනුපමා පළමු වතාවට දැස් ඔසවා බැලුවා ය. දේවකගේ දෑසේ ලියැවී තිබුණේ සැබැවින් ම බොහෝ කලක් ප්‍රේමය උදෙසා පාරමිතා පිරුවකුගේ දෑසේ ඇඳෙන හැඟීම් ගොන්නකි. අනුපමා.. මදක් පහත් වී.. දෑත් එකතු කොට දේවකට ආචාර කළාය.

එහෙත්.. ඒ ආචාරය.. දේවකගේ හදවතට බර වැඩි විය. වෙහෙසක් නොගෙන ම ඔහුගේ හදවතේ වූ සෙනෙහස වචන බවට පත්වූයේ එබැවිනි.

"එපා.. අනූ.. මට වඳින්න එපා.."



The Reader's Place Novel

අනූ..! එම ආමන්ත්‍රණය සවන් වැකෙත් ම, අනුපමා නොසැහෙන තරමට තිගැස්සුණාය. එවන් ආදරණීය ආමන්ත්‍රණයක් අතීතයේ කිසිදා ඇයට ඇසී තිබුණේ නැත. හදවත අමුතුවෙන් ම තිගැස්සිණි ද, එහි අපූරු රිද්මයක් ඇතැයි මොහොතින් අනුපමා හැඳින ගත්තා ය. දැස් ඉවතට ගන්නට ඉඩ නොදෙන ආදරණීය දැසකින් තමා දෙස බලා හිඳින තරුණයාගේ දැසින්, උදුරා ගත්තාක් මෙන් තම දැස ඉවතට ගත් අනුපමා, සෙමෙන් අඩි තබා තම මව අද්දරට ඇදුණාය.

"දුව ඇවිල්ලා ඔයාගෙ අලුත් අම්මා ළඟින් ම වාඩිවෙන්නකො.. නංගියි මල්ලියි දෙන්නත් දැන් ඉතින් වාඩිවෙන්නකො.."

ආරාධනය.. දේවකගේ ලොකු මාමා වූ එඩ්වඩ් සිරිවර්ධන ගෙනි.

"ඔව්.. ඔව්.. අයියයි අක්කයි දෙන්නා මෙතනින් ම වාඩිවෙන්නකො.. ඕන තරම් වෙලාව තියෙන එකේ අපි නිදහසේ දැන් ඉතින් කතා බහ කරමුකෝ.."

දේවකගේ පියාගේ බාල සොයුරා වූ සේනක රන්මුතුගල මහතා ද එලෙස සංවාදයට එක් වූයේ ය.

"මේ දවස් ටිකේ ම ටෙලිෆෝන් එකෙන් හැමදේම කතා බහ කරපු එකේ.. අපිට කතා කරන්න ආගිය තොරතුරුත් නැති එකේ.. අපි එහෙනම් අදාළ කාරණාවම කතා කරමු නේද පුතේ.. එහෙම නේද වෙන්න ඕන මිසිස් රන්මුතුගල..?"

දේවකගේ මව අනුපමාගේ පියාගේ පැනයට පිළිතුරු දෙන්නට මත්තෙන් වර්ණවීර යුවළ දෙස බැලුවේ ආයාචනාත්මක දෑසිනි.





"මට මිසිස් රන්මුතුගල කියන්නෙපා මල්ලියේ.. අපි දැන් මේ ලෝකෙ පවුල් දෙකක් අතර ඇතිවෙන්න පුළුවන් ලොකුම බන්ධනයකින් බැඳෙන්න යන්නෙ.. මින් මත්තට අපි නැදෑයො වෙනවා.. මගේ පුතා මේ දුවව විවාහ කරගන්නවා කියන්නෙ.. මමත් ඔය දෙන්නට සහෝදරියක් වෙනවා.."

වර්ණවීර යුවළ තම අනාගත ඥාති සමූහයා වෙත හෙලුවේ කෘතවේදී බැල්මකි. වර්ණවීර මහතා දීර්ඝ කතාවකට මුල පිරුවේ ඉන් පසුවය.

"අන්න ඒ වගේ හදවතට සමීප බැඳීමකින් අපිට ඉදිරියට ඉන්න ඉඩ ලැබෙනවා නම්.. අපිට ඒ තරම් සතුටක් තවත් නැ අක්කෙ.. අපි මේ මංගල යෝජනාව මීට කලින් හැම වතාවකම ප්‍රතික්ෂේප කළේ අපි බොහෝම සරල සාමාන්‍ය පවුලක් හින්දා.. අපි දන්නවා දේවක පුතා අපිට වඩා බොහෝ ම ඉහළ පැළැන්තියකට අයිති දරුවෙක් බව.. ඇත්තටම ඒකයි අපි මේ යෝජනාව මීට කලින් හැම වතාවකම මග ඇරලා දාන්න උත්සාහ කළේ.."

රන්මුතුගල පවුලේ සියල්ලෝම කිසිදු බාධා කිරීමකින් තොරව, වර්ණවීර මහතාගේ අදහස් දැක්වීමට සවන් යොමාගෙන උන්හ. තම මව හිඳ උන් අසුනට යාබද අසුනේ අසුන්ගෙන, සමවැදී මෙන් බිමට යොමු වූ නෙතින් තම දසැහිලි දෙසම බලා හිඳින අනුපමා, දේවකගේ දැසට හසුවූයේ සරල රේඛීයව ය.

"විශේෂයෙන් ම විවාහයකදී.. පවුල් දෙක අතර තරාතිරම් බොහෝ දුරට සමාන වෙන්න ඕන.. දුරස්කම් පුළුවන් තරම් අවම වෙන්න ඕන.. පවුල් දෙකක් අතර තියෙන නොගැළපීම් වැඩිවෙන තරමට විවාහයක් ඇතුළෙ ඇතිවන ප්‍රශ්න ප්‍රමාණයත්



The Readers Nook

වැඩිවෙනවා.. මම මේ ප්‍රශ්නෙ කෙළින්ම පුතාගෙන් ම අහන්නම්කෝ අපි හැමෝම ඉස්සරහා.. ඇත්තටම පුතා.. පුතාගෙ තත්වෙ හැටියට.. අපි වගේ බොහොම සරල සාමාන්‍ය පවුලක් ගැළපෙනවද..? අපේ දුව වගේ බොහෝම සරලව සාමාන්‍ය විදියට ජීවත්වෙන දරුවෙක් පුතාගෙ බිරිඳ වෙන්න සුදුසුද..?"

දේවක.. එවැනි පැනයක් වර්ණවීර පවුලෙන් බලාපොරොත්තුව සිටියේ නැත. ඔහු, පිළිතුරු දීමට මත්තෙන්, පළමුව තම සිත පැහැර ගත් යුවතිය දෙස බැලුවේය. දෙසිත තුළ වූ හැඟීම් කිසියම් ආකස්මික බලයකට නතු වූවාක් මෙන්, අනුපමා ද ඒ මොහොතේ හිස ඔසවා තමාව පතා ආ තරුණයා දෙස බැලුවාය. අනුපමාගේ හැඟීම් විරහිත දෑස් දේවකගේ සිතට ධෛර්යය රැගෙන ආවේය.

"සරල සාමාන්‍ය බව කියලා අප්පච්චි ඔය කියන්නෙ.. අප්පච්චිලා ළඟ තියෙන නිහතමානීකමට.. අනුපමාට මම මුලින්ම කැමති උනේ එයා ළඟ තියෙන ඒ නිසංසල නිරහංකාරකමට.. මේ මොහොතෙ තියෙන මිල මුදල්.. ගේ දොර වතු පිටි.. යාන වාහන.. ඊළඟ මොහොතෙ නැතිවෙලා යයි.. ඒත්.. මිනිස්සු ළඟ තියෙන වටිනාකම්.. එහෙම නැතිවෙලා යන්නෑ.. මිනිස්සුන්ව ජීවත් කරවන්නෙ මිනිස්සු ළඟ තියෙන මිනිස් වටිනාකම්වලින් අප්පච්චි.. භෞතික සම්පත්වලට පුළුවන් අපේ ජීවිත පහසු කරවන්න මිසක්.. අපිව ජීවත් කරවන්න නෙමෙයි.."

දේවක, වර්ණවීර මහතා නිරුත්තර කරවන තරමේ හෘදයාංගම පිළිතුරක් ලබා දුන්නේ ය. ඉන්පසු යළිත් දෙපාර්ශවයේ කිසිවෙකු හෝ තමාගේ තරාතිරම පිළිබඳව ප්‍රශ්නකාරී ලෙස කිසිවක් කතා කළේ නැත. අනතුරුව සියල්ලෝම තේ පානය





සඳහා අසුන් ගත්හ. තේ මේසය මත සූදානම් ව තිබූ කැවිලි පෙවිලි ආදිය දුටු දේවකගේ මව, අනුපමාගේ මව දෙස බැලුවේ පුදුමයෙනි.

"නංගියේ.. මගුල් ගෙදරකට වගේ ලෑස්තිවෙලානෙ.."

අනුපමාගේ මව, දේවගේ මව දෙස බැලුවේ ගෞරවය මුසු සෙනෙහසකිනි.

"අපිට ඉතින් ආයෙ ඉන්නෙ මෙච්චරයිනෙ අක්කෙ.. අපිට ආයෙ දකින්න වෙන මංගල්‍යයක් නෑ.. දරුවො දෙන්නා කැමති නම්.. හිතේ සන්තෝසෙන් පුළුවන් හැමදේම කරන්න බලනවා අක්කෙ.."

වර්ණවීර මහත්මියගේ දෑස යළි කඳුළින් තෙත් වීමට ගතවූයේ ඇසිල්ලක කාලයකි. සතුටු සාමීචි මැද ඔවුහු තේ පානය ද නිමා කළහ. තේ පානය නිමා වීමෙන් අනතුරුව අස් පස් කිරීමේ කටයුතු සඳහා දේවකගේ පුංචි අම්මා වූ නයනා කැමැත්තෙන් ම ඉදිරිපත් වූවාය.

"මට මේ ටික තනියම කරගන්න පුළුවන්.. නංගි ඉන්නකො.. ගෙදරට එන අමුත්තන්ගෙන් වැඩ කරවා ගන්න සිරිතක් නැනෙ නංගි.."

සුභාෂිණී කීවේ සැබෑම ළෙන්ගතු හැඟීමෙනි.

"ඒ අමුත්තො ආවොත්නෙ අක්කෙ.. අපි ඉතින් දැන් අමුත්තොයැ.. අනික.. හෙට අනිද්දම අපි නැදෑයො උනාට පස්සෙ.. මොන අමුත්තක්වත් ඉතුරු වෙන්නෙ නෑ අක්කෙ.. දේවක පුතා කියන්නෙ අපි හැමෝටම ඉන්න එකම දරුවා..



The Readers Novel

අනුපමා, නොදැරියක සේ යළිත් තම මවගේ දෑතේ එල්ලී
ද උන් තැනින් නැගී සිටියා ය. ස්වයංක්‍රීයව ඇදී යන
ත්නික්කියක සේ, ඈ තම මව පසුපසින් ඇදී ආලින්දය දෙසට
විද ගියා ය. තේ පානයෙන් පසුව අනුපමාගේ ඡායා මාත්‍රයක්
ා නොදැන සාංකාවෙන්· මෙන් පසු වූ දේවක, මවගේ අතක
ළී ළදැරියක මෙන් ඇවිද එන අනුපමා දුටු මතින් තිගැස්සිණි.
ඉදිරියේ මවා පෙන්වන සොඳුරු ලොව යට සහවා ගත්
දුරු සෙවණැලි, ඒ මොහොතේ ඔහුගේ සිත වටා සරිසරන්නට
යේ ය. උදෑසන පැමිණි මොහොතේ ඔහු දුටු අනුපමාගේ
බිදුණු දෑස, ඒ මොහොතේ පරවී ඇතැයි දේවකගේ සිත මොර
න්නට වූයේය. යුද්ධය පැවතියේ දේවකගේ සිත යට ය.
රිසරය පෙර තිබූ පරිදි ම සතුට පිරුණු සැහැල්ලුවේ ගිලී
වතිණි.

සියල්ලන්ගේ ම· වැඩිහිටියා වූ එඩ්වඩ් සිරිවර්ධන සිරිත්
රදි ම කතා බහට මුල පිරුවේ ය.

"මම මේ කතාව මෙහෙම පටන් ගන්නෙ.. දැනටමත් අපි
ාතියෝ බවට පත්වෙලා අවසානයි කියලා හිතාගෙන.. ඇත්ත
කිව්වොත්.. සත්‍ය කතාවත් ඒකම තමයි.. පවුල් දෙකක්
වාහ පොරොන්දුවකින් බැඳෙනවා කියන්නෙ ම.. ඒ මොහොතෙ
ාතීත්වයක් උපදිනවා.. මම කියන දේ හරි නේද..?"

සියල්ලෝ ම කිසිදු විරෝධයකින් තොරව හිස සැලුවේ,
ැඟුරින් සිතා බලන කල, සිරිවර්ධන මහතාගේ වදන් තුළ
ැබිව තිබුණේ සත්‍යයක් ම බැවිනි.

"හොඳයි.. එහෙනම් අපි කෙළින්ම අදාල කාරණාවට බහිමු..
පුතා අවුරුදු තුනක් තිස්සෙ මේ දුව ගැන බලාපොරොත්තු



අනුපමා, දැස විදා තම මව දෙස බැලුවේ,
"මම මේ කසාද බඳින්න නේද යන්නෙ..?"
වර්ණවීර මහත්මිය හිස සැලුවා ය.
"අම්මා අර කියපු නිදහස් හැඟීම.. හෙ
හැඟීමක් ද කියලා මට දැන්මම දැනෙන්න
අනුපමාගේ මුවින් වචන වී පිට වුයේ, ද
ම අපේක්ෂා නොකළ ආකාරයේ හැඟුම් සුළඟක් වනිණි.
"මගෙ දුව.. බයවෙලාද ඉන්නෙ..? ඇයි දු
අනුපමා, කඳුළු රැඳී දිදුලන දෙතොත්, හ
පතුලේ ම රැඳෙව්වා ය.
"ඇත්තටම.. මට බයයි අම්මා.. දේවක සි
අම්මගෙ විතරක් නෙමෙයි.. ඒ හැමෝගෙම
හැමෝම දේවකට මහ පුදුම ආදරයක් දක්වන
මට අනවශ්‍ය බරක්, වගකීමක්, පීඩාවක් වෙයි
හිතෙනවා අම්මා.."
"ආදරේ වැඩි උනාට.. නරකක් වෙන්නෙ
දුව බය වෙන්නෙපා.: අපි යමු ඉස්සරහට.. අඳි

The Reader's Place Novel

අපේ පුතා මේ දුවව බඳිනවා කියන්නෙ මේ දරුවත් අපේම දරුවෙක් වෙනවා.. ඒ කියන්නෙ.. ඊට පස්සෙ අපි එකම පවුලක්.."

නයනා කිවේ, සුභාෂිණීගේ අතක් ද අල්ලාගෙන ය. එය, සුභාෂිණීගේ දැසේ රැඳුණු කඳුළු පෙළ අල්ලත් කිරීමට සමත් විය. ඇය, නයනා දෙස බැලුවේ අපේක්ෂා සහසක් රැඳුණු දැසිනි.

"ඔව් නංගි.. දරුවෙක් කියන්නෙ පවුලක් එකට ගැට ගහලා තියන නූලක් වගේ.. දේවක පුතාට පවුලෙ හැමෝගෙත් ම ලැබෙන ඒ ආදරේ නම් මහා විඳුනාවක්.. ඒ විඳුනාව ම මගේ දරුවටත් ලැබෙනවා දකින තරම් සතුටක් අම්මා කෙනෙක්ට විදියට මට මේ ලෝකෙ වෙන නෑ නංගි.."

නයනා, සුභාෂිණීගේ උරහිස මත සුරත තැබුවේ තම ඥාති පුතු සේ ම, ඔහුගේ අනාගත උරුමක්කාරිය වීමට දෛවයේ නීත්‍යනුව වූ යුවතිය කෙරෙහි ද උපත් මහා පරිමාණ සෙනෙහසක් දැසේ කවරාගෙන ය.

"අනුපමා දුවට අපි ආදරය දක්වනවා කියන්නෙම.. අපි අපේ පුතාට දක්වන ආදරයේ, සෙනෙහසේ කොටසක්.. දුවට අපෙන් අඩුපාඩුවක් වෙනවා කියන්නෙම.. අපි අපේ දරුවට කරන අනාදරයක්.. අපේ දරුවගෙ සතුටට කරන අනතුරක්.. ඒ හින්දා අක්කා පොඩ්ඩක්වත් බයවෙන්නෙපා.. අපි අපේ පුතාව බලාගත්තා වගේම ආදරෙත් අක්කගෙ දුවවත් බලාගන්නවා.."

නයනාගේ වදන් ඉදිරියේ සුභාෂිණීට හැඬෙනු වළක්වාගත නොහැකි විය. එසේ ම සිත සැනසූ නයනාගේ වදන්වලට කෘතවේදී නොවී හිඳීමට සුභාෂිණීට ද නොහැකි විය.

"නංගි කියපු ඒ වචන ටික ඇතුළෙ තියෙන දර්ශනේ නම්





මේ ලෝකෙ කොයි කවුරුත් දැන ඉගෙන ගත්ත ඕන දර්ශනයක් නංගි.. මේ ලෝකෙ ඉන්න කොයි දරුවත් තමන්ගෙ දරුවොට සමානයි කියලා ඕනෑම වැඩිහිටියෙකුට හිතන්න පුළුවන් නම්.. මේ ලෝකෙ ජීවත්වෙන දරුවොට ඉස්සරහට එන ප්‍රශ්නවලින් බාගෙට බාගයක්ම විසඳෙනවා නංගි.. අපි අතරෙ ඉන්න ගොඩක් දරුවොට දුක් විඳින්නෙ වැඩිහිටියන්ගෙ ම වරදින්.."

තමාගේම දරුවන් විෂයයේ අත්දැකීම් නොවූව ද, නයනා, සුභාෂිණී කියූ දෑ සමඟ තර්කයකින් තොරව එකඟ වූවා ය. වර්ණවීර මහතා මුළුතැන්ගෙයට ආවේ ඒ මොහොතේ ය.

"සුතා.. අස් කරලා ඉවර නම් ආපහු අර පැත්තට එන්න.. අයියා කියනවා දවල් කෑමට තව වෙලාව තියෙන හින්දා අපිට දේවල් ටික කතා බහ කරගෙන ඉවරයක් කරමු කියලා.. එතකොට දවල් කෑමෙන් පස්සෙ නිදහසේ දේවක පුතාලාට පිටත් වෙන්න පුළුවන්.."

"අපි මේ තිකම් කතා කර කර හිටියෙ.. අපි එන්නම් මහත්තයා.."

"එහෙනම් එන්න... කතාබහ ඉවරයක් කළාම අපි හැමෝටම ලේසියි.."

වර්ණවීර මහතා පිටව ගියේ නයනා රාජසිංහ වෙත ද ළෙන්ගතු හසරැල්ලක් තිළිණ කරගෙන ම ය.

සියල්ලෝ ම යළි ආලින්දයට රැස් වූහ. එතෙක් වේලා තමාගේ කාමරයට වී දිගු කල්පනාවලියක පැටලී උන් අනුපමා සොයාගෙන, ඇගේ මව එතැනට පැමිණියා ය. කල්පනාවේ නිමග්නව උන් දියණියගේ දැසේ කඳුළු පිරී තිබෙනු දුටු වර්ණවීර

The Reader's Place Novel

මහත්මියගේ සිත නොමනා ලෙස තිගැස්සිණි. අනුපමා, මවගේ පියවර හඬින් දැස ඔසවා බැලුවේ, ඒ කඳුළු දෑසේ ඵලලය ම රැඳී තිබියදී ය.

"වූටි දුව.. ඇයි පුතේ මේ..?"

අනුපමා, දැස විදා තම මව දෙස බැලුවාය.

"මම මේ කසාද බඳින්න හේද යන්නෙ අම්මා..?"

වර්ණවීර මහත්මිය හිස සැලුවා ය.

"අම්මා අර කියපු නිදහස් හැඟීම.. මොන තරම් ලස්සන හැඟීමක් ද කියලා මට දැන්මම දැනෙන්න අරගෙන අම්මා.."

අනුපමාගේ මුවින් වචන වී පිට වුයේ, ඇගේ මව කිසිදෙනෙ ම අපේක්ෂා නොකළ ආකාරයේ හැඟුම් සමුදායකි.

"මගෙ දුව.. බයවෙලාද ඉන්නෙ..? ඇයි පුතේ.."

අනුපමා, කඳුළු රැඳී දිදුලන දෙනෙත්, තම මවගේ දෑස පතුලේ ම රැඳෙව්වා ය.

"ඇත්තටම.. මට බයයි අම්මා.. දේවක කියන්නෙ එයාගෙ අම්මගෙ විතරක් නෙමෙයි.. ඒ හැමෝගෙම දරුවා.. එයාලා හැමෝම දේවකට මහ පුදුම ආදරයක් දක්වන්නෙ.. ඒ ආදරේ මට අනවශ්‍ය බරක්, වගකීමක්, පීඩාවක් වෙයිද කියලා මට බය හිතෙනවා අම්මා.."

"ආදරේ වැඩි උනාට.. නරකක් වෙන්නෙ නෑ පුතේ.. මගෙ දුව බය වෙන්නෙපා.. අපි යමු ඉස්සරහට.. අපි එනකල් හැමෝම බලන් ඉන්නවා.."



අනුපමා, නොදැරියක සේ යළිත් තම මවගේ දැතේ එල්ලී හිඳ උන් තැනින් නැගී සිටියා ය. ස්වයංක්‍රියව ඇදී යන බෝනික්කියක සේ, ඈ තම මව පසුපසින් ඇදී ආලින්දය දෙසට ඇවිද ගියා ය. තේ පානයෙන් පසුව අනුපමාගේ ඡායා මාත්‍රයක් හෝ නොදැන සාංකාවෙන්ම මෙන් පසු වූ දේවක, මවගේ අතක වෙළී ළදරියක මෙන් ඇවිද එන අනුපමා දුටු මතින් තිගැස්සිණි. ඈ ඉදිරියේ මවා පෙන්වන සොඳුරු ලොව යට සඟවා ගත් අඳුරු සෙවණැලි, ඒ මොහොතේ ඔහුගේ සිත වටා සරිසරන්නට වූයේ ය. උදෑසන පැමිණි මොහොතේ ඔහු දුටු අනුපමාගේ පිබිදුණු දෑස, ඒ මොහොතේ පරවී ඇතැයි දේවකගේ සිත මොර ගාන්නට වූයේය. යුද්ධය පැවතියේ දේවකගේ සිත යට ය. පරිසරය පෙර තිබූ පරිදි ම සතුට පිරුණු සැහැල්ලුවේ ගිලී පැවතිණි.

සියල්ලන්ගේ ම වැඩිහිටියා වූ එඩ්වඩ් සිරිවර්ධන සිරිත් පරිදි ම කතා බහට මුල පිරුවේ ය.

"මම මේ කතාව මෙහෙම පටන් ගත්තෙ.. දැනටමත් අපි ඥාතියෝ බවට පත්වෙලා අවසානයි කියලා හිතාගෙන.. ඇත්ත ම කිව්වොත්.. සත්‍ය කතාවත් ඒකම තමයි.. පවුල් දෙකක් විවාහ පොරොන්දුවකින් බැඳෙනවා කියන්නෙ ම.. ඒ මොහොතෙ ඥාතීත්වයක් උපදිනවා.. මම කියන දේ හරි නේද..?"

සියල්ලෝ ම කිසිදු විරෝධයකින් තොරව හිස සැලුවේ, ගැඹුරින් සිතා බලන කල, සිරිවර්ධන මහතාගේ වදන් තුළ ගැබ්ව තිබුණේ සත්‍යයක් ම බැවිනි.

"හොඳයි.. එහෙනම් අපි කෙළින්ම අදාල කාරණාවට බහිමු.. අපේ පුතා අවුරුදු තුනක් තිස්සෙ මේ දුව ගැන බලාපොරොත්තු



The Reader's Place Novel

තියාගෙන කල් ගෙව්වා.. අවසානයේදී මේ දුවත් අපේ පුතා එක්ක විවාහ වෙන්න කැමති උනා.. අපේ පාර්ශවයෙන් බලෙ යෝජනාව ගෙනාව දවසෙ ඉඳන් මේ විවාහය නොකෙරෙන්න අඩුවකට තිබුණෙ මේ දුවගේ කැමැත්ත විතරයි.. දැන්.. ඒ අඩුවත් සම්පූර්ණයි.. ඒ විදියට කරුණු කරණා සම්පූර්ණ වෙලා තියෙද්දි, මේ විවාහය තවදුරටත් කල් දාන්න අපේ පැත්තෙන් නම් කිසිම හේතුවක් නෑ.."

එයින් මතු විවාහය සිදු කිරීමට අවශ්‍ය කාරණා දෙපාර්ශවයේ ම කිසිදු විසංවාදයකින් තොරව සාකච්ඡා වන්නට විය. අනුපමා, සියල්ල සිදුවන දෙස නිනව්වක් නොමැතිව ඔහේ බලා සිටියාය. වැඩිහිටියන් එක්ව විවාහය සඳහා සුදුසු කාල වකවානු පවා තීරණය කළහ. තීන්දු තීරණ සියල්ල ගැනුණේ දෙපාර්ශවයේම පූර්ණ එකඟතාවයෙනි. දෙහෝරාවකට ආසන්න කාලයක් වැඩිහිටියන්ගේ කතාබහට සවන් දෙමින්, අනුපමා එම කාලය ගත කළේ, පියවි ලොවින් අඩක් බැහැරව අර්ධ වශයෙන් නිර්විඳ්දනය වූවාක් වැනි ස්වභාවයකිනි. දේවක අතරින් පතර සංවාදය හා එක්වෙමින් ඔහුගේ අභිමතය හා රුචි අරුචිකම් ප්‍රකාශ කළ ද, අනුපමා එකදු වදනක් හෝ නොදොඩා මුනිවතින් ම පසු වූවා ය. ඒ මුළු කාලය පුරාම දේවකගේ දැස් බැල්ම මුළුමනින් ම වාගේ යොමුව තිබුණේ අනුපමා වෙතට ය.

වැඩිහිටියන්ගේ සාකච්ඡා වාරය.. අවසානය කරා ළඟා වී තිබිණි. දේවක - අනුපමා දෙදෙනාට අවසන් නිවේදනය ලැබුණේ ද ලොකු මාමාගෙන් ම ය.

"ඔන්න එහෙනම් වැඩිහිටි අපේ කතාබහ අවසානයි..





තීන්දුයි.. දැන් දුවටයි පුතාටයි දෙන්නටත් කතා කරන්න ගොඩක් දේවල් ඇතිනෙ.. එහෙනම් පුතයි දුවයි කතා කරන්න.."

වැඩිහිටියන් ඉවත ගියේ අනුපමාටත් - දේවකටත් නිදහසේ කතාබහට ඉඩ සලසා දෙමිනි. වැඩිහිටියන් සියල්ලෝ ම ආලින්දයෙන් ඉවත්ව ගිය පසු, දිගු වේලාවක් අපේක්ෂාවෙන් පසු වූ යමක් ඉටු වූ කලෙක මෙන් දේවක අනුපමා දෙස බැලුවේය. දේවකගේ සිත තුළ වූ හැඟීම් දැනුණාක් මෙන් අනුපමා මදහසක් නැගුවා ය.

"හරිම රස්නෙයි අනූ.. අපි එළියට යමුද..?"

දේවක එසේ විමසුවේ ගතට දැනුණු දාහයටත් වඩා, සිතට දැනුණු වෙහෙස නිවා ගන්නට ය.

"යමු එහෙනම්.."

අනුපමා ද දේවක අනුවම හිඳ උන් අසුනින් නැඟී සිටියා ය. දෙදෙනා ම විවෘත ආලින්දයෙන් පිටතට විත් මිදුලේ කොණක වූ අඹ ගස පාමුල ඉදිකර තිබූ ලී බංකුව දෙසට ඇවිද යන්නට වූවෝ ය. අනුපමාගේ පියාත්, දේවකගේ ලොකු මාමාත්, බාප්පාත් ගෙවත්තේ පොල් රුප්පාවෙන් සෙවණ වූ ඉසව්වේ ඇවිදිමින් සිටියහ.

"අම්මලා කුස්සිය පැත්තෙද අනූ..?"

දේවකගේ මුවින් පිටවූ කෙටි ආමන්ත්‍රණය තුළ වූ ආදරණීය බවින් අනුපමාගේ හදවත අලුත් ම රිද්මයකින් තිගැස්සිණි. ඇ, ඒ හැඟුම් මිහිරියාවන් සියල්ල සිත යට ම සඟවාගෙන හිස සැලුවා ය.



The Reader's Place Novel

"හැමෝම ඔයාට ගොඩක් ආදරෙයි නේද දේවක..?"

දේවක.. අනුපමා දෙස බැලුවේ වඩාත් ආදරණීය දැසකිනි.

"ඒගොල්ලො ඔයාටත් මට වගේ ම ආදරේ කරයි අනූ.. සමහරවිට කාලයක් යනකොට.. මටත් වඩා.. ඔයාට ආදරේ කරයි.."

අනුපමා නළල රැළි කළා ය.

"එහෙම වෙන්න පුළුවන්ද..?"

දේවක.. යළිත් හිනැහුණේ පෙර සෙනෙහස තැවරුණු සුපුරුදු දෑසිනි.

"ඔයාම තේරුම් ගන්න ඇතිනෙ අනූ.. මම අපේ අම්මගෙ විතරක් නෙමෙයි.. අපේ පවුලෙම පොදු දරුවෙක්.. ඒ කියන්නෙ හැමෝ ම මම ගැන හොයලා බලනවා.. අපි දෙන්නා විවාහ වෙනවා කියන්නෙ ඔයාටත් ඒ විදියට එයාලා අතරෙ පොදු දරුවෙක් වෙන්න වෙනවා.. ඒක අපේ ජීවිතවලට එයාලා කරන ඇහිලි ගැහීමක් කියලා හිතන්නෙපා අනූ.. ඒක එගොල්ලා අපිට දක්වන සෙනෙහස විදියට ම බාරගන්න.. ඔයා ගොඩක් දේවල් ගැන හොඳ අවබෝධයකින් ඉන්න ළමයෙක්.. ඒ හින්දා ඔයාට මේවා අලුතින් පැහැදිලි කරන්න උවමනා නැනෙ.. අනූට මම කියන දේ හොඳින් තේරෙනවනෙ..?"

රෝස මලක පෙති අතරේ අතැඟිලි දවටමින් උන් අනුපමා, දෑස් ඔසවා දේවක දෙස බැලුවාය. ප්‍රශ්නාර්ථයන් දහසක් ඇගේ සිත තුළ විණි ද, ඈ සිනාසෙන්නට උත්සාහ දැරුවා ය.

"අම්මයි අප්පච්චියි එක්ක පුංචි ලෝකයක් ඇතුළෙ ජීවත්



වුන මට.. ඒ ලොකු ලෝකෙ ජීවත්වෙන්න ඕන විදිය ඉගෙන ගන්න ටික කාලයක් යයි.. ඒකට මට ටිකක් කාලය දෙන්න දේවක.. කොහොම උනත්.. ඔයාගෙ බිරිඳ විදියට ඔයාගෙ ජීවිතේට ප්‍රශ්නයක් නොවෙන විදියට ජීවත්වෙන්න මම පුළුවන් තරම් උත්සාහ කරන්නම්.."

අනුපමාගේ හඬෙහි වූයේ පුදුමාකර අව්‍යාජ බවකි. ඇ පමණටත් වඩා අවිහිංසක යැයි දේවකට ඒ මොහොතේ දැනිණි. ඇයට අවංක විය නොහැකිව අසරණ වූ ඔහුගේ හදවතේ එක් ඉසව්වක් පමණක් විසල් පසුතැවිල්ලකින් රිදුම් දෙන්නට විය. එහෙත්, ඔහු අනුපමාට සිත යටින් අපරිමාණව ආදරය කළේය. ජීවිතයේ පළමුව, තැනට පැමිණි සෙනෙහස විනා, අන් සියලු කාරණා පසුව විසඳා ගැනීමට, සිතේ පසෙකට ම කර තබන්නට දේවක අසීරුවෙන් වුවත් තීරණය කළේ ය.

"ඔය මල් පෙතිවලට රිදෙයි අනූ.. පව්.. ඔය බේබි රෝස පොකුර අතැරලා ඇවිත් මෙතනින් වාඩිවෙන්නකො.. මේ බංකුව අඩි හයකට වඩා දිගයි.."

අනුපමා කිසිවක් නොකියා නිහඬව ම සිනාසෙමින් පැමිණ, දේවකට මදක් දුරස්ව ලී බංකුව මත හිඳ ගත්තා ය. දේවකගෙන් අසා විමසා දැන ගැනීමට අනුපමාගේ සිත තුළ දහසක් පැන නළියමින් තිබිණි.

"දේවක.. ඇත්තටම ඔයාට විවාහ වෙන්න මට වඩා හොඳ කෙනෙක් මුණ ගැහුණෙ නැද්ද.. මං අහන්නෙ.. මට වඩා හොඳ කෙනෙක්... සුදුසු කෙනෙක්..?"

දේවක යළිත් අනුපමා වෙත හෙලුවේ ආදරණීය බැල්මකි.



The Readers Place Novel

"අනූ.. හොඳකම, සුදුසුකම මේවා මනින මිනුම් දඬු මොනවද..? ඒ ප්‍රශ්නෙට අනූට උත්තරයක් දෙන්න පුළුවන් උනොත්.. මටත් අනූගෙ ප්‍රශ්නෙට උත්තරයක් ගොඩ නගා ගන්න පුළුවන් වෙයි.."

අනුපමා, නිරුත්තරව දෙපසට හිස සැලුවා ය. සැබැවින් ම දේවක විමසූ පැනයට දීමට උචිත පිළිතුරක් අනුපමා ළඟ නොවිණි.

"අනූ.. කවද හරි කාට හරි ආදරය කරලා තියෙනවද..?"

දේවක විමසූ සෘජු පැනයට අනුපමා හිස ඔසවා ඔහු දෙස බැලුවේ ද සෘජු දෑසිනි.

"අපි අවංකව හැමදේම කතා කරමු අනූ.. ඒක ලොකු ප්‍රශ්නයක් කියලා හිතන්නෙපා.."

අනුපමා, දේවකගේ ප්‍රශ්නයට එකහ වූ අයුරින් හිස සැලුවා ය.

"නෑ දේවක.. මම කිසිම පිරිමි ළමයෙකුට ආදරේ කරලා නෑ.. මට කවදාවත් ආදරවන්තයෙක් ඉඳලා නෑ.."

දේවක, අනුපමා දෙස බැලුවේ පෙරටත් වඩා වැඩි සෙනෙහසකිනි.

"අනූගේ ආදරේ දිනාගන්න උත්සාහ කරපු අය නම් ඉන්න ඇති ඕන තරම්..?"

අනුපමා අවිහිංසක ලෙස හිනැහුණා ය.

"අනේ නෑ දේවක.. එහෙම විශේෂ අය හිටියෙත් නෑ"





කැම්පස් යන කාලෙ නම් දෙතුන් දෙනෙක්ම මාව බලාපොරොත්තු උනා.. ඒත්.. ඒ එක තැනකවත් පැහැදිලි ආදරයක් තිබුණෙ නෑ. ඒ හින්දා මම ඒ හැම එකක්ම උවමනාවට වඩා කාලය නොගෙන ප්‍රතික්ෂේප කළා.."

වසර තුනක් මුළුල්ලේ අවස්ථා කිහිපයකදී ම අනුපමා පිළිබඳ ඇති තතු සොයා බලා, ඈ පිළිබඳ බොහෝ දෑ දැන සිටි ඔහුට, අනුපමා කියන කිසිවක් මහා අරුමයක් ලෙස දැනුණේ නැත.

"මට නම් ගර්ල් ෆ්‍රෙන්ඩ් කෙනෙක් හිටියා අනූ.. අවුරුදු දෙක හමාරක් අපේ සම්බන්ධය තිබුණා.."

අනුපමාගේ දෑසේ රැඳී තිබුණු සොඳුරු මන්දස්මිතය, ඒ මොහොතේ අතුරුදන්ව ගියේ දේවකගේ හඬෙහි ඇඳී තිබුණු බර නිසාවෙනි. එසේ නම් තමාට පිරවීමට සිදුවී ඇත්තේ, වරක් පිරී තිබී යළි හිස්වූ හදවතක් ද..? ඔහුගේ ලෝකය තුළ වන හිස්තැන කවරාකාරයේ විසල් හිස්තැනක්දැයි ඈ නොදැන සිටියාය. එහෙත්, ඈ සෘජුවම ඇගේ දෑස දේවකගේ දෑස වෙත එල්ල කළා ය.

"ඒ සම්බන්ධේ නැතිවෙලා ගියේ ඇයි කියලා දැනගන්න මට අයිතියක් තියෙනවද දේවක..?"

"ඇයි නැත්තෙ අනූ.. අපි මැරි කරනවා කියන්නෙ.. අපි දෙන්නගෙ ජීවිත බෙදා හදා ගන්නවා කියන එක.. අපේ ජීවිත ඇතුළෙ තියෙන සොඳුරු.. අඳුරු.. හැම අත්දැකීමක්ම බෙදා හදාගෙන අපි අපිට විවාහ වෙන්න ඕන.. එතකොට තමයි අපිට සාර්ථක විවාහ ජීවිතයක් ගත කරන්න හොඳ අඩිතාලමක් දාගන්න පුළුවන් වෙන්නෙ.. මම හරි නේද අනූ..?"



The Reader's Place Novel

පෙර මුහුණේ ඇඳී තිබුණු බරපතල පෙනුම වියැකී, ඒ මොහොතේ දේවකගේ මුහුණේ ඇඳුණේ මෘදු මදහසකි. අනුපමා ද මුවින් නොදොඩා පිළිතුරු උදෙසා හසරැල්ලක් පෑවාය.

"අනිත් හැමදේට ම කලින් මම ඒ ගර්ල් ගැන කියලා ඉන්නම්කෝ.. අපි දෙන්නත් ලෝ ෆැකල්ටි එකේ එකට ඉගෙන ගත්තෙ.. එයා ගොඩක් දුප්පත් පවුලකින් ආව ගැනු ළමයෙක්.. අපි යාළු උනේ ෆයිනල් ඉයර් එකේදි.. හැබැයි ඊට කලින් පස්සු ඉයර් එකේ ඉඳල ම අපි යාළුවෝ.. අනු විශ්වාස කරයිද මන්දා.. යාළුවෙක් විදියට එයාගෙ අධ්‍යාපන ජීවිතය පුරා ම මං එයාට ගොඩක් උදව් කළා.. ඒ දවස්වල උනත් මම මගේ පවුලේ සල්ලිවලින් කරන්න දෙයක් තිබුණෙ නෑ.. මම කළා පුළුවන් තරම් නැති බැරි ළමයින්ට උදව් කරපු එක.."

"කොයි තරම් උතුම් වැඩක්ද දේවක.. ඒ උපකාර සමහර විට ඒ උදව් ලැබුව අයගෙ මුළු ජීවිතේම.. අනාගතේම.. ගොඩ නගා ගන්න ලොකු අත්වැලක් වෙන්න ඇති. ඔයාට ඔය විදියට හැමදේම ලැබිලා තියෙන්නෙ ඔයා මේ ආත්මෙට කලින් ආත්මවල්වල ඒ වගේ හොඳ දේවල් කරලා එක් රැස් කරගත්ත කුසල් නිසාම වෙන්න ඇති.."

හදවතට පිවිසුණු නිර්ලෝභී ප්‍රශංසාව, අනුපමා කිසිදු පැකිළීමකින් තොරව එයාකාරයෙන් ම වචන බවට පත් කළා ය.

"තැන්ක්ස් අනූ.. ඔයා හරිම පිරිසිදු සිංහල වචනවලින් හරි අපූරුවට හිතක් හදන හැටි දන්නවා.. ඔයා කතා කරන විදියට මං ආසයි.."





දේවකගේ ප්‍රශංසාව ඉදිරියේ, අනුපමා නිහතමානී නසරැල්ලක් පෑවාය. දේවක යළි නැවතූ තැනින් කතාව ඇරඹුවේ ය.

"කොහොම හරි අවුරුදු තුනක් තිස්සෙ අපි අතර තිබුණ යාළුකම නොදැනුවත්වම ෆයිනල් ඉයර් එකේදි ආදරයකට පෙරළුණා.. මට ඉනින් ප්‍රශ්නයක් තිබුණෙත් නෑ නදීශා මගේ ජීවිතේට එකතු කරගන්න බැරිවෙන්න තරම්.. අපේ අම්මා.. පවුලෙ හැමෝම.. එයාට ගොඩක් ආදරේ කළා.. ඒත්.. කැම්පස් අවුට් වෙලා ඔත්ස් දිලා.. එයා ලෝයර් කෙනෙක් උනාට පස්සෙ.. තවදුරටත් එයා අර ගමකින් ආව අහිංසක ගැනු ළමයා නම් උනේ නෑ.. එයා හරිම ඉක්මනට ගොඩක් වෙනස් උනා.. පුදුම විදියට මිල මුදල්වලට ආස කරන්න පටන් ගත්තා.. කොටින්ම කිව්වොත්.. එයා මගේ වස්තුවේ දිග පළල මනින්නත් පටන් ගත්තා.."

අනුපමාගේ සිත කුමක්දෝ නොතේරුන ශෝකයකින් ඇලළී යන්නට විය.

"සල්ලි කියන්නෙ මිනිස්සුන්ගෙ ජීවිත පුදුමාකාර විදියට වෙනස් කරන සාධකයක් නම් තමයි දේවක.."

"ජීවත්වෙන්න ඇති ප්‍රමාණයට සල්ලි තියෙන මට.. මට ආදරය කරන කෙනෙක් මිසක්.. මගේ සල්ලිවලට.. ගේ දොර ඉඩකඩම්වලට.. වතු පිටි, යාන වාහනවලට ආදරේ කරන කෙනෙක්ගෙන් ඇති වැඩේ මොකක්ද..? එයාට පුළුවන් තරම් ලෝකෙ ජීවත්වෙන්න සුදුසු විදිය ගැන පැහැදිලි කරලා දෙන්න මම උත්සාහ කළා.. ඒත් වැඩක් උනේ නෑ.."



The Reader's Place Novel

අනුපමා, තමා නමක්, ගමක් හෝ නොදන්නා වුදිතයෙකුට එරෙහිව වචනයක් හෝ පවසන්නට නොසතුටු වූවා ය. එබැවිත් ඈ, දේවකට සාවධානව සවන් දෙමින්, නිහඬවම පසු වූවා ය. එහෙත්, අවසානයේදී දේවක හෙලූ දිගු සුසුමින් අනුපමා තිගැස්සුණා ය.

"ඇයි දේවක.. ඔයා ඒ ගෙවිලා ගිය අතීතෙ ගැන දුක් වෙනවද..? නදීශා මතක් උනාම ඔයාගෙ හිතට වේදනාවක් දැනුණද.?"

"වේදනාවක් නෙමෙයි.. ඒ දැනෙන හැඟීම හරි නීරස.. හිස් හැඟීමක් අනූ.. ඔය හැමදේටම වඩා.. වැඩිපුරම මම නදීශා ගැන කලකිරුණෙ.. එයා දරුවන්ට ආදරේ නොකරපු නිසයි අනූ.. අපේ අම්මලා.. නැන්දලා.. පුංචි අම්මලා.. දරු පැටියෙක් ගැන කියපු හැම වෙලාවක ම.. නදීශා ඒක බාරගත්තෙ මහ හිරිහැරයක් විදියට.. එයාගෙ වෘත්තිය තුළ එයා ස්ථාවර වෙනකල්.. අඩු තරමෙ බැඳලා අවුරුදු පහක්වත් යනකල්.. දරුවො හදමු කියලා එයාට කරදර කරන්න එපා කියලා එයා මට කෙළින් ම කිව්වා.. නදීශා ගැන මගෙ හිත බිඳුණෙ එදා අනූ.."

ඇය.. මොහොතින් සියල්ල ප්‍රත්‍යක්ෂ කර ගත්තා ය. දේවකගේ විවාහයෙන් මතු බිහිවන දරුවා.. ඔහුගේ පරපුරේ ම සුවිසල් ම අපේක්ෂාව වග ඈ වටහා ගත්තා ය. වෘත්තියෙන් ගුරුවරියක වීම නිසා නොව, ආධ්‍යාත්මයෙන් ම දරුවන්ට පණ සේ ආදරය කළ අනුපමා, දේවකගේ පරපුරේ ම අපේක්ෂාව, තමාගේ සකල විධ සුබ සිහින ඉටු කරනු ඇතැයි අපේක්ෂා දල්වා ගත්තා ය.

"දේවක.. මට ප්‍රශ්නයක් අහන්න තියෙනවා.."





අනුපමාගේ හඬ තුළ වූ පෞරුෂත්වයෙන් පිරි පැහැදිලි බව, දේවකගේ සිත පුදුමයෙන් පුරවාලී ය.

"අහන්න අනූ.. ඕනම දෙයක් අහන්න.. මාව මැරි කරන්න කැමති නෑ කියලා කියන්නෙ නැතුව.. වෙන ඕනම දෙයක් කියන්න මට.."

දේවකගේ ආයාචනය අනුපමාගේ දෑසට කඳුළු නැංවී ය.

"නෑ දේවක.. ඔයාට බලාපොරොත්තු දීලා ආපහු ගන්න තරම් දරුණු වෙන්න මට බෑ.. එහෙම කරන්න හේතුවකුත් මට නෑ.. මට අහන්න තියෙන්නෙ.. ඔයාට මම ගැන එහෙම අවිශ්වාසයක් නැද්ද..? මම ඔයාගෙ ධන සම්භාරයට ලෝබවෙයි.. දරුවෙක් හදන්න අකමැති වෙයි.. මේ වගේ බය ඔයාට කොයි වෙලාවකවත් දැනිලා නැද්ද..?"

දේවකගේ සිත තුළ වූයේ, ඇගේ දෑතින් අල්ලාගෙන ඔහුට ඈ ගැන දැනුණු, නැඟුනු ආත්මීය සහතිකය ඇයට දෙන්නට ය. එහෙත්, එවන් සමීප වීමක් උදෙසා ඔවුන්ගේ කාලය තිබුණේ ඔවුනට ඉදිරියෙනි.

"නෑ අනූ.. ආධ්‍යාත්මයෙන් ඔයා ගොඩාක් පිරිපුන් කෙනෙක් කියලා මම දන්නවා.. ඔයා අතින් කවදාවත් එහෙම වැරදීම් සිද්ධ වෙන්නෙ නෑ.. මට ඔයාව විශ්වාසයි අනූ.."



The Reader's Place Novel

# 05



කාලයයි.. තටු සලා ඉගිළ යමින් තිබිණි. දේවකගේත්, අනුපමාගේත් විවාහය සඳහා තවත් ඉතිරිව තිබුණේ හරියට ම මසක කාලයක් පමණි. එසේම, දියණියගේ විවාහයෙන් සතියකට පසු වර්ණවීර යුවළ විදේශගත වීමට ද සියල්ල සූදානම් වෙමින් තිබිණි. නැවතීමක් නොමැතිව, වේගයෙන් ඉදිරියට ගලා යන ජීවිතය, අනුපමා උපේක්ෂාවෙන් බාර ගත්තා ය. දින නියමයක් නොමැතිව රට හැර යන මවටත්, පියාටත් තමා ගැන සිතෙහි රඳවා ගත් කිසිදු බරකින් තොරව, නික්ම යාමට ඉඩ සලසා දීම ඇගේ පරම අභිලාෂය විය. ඈ, කිසිදු දෙගිඩියාවකින් තොරව දේවකගේ ලෝකයේ පවුරු බැඳ ගත්තා ය.

විවාහය සඳහා අවශ්‍ය මූලික කටයුතු සියල්ල නිම කෙරුණේ දේවකගේ පාර්ශවයෙනි. අනුපමාගේ මව සහ පියාගෙන් අදහස් විමසුවා විනා, ඔවුහු වර්ණවීර යුවළ කිසිවක් වෙනුවෙන් වෙහෙස කරවූයේ නැත.





"අක්කටයි අයියටයි ඉන්නෙ මේ දුව විතරයි වගේම අපේ පවුල් දෙක තුනටම ඉන්නෙත් අපේ පුතා විතරයි.. ඒ නිත්දා. අක්කයි අයියයි හිතේ නිදහසේ පිටරට ගමනට ලැස්ති වෙන්න.. මගුල් ගෙදර වැඩ කටයුතු සේරම අපි බලා ගන්නම්..."

වර්ණවීර යුවළට ඒ පිළිතුර ලැබුණේ දේවකගේ බාප්පාගෙනි. ඊළඟ ඉරු දිනයේ දේවක පැමිණියේ අනුපමා නිවසින් පිටතට කැඳවාගෙන යාමට ය. එම ගමනට අරමුණ වූයේ විවාහයට පෙර අනුපමාට උවමනා ස්වර්ණාභරණ මිලදී ගැනීම ය. අනුපමා ගමනට සූදානම් වූයේ මදක් පසුගාමී ලෙසිනි. වර්ණවීර මහත්මිය තම දියණියගේ වෙනස වටහා ගත නොහැකිව මදක් ඇගේ මුහුණ දෙසම බලා සිටියා ය. අනුපමා, කඳුළු පිරි දැසින් මොහොතක් ඇසි පිය පවා නොසලා තම මව දෙසම බලා හිඳ, එදින උදෑසන මව තමා වෙත ලබා දුන් මුදල් දැමූ කවරය යළි තම මව අත තැබුවා ය.

"චූටි දුව.. ඇයි පුතේ මේ..? සල්ලි ටික ආපහු දෙන්නෙ ඇයි..?"

"දේවකගෙ අම්මා සේරම රත්තරන් බඩු අරන් තියලලු තියෙන්නෙ අම්මා.. මගෙ මඟුල් මුද්ද විතරමලු ආයෙ ගන්න තියෙන්නෙ.. මේ සල්ලි එපාලු.."

"දේවක පුතා එහෙම කිව්වද..?"

රුපියල් ලක්ෂ දෙකක් වටිනා දහසේ මුදල් නෝට්ටු මිටිය ද රැගෙන, වර්ණවීර මහත්මිය ආලින්දය දෙසට ගියේ උග්‍ර ප්‍රශ්නාර්ථයක් ළය දරාගෙන ය. ආලින්දයේ අසුනකට බරව්,



The Reader's Place Novel

අනුපමා සුදානම්ව පැමිණෙන තෙක් පුවත්පතක තොතු රඳවාගෙන උන් දේවක අසලට ඈ පැමිණියේ දෙගිඩියාව විඳිමින් නොසැහෙන සේ තලා පෙළා දමන සිතකිනි.

"පුතේ.."

දේවක, මද සිනා මුසු මුහුණින් යුතුව, අනුපමාගේ මුව දෙස හිස ඔසවා බැලුවේ ය.

"ඇයි අම්මෙ..?"

අනුපමාගේ මව අත වූ මුදල් නෝට්ටු මිටිය, හිස මඟවා බලන දේවකගේ දෑසට හසුවිය. වර්ණවීර මහත්මියගේ පැතිය දේවක හඳුනා ගත්තේ ය.

"සල්ලි එපා අම්මෙ.. සල්ලි තියෙනවා.."

"මං දන්නවා පුතේ.. පුතා ගාව සල්ලි තියෙනවා තමයි.. ඒත් මේවා අපේ යුතුකම් පුතේ.."

දේවක, අනුපමාගේ මව වෙත හෙලුවේ කරුණාව පුරවාගත් බැල්මකි.

"ඒවා යුතුකම් විදියට ඉෂ්ට වෙන්න ඕන මගෙ ළඟ මොනවත්ම නොතිබුණා නම් අම්මෙ.. අනුපමාට ඕන කරන හැමදේම මගේ ළඟ තියෙද්දි.. අම්මලා ඒවා ගැන කරදර වෙන්න ඕන නෑ.."

අනුපාමගේ මව, දේවක දෙස බැලුවේ ආයාවනාත්මක දෑසිනි.





"දෙමව්පියන්ට තියෙනවා නම් දරුවන්ට යමක් දුන්නට කමක් නැනෙ පුතේ.. අපි මේ සල්ලි ටික ටිකෙන් ටික එකතු කළේ අපේ දුව කසාද බඳින දවසක එයා වෙනුවෙන් පුළුවන් හැටියට යුතුකම් ඉෂ්ට කරන්න.. පුතාට තිබුණට කමක් නෑ.. අපේ දරුවා වෙනුවෙන් අපිටත් පුංචි දෙයක් හරි කරන්න ඉඩ දෙන්න.. ලොකු දෑවැදි දෙන්න නම් අපිට වත්කමක් නෑ පුතේ.."

දේවක, අනුපමාගේ මව දෙස යළිත් බැලුවේ කරුණාව උතුරන දෑසිනි.

"හොඳ දුවෙක් හදලා ලෝකෙට දෙන කිසිම අම්මා කෙනෙක් තාත්තා කෙනෙක් දෑවැදි දෙන්න ඕන නෑ අම්මෙ.. හොඳ බිරිඳක් ලැබෙනවා කියන්නෙ ම පිරිමියෙකුට ලැබෙන වටිනාම දෑවැද්ද තමයි.. මම අනූගෙ අම්මගෙනුයි අප්පච්චිගෙනුයි අනූ වෙනුවෙන් කිසිම දෙයක් බලාපොරොත්තු නොවෙන්නෙ.. මට අනූ ඇරෙන්න වෙන කිසිම දෙයක් උවමනා නැති හින්දා.."

දේවකගේ ආත්මීය හඬ අනුපමාගේ මවට දරා, අසා හිඳින්නට බැරි තරමට සුසංවේදී විය. දේවකගේ මුවින් වචන බවට පත්වී වැහිරෙන්නේ ඔහුගේ සැබෑ අව්‍යාජ ආත්මය නම්, තමා තරම් වාසනාවන්ත මවක් තවත් නම් ලොව නොවන බව වර්ණවීර මහත්මිය සිහි කළේ හද පිරී ඉතිරී යන තරමේ සෙනෙහසකිනි.

"හතර වතාවක්ම මඟ ඇරිලා.. අන්තිමේදි ආයෙමත් අනූව මූණ ගැහුණ දෛවය ඇතුළෙ.. මොකක්දෝ හාස්කමක් තියෙනවා අම්මෙ.. වස්තු තණ්හාවක් හිතේ නැති මං.. මිල මුදල් වගේ දේවල් ඉස්සර කරගෙන ඒ හාස්කමේ බල බිඳගන්න කැමති



The Readers Place Novel

"ඇවිල්ලා නම් ටිකක් වෙලා අප්පච්චි.. මම එනකොට අනු ඉස්කෝලෙ වැඩක් කර කර හිටියේ.. ඒක ඉවර වෙලාම ලෑස්ති වෙන්න කියලා.. මම පත්තරේ බැලුවා.. අනු ලෑස්ති හින්දා අපි ටවුන් එකට ගිහිල්ලා එන්නම් අප්පච්චි.. දවල්ට කාලා යන්නම්කෝ.. අම්මයි අප්පච්චියි රට ගියාට පස්සෙ දෙන්නා එකතු වෙලා උයන රස කෑම අපිට ආයෙ කවදා කන්න ලැබෙයිද දන්නෙත් නැනෙ.. ඒ හින්දා.. මම ඉස්සරහට තියෙන නිවාඩු දවස් ටිකේ ම එන්නම්කෝ අම්මයි අප්පච්චියි උයන ඒවා කාලා යන්න.."

දේවක.. එතරම් සරල, සුන්දර මිනිසෙකු යැයි වර්ණවීර පවුලේ කිසිවෙකුත් එතෙක් කිසිවිටෙක සිතා සිටියේ නැත. ඔහුගේ නිර්ව්‍යාජ හැසිරීම වර්ණවීර පවුලේ තිදෙනාගේ ම සිත් ගත්තේ ය.

"එහෙනම් පුතාලා ප්‍රමාද නොවී ගිහිල්ලා එන්නකෝ.. අපි පුතාට රසට උයලා තියන්නම්.. පුතා ආස දෙයක් තියෙනවා නම් කියන්න.. මට ආපහු ගිහිල්ලා හරි ගේන්න පුළුවන් පුතේ.."

වර්ණවීර මහතාගේ පිතෘ සෙනෙහස දේවකගේ හදවත සැනසීමෙන් පුරවාලී ය.

"එහෙම විශේෂයෙන් කැමති විශේෂයෙන් අකමැති කෑම කියලා දේවල් නෑ අප්පච්චි.. අහුවෙන දෙයක් කනවා.. ඒත් ඉතින්.. මස් මාළු උයන්න නම් කරදර වෙන්නෙපා අම්මෙ.. ඒවට වැඩි ප්‍රියක් නෑ.."

වර්ණවීර පවුලේ තිදෙනා ම උනුන් මුහුණ බලා ගත්තේ





නෑ.. පිටරට ගියාම එහෙ ඉන්න ටික කාලෙට අක්කට කරදර නොකර අම්මගෙයි අප්පච්චිගෙයි පුංචි පුංචි දේවල් කරගත්ත සල්ලි ටිකක් ළඟ තියාගන්න ඕනනෙ.. ඔය සල්ලි ටික අනුර දුන්නා කියලා හිතාගෙන මම කියන හින්දා අම්මයි අප්පච්චියි තියාගන්නකෝ.. අනුට ඕන වෙයි කියලා හිතෙන හැම දෙයක්ම අපේ අම්මා දැනටමත් ලෑස්ති කරලා තියෙන්නෙ.. ඒ හින්දා.. අම්මා කිසිම දෙයක් ගැන හිතේ බරක් තියාගන්න එපා.."

දේවක, ඒ සියල්ලම කීවේ අනුපමාගේ මවගේ මුහුණ දෙස සෘජුව ම බලාගෙන ය. ඔහුගේ දෑස තුළ ලියැවී ඇති කිසිදු රැවටිල්ලක් වර්ණවීර මහත්මිය නොදුටුවා ය. ගමනට සුදානම්වූ පැමිණි අනුපමා ද මවගේත්, තම අනාගත සැමියාගේත් සංවාදයට ඇහුම්කන් දුන් බවක් දෙදෙනා ම නුදුටුවෝ ය. උදයෙන්ම සුදු පොළට පිටත්ව ගිය වර්ණවීර මහතා ද ආපසු නිවසට පැමිණියේ ඒ මොහොතේ ය. දේවක පැමිණෙන බව කල් තියා දැන සිටි බැවින් දේවකගේ පැමිණීම ඔහුට පුදුමයක් නොවිණි ද, තම බිරිඳ, දියණිය සේ ම අනාගත බෑණනුවන් යන තිදෙනා අතර පැතිර පැවති නිහැඬියාව ඔහුගේ සිත පුදුමයට පත් කළේ ය. එහෙත්, සිනාමුසුව දේවක දෙස බැලූ වර්ණවීර මහතා, ඒ පුදුමය දේවකගෙන් සඟවා ගත්තේ ය.

"පුතා දැන්ද ආවෙ..? පුතා එනවා කිව්ව හින්දා මම අද කලින් ම පොළට ගිහිල්ලා ඉක්මනට ආපහු ආවා.. පුතා දවල්ට කාලා යන්න ඉන්නවනේ.."

දේවක, වර්ණවීර මහතා වෙත ද සෙනෙහස සහිත හසරැල්ලක් නිළිණ කළේ ය.



The Reader's Place Novel

දෙවක කියූව විශ්වාසයට ගත නොහැකි පුදුමයෙනි. වර්තමාන
සමාජයේ දෙවක වැනි තරුණයන් දුලබ බව ඔවුහු දැන සිටියෙ
ය. මුවින් පිටවන වචනවලට වඩා ඔවුන්ගේ සිත් තුළ පැවතියෙ
හැකිම් ය.

"එහෙනම් කවත් ප්‍රමාද නොවී ගිහිල්ලා එන්න පුතේ.."

අනුපමාගේ මව අත වූ මුදල් කවරය තම සැමියාට දැක්වූයේ
ඒ මොහොතේ ය.

"ඇයි සුභා මේ..?"

"දුවට ජුවෙලරි ගන්න දුන්න සල්ලි මහත්තයා.."

වර්ණවීර මහතා මොහොතින් සියල්ල වටහා ගත්තේ ය.

"ඇයි පුතේ.. මේවා අපි දුවට දෙන්න හිටපු දේවල්.. අපි
සන්තෝසෙන් දෙන දේ සන්තෝසෙන් බාරගන්න පුතේ.."

දෙවක, අනුපමාගේ පියා දෙස බැලුවේ අතිශය තීරණාත්මක
දැසිනි. එහි අප්‍රමාණ සෘජු බවක් සේ ම මෘදු බවක් ද තැවී
තිබිණි.

"එපා අප්පච්චි.. මේ සල්ලියි.. තව අනූට දෙන්න කියලා
හිතාගෙන තියාගෙන ඉන්න තවත් සල්ලියි තියෙනවා නම් ඒ
සේරම අම්මයි අප්පච්චියි ඕස්ට්‍රේලියාවල ජීවත්වෙන කාලේ
ප්‍රයෝජනයට ගන්න තියාගන්න.. අනූට ඕන කරන සේරම
දේවල් දැනටමත් අපේ ගෙදරින් ලැස්ති කරලා ඉවරයි.. තොද
දුවෙක් විදියට අනූව හදපු එක තමයි අනූ වෙනුවෙන් අම්මයි
අප්පච්චියි දීපු හොඳ ම දෑවැද්ද.. ඒ හොඳ රැකගෙන ජීවි





කාලෙ ම ජීවත්වෙන එක තමයි ඒ දෑවැද්දෙ තියෙන ලොකු ම
වටිනාකම අම්මෙ.. අනූ ඒ ටික කරයි කියලා මම විශ්වාස
කරනවා.. ඒ වෙනුවෙන් මම අනූ වෙනුවෙන් මගෙ ජීවිතේ ඕන
ම දෙයක් කැප කරනවා අප්පච්චි.."

දෙවක ඒ මොහොතේ අනුපමාගේ මාපියන් ඉදිරියේ තැබුවේ
තරුණයෙකු පහසුවෙන් තබන පොරොන්දුවක් නම් නොවේ.
ආදරයෙන් බැඳී කාලයක් පසු වූ යුවළක් නම් ඒ වදනක් ගානේ
ම විශ්වාස කිරීමට සාධාරණ හේතු තිබිය හැකිව තිබිණි.
එහෙත් යෝජිත විවාහයක් හමුවේ, එතරම් සොඳුරු ප්‍රාර්ථනා
ගොනු කර ගැනීම කෙතරම් නම් සාධාරණදැයි අනුපමා කල්පනා
කළේ, අවිනිශ්චිත හැඟුම් සමුදායක් සමගිනි.

යළිත් සිවි දෙනාගේ එක් අයෙකු හෝ මුදල් පිළිබඳව
වචනයක් හෝ කතා නොකළහ. අනුපමා.. තම මවගේත්,
පියාගේත් දෙපා නැමදුවා ය. දෙවක ද ඒ අනුව ම හිඳ උන්
අසුනින් නැගිට අනුපමාගේ මාපියන්ගේ දෙපා වැන්දේ ය.
දෙවක, වර්ණවීර නිවසෙන් පිටතට පැමිණියේ අනුපමා පෙරටු
කරගෙන ය.

"අපි ගිහින් එන්නම් අම්මා.. අප්පච්චි ගිහිල්ලා එන්නම්.."

"හොඳයි පුතේ.. පරිස්සමින්.."

අනුපමාගේ සමුගැනීමට පිළිතුරු දිය යුතු අන්දම වර්ණවීර
යුවළ නොදැන සිටියහ. ජීවිතයේ පළමු වතාවට තරුණයෙකු
සමග පිටව යන තම බාල දියණිය දෙස මාපියන් බලා සිටියේ
කඳුළු වැකුණු දෑසිනි. නුදුරේදී ම දිනයක ඒ තරුණයාගේ අත



The Reader's Place Novel

යෙන. තම් දියණිය සඳහට ම තමාගේ ලෝකයෙන් ඒකම ඇත ඛඩ දැනී. ඔවි-ඉය දෙදෙනාගේ ම ළය රිදුම් දෙන්නට දිලිදු පෙර කිසිදා අත් නොවිඳි වේදනාවකිනි.

දේවකගේ ස්‍රඛෝපනෝයි ටොයෝටා එලියොත් රථයේ ඔදිදු වම් පස අසුනේ ගමන් කිරීම අනුපමාට පහසුවක් වුයේ නැත. තමාගේ තරල, සුගම දිවි පෙවෙත මතට කඩා වැටුණු අදිසි දෙවය රැගෙන ආ ජීවිතය පමණට වඩා ඛර යැයි ඇගේ ඇතුළු ළය ඇයට පුන පුනා සිහි කර දෙන්නට විය. මහ මඟ දිවෙන බස් රථයක පොදු ජනයා සමග එකට වැටී යනෙන ගමන තරම්, දේවකගේ මෝටර් රථයේ නැඟී යන ගමන ඇගේ සිතිවිලි ලෝකයට සොඳුරු ලෙස දැනුණේ නැත. ඇයට දැනුණේ මහ පොළොව සමග බද්ධ වී ජීවත් වූ තමාගේ ලෝකයේ මුල් හදිසියේ උදුරා දැමුවාක් වැනි අසරණ හැඟීමකි.

"අනූ.. ඇයි..?"

දේවක විමසුවේ සෙමෙන් ඉදිරියට ඇදෙන මෝටර් රථය තුළ ගතින් තමා අසලම අසුන් ගෙන සිටියත්, සිතින් බොහෝ දුර ගමන් කර නිදි අනුපමාගේ කල්පනාවලිය දරාගත නොහැකි ම වූ තැන ය.

"දේවී.. මගෙන් ඇයි කියලා ඇහුවෙ.. මොකක් අදහස් කරගෙනද..?"

"අනූ මොනවද ඔය තරමට ම කල්පනා කරන්නෙ..? අපි මැරි කරන්නත් තියෙන්නෙ හරියටම මාසයයි.. ඉතින්.. දැන් මාවත් ඔයාගෙ කරගන්න.. හරි නම් දැන්.. ඔයාගෙ ලෝකෙ ලොකු ම ඉඩ කඩ වෙන් වෙන්න ඕන මම වෙනුවෙන්.. එහෙම





නේද..? තනියම කල්පනා කරන්නෙපා.. හිතට දැනෙන හැමදේම මාත් එක්ක බෙදා ගන්න අනූ.."

අනුපමා, දේවක වෙත සොඳුරු මදහසක් පෑවා ය. ඒ සිනාව තුළ වූයේ වර්තමාන කාරුණ්‍යය තුළ නොවන තරමේ අවිහිංසක බවකි. ඈ, කිසිදු දෙගිඩියාවකින් තොරව ඇගේ හදවතට දැනුණු නිර්ව්‍යාජ ම හැඟීම් වචන බවට පත් කළාය.

"දේවී.. බස් එකේදි යන ගමන වගේ.. ඔයාගෙ වෙහිකල් එකේ.. දොර ජනෙල් වහගෙන මුළු ලෝකෙන් ම හැංගිලා වගේ මේ යන ගමන.. මගේ හිතට පහසු නෑ.. මම මීට කලින් කවදාවත් ම මෙහෙම ගිහිල්ලත් නෑ.. මේ වගේ ගමනක් යන අදහසක්වත් කවදාවත් මට දැනිලත් නෑ.. ඒ හින්දා මේ ගමන මගෙ හිතට ගොඩක් ලොකු බරක් විදියට දැනෙනවා දේවි.."

වස්තු කාමයෙන් නොපෙළෙන්නෝ මෙලොව ජීවත් වනුයේ අල්ප වශයෙනි. තමාගේ අනාගත සහකාරිය ද එම අල්ප වූ මිනිස් කුලයේ උත්තම ගණයේ ගැහැනියක වීම පිළිබඳව දේවකගේ සිත තුළ උපන්නේ අසීමිත ගෞරවාදරයකි. දේවකගේ දෙතොල පුරා පැතිරී තිබුණේ අතිශය ආදරණීය හඬරැල්ලකි.

"ඔයා.. නිදහස් කිරිල්ලියක් කියලා.. මං දන්නවා අනූ.. ඔයාගෙ ඔය හිතේ තියෙන පැහැල්ලු පියාපත් කඩලා දාලා.. ඔයාව කූඩු කරලා හිර කරන්න මං කවදාවත් උත්සාහ කරන්නෙ නෑ.. ඔයා ඉස්සර වගේ ම.. ඉස්කෝලෙ යනකොට.. බස් එකේ යන්න.. ඔයා ආස කරන කිසිම දෙයක් මං හින්දා වෙනස් කරන්න ඕන නෑ අනූ.. ඒ හැම දෙයක් ම ඔයාගෙ ආදරේ වෙනුවෙන් මගෙන් ලැබෙන පුංචි පුංචි තෑගි කියලා හිතාගන්නකො.."



The Reader's Place Novel

ගෙන, තම දියණිය සඳහට ම තමාගේ ලෝකයෙන් නික්ම යන බව දැනී, මව්-පිය දෙදෙනාගේ ම ළය රිදුම් දෙන්නට වූයේ පෙර කිසිදා අත් නොවිඳි වේදනාවකිනි.

දේවකගේ සුඛෝපභෝගී ටොයෝටා ඵලියොත් රථයේ ඉදිරි වම් පස අසුනේ ගමන් කිරීම අනුපමාට පහසුවක් වූයේ නැත. තමාගේ සරල, සුගම දිවි පෙවෙත මතට කඩා වැටුණු අදහස් දෙවය රැගෙන ආ ජීවිතය ඊමණට වඩා බර යැයි ඇගේ ඇතුළු ළය ඇයට පුන පුනා සිහි කර දෙන්නට විය. මහ මග දිවෙන බස් රථයක පොදු ජනයා සමග එකට වැටී යනෙන ගමන තරම්, දේවකගේ මෝටර් රථයේ නැගී යන ගමන ඇගේ සිතිවිලි ලෝකයට සොඳුරු ලෙස දැනුණේ නැත. ඇයට දැනුණේ මහ පොළොව සමග බද්ධ වී ජීවත් වූ තමාගේ ලෝකයේ මුල් හදිසියේ උදුරා දැමුවාක් වැනි අසරණ හැඟීමකි.

"අනූ.. ඇයි..?"

දේවක විමසුවේ සෙමෙන් ඉදිරියට ඇදෙන මෝටර් රථය තුළ ගතින් තමා අසලම අසුන් ගෙන සිටියත්, සිතින් බොහෝ දුර ගමන් කර හිඳි අනුපමාගේ කල්පනාවලිය දරාගත නොහැකි ම වූ තැන ය.

"දේව්.. මගෙන් ඇයි කියලා ඇහුවෙ.. මොකක් අදහස් කරගෙනද..?"

"අනූ මොනවද ඔය තරමට ම කල්පනා කරන්නෙ..? අපි මැරි කරන්නත් තියෙන්නෙ හරියටම මාසයයි.. ඉතින්.. දැන් මාවත් ඔයාගෙ කරගන්න.. හරි නම් දැන්.. ඔයාගෙ ලෝකෙ ලොකු ම ඉඩ කඩ වෙන් වෙන්න ඕන මම වෙනුවෙන්.. එහෙම





නේද..? තනියම කල්පනා කරන්නෙපා.. හිතට දැනෙන හැමදේම මාත් එක්ක බෙදා ගන්න අනූ.."

අනුපමා, දේවක වෙත සොඳුරු මදහසක් පෑවා ය. ඒ සිනාව තුළ වූයේ වර්තමාන තාරුණ්‍යය තුළ නොවන තරමේ අවිහිංසක බවකි. ඈ, කිසිදු දෙගිඩියාවකින් තොරව ඇගේ හදවතට දැනුණු නිර්ව්‍යාජ ම හැඟීම් වචන බවට පත් කළාය.

"දේව්.. බස් එකේදි යන ගමන වගේ.. ඔයාගෙ වෙනිකල් එකේ.. දොර ජනෙල් වහගෙන මුළු ලෝකෙන් ම හැංගිලා වගේ මේ යන ගමන.. මගේ හිතට පහසු නෑ.. මම මීට කලින් කවදාවත් ම මෙහෙම ගිහිල්ලත් නෑ.. මේ වගේ ගමනක් යන අදහසක්වත් කවදාවත් මට දැනිලත් නෑ.. ඒ හින්දා මේ ගමන මගෙ හිතට ගොඩක් ලොකු බරක් විදියට දැනෙනවා දේව්.."

වස්තු කාමයෙන් නොපෙළෙන්නෝ මෙලොව ජීවත් වනුයේ අල්ප වශයෙනි. තමාගේ අනාගත සහකාරිය ද එම අල්ප වූ මිනිස් කුලයේ උත්තම ගණයේ ගැහැනියක වීම පිළිබඳව දේවකගේ සිත තුළ උපන්නේ අසීමිත ගෞරවාදරයකි. දේවකගේ දෙතොල පුරා පැතිරී තිබුණේ අතිශය ආදරණීය හසරැල්ලකි.

"ඔයා.. නිදහස් කිරිල්ලියක් කියලා.. මං දන්නවා අනූ.. ඔයාගෙ ඔය හිතේ තියෙන සැහැල්ලු පියාපත් කඩලා දාලා.. ඔයාව කූඩු කරලා හිර කරන්න මං කවදාවත් උත්සාහ කරන්නෙ නෑ.. ඔයා ඉස්සර වගේ ම.. ඉස්කෝලෙ යනකොට.. බස් එකේ යන්න.. ඔයා ආස කරන කිසිම දෙයක් මං හින්දා වෙනස් කරන්න ඕන නෑ අනූ.. ඒ හැම දෙයක් ම ඔයාගෙ ආදරේ වෙනුවෙන් මගෙන් ලැබෙන පුංචි පුංචි තෑගි කියලා හිතාගන්නකො.."



The Reader's Place Novels

පුදුමාකාර සංයමයකින් සපිරුණු දේවකගේ වදන් අනුපමා අසා සිටියේ අදහා ගත නොහැකි දෙසවතෙනි. ඔහුගේ සෙනෙහසේ අසිරිමත් බව විසින් ඇගේ දෑස කඳුළින් තෙත් කොට තිබිණි.

"නිදහස කියලා කියන්නෙ.. බිරිඳකට ලැබෙන පුංචි තැග්ගක් නෙමෙයි දේව.. නිදහස කියලා කියන්නෙ කෙනෙකුගෙ මුළු ජීවිතේ ම වෙන්න පුළුවන්.. ඔයාගෙ හිත රම්‌ තරම්‌ පරිත්‍යාගශීලිද කියන එක නම්‌ මට කාමත් අදහගන්න අත්තට ම බෑ දේව.."

දේවක, අනුපමා දෙස බැලුවේ සසැලෙන දෑසිනි.

"දැන් ම කිසිම දෙයක්‌ ගැන තීරණ ගත්තොත් ඔයාගෙ ජීවිතේට ඉඩ දෙමු.. අපි කොච්චර පරිත්‍යාගශීලී ද කොච්චර ආත්මාර්ථකාමී ද කියලා හැබෑ ජීවිතේට මුණ දෙන්නේ තීරණයක්‌ කරන්න බෑ අනු.."

දේවක කියූ කිසිවක අගක්‌ මූලක්‌ අනුපමාට අනුමාන කර ගත නොහැකි වූයේ, රිය ගම්‍යෝත්තයට ළඟා වී තිබුණු බැවිනි. ඇයට කිසිවක්‌ විමසා, පහදා ගැනීමට ඉඩක්‌ ඉතිරි නොකර ම දේවක ඇයට රියෙන්‌ බැසීමට ආරාධනා කළේ ය.

"බහින්න අනු.."

ඈ, නිහඬව ම හිස සලා රියෙන්‌ බැස ගත්තා ය. මාපියන් සමග හුදෙකලාවේ ගත කළ සරල, සුන්දර හුදෙකලා ජීවිතයට වඩා බෙහෙවින්‌ ගැඹුරු, සංකීර්ණ ලෝකයක්‌ තමා අබිමුවට පැමිණ ඇති වග අනුපමා ඉවෙන්‌ මෙන්‌ හඳුනා ගත්තාය. අව්වාහකව දිවි ගෙවන තමා කෙරෙහි මාපියන්ගේ සිත් තුළ





වන අපරිමාණ බරෙන්‌ ඔවුන්‌ දෙදෙනා නිදහස්‌ කිරීමේ පරම අභිලාෂය විනා, දේවකගේ පරපුර හා පැහීමේ මහා පරිමාණ උවමනාවක්‌ අනුපමාගේ සිත තුළ ඒ වන විට ද පිළිසිඳ නොතිබිණි. තමා එතෙක්‌ කල් ලෝකය දුටු හැඟීම් දැනීම් සමුදායට අනුව, ඉතාම කෙටි කාලයකින්‌ තමා තල්ලු වී යන අලුත් ලෝකය තමාගේ හදවතට බර වැඩි වග අනුපමා වටහා ගෙන සිටියා ය.

"අනු.. ඔන්න එතනට ගියාට පස්සෙත්‌ මේ වගේ කල්පනා කර කර ඉන්නෙ නැතුව ජුවෙලරි තෝරන්න ඕන නොදද..?"

දේවකගේ වදන්, අභිනයන්, සිනාවන්‌ ආදී වූ මේ සියල්ලෙහි තැවරී තිබුණේ, කුඩා දියණියකට අවවාදයක්‌ දෙන ආදරණීය පියෙකුගේ ගති ස්වභාවයන්‌ ම ය. අනේක විධ අවිතිඛ්චිත කල්පවලි අතරේ දෝලනය වන සිත එකඟ කර ගැනීමට අනුපමාට අත්‍යන්තර අරගලයක නිතර වීමට සිදුවී තිබිණි. දැවැන්ත ලෝකයක්‌ තනි උරුමක්කරුවා වූ දේවක වැනි තරුණයකු, තමා වැනි අතිශය සාමාන්‍ය ලෝකයක ජීවත්වන තරුණියකගේ අත පැහීම ම අභාව්‍ය අවස්ථාවක්‌ බව ඇගේ බුද්ධිය විසින් විටින්‌ විට සිහි කැඳවමින්‌ සිටිණි. එහෙත්‌, ඒ මොහොතේ චිත්ත අභ්‍යන්තරයේ වන සියලුම නැඹුම් පසෙක ලා, අනුපමා, දේවක වෙත සැහැල්ලු නසරැල්ලක්‌ පැවිය.

"අනු අඳින්නෙ කලර්ෆුල් ඇඳුම්.. ඔයාගෙ ස්කින්‌ කලර් එකත්‌ එක්ක ඒ පාටවල් හරි ම ලස්සනයි අනු.. මේ ඇත්තමයි මම කියන්නෙ.."

"තැන්ක්ස්‌ දේව්.. ඒත්‌ මේ ඇඳුම් තෝරන්නෙ මම නෙමෙයි..



The Reader's Place Novel

මේවා අපේ අම්මා මට ගෙනල්ලා දෙන ඇඳුම්.. අපේ අම්මා කියනවා ගෑනු ළමයි ගෑනු ළමයි විදියට ඉන්න කාලෙ මල් වගේ.. සමනල්ලු වගේ.. දේදුනු වගේ.. ලස්සනට ඉන්න ඕනලු.. කසාද බැඳලා දරුවො හැදුවට පස්සෙ ඉබේම ගෑනු අයට තමන් ලස්සනට ඉන්න ඕන කියන එක අමතක වෙනවලු දේවි.. ඊට පස්සෙ එයාලා කරන්නෙ තමන්ව අමතක කරලා තමන්ගෙ සැමියගෙයි දරුවන්ගෙයි ජීවිත ලස්සන කරන එකලු.."

ඉන් ඔබ්බට කතා කර ගත නොහැකි තරමට අනුපමාගේ කට හඬ සේ ම දැස ද බිඳිණි. තමාගේ ආදරණීය මව කෙරෙහි ඇගේ හදවත තුළ උපන් අකලංක කෘතවේදී ගුණය, මව් සෙනෙහසේ මහිමයෙන් ඇගේ හඬ නිහඬ කොට, දැසට කඳුළු කැඳවා තිබිණි. දේවක, ඒ මොහොතේ පළමු වතාවට, පාරමී පුරා තමා හිමි කර ගත් යුවතියගේ අතකින් අල්ලා ගත්තේය. ජීවිතයේ පළමු ම වතාවට, තරුණයකුගේ සුරතක පැටලුණු තම අත දෙස අනුපමා මොහොතකට බැලුවා ය. සංවේදී හැඟුම් සමුදායකින් හිත හිරි වැටී තිබුණු බැවින්, දෙදෙනාගේ අතිනත් පැටලුණු මොහොතේ ඇය්ට අමුතුවෙන් දැනුණු තිගැස්මක් නොවිණි. එහෙත්, ජීවිත කාලය තුළ කිසිදු මොහොතක නොදැනුණු, නොදන්නා රැකවරණයක හැඟීමක් ඒ මොහොතේ ඇගේ හදවත වටා වෙළෙන්නට වූයේය. අනුපමා, තමන් දෙදෙනාගේ අතිනත් පැටලී තිබියදී ම දැස උස්සා දේවක දෙස බැලුවා ය.

"ඇස් දෙකට කඳුළුත් පිරිලා.."

"සොරි දේවි.. ඇත්තටම මම ටිකක් සංවේදී කෙනෙක්.."





දේවක, තම සෙනේවන්තිය දෙස බැලුවේ සෙනෙහස උතුරා යන දැසිනි.

"ටිකක් නෙමෙයි.. ගොඩක් සංවේදී කෙනෙක් අනූ.. ඒ වගේම.. ගොඩක් ආදරණීය කෙනෙක්.. මගෙ ජීවිතේ මට අඩුවකට කියලා තිබුණෙ ගෑනු ළමයෙකුගෙ ආදරේ විතරයි.. දැන් ඒකත් සම්පූර්ණයි.. ඒ කියන්නෙ දැන් මගේ ජීවිතේ සර්ව සම්පූර්ණයි.."

"ඔයාට ඒක හොඳටම විශ්වාස ද දේවි..?"

"ඔව්.. මට විශ්වාසයි.."

අනුපමා, දේවක විසින් තම උර මත පැවරූ වගකීමෙන් බීයට පත් දැස උස්සා දේවක දෙස බැලුවා ය.

"ඒක ගොඩක් ලොකු සහතිකයක් දේවි.. මාව හරියට අඳුනගන්නත් කලින්.. ඒ වගේ ලොකු සහතිකයක් දෙන එක ඒ තරම් හොඳ දෙයක් නෙමෙයි නේද දේවි..?"

දේවක, දෙපසට හිස සැලුවේ ය.

"නෑ අනූ.. ඒක හොඳ දෙයක්.. විශ්වාසය කියන සහතිකය කෙනෙකුට දුන්නම.. සැබෑ හදවතක් තියෙන කෙනෙක් නම්.. ඒ සහතිකයෙ වටිනාකම ආරක්ෂා කරන්න උත්සාහ කරනවා.. අපි අපිට ආදරය කරන අයව.. අපි ආදරය කරන අයව.. පුළුවන් තරම් විශ්වාස කරන්න ඕන.. විශ්වාසය කියන්නෙ කෙනෙකුට දක්වන ලොකු ගෞරවයක් අනූ.. අහම්බෙන් අවස්ථාවක කෙනෙකුට කෙනෙක් විශ්වාස කරලා වැරදුණොත් මිසක.. විශ්වාසය කියන්නෙ පුදුමාකාර ප්‍රතිලාභ ගෙනත් දෙන මිනිස් හැඟීමක්.."

The Reader's Place Novel

අනුපමා, දේවක දෙස බැලුවේ, කිසිසේත් ම අදහාගත නොහැකි දැසිනි.

"දේව්.. ඔයාගෙ හැඟීම් දැනීම් ගැන මට තාමත් අදහාගන්න බෑ.. මම දන්නෙ.. අපේ පරම්පරාවේ ඔය වගේ සාරගර්භ සුහදවැලි පිරුණු තරුණයෝ සුලබ නෑ කියලා විතරයි.."

දේවක දෙක් හිස නවා, අනුපමාගේ දෑසට එබී බැලුවේ ය.

"සුවිල නැහිවෙන්න පුළුවන්.. ඒ උනාට දුලබ නම් නෑ.. තරුණයෝ විතරක් නෙමෙයි.. තරුණියොත් එහෙම තමයි.. අනු දන්නවද දෙයක්.. දැන් ඉන්න තරුණ තරුණියෝ ගොඩක් අය ළඟ හරි සුන්දර සිසිවිලි තියෙනවා.. අද ඉන්න උගත් බුද්ධිමත් තරුණ පරම්පරාවේ ගොඩක් දෙනෙක් හරිම සහනශීලියි.. මානුෂිකයි.. අපිට කලින් පරම්පරාවල ගොඩක් අය ළඟ පැහැදිලිව දැකින්න තිබුණ ඊර්ෂ්‍යාව, ද්වේෂය, කුහකකම වගේ සෘණ ගුණාංගයන් අද තරුණ පරම්පරාව අතර ගොඩක් දුරට අඩුයි.. ඒක අද ලෝකය පුරා ම දකින්න තියෙන යහපත් ප්‍රවණතාවයක්.."

අනුපමා.. මොහොතින් මොහොත තමා අරුමැසි ලොවකට කැඳවාගෙන යන තරුණයාගේ දෑස දෙස සෘජුව බැලුවා ය. ඊට පෙර ඇගේ දෑසේ ඇඳී තිබුණු අඳුර පලා ගොස්, ඒ මොහොතේ ඇගේ දෑස දිදුලමින් තිබිණි.

"උගත් නීතිඥ මහත්මයට දෙන්න තරම් පරිණත උත්තර මගේ ළඟ නෑ.. අපි දෙන්නා කතා කරන්න ගත්තොත් හෙට උදේවෙනකල් උනත් දිගට දිගට කතා කරන්න දේවල් අපි ළඟට



එයි.. අර සෙකියුරිටි ඔෆිසර් දැන් දෙතුන් වතාවක් ම අපි දෙන්නා දිහා උවමනාවෙන් බැලුවා.. ඒ මනුස්සයගෙ හිතේ ලොකු ප්‍රශ්නයක් ඇති මේ කාර් පාක් එකේ ගිනි අව්වෙ හිටගෙන අපි දෙන්නා මේ තරම් බර කතාවක මොකද කියලා.."

අනුපමා සැහැල්ලු ලෙස හිනැහෙමින් කියද්දි, එයාකාර ම වූ සැහැල්ලුවකින් සිනාසෙමින් ඇය පැවසූ දෑ සැබෑවක් යැයි පිළිගත් නියාවෙන් දේවක ද හිස සැලුවේ ය.

"ඔන්න අනු.. ඇතුළට ගියාට පස්සෙ.. ගණන් බල බලා ඉන්න තහනම්.. හිතට අල්ලන එක තිබුණොත් කීය උනත් කමක් නෑ.. ගන්න ඕන හොඳද..?"

දේවක, කල් තබා ම කොන්දේසිය දැමුවේ ය. අනුපමා නළල රැළි කළා ය.

"හරි.. කොන්දේසියට එකහයි.. ඒත් දේව්.. මම මේ ඇත්තමයි කියන්නෙ.. ලොකු ලොකු ජුවෙලරිවලට නම් මම ආස නෑ දේව්.. ඔන්න මට එහෙම ඒවා ගන්න කියලත් බල කරන්න එපා හොඳද..?"

දේවක, සිනා තැවරුණු දෑසින් අනුපමා දෙස මොහොතක් බලා සිටියේ ය. දෙවනුව, ආදරයට සරදම මුසු කළ හඬ අවදි කළේ අනුපමාට පිළිතුරු දෙන්නට ය.

"හ්ම්.. හ්ම්.. ඉස්කෝලෙ හාමිනේට මම මේ වතාවට දිනුම දෙන්නම්කෝ.."

අනුපමා යළිත් වතාවක් නළල රැළි කළා ය.

The Reader's Place Novel

"ඇයි මේ වතාවට කිව්වෙ..?"

"මාත් එක්ක ඇවිත් මෙහෙම තෝරගන්න ඉඩ ලැබුණාට.. අපේ අම්මා අරන් තියපු ඒවා ගැන නම් මට වග කියන්න බෑ.."

දේවක හිනැහෙමින් කියූවෙහි අරුත අනුපමා එසැණින් වටහා ගත්තා ය.

"අම්මා සන්තෝසෙන් දෙන දේ මම ගොඩක් සතුටින් බාර ගන්නම් දේවි.. නැග්ගක වටිනාකම තියෙන්නෙ.. ඒක දෙන කෙනාගෙයි ලබා ගන්න කෙනාගෙයි හිත තුළ උපදින හැඟීමේ මිසක්.. ඒ නැග්ගෙ තියෙන හැඩයෙවත්, ප්‍රමාණයෙවත්, මූල්‍ය අගයෙවත් නෙමෙයි.. නැග්ගක වටිනාකම අම්ලයි දේවි.."

දේවක, මෘදු ලෙස අනුපමාගේ උරහිස පිරිමැද්දේ ය. ස්වර්ණාභරණ මන්දිරයේ සේවකයන් දේවක හා අනුපමා පිළිගත්තේ අතිශය උණුසුම් ලෙසිනි. රන්මුතුගල පවුලේ ස්වර්ණාභරණ මිලදී ගන්නා හුරු පුරුදු අලෙවිසැල එය බව අනුපමාට අවබෝධ කර ගැනීමට දේවකගේ පැහැදිලි කිරීම් අවශ්‍ය නොවිණි. සේවකයන් දේවක කෙරෙහි දැක්වූයේ පුදුමාකාර හිතෛෂීවන්ත, පක්ෂපාතී බවකි.

"ගුඩ් මෝනින් සර්.. එන්න.. එන්න.. වාඩිවෙන්න සර්.. වාඩිවෙන්න මැඩම්.."

"තැන්ක්ස් බිනර.. අනූ වාඩිවෙන්නකෝ.."

දේවක, අනුපමාට අසුන් ගැනීමට පුටුව ද පිටුපසට ඇද දුන්නේ ය.





"ගිය සතියෙ සේනාරත්න අංකල් එක්ක ලොකු මැඩමුත් ඇවිල්ලා ගියානෙ සර්.."

ආගන්තු තරුණයා පවසද්දි, දේවක, අනුපමා වෙත ආදරණීය බැල්මක් හෙළා, යළි තරුණයා වෙත හැරුණේ ය.

"ඒවත් මෙයාට ම තමයි ඉෂාන්.."

තරුණයා පුදුම වී කුමක්දෝ විමසන්නට සැරසුණත්, දේවක ඔහුට වඩා ඉස්සර වූයේ ය.

"අද ආවෙ අපි දෙන්නගෙ වෙඩින් රිංග්ස් ගන්න.. කෝ.. ගේන්න බලන්න බිනර.."

තරුණයන් රැගෙන ආ මංගල මුදු රැඳවූ බහාලුම් තුළ වූ එකදු මෝස්තරයක් හෝ අනුපමාගේ සිත තුළට විශේෂයෙන් පිවිසියේ නැත. තරුණයන් විවිධ මාදිලියේ මංගල මුදු එකිනෙක ගෙන කිසිදු පැකිළීමකින් තොරව ඈ වෙත දක්වන්නට වූහ. අනුපමා ඒ සියල්ල දෙස කිසිදු විශේෂිත හැඟීමකින් තොරව බලා සිටියා ය.

"මේවා තමයි ලේටස්ට්ම ඩිසයින්ස් මැඩම්.."

අනුපමා, තරුණයන් වෙත සුහදශීලී හසරැල්ලක් පැවා ය.

"නෑ මල්ලි.. මම මේ වගේ ඩිසයින්ස්වලට කැමති නෑ.. ඒවා වයිට් ගෝල්ඩ් ඕක්ස්ඩ් ඒවනෙ.. සාමාන්‍ය විදියට රත්තරන්වලින් හදපුවා මට පෙන්නන්නකෝ.."

තවත් විනාඩි ගණනාවක ඇවැමෙන් අනුපමා සරල, වාම්



The Readers Place Novel

මෝස්තරයක මංගල මුදුවක් තෝරා ගත්තා ය. ඈ, සතුටු සිතින් මද සිනා මුසු දැසින් දේවක දෙස බැලුවා ය.

"මේක නම් මට ලස්සනයි දේවි.. ඔයා මොකද කියන්නෙ..?"

"ලස්සනයි.. ඒත් වුට්ටියිනෙ.."

අනුපමා පළමු වතාවට දේවක වෙත සිහින් තරවටු බැල්මක් හෙලුවා ය. දේවකට ඇඟේ කොන්දේසිය සිහි වී, දෙතොල එකිනෙක මත තෙරපා ඇද කර ගත්තේ ය.

"ස්.. සොරි.. සොරි.. වැරදි වචනයක් පිටවුණේ.. ඔයා කිව්වෙ මට බල කරන්න එපා කියලනෙ.. මම මේ බල කරනවා නෙමෙයි.. අදහසක් විමසනවා විතරයි.. බැරිද ටිකක්වත් ලිව වඩා වුට්ටක් විතර ලොකු එකක් ගන්න..?"

දේවකගේ වදනක් වදනක් ගානේ ම තැවරී තිබුණේ අතිශය කාරුණ්‍යයේ පසු වන්නකුගේ ආදරණීය අභිනයන් ය. අනුපමාගේ ළය.. අමුතුම රිද්මයකින් මෘදු මොළොක් වන්නට පටන් ගෙන තිබිණි. දේවකගේ මුවින් පිටවූ වචන කිහිපය හා අනුපමාගේ සුරතේ රැඳි කුඩා මුදුවේ ප්‍රමාණය අනුව ද අනුපමාගේ අත, කණ, කර පැළඳි කුඩා ආභරණ කිහිපය ද දුටු බිනර ඒ මොහොතට අවශ්‍ය දේ හොඳාකාරවම අවබෝධ කර ගත්තේ ය.

"මැඩම් ආස වුටි වුටි ජුවෙලරි වලට නේද සර්.. මේ මුද්ද පවුම් බාගයයි.. මේකෙම තුන් කාලට හදපු එක තියෙනවා සර්.. දෙන්නද..?"

"ගේන්න බලන්න ඉෂාන්.."





තරුණයා ගෙනැවිත් දුන් මුදුව අනුපමා තේරූ මුදුවට වඩා මදක් ප්‍රමාණයෙන් විශාල වුවත්, එහි සුන්දරත්වයෙහි කිසිදු අඩුවක් නොවිණි.

"ජීවිත කාලෙට ම මේ වගේ මුද්දක් දාන්නෙ එකම එක වතාවයි අනූ.. මේ බලන්න.. ඔයා තෝරගත්ත මුද්ද වගේ ම මේකත් ලස්සනයි.. ඊට වඩා ගොඩක් ලොකුත් නෑ.. මේක ගමු නේද අපි..?"

දේවකගේ ආයාචනය ඇයට මඟ හැරිය නොහැකි විය. විවාහය නම් වූ මහා සාගරය තුළ, ජීවිතය නැමැති නෞකාව කිසිවෙකුටත් තමාගේ අභිමතය මත හුදෙකලාවේ, එකිනෙකාගේ සහයෝගයකින් තොරව, එකිනෙකා වෙත නම්‍යශීලී නොවී පදවාගෙන යා නොහැකි බව අනුපමාට මොහොතින් මොහොත පසක් වෙමින් තිබිණි. ඈ, ඒ අසීරු ජීවන සත්‍යයට දිරියෙන් මුහුණ දීමට ධෛර්යය එක්කාසු කරන්නට වූවා ය.

"ඔයාට හොඳ නම්.. අරන් දෙන්න දේවි.."

තමා කෙරෙහි උපන් නියමාකාර ආදරණීය බව අනුපමාගේ වදන් තුළ තැවරී තිබුණේ ඒ මොහොතේ යැයි දේවකට පවා දැනෙන්නට විය. ඒ මොහොතේ දේවකගේ හදවත තුළ අනුපමා කෙරෙහි ඉපදුණේ පුදුමාකාර සෙනෙහසකි.

"අනූ.."

"අපි දෙන්නා විවාහයකින් බැඳෙනවා කියන්නෙ.. ඊට පස්සෙ අපි දෙන්නා දෙන්නෙක් වෙන්න බැනෙ දේවි.. විවාහ උනා.. විවාහ වෙන්න පොරොන්දු උනා කියලා.. ලොකු වෙනසක්



The Reader's Place Novel

වෙන්න බැනෙ.. අනිත් කෙනාගෙ සාධාරණ සතුට මොකක්ද.. ඒ වෙනුවෙන් නම්‍යශීලී වෙන එක.. අපෙන් ඉෂ්ට වෙන ලොකු යුතුකමක්.. ඒ වගේම ඔයාගෙ සතුට ආරක්ෂා කරලා දෙන එක.. දැන් මගේ ලොකුම වගකීම.. කාටවත්ම අවැඩක්, තරකුත්, නපුරක් සිද්ධ නොවෙන දෙයක් ඔයා මට දෙනවා නම් ඒ ඕනම දෙයක් මම සතුටින් බාර ගන්නම් දේව්.."

අනුපමාගේ වදන් දේවකගේ දෑසට කඳුළු කැදවීමට තරම් ප්‍රබල වී තිබිණි. දේවකගේ මංගල මුදුව තේරීමට අවශ්‍ය රත්, භාණ්ඩ බහාලුම් රැගෙන ඒම සඳහා බිහාර, ඉෂාන් තරුණයන් දෙදෙනා ප්‍රදර්ශන රාක්ක වෙත ගොස් සිටි බැවින්, අනුපමාටත් දේවකටත් නිදහසේ කතා බහ කරන්නට කිසිදු බාධාවක් නොවිණි.

දේවකගේ මංගල මුදුව ද තේරීමෙන් අනතුරුව දේවක යළි බිහාර හා ඉෂාන් ඇමතුවේය.

"අනූගෙ වෙඩින් රිංග් එකට හරියන ලස්සන ගාඩ් රිංග් එකකුත් බලමු.."

හෝරාවකට ආසන්න කාලයක් ගත කොට මංගල මුදු තෝරාගත් දේවක හා අනුපමා හිතෛෂීවන්ත තරුණයන්ට සමුදී යළි මෝටර් රථය වෙත පැමිණියෝ ය. දේවක, අනුපමා දෙස බැලුවේ අතිරණයෙනි.

"අනූ.. මේවා ඔයා ළඟ තියාගන්නවද..?"

මිලදී ගත් ස්වර්ණාභරණ මංජුසාව දක්වමින් දේවක විමසද්දී අනුපමා දෙපසට හිස සැලුවා ය.





"නෑ දේව්.. ඔය ටිකත් ඔයාගෙ අම්මා අතට ම ගිහිල්ලා දෙන්න.. එතකොට මගෙ හිතටත් බරක් නෑ.. අනික අම්මා තෝරාගත්ත ලේලි ගැන අම්මට සතුටකුත් දැනෙයිනෙ.."

දේවක, අනුපමාගේ සුරත දැඩිව අල්ලා ගත්තේ ය. එහෙත්, ඒ ස්පර්ෂය නොදැනුණා සේ අනුපමාගේ දෑස රැඳී තිබුණේ, මෝටර් රථය ඉදිරියෙන් දිස් වී ඇතට ඇදී යන දසුනක ය.

"ඇයි අනූ.. ඔයා අඳුනන කවුරු හරිද..?"

අනුපමාගේ දෑසට උනා ආ කඳුළු කැට දෙක විසල් වී ඇගේ දෑස බොඳවී යන්නට විය.

"නෑ දේව්.. ඒත්.. ඒ දැකපු දේ මගෙ හිතට හුහාක් සමීපයි.. ඉස්සර හැමදාම.. අපේ අප්පච්චිත් මාව අතින් අල්ලගෙන හැම තැනම එක්කරගෙන ගියේ ඔය විදියටමයි දේව්.."

දේවක, අනුපමාගේ දෑතම තම දෑතට මැදි කර ගත්තේය.

"ඔයා.. හරී..ම ආදරණීය දුවෙක් අනූ.. ඔයාගෙ අම්මයි අප්පච්චියි.. මේ ලෝකෙ බහුතරයක් මව්පියන්ට වඩා ගොඩක් වාසනාවන්තයි.."

දේවක, ඈ වෙනුවෙන් තවත් අපූර්ව සහතිකයක් ලියුවේ ය. ඈ පිටත්ලෙන් ම දැසේ රැඳුණු කඳුළු පිසදා ගත්තා ය.

"හරි දේව්.. අපි යමු එහෙනම්.."

"අපි ෂොපින් කරමුද අනූ.. ඔයාට ඇඳුම් ටිකක් ගන්න යමුද අපි.. තව වෙලාව තියෙන හින්දා.."



The Reader's Place Novel

අනුපමා, තම දැසේ ඇදුණු ආයාවනාත්මක බැල්ම එලෙස ම දේවකගේ දැසේ රැඳෙව්වේ ය.

"දේවි.. අපි මැරි කළාට පස්සෙ.. සමහර වෙලාවට.. මට උහුලගන්න බැරි පාළුවක් දැනෙන වෙලාවල් තියෙන්න පුළුවන්.. අන්න ඒ වගේ වෙලාවට.. ඔය වගේ සැහැල්ලු ගමන් එක්ක යන්න ඔයා මාව.. දැන් අපි පුළුවන් ඉක්මනට ගෙදර යමු.. මේ ටික දවසට.. වැඩිපුර තත්පරයක් හරි මම මගේ අම්මයි, අප්පච්චියි ළඟ ඉන්න බලන්නෙ.. ටික කාලෙකට හරි.. ඒ දෙන්නා මාව දාලා ඇතක යනවා.. ඔයාගෙ පවුලට පුරුදු වෙනකල් මම තනිවෙනවා නේද දේවි එතකොට..? ඒ දෙන්නා දුරයි කියලා නොදැනෙන විදියට ඔයා මාව බලාගන්නවා නේද දේවි..?"

දේවක, අනුපමාගේ හිස මත මෘදු ලෙස සුරත තැබුවේ ය. ඔහුගේ දැසේ ඇදී තිබුණේ පියෙකුගේ උවනතක ඇදෙන්නා වූ ස්නේහාර්ද බැල්මකි.





# 06



අනුපමාගේත්, දේවකගේත් විවාහ මංගල්‍යෝත්සවය නොසිතූ තරම් උත්කර්ෂවත් අන්දමින් දේවකගේ ඥාති සමූහයා එක්ව සංවිධානය කර තිබිණි. දේවකගේ විසල් ලෝකය පාමුල තමාගේ කුඩා බව අනුපමා පැහැදිලිව ම වටහා ගත්තේ ඒ මොහොතේ ය. එහෙත්, ඇ එයින් බිඳක් හෝ හීනමානයක් ඇති කරගත්තේ නැත. තමාගේ ලෝකය සපුරා පැවති ආත්මීය වටිනාකම් සලකා ඇ දේවකගේ භෞතික ලෝකයේ වපසරිය ඉදිරියේ සසැලුණේ නැත. කෙතරම් දෙගිඩියාවන් පැමිණිසිත වට කර පවුරු බඳින්නට වෙර ද දැරුවද, ඇ ඒ සියලු හැඟීම් මැඩ ගෙන සිනාමුසුව තම විවාහ මංගල්‍යයට මුහුණ දුන්නා ය. විවාහ මංගල්‍යෝත්සවයේ අවසන් භාගයේදී දේවක හා අනුපමා දෙපාර්ශවයේම ඥාතීන්ට ආචාර කළහ. ඥාතීන් අතරට යන අතරවාරයේ දේවක අනුපමාගේ සුරත අල්වාගෙන සිටි අයුරින් ම, ඔහුගේ සදාතනික සෙනෙහසේ මහිමය ඇ



The Reader's Place Novel

හදනා ගත්තා ය. හදවතට දැනෙන බොහෝ දෑ වචන බවට පත් කර ගැනීමට ඇයට උවමනා වුවත්, ඒ සියල්ල අතොරක් නොමැතිව සින තුළ පොර බදන හැඟීම් ප්‍රවාහයක් පමණක් ම බවට පත් විය. එහෙත්, අනුපමාගේ පමණක් නොව දේවකගේ සිත තුළ ද උපත ලද ප්‍රේමණීය සත් සිතිවිලි සමුදාය ම දෙදෙනාගේ ම දැසේ බිඳකුදු නොඅඩුව ඇඳී තිබිණි. නෑදෑ සම්භාෂා අතරේ සැරිසරමින්, දෙදෙනා පෙර කවරදාවත් නොවූ විරූ ලෙස දෙහදවත් හි සුපුෂ්පිත සෙනෙහස නිර්ලෝභීව බෙදා හදා ගන්නට වූහ.

"අනූ.. අර පෝරුවට නැගපු මොහොතෙ ඉඳන්.. මගෙ හිතට ඔයා ගැන මහ පුදුමාකාර ආදරයක් දැනෙනවා."

"දේවී.. මටත් ඒ දේම ඒ විදියට ම දැනෙනවා.. ඒ මොහොතෙ ඉඳන්.. මගෙ මුළු ලෝකෙ ම ඔයා කියලා මට දැනෙන්න ගත්තා.."

ඒ මොහොතේ දෙදෙනාට දැනෙන්නට වූයේ තමන් දෙදෙනා හිඳිනුයේ මහා පිරිසක් අතර නොව, තමන් දෙදෙනා පමණක් තනිවූ මිහිරි ම ලොවක් තුළ ලෙසිනි. අනුපමා යළිත් දේවක දෙස බැලුවේ අතිශය කෘතවේදී දැසිනි.

"ඔයාගෙ පවුලෙ අය එකතුවෙලා ලස්සනට වෙඩින් එක ප්ලෑන් කරලා දේවි.."

දේවක ඊට හෝරා කිහිපයකට මත්තෙන් තම ප්‍රියාදර බිරිඳ බවට පත්වූ යුවතිය දෙස බැලුවේ අපරිමිත සෙනෙහසකිනි.

"ඔයාගෙ හිතට සතුටු නම් මට ඊට වඩා සතුටක් තවත් නෑ අනූ.. මේ හැමදේම ඔයා වෙනුවෙන්.."





"මීට ටික වෙලාවකට කලින් මේ ජීවිත කාලෙ පුරා ම.. ඔයාගෙ ළඟින් ඉන්න දුන්න ලිඛිත ගිවිසුමක් වගේ ම ආත්මීය පොරොන්දුවකුත් එක්ක.. මම ඔයාගෙ බිරිඳ උනා.. ඒ හින්දා, පුංචි වචනයක් විතරක් කියලා ඔයාට ස්තුති කරන නැටි.. මම දන්නෙ නෑ දේවි.. ජීවිත කාලෙ පුරා ම ඔයා බලාපොරොත්තු වෙන ආදරණීය අනුපමා වෙලා ඔයාගෙ ළඟ ම ඉන්න.. මම හැම මොහොතක ම උත්සාහ කරන්නම්.. මේ හැමදේම වෙනුවෙන් මට ඔයා වෙනුවෙන් දෙන්න පුළුවන් අන්න ඒ සෙනෙහස විතරයි දේවි.."

"මට ඒ දේ හොඳටම ඇති අනූ.. ඊට වඩා කිසිම දෙයක් මම ඔයාගෙන් බලාපොරොත්තු වෙලා නෑ.. ඉදිරියට බලාපොරොත්තු වෙන්නෙත් නෑ.. මගේ අතින් මොකක් හරි අත්වැරදීමක් උනොත්.. මට සමාව දීලා එදාට මට අදටත් වඩා ඔයා ආදරේ කරන්න අනූ.. මොකද.. එහෙම වෙලාවක් ආවොත්... මම ගොඩක් අසරණ වෙයි.. එහෙම දෙයක් සිද්ධ උනොත්.. මට අනුකම්පා කරන්න අනූ..."

දේවකගේ බැගැබර ස්වරයෙන් අනුපමාගේ සිත නොමනා ලෙස තිගැස්සිණි. ඔහුගේ අරමුණ කුමක් අරබයා දැයි නොදන්නී, තමා දැන උන් ජීවන යථාර්ථයන් සියල්ල ම පුර්වාදර්ශ කොටගෙන, සෙනෙහස පිරී ඉතිරී යන හදවතින් පිළිතුරු ඇම්ණුවා ය.

"අපි විවාහ උනේ.. ජීවිතේ ඇතුළෙ තියෙන දුක සැප.. රස නීරස.. හැමදේම දෙකට බෙදා ගන්නනෙ දේවි.. එහෙම නම් මොකටද දේවි මේ විශේෂ ඉල්ලීම්..?"



The Reader's Place Novel

අනුපමාගේ සිත තුළ තෙරපෙන්නට වූයේ විසල් ප්‍රශ්නාර්ථයකි.

"ජීවිතේ කියන්නෙ අහඹු සිදුවීම් එකතුවක් අනූ.. ඒ ඇරඹෙන තත්පරේදි අපි කිසිසේත් ම නොහිතන නොපතන දෙයක් සිද්ධ වෙන්න පුළුවන්.. අපි බලාපොරොත්තුවෙන් හිටිය දෙයක් තමයි ඒ දේ ඉෂ්ට උනත් නැතත් එහෙම දේවල්වලට මූණ දෙන්න අපිට පහසුයි.. අපේ හිත්වල තියෙන ආදරේ රැකගෙන අපිට එහෙම අවස්ථාවලදී ජීවිතේට මූණ දෙන්න පුළුවන්.. ඒත්.. අහඹු අවස්ථාවක අපි ඉස්සරහට එන ප්‍රශ්නවලට මුහුණ දෙද්දි.. සමහරවිට අපිට ආදරේ විතරක් නෙමෙයි අපි කවුද කියලත් අමතක වෙන්න පුළුවන්.. එහෙම වෙන්න ඉඩ දුන්නොත්.. අපි අපේ හිත්වල පුරවා ගත්ත ආදරේට කරන අවමානයක් වෙයි අනූ.. ඒ හින්දා ගොඩක් ඉවසීමෙන් අපිට ආදරේ කරන්න.. එකට බැඳිලා මේ ජීවිත ගමන යන්න සිද්ධවෙයි අනූ.."

දේවකගේ දෑසේ නළියන කඳුළු පොකුර ළඟ අනුපමා අත්‍යයන්තයට ම අසරණ වූවාය.

"දේවි.. ඇයි මේ.. අපි දෙන්නගෙ විවාහය යෝජිත විවාහයක් හින්දා.. ඔයාගෙ හිතට බයක් දැනෙනවද මම ඔයාට ආදරේ නොකරයි කියලා.."

දේවක, තම වමතේ පටලවාගෙන උන් අනුපමාගේ සුරත තවත් බිඳක් තද කොට අල්ලා ගත්තේ ය.

"නෑ අනූ.. එහෙම බයක් මට පොඩ්ඩක්වත් දැනෙන්නෙ නෑ.."

"එහෙනම්.. මොනවටද මේ වෙලාවෙ.. අපි අතරෙ.. මේ තරම් දිග කතා..?"





අනුපමාගේ වාග් විලාසය තුළ වූයේ අමුතුම රටාවකි. දේවක, එය බෙහෙවින් ප්‍රිය කළේය. ඔහුගේ දෑසින් ගිලිහෙන සෙනෙහසෙහි නිමාවක් නොවිණි.

"මොකක් හරි විශේෂිත හැඟීමක්.. ඒවා හිතට දැනෙන වෙලාවට ම කියලා තිබුණම.. ඒක ඉදිරියට ලොකු පහසුවක්.. ඒ වගේ ම හිතට ලොකු නිදහසක් අනූ.."

ඔවුන් දෙදෙනාගේ විවාහ මංගල්‍යෝත්සවයට පැමිණ සිට සිව් සිය ගණනක් වූ ඥාතී, හිත මිතුරු සමූහයා අතරේ පවා ඔවුන් දෙදෙනා, ඔවුන්ගේ ලෝකයේ පවුරු පදනම් සවිමත් කිරීම උදෙසා මං මාවත් සොයමින් සැරිසැරූහ.

මනාල යුවළ උත්සව භූමියෙන් පිටව යාමට නියමිත නැකත එළඹීමට තවත් ඉතිරිව තිබුණේ හෝරා බාගයකට මදක් වැඩි කාලයකි. නෑදෑ හා මිතුරු පිරිසට ආචාර සමාචාර පවත්වා, මනාල යුවළ ඔවුන් දෙදෙනා වෙනුවෙන් සූදානම් කොට තිබූ අසුන වෙත යළි පැමිණියේ, සමුගැනීමේ මොහොත ආසන්න වෙමින් තිබුණු බැවිණි. අසුනේ හිඳ ගත් අනුපමා, මදක් පහතට නැමී තමාගේ වම් පාදය පිරිමැද ගත්තා ය.

"අනූ.. ඇයි..?"

"ෂූ එකට කකුල චුට්ටක් කැපිලා වගේ දේවි.."

"අයියෝ.. දැන් මොකද කරන්නෙ.. කෝ බලන්න ගොඩක් කැපිලද..?"

අනුපමාගේ සුළු වේදනාව, දේවකට දැඩි වේදනාවක් විය. තම සැමියාගේ දෑසේ ඇදුණු වේදනාවේ පරිමාණය දුටු



The Reader's Piece Novel

අනුපමාගේ සිත තුළ උපන්නේ සුවිල් අනුකම්පාවකි. ඈ, මෘදු ලෙස හිනැහී දේවකගේ වමත මත සුරත තැබුවා ය.

"අනේ දේව්.. මේක ඒ හැටි දෙයක් නෙමෙයි.. බය වෙන්නෙපා.."

දේවක දෙපසට නිස සැලුවේය.

"වෙන සාමාන්‍ය දවසක උනා නම් මේක සාමාන්‍ය දෙයක් උනාට.. අද ඔයා මනමාලි උන දවසේදත නිසා මේක සාමාන්‍ය දෙයක් නෙමෙයි.. මෙතන ඉන්න විශේෂ ම කෙනා ඔයාතෙ අනු.. මේ තරම් ඇදුම් ආයිත්තම් ගොඩකුත් උස්සාගෙන ඉන්න මේ වෙලාවෙ.. කකුල තුවාල වෙලා ඔයා අපහසුවෙන් ඇවිදිනවා කියන්නෙ පුංචි දෙයක් නෙමෙයි.. කෝ ඉන්නකොා.. මේ හොල්ලේ එකේ ෆස්ට් ඒඩ් බොක්ස් එකක් ඇතිනෙ.. මම ප්ලාස්ටර් එකක් හොයාගෙන ඉක්මනට එන්නම්.."

එතෙක් වේලා ඉදිරිපස මේසයක් අසල අසුන් ගෙන දියණිය දෙස ම දැස තබාගෙන උන් වර්ණවීර මහත්මිය, තම දියණිය අසලට ඇවිද ගියේ ඉක්මන් ගමනිනි. දියණිය කිසියම් පීඩාවක් විඳින බව ඈ ඇසිල්ලෙන් වටහා ගත්තා ය. දේවක, අනුපමා සෙත්සිත් ඔක් එන්නට පළමු අනුපමාගේ මව, තම දියණිය හා ඉඟියාතුළින් ඒත්ත කම්පා වූවා ය.

"ඇයි පුතේ.. මොකක්ද වෙලා තියෙන්නෙ..?"

තම මවගේ ඒදනාබර දැස දුටු මතින්, පාදයේ වේදනාව අමතකව ගොස් අනුපමාගේ දැස සැලෙන්නේ කඳුළින් පෙනිණි.

"මේ කකුල වුට්ටක් කැපිලා අම්මා.. ලොකු දෙයක් නොමෙයි.."





තවත් නොබෝ වේලාවකින්, තම මවගේ හා පියාගේ ලෝකයෙන් නික්ම යාමට සිදුවන බව දැනී, ඒ මොහොතේ පටන් අනුපමාගේ ළය අසීමිත වේදනාවකින් රිදුම් දෙන්නට විය.

"ඉන්න පුතේ.. මගෙ බෑග් එකේ ඩෙටෝල් ප්ලාස්ටර්ස වගයක් තියෙනවා.. මං ඕන වෙයි කියලා දාගෙන ආවා.."

අනුපමාත්, දේවකත් හිඳ උන් අසුනේ පසෙකට ඇදී, අනුපමාගේ මවට අනුපමා අසල හිඳ ගැනීමට ඉඩ සකසා දුන්හ. වර්ණවීර මහත්මිය තම දියණියගේ දෙපා දෙසට නැවී, කැපුම් පහර සොයා ඒ ප්ලාස්ටරය ඇලෙවිවා ය. අනුපමාගේ දෑසට රොක් වූ කඳුළු තර වී බිමට වැටිණි. වර්ණවීර මහත්මිය තම දියණියගේ දෑස දෙස බලන්නට පවා බිය වූයේ, ඇය ද තමාගේ කඳුළු දැස තුළ සිර කරගෙන උන්නේ දැඩි ආයාසයකින් බැවිනි.

"මගෙ පුතේ.. අඩන්නෙපා.."

"අම්මලාට දිවැස් තියෙනවා කියන්නෙ ඇත්ත ම ඇත්ත අම්මා.. දරුවෙකුගෙ මුළු ලෝකෙ ම එක වැර දකින්න පුළුවන් දිව්‍යමය ඇස් දෙකක් හැම ආදරණීය අම්මා කෙනෙකුට ම ඇති නේද අම්මා..?"

වර්ණවීර මහත්මිය තම සදාදරණීය දියණියගේ කම්මුලක් මත මෘදුව සුරත තැබුවා ය.

"මගෙ පුතත්.. අම්මා කෙනෙක් උන දවසට.. ඒක කොයි තරම් ලොකු ඇත්තක්ද කියලා තවත් නොදට තේරෙයි මගෙ පුතේ.."



The Reader's Place Novel

අනුපමා, දැස තද කොට පියාගෙන තම මවගේ උරහිසට වාරු වුවා ය. ළය තුළින් බුර බුරා නැගී එන ඉකි බිඳුම් වළක්වා ගන්නට අනුපමා තව දුරටත් සවිමත් වූයේ නැත.

"අඬන්නෙපා පුතේ.. මගෙ දුව මේ වෙලාවෙ හිනාවෙලා ම ඉන්න ඕන පුතේ.."

බිඳෙන ඉකිය අසීරුවෙන් වළක්වා ගනිමින් අනුපමා තම මවගේ උරහිසෙහි තවත් බරට හිස රුවා ගත්තා ය.

"අම්මගෙයි අප්පච්චිගෙයි ලෝකෙන් යන්නම යන්න යන වෙලාවෙ මට හිනාවෙලා ඉන්න පුළුවන්ද අම්මා..?"

දියණියගේ වදන් නමුවේ වර්ණවීර මහත්මියගේ ළය වේදනාවෙන් කීරි ගැහෙන්නට විය. තවත් නොබෝ වේලාවකින් එළඹෙන සුබ නැකතින්, අනුපමා මාපියන්ගේ ලෝකයෙන් නික්ම පතිකුලය බලා පිටත්ව යන්නේ සදහට ම බව දන්නා බැවින්, ඒ අවසාන මොහොතේ මවටත්, දියණියටත් රිසි සේ තම ආත්මීය සංවේදනාවන් බෙදා හදා ගන්නට ඉඩ දී, දේවක, අනුපමා සමීපයෙන් ඉවත්ව තම මිතුරු කැළ සොයාගෙන ගියේ ය.

බොහෝ වේලාවක් උත්සව ශාලාවේ හුදෙකලා ඉසව්වකට වී දැසින් නොව හදවතින් හඬා වැටෙමින් උන් වර්ණවීර මහතා, දේවකගෙන් හිස්වූ අසුන වෙත පැමිණ දියණිය පසෙකින් හිඳ ගත්තේ ය. දැසින් උතුරා ගලා යන කඳුළු ධාරාවන් නොවුණ ද, තමාගේ පියා ද තමාට සමුදිය නොහැකිව දරා ගත නොහැකි වේදනාවෙන් හඬා වැටෙන බව අනුපමා හොඳාකාරව ම දැන සිටියා ය.





"අප්පච්චි.."

අනුපමාට මුවින් පිටකර ගත හැකි වූයේ එපමණකි. ශෝකයෙන් මුසපත්ව උන් ඇගේ ඉකිය ඇසිල්ලකදී අලුත් විය. මවගේ උරහිසින් හිස හරවාගත් අනුපමා තම පියාගේ උරහිසේ හිස හොවාගෙන හඬන්නට වූවා ය.

"අඬන්නෙපා පුතේ.. ඔයා ඔය විදියට අඩා වැළපෙනවා මට බලන්න බෑ පුතේ.."

"මට අඬන්න එපා කිව්වට.. අම්මයි අප්පච්චියි දෙන්නත් හොඳටම අඬනවා කියලා මං දන්නවා අප්පච්චි.."

අනුපමා සිතට වාරු ගෙන කීවා ය.

"වෙන්වීම මොන තරම් වේදනාවක් උනත්.. හැම අම්මා කෙනෙක් ම තාත්තා කෙනෙක් ම තමන්ගෙ දරුවන්ගෙ ජීවිතේ මේ වගේ ලස්සන දවසක් දකින්න සුබ ප්‍රාර්ථනා ඇති කරගන්නවා පුතේ.."

"ඒ සුබ ප්‍රාර්ථනාව ඉෂ්ට උන සතුට හිතේ දරාගෙන අම්මයි අප්පච්චියි අක්කා ළඟට ගිහිල්ලා ඉන්න කාලයක් සතුටින් ඉඳලා ආපහු එන්න.. මම දේවකයි එයාගෙ පවුලෙ අයයි එක්ක සතුටින් ඉන්නම් අම්මා.. අම්මයි අප්පච්චියි හදපු හොඳ දුව විදියට ම මම එයාලා ළඟ ජීවත් වෙන්නම් අම්මගෙයි අප්පච්චිගෙයි ගෞරවය ආරක්ෂා කරගෙන.. මම ආයෙත් අඬන්නෙ නෑ.. අම්මයි අප්පච්චියි දෙන්නත් ආයෙ වුටි දුව වෙනුවෙන් කවදාවත් දුක් වෙන්නෙපා.."



The Reader's Place Novel

මනාල යුවළට පිටත් වීමට නැකත ආසන්න බව පැවසීමට දේවකගේ ලොකු මාමා වර්ණවීර පවුලේ සාමාජිකයන් වෙත පැමිණියේ ඒ මොහොතේ ය. ඉන් පසු අනුපමාගේ මව හා පියා තම දියණියගේ දෑතින් ම අල්ලා දේවකගේ මව වෙත බාර කරන ලදී. අතිශය සුසංවේදී හැඟීම් දැනවූ ඒ මොහොතේ අනුපමා, තළලත තම මවගේත්, පියාගේත් දෙපතුලේ හොවා ඔවුන්ගෙන් සමු ගත්තා ය. එසේ ම දේවකගේ මවගේ, දෙපතුලේ හිස හොවා ඈ වෙත තමාගේ ජීවිතය බාර කළා ය. එළඹුණු සුබ මොහොතින් ඈ යුවතියක ලෙස ගෙවූ ජීවිතයට සමුදී, දේවක සමග පතිකුලය බලා පිය මැන්නා ය.

"මෙතන ඉඳලා දිගට ම අපේ ගෙදර වත්ත අනු.."

මනාල යුවළ රැගත් මෝටර් රථය රන්මුතුගල නිවැසියන්ගේ ඉසව්වට ළඟා වන විට දේවක, අනුපමාට ඔවුන්ගේ ඉඩ කඩම්වල මායිම් දැක්වූයේ ය. දේවකගේ ම ඉඩකඩම් ඔස්සේ කිලෝ මීටර කාලක පමණ දුරක් ගොස් මනාල යුවළ හා සහපිරිවර දේවකගේ පරම්පාරගත උරුමය වූ විසල් වළව්ව වෙත පැමිණියහ.

"මම ලෑස්ති උනේ.. අනුව අපේ හනි-මූන් එකට කොහේ හරි ලස්සන තැනකට එක්කරගෙන යන්න.. කොහොම හරි ඉතින්.. මට අනුව ඒකට කැමති කරවගන්න බැරි උනානේ.."

අනුපමා, දේවකගේ දෑස දෙස බැලුවේ ආදරණීය ලෙසිනි.

"ඒ කැන මොන තරම් ලස්සන උනත්.. දහස් ගණන් මිනිස්සුන්ට ලැඟුම්හලක් උන ඒ වගේ කැන්වලට වඩා.. ඔයාගෙ ජීවිතේ හැම දෙයක් ම මුසුවෙලා තියෙන මේ ගෙදරින්ම ඔයා





එක්ක අලුතින් පටන් ගන්න යන මගේ ජීවිතේ.. පටන් ගන්න මම කැමතියි දේව්.."

අනුපමාගේ වදන් තුළ වූයේ ආදරණීය බව මුසු වූ පැහැදිලි නිර බවකි. එහෙත්, ඒ මොහොතේ දේවකගෙත් ගිලිනුණේ දිර්ඝ සුසුමකි. ඔහුගේ හිත තුළ වූයේ අනුපමා වෙත පහදා කිව නොහැකි දෙගිඩියාවත් සමූහයකි.

"අනු.. මගේ ගෙදරට ආවට පස්සෙ.. ඔයාගෙ ඔය සුන්දර ප්‍රාර්ථනා ලෝකෙ.. මොනම හේතුවක් හින්දාවත් විනාශ වෙලා යන්නෙපා කියලා මම ප්‍රාර්ථනා කරනවා.."

පමණටත් වඩා සුසංවේදී දේවකගේ වදන් හමුවේ, අනුපමාගේ සිත යළිත් දෙගිඩියාවට පත්විය. දේවක නොකියා කිමට උත්සාහ දරන කුමක් හෝ කතාවක් පිළිබඳ ඉවක් ඇගේ ඇතුළාන්තය විසින් හඳුනාගෙන තිබිණි. නොදන්නා ලොවක කිරුළු ලන්නට ගොස්, තමාට තම ජීවිතය ම අහිමි වේදැයි ආදී වූ අවිනිශ්චිත බියක්, රන්මුතුගල වළව්ව ඉදිරිපස ද්වාරයට සමීපව මෝටර් රථය නැවතුන මොහොතේ අනුපමාගේ සිතට එක වරම පිවිසියේ ය. එහෙත්, ඉදිරි ගමනකට මිස ආපසු ගමනකට දෙවයෙන් ඒ වනවිට කිසිදු ඉඩක් ඉතිරි කොට නොතිබිණි.

මංගල රිය පෙරහැර වළව් භූමියේ පිවිසුම් මාවත දිගේ පසු පසට පෙළ ගැසී නැවතී තිබිණි. ඔහුගේ මව ද ඇතුළු දේවකගේ පාර්ශවයේ ඥාති පිරිස මනාල යුවළ පැමිණීමට ටික වේලාවකට පළමුව පැමිණ, මනාල යුවළ ඇතුළු අනුපමාගේ ඥාති පිරිස පිළිගැනීමට සූදානම්ව සිටියෝ ය. මංගල රථයෙන් පිටතට පය තැබීමට ප්‍රථම දේවක යළිත් තම බිරිඳ දෙස බැලුවේ ය.



The Reader's Place Novels

"අනූ.. මේ මොහොතෙ ඉඳන් ඔයා මගේ ජීවිතේ.. අපේ පරම්පරාවෙ ම ගෞරවය.. ඒ දේ මං වෙනුවෙන් මතක තියාගන්න.."

දේවක පැවසුවේ තමාගේ උකුල මත ද අඩක් දැවටී තිබුණු අනුපමාගේ මල් කළඹ වඩාත් ප්‍රවේසමෙන් ඇගේ දෑතේ දවටමිනි. දේවකගේ ඉල්ලීම තුළ ගැබ්ව තිබුණු සුවිසල් වගකීම ඒ මොහොතේ ඇගේ හදවතට බර වැඩි වුවත්, දේවකට පිළිතුරක් දීමට තබා, පුදුසු පිළිතුරක් සිතා ගැනීමටවත් කාලයෙන් අවකාශයක් නොවිණි. දේවක රියෙන් බැස විත්, අනුපමාට බැස ගැනීමට ආධාර කළේ ය. සිහිවිලිවලට ඉඩ නොතබා, සිදුවීම්වලට පමණක් ඉඩ හදමින් ඒ සන්ධ්‍යාවේ අවර කොටස වේගයෙන් ගෙවී යමින් තිබිණි.

දේවකගේ මවගේ අත තිබූ සමන් පිච්ච මල් දැමූ වතුර විදුරුවෙන් උගුරක් මුවට ගත් අනුපමා හා දේවක ඇ ඉදිරියේ දණ බිම ඔබා ආචාර කොට, විසල් නිවසේ ඉදිරි ද්වාරයෙන් ඇතුළතට පා තැබුහ. සාම්ප්‍රදායික චාරිත්‍ර වාරිත්‍ර ඉටු කෙරෙමින් හෝරාවකට පමණ කාලයක් ගතවී ගොස් තිබිණි. රත්මුතුගල වළව්ව තුළ වූ ශ්‍රී විභූතිය ඉදිරියේ අනුපමාගේ ඇතැම් ඥාතීහු මදක් සිත් තුළින් කැළඹී උන්හ. එහෙත්, අනුපමාගේ අත දේවකගේ අත පත් මොහොතින් මතු ඒ කිසිදු හැඟීමකින් ඵලක් තිබුණේ නැත. සියලු සැප සම්පතින් ආඪ්‍ය ලොවක අභිෂේක ලැබීමට ලැබූ වරම, ලෝකය ඇගේ වාසනාව දැයි අවාසනාව දැයි තීරණය කිරීම කාලයට බාර කටයුත්තක් පමණක් බව සියල්ලෝ ම දැන සිටියහ.





මංගල උත්සවය පැවති හෝටල් භූමියේදී රිසි සේ තම මාපියන් අබිමුව හඬා වැළපුණත්, ඒ මොහොතේ අනුපමා හැකි තාක් ආයාසයෙන් හැඬුම් වළකා ගැනීමට උත්සාහ දැරුවාය. තමාගේ මවටත්, පියාටත් නිදුක්, නිබය සිතින් පිටවී යන්නට ඉඩ සලසා දෙන්නට ඇගේ සිත තුළ ඉපදී තිබුණේ පුදුමාකාර ඕනෑකමකි. ගසට පොත්ත මෙන් මාපියන් හා සබැඳී ජීවත් වූ ඇ, ඒ අවසාන මොහොතේ නොහඬා හිඳින්නට දැඩි පරිශ්‍රමයක් දැරුවා ය.

දියණියට සමුදී ගත නොහැකිව දෙපසින් බලා හිඳින තම මාපියන් දෙස අනුපමා බැලුවේ පුදුමාකාර කුළුණුබර දැසකිනි.

"ගිහින් එන්න අම්මා.. මං හොඳින් ඉන්නම්.. දැන් ගිහිල්ලා ඉක්මනට ආපහු එන්න අප්පච්චි.. අම්මයි අප්පච්චියි ආපහු එනකල්.. මම මග බලන් ඉන්නවා.."

තවත් මොහොතකට පසු අනුපමාගෙන් සමුගත් මාපියන් ඇතුළු ඥාති පිරිස නොපෙනී යනතුරු ම විසල් විවෘත ආලින්දයේ කුළුණකට බර දී බලා උන් අනුපමා.. එයින් මතු ද බොහෝ වේලාවක් නිස් මාවත දෙස නිස් දැසින් බලා උන්නා ය.

"පුතේ.. අපි ඇතුළට යමු දැන්.."

දේවකගේ මව පැමිණ අනුපමාගේ සුරත මෘදු ලෙස අල්වා ගත්තා ය. සෙමෙන් නිස සැලූ අනුපමා, දේවකගේ මවගේ සුරතෙහි පැටලීගෙන ම ආපසු හැරුණා ය. ඇයට පසුපසින් දේවක ද රැඳී උන් බව අනුපමා දුටුවේ ඒ මොහොතේ ය.

"දුව්ව ඇතුළට එක්ක යන්න පුතේ.. දුව.. පුතාට උඩ



The Reader's Place Novel

තට්ටුවෙත් කාමරයක් තියෙනවා.. පහළ තට්ටුවෙත් කාමරයක් තියෙනවා.. දෙක ම එක ම විදියට ලෑස්ති කරලයි තියෙත්තෙ.. දුව කැමති කාමරේකට යන්න පුළුවන්.."

අනුපමා, දේවකට හා මවට එකම සිනාවක් තිළිණ කළා ය. දේවක අනුපමා දෙස බැලුවේ පිළිතුරක් අපේක්ෂා කරන දැසිනි.

"කියන්න අනූ.. අනූ කැමති කොයි රූම් එකටද..?"

අනුපමා සෙමින් කටහඬ විවර කළා ය.

"උඩ තියෙන රූම් එක හොඳයි දේවි.."

"හරි.. අපි එහෙනම් උඩට යමු අම්මා.. තරංගට කියන්න අනූගෙ බෑග්ස් ටික උඩට ගෙනල්ලා දෙන්න කියලා.."

දේවක, අනුපමාගේ සුරත ගෙන උඩු මහලේ දිගු පියගැට පෙළ නගින්නට වූයේ ය.

"පාන්දර ඉඳන් මෙහෙම ඇඳන් ඉඳලා ඔයාට ගොඩක් මහන්සි ඇති නේද අනූ..?"

අනුපමා මදහසක් දෙතොලතර තවරා ගෙන දෙපසට හිස සැලුවා ය. උඩරට මනාලියගේ ඇඳුම් ආයිත්තම් කට්ටලයෙන් හැඩ ගන්වා තිබුණු ඈ, ඇගේ මංගල දිනයේ සොඳුරු ම මනාලියකව සිටියා ය.

"ජීවිතේට ම එක දවසනෙ දේවි.. මහන්සි උනත් මහන්සියි කියලා හිතන්න හොඳ නෑ.."





අනුපමාගේ සහනශීලීත්වය පිරුණු සිත පිළිබඳව දේවකගේ සිත තුළ සතුට ඉතිරුණා ද, එළඹෙන්නා වූ මොහොතක් පාසා ඒ සතුට දිය කර හරින බිය තමා ලුහුබැඳ පැමිණෙන බව දේවක දැන සිටියේ ය. දේවක තම බිරිඳගේ අතින් අල්ලාගෙන උඩු මහල දෙසට ඇවිද ගියේ, කවර හෝ මොහොතක තමා කරා පැමිණෙන එම බිය හදවත තුළ තෙරපවාගෙන ය.

දේවකගේ විසල් නිවස්නෙහි භාත්පස දක්නට ලැබෙන ශ්‍රී විභූතිය තුළ අනුපමා දැස අලවා ගන්නට ගියේ නැත. ඈ අදහනු ලබන ජීවන යථාර්ථයන්ට දේවකගේ ලෝකයේ පිරී පවතින භෞතික සම්පත් සමුදාය වැදගත් සාධකයක් වූයේ නැත. සෙමින් චලනය වන යන්ත්‍රයක් සේ, ඈ, දේවක පසුපස ඇදී ගියා ය. උඩු මහලේ ආලින්දයට හා පිටුපස සඳැල්ලට ද විවෘත වන, උඩු මහල මධ්‍යයේ පිහිටි විශාල එහෙත් සොඳුරු නිමාවකින් යුතු තමාගේ කාමරයේ ද්වාරය, දේවක, ඒ මොහොතේ විවෘත කළේ, තමා වෙනුවෙන් නොව තමාගේ පතිනිය බවට පත්වූ අනුපමා වෙනුවෙනි. අනුපමා, දේවක සමග ඔහුගේ පෞද්ගලික කාමරය වෙත ඇතුළු වූයේ සහසක් ප්‍රාර්ථනා ළය දරා ගත් පතිනියක ලෙසිනි. දේවක, අනුපමාගේ දැත දැතින් ම ගෙන, ඇයට සම්මුඛව සිට ගෙන ඇගේ දෑසට එබී බැලුවේ ය. අනුපමා, ඒ මොහොතේ දේවක දෙස බැලුවේ එදින උදෑසන කාලය දක්වා ඔහුගේ ලෝකයේ උන් යෝජිත මනාලිය ලෙස නොව, ඔහුගේ සදාදරණීය බිරිඳ ලෙසිනි.

"අනූ..."

"ම්.."



The Reader's Piece Novel

"මේ තමයි අපේ අලුත් ලෝකෙ.."

"හ්ම්.."

"අපි දෙන්නා අතර සිද්ධවෙන හැමදේම සිද්ධ වෙන්න ඕන.. මේ බිත්ති හතර ඇතුළෙ අනූ.."

"මම දන්නවා දේවි.. ඔයාට හොඳ බිරිඳක් වෙන්න බලාපොරොත්තු වෙනවා නම් මම ඒ පොරොන්දුව ඔයාට දෙන්න ම ඕන.. අපි දෙන්නගෙ ලෝකෙට විතරක් ම අයිති දේවල් මේ බිත්ති හතරෙන් පිටතට යන්න නොදී රැක ගත්තමට පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා දේවි.."

ඇඟිල්ලකුදු ගත නොවී, දේවකගේ දෑසට කඳුළු පිරුණේ, අනුපමාගේ වදන්වල තැවරී තිබුණු සෙනෙහෙබර බව ය. දේවකගේ දෑසට නැඟුණු කඳුළු දුටු අනුපමාගේ හදවත ද සසල විය.

"ඇයි දේවි..?"

"ඒ වචන මොන තරම් ආදරණීය ද..?"

"මේ තරම් කාලයක් නම්.. මගේ වචනයි ක්‍රියාවයි අතර කිසිම වෙනසක් තිබුණෙ නෑ දේවි.. මම කියපු දේමයි කළේ.. කරපු දේමයි කිව්වෙ.. ඉදිරියටත් ඒ දේවල් වෙනස් වෙන එකක් නැතිවෙයි.."

අනුපමා කියුවා නොව සිහින් සරින් මිමිණුවා ය.

"මං ඔයාට ගොඩක් ආදරෙයි අනූ.. මාව විශ්වාස කරන්න.."





දේවක, පළමු වතාවට, අනුපමා දැතින්ම සමීපයට ගෙන තම ළයට ගුලි කර ගත්තේ ය. අනුපමා ද නිසොල්මනේ ම තම සැමියාගේ ළයට හිස බර කර ගත්තා ය. දෙදෙනා ඒ අත් විඳිමින් උන්නේ පෙර කිසිදා නොවිඳි පහසකි. මිහිරකි. සෙනෙහස යනු ආත්මීය සුව ගෙනෙන එතරම් සොඳුරු සංවේදනාවක් යැයි අනුපමා එතුවක් දැන නොසිටියාය. ප්‍රේමයක පූර්ව කාලීන අත්දැකීම් සපිරි දේවකට එය එතරම් ආගන්තුක හැඟීම් නොදැනෙව්ව ද, අනුපමාට නම් දේවකගෙන් තිළිණ ලද ලෝකය මුළුමනින් ම නැවුම් වූවක් විය.

"දේවි.. ඔයාගෙ නෑදෑයො සේරම අද රෑට මෙහෙ ඉන්නවද..?"

අනුපමාගේ දෑසට දැස හසුවන මොහොතක් පාසා, දේවකගේ දෑසේ ඇඳෙන මන්දස්මිතයට අනුපමා බෙහෙවින් ම ප්‍රිය කළා ය.

"කවුරුත් යන එකක් නෑ අනූ.. හැමෝට ම ඉතින් අද සතුටු දවසක්නෙ.."

අනුපමාගේ උවනේ ඒ මොහොතේ ඇඳී තිබුණේ, සදාදරණීය බිරිඳකගේ උවනක ඇඳෙන පහන් මන්දස්මිතයකි.

"ඔයා එයාලා නැමෝගෙම ලොකු පුතානෙ.. අද දවසෙ එයාලට ඒ සතුට නිදහසේ විඳගන්න ඉඩ තියෙන්න ඕනනෙ.. එක අතකින් ලොකු මාමාලා බාප්පලා හැමෝ ම පව් දේවි.. ඒ වගේ ම.. ඒ තරම් ලොකු පිරිසකගෙ ආදරේ ලබන්න තරම් ඔයා වාසනාවන්ත උන එකත් ලොකු පුදුමයක්.."

අනුපමා-දේවක.. ඔවුහු ජීවන ගමනේ දෙමංසලකදී අහම්බෙන්



The Reader's Place Novel

හමුවූවෝ වූහ. එහෙත්, දෙවයේ ප්‍රකාරව ඔවුන්ට උරුම වූයේ එකම ජීවන මගකි. ඔවුහු, එදින උදෑසන රන් හුය දැහිල්ලෙහි පැටලූ මොහොතේ පටන්, ඒ එකම ජීවන මාවත තුළ ගමනාරම්භ කළහ.

"අනූ.. එන්න මම ඔයාට චේන්ජ් කරගන්න හෙල්ප් කරන්නම්.."

අනුපමා මදහසක් දෙතොලතර රඳවාගෙන, දේවක දෙස බලා දෙපසට හිස සැලුවා ය.

"මම හෙමින් චේන්ජ් කර ගන්නම් දේවි.. ඔයා පහළට ගිහිල්ලා ඉන්න අය ගැන බලලා එන්න.. ලොකු මාමට, අම්මට එහෙම පුදුම විදියට මහන්සි ඇති.. මගේ වෙඩින් එක මේ වගේ ග්‍රෑන්ඩ් වෙඩින් එකක් වෙයි කියලා මම කවදාවත් හිතුවේ නෑ දේවි.."

අනුපමාගේ දෑසට කඳුළක් නැඟී ආවේ, නොපැතූ යමක් ඉටු වන මොහොතක යුවතියකගේ ළයකට දැනෙන අපරිමාණ බර දරාගත නොහැකිව ය. දේවක වදනින් කිසිවක් ම කීමට උත්සාහ නොකළේ ය. තම ප්‍රියාදර බිරිඳගේ නළලත මෘදු හාදුවක් තැවරූ දේවක පහත මාලය බලා පිටව ගියේ ය. හිසෙහි පටන් පළඳා තිබුණු ආභරණ එකින් එක ඉවත් කරද්දී, අනුපමාගේ සිතට සේ ම ගතට ද දැනෙන්නට වූයේ අපූර්වත ම සැහැල්ලුවකි. සියලු ආභරණවලින් නිදහස් වූ ඇ, හැඳ උන් මංගල ඔසරිය ඇහලාගෙන ම යහනෙහි වැතිරී දෑස පියා ගත්තා ය. සැහැල්ලුව හා වෙහෙස මතින් ඇගේ දෑස පියවී යන්නට සූදානම් වූ අවසාන තත්පරයේ සිහිනයෙන් සේ ඇසුණු අමුතු ශබ්දයකින් තිගැස්සී, ඇ දෑස දෙපියන් හැරියා ය.





"ෂ්.. ෂ්.."

ගොරෝසු අමිහිරි හඬක් දෙවන, තෙවන වරටත් සවන් වැටෙද්දී, තමා දුටුවේ සිහිනයක් නොවන වග අනුපමා හඳුනා ගත්තා ය. තමාට ඇසෙනුයේ සැබෑ ලොව තුළ සැබැවින් ම නැගෙන හඬක් බව නිශ්චය වූ මොහොතේ, ඈ වැතිරී උන් යහනින් ඉද්ද ගැසුවා සේ නැඟී සිටියා ය.

"ක්.. කවුද.. දේ..වි.. දේවි..?"

ඇයට නගන්නට උවමනා වූ පරිමාණයෙන් ඇගේ හඬ පවා මුවින් පිටවූයේ නැත. එතරම් ම ඈ බියපත්ව සිටියා ය. දේවක රන්මුතුගල නීතිඥ මහතාගේ බිරිඳ වී ඔහුගේ නිවසට පැමිණි අනුපමා, අසුරු සැණක් වත් කාලයකදී ඔවුන්ගේ කාමරයේ දොරින් එබී, තමා දෙස බලා හිඳින දෙ රූ දැක හිතියෙන් ගල් ගැසුණා ය. යටි ගිරියෙන් කැගැසෙන්නට ගිය ද, සැණෙකින් සිය මුව සුරතින් වසා ගත් ඈ, තමාගේ දෑස් ඉදිරියේ දිස් වූ අද්භූත සත්වයන් දෙදෙනා දෙස හිතියෙන් හිතියට පත්වී බලා සිටියා ය. ඈ යළි පියවි ලොවට පැමිණියේ ද, අහඹු මොහොතක දෑස මානයට ආ අමුතු සත්වයන් දෙදෙනාගේ කට හඬිණි.

"ඕගොල්ලො.. ක්.. කවුද.. ඇ.. ඇයි මෙහෙ ආවෙ..?"

අමුතු සත්වයන් දෙදෙනා දොර තිරය අසලින් මැත් වී, තමා දෙසට ඇවිද එනු දුටු අනුපමා, දරා ගත නොහැකි තිගැස්මෙන් යහනෙහි හිඳ උන් තැනින් ද නැගිට පසුපසට වන්නට වූවාය.

"අක්කා.. කාමරේට එන්නං..???"



The Reader's Place Novels

ඒ හඬත් සමඟම, අනුපමාගේ සියලඟ දහඩියෙන් තැනැව්, දැස ද බියෙන් විසල් වී, ඈ ගැහෙන්නට වූවා ය. ඇගේ දැස මානයේ දිස්වන රූ අතර වූ කාන්තා රූව, විරූපී පෙනුමක් සහිත මුහුණක් ඇත්ති, ඇස් වපර, කොර ගසන්නියක වූවා ය. ඈ පසුපසම ඇදී ආ පුරුෂ රූව, සහමුලින් ම මන්ද මානසික ස්වරූපයක් ඉසිලී ය. එවන් මොහොතක කිසිසේත් ම දකින්නට අපේක්ෂා නොකළ අද්භූත ජීවීන් දෙදෙනා, තමා වෙතට ම ඇදී එනු දුටු අනුපමාගේ පියවි සිහිය එළඹී ඇයට ඉබේට ම කෑගැසිණි.

"අ..න්..නේ.. දේ..වි..?"

භද්‍රාසීන් සමඟ මදක් සාමීචියේ යෙදී හිඳ, යළි අනුපමා වෙත පැමිණෙමින් උන් දේවකට, උඩු මහලේ ආලින්දය හරහා පැමිණෙන මොහොතේදී තම බිරිඳගේ බියපත් ඇමතුම් හඬ සවනට වැටිණි. අනුපමාගේ බියපත් හඬින් අඩියට දෙකට කාමරයට පැමිණි දේවකගේ මුහුණේ ඇඳුණේ, කිසිදා කිසිවෙකුට වචනයෙන් විස්තර කළ නොහැකි අන්දමේ පශ්චාත්තාපයකි. දේවක වෙත දිව යන්නට මෙන් එසවුණු අනුපමාගේ දෙපා උන් තැනම ගල් ගැසුණේ, දේවකගේ දැසේ ඇඳී තිබුණු පසුතැවිල්ලේ පරිමාණයට ය.

"අයියා... මනමාලි අක්කා.. ලස්සනයි.."

මන්ද මානසික තරුණයා ගොත ගසමින් ගළපා ගනිද්දී, අනුපමාගේ ළය බියෙන්, චකිතයෙන්, අපේක්ෂා භංගත්වයෙන් සේ ම වේදනාවෙන් ද ඇළලී ගියේ ය. මොහොතින් මොහොත තමාගේ ලෝකයට කඩා පාත්වන අහම්බයන් වටහා ගැනීම ඇගේ සියුමැලි හදවතට පහසු නොවිණි.





"ක්.. කවු..ද.. දේවි.. මේ..?"

දේවකගේ දැසින් කඳුළු දෙපේළියක් රූරා වැටෙන්නට විය. අනුපමාගෙන් සඟවා ගත් එකම සත්‍යය ද පමණටත් වඩා වේලාසනින් කල එළි බැස තිබිණි. දේවකගේ දැසේ ඇඳී තිබුණේ අනුපමාගේන් සමාව අයදින, එතෙක් උරුමව තිබූ සමස්ත ජීවිතය ම අහිමිව ගිය අයෙකුගේ දැසේ ඇඳෙන්නාක් වන් පරාජිත බැල්මකි. අනුපමා, දේවක දෙස බලා සිටියේ, දකිමින් උන් සොඳුරු සිහිනයකින් හදිසියේ ම අවදි වී, අඳුරු අගාධයකට ඇද වැටුණාක් වැනි බියකරු සිතිවිලි සමුදායක් සමඟිනි.

"දේ..වි.. මේ කවුද..?"

දේවක.. අනුපමාට පිළිතුරු දීමට අසීරුවෙන් මුව විවර කර ගත්තේ ය.

"මේ.. මගෙ ම.. නංගියි මල්ලියි අනූ..!"

අනුපමාට දැනුණේ කිසිවෙකු විසින් තම හිස මතට තදබල පහරක් එල්ල කළාක් වැනි දරුණු වේදනාවකි. ගතින් සේ ම සිතින් ද අවසන්ව ගිය ඈ යහන කොණක හිඳ ගත්තා ය. එයින් මතු.. ඒ රෑ පුරා.. අනුපමාගේ ඉකිබිඳුම කඩින් කඩ අලුත් විය.

"ප්ලීස් අනූ.. මට සමාවෙන්න.. ඔය විදියට අඬන්න එපා.."

ප්‍රශ්නයක් ඉදිරියේ ගොළුවන පිරිමි, යහපත් පෞරුෂයකට අනුචිත ගුණාංගයක් බව දන්නා බැවින්, හැඬුම් අතරින් වුවත් අනුපමා දේවක හා දොඩමලු වූවා ය.



The Reader's Place Novel

"මට තියෙන ප්‍රශ්නෙ.. ඇයි ඔයා මට බොරු කළේ දේව..???"

දේවකගේ දෑස යළිත් වතාවක් කඳුළින් තෙත් වනු දුටු අනුපමාගේ ළය, හෝරා කිහිපයක් මුළුල්ලේ ඔහු කෙරේ තොවූ අනුකම්පාවකින් සසැලෙන්නට විය.

"මං ඔයාට ඇත්ත කිව්වෙ නෑ තමයි.. ඒත්.. මම ඔයාට බොරු කළේ නෑ අනූ.."

අනුපමාට, ජීවිත කාලයක් මුළුල්ලේ කල්පනා කරමින් හිඳිමට තරම් කරුණු කාරණා ගෙවී ගිය හෝරා දෙක තුනක කාලය තුළ ඒකරාශී වී තිබිණි. එහෙත්, විවාහය නමැති බන්ධනයෙත් බැඳුණු පසු, දෛවය විසින් කවරාකාරයේ උරුම කරුමකම් ගෙනැවිත් දුන්නද, ඒ සියල්ල ජීවිතය කොට බාර ගත යුතුව අනුපමා අසා තිබුණා ය.

"ජීවිත කාලෙට ම මීට වඩා වැරැද්දක් මගේ අතින් ඔයාට සිද්ධ වෙන්නෙ නෑ ආයෙත් කවදාවත් ම.. මට සමාවෙන්න අනූ.."

අනුපමා, දෑස අගින් ගලා යන කඳුළට අලුත් වන්නට ඉඩ නොදී, ආයාසයෙන් ඉවුරු බැන්දා ය.

"ඇයි දේව්.. මේ දේවල් මට කලින් නොකිව්වෙ..? මේ වෙලාවෙ මං ඔයාගෙන් අහන ප්‍රශ්නෙ මෙච්චරයි.. ඔයාගෙ පරම්පරාවෙ ගොඩක් අයට දරුවො නෑ.. ඔයා ඇරුණාම.. ඉන්න අනිත් අයත් මේ වගේ අඩුපාඩු තියෙන දරුවො නම්.. ඔයා මාව විවාහ කර ගත්තේ.. ඔයාගෙ පරම්පරාව වෙනුවෙන් නීරෝගී දරු සම්පතක් බලාපොරොත්තුවෙන් විතරමද දේව්..?"





අනුපමා පැනයක් ලෙස විමසුයේ ඔහුගේ තුන් සිතක නෝ නොවුණු අරමුණක් පිළිබඳව ය.

"එකම එක වතාවක් ඇත්ත නොකිව්වට.. මම මේ කියන කිසිම දෙයක් බොරු නෙමෙයි අනූ.. මම ඔයාට මීට කලින් නංගිගෙයි මල්ලිගෙයි ඇත්ත තත්වය නොකිව්වෙ.. මට ඔයාව නැති කරගන්න බැරි හින්දා.. මට ඔයා නැතිවෙයි කියලා බය හිතුණා අනූ.. ප්‍රපෝසල් එකකින් අපි මුණ ගැහුණට.. දැකපු පළවෙනි මොහොත ඉඳන්.. මං ඔයාට පුදුමාකාර විදියට ආදරේ කළා.. ඔයාට මගේ ළඟ තව ටිකක් කල් ඉන්නකොට ඒ ආදරේ මොන වගේද කියලා තේරුම් ගන්න පුළුවන් වෙයි අනූ.."

දේවක සමඟ තවදුරටත් කතා කිරීමෙන් සිත වෙහෙස කරවන්නට අනුපමාට අවැසි නොවිණි. තමා ලෝකය තුළ මුළුමනින් ම නුදෙකලා වූවාක් වැනි වේදනාකාරී හැඟීමකින් ඇගේ ළය දැවෙන්නට විය. ඇයට උවමනා වූයේ කිසිවෙකුටත් නොපෙනී, සැඟවී ළය තුළ වන බර විරේක වන තුරු නිදහසේ හඬා වැටෙන්නට ය. එහෙත් දේවකගේ විසල් ලෝකය තුළ එවැන්නකට පවා ඇයට නිදහසක් නොවිණි.

"අනූ.. එකොළහයි වෙලාව.. ප්ලීස්.. නැගිටලා චේන්ජ් එකක් දාගෙන.. අපි පහළට ගිහිල්ලා කෑම ටිකක් කාලා එමු.. ප්ලීස්.."

අනුපමා, දේවක දෙස බැලුවේ අසරණ දෑසිනි.

"මට බඩගිනි නෑ දේව්.. මට කන්න බෑ දැන්.."

දේවකගේ සියලඟ ම වූයේ අන්ත පරාජිත ස්වරූපයකි.



The Reader's Place Novel

"අනූ ප්ලීස්.. එහෙම කරන්නෙපා.. නංගියි මල්ලියි ගැන දැනගත්ත හින්දා.. ඔයා අප්සෙට් වෙලා කියලා හැමෝම ගොඩක් බයවෙලා ඉන්නෙ.. මේ මොහොතේ ඉඳන්.. හැම දෙයක්ම තීරණය වෙන්නෙ ඔයාගෙ අතින්.. අපි හැමෝගෙම දෛවය දැන් ඔයාට බාරයි අනූ.."

අනුපමාගේ දෑසින් යළින් කඳුළු පිට පැන්නේ ය.

"ඒ තරම් ලොකු වගකීමක් මට පවරන්නෙපා දේවි.. මගේ අතින් ඕගොල්ලන්ට ගොඩක් වැරදි සිද්ධ වෙන්න පුළුවන්.. ඒ තරම් ලොකු වගකීමක් බාරගන්න තරම් මම මානසිකව ඒ තරම් පිරිපුන් කෙනෙක් නෙමෙයි දේවි.."

දේවකට පිළිතුරක් දෙන්නට ඉඩක් නොතබා, ඔහුගේ ඊංගම දුරකතනය යළිත් නාද වන්නට විය. තිරයේ දිස්වන අංකය දුටු දේවක, අනුපමා දෙස බැලුවේ වියවුල් වූ දෑසිනි. ඇමතුම පැමිණියේ අනුපමාගේ නිවසිනි.

"අප්පච්චි ආයෙත් ගන්නවා අනූ.."

අනුපමාගේ ළය ඒ මොහොතේ ගිනි ගෙන දැවෙන්නට වූයේ ලොව වන දරුණුතම වේදනාවන්ගෙන් එකකිනි. විහඟ පෝතකයෙකු සේ සෙනෙන් හැඳී වැඩී, මාපිය තුරුලෙන් නික්ම ආ දා ම, රුදුරු ව්‍යාජයකට හසුවී වේදනා විඳීමට සිදුවීම කවර නම් පාපයක්දැයි ඈ ඒ මොහොතේ කල්පනා කළා ය. දෙවරක් නොසිතා ඈ දේවකට පිළිතුරක් දුන්නා ය.

"කියන්න මම කෑම කාලා ආපහු නිදාගත්තා කියලා.. ඔළුව කැක්කුම පොඩ්ඩක් අඩුයි කියන්න.. අම්මටයි අප්පච්චිටයි නිදාගන්න කියලා මම කිව්වා කියන්න.."





දේවක, අනුපමා දෙස බැලුවේ පුදුමයෙන් විසල් කරගත් නෙතිනි.

"එතකොට.. මේ සිද්ධ උන දේවල් අනූ අම්මටයි අප්පච්චිටයි කියන්නෙ නැද්ද..?"

අනුපමා, ස්ථිරසාර ලෙස හිස දෙපසට වැනුවා ය.

"නෑ.."

බිරිඳගේ පිළිතුර ඉදිරියේ දේවකගේ සිත තුළ උපන් පුදුමයට නිමාවක් නොවිණි.

"ඒ ඇයි අනූ..???"

අනුපමා, පිටත්ලෙන් කම්මුල් මත තැවරී තිබුණු කඳුළු පිස දා ගත්තා ය. මුවැත්තියගේ අවිහිංසක දෑසේ ඒ මොහොතේ ඇදී තිබුණේ, සිංහ ධේනුවකගේ මෙන් එඩි පිරුණු බැල්මකි.

"අම්මයි අප්පච්චියි මාව ඔයාට බන්දලා දුන්නෙ.. එයාලගෙ හදවත උඩ තියාගෙන හිටිය බරකින් නිදහස් වෙන්න.. කසාද බැඳලා ආව පළවෙනි දවසෙ ම.. මට බෑ දේවි ඒ සැනසීම විනාශ කරලා දාන්න.. තනියම මම මොන දුකක් වින්දත්.. මම මගේ දෙමව්පියන්ට ගින්දර දෙන්නෙ නෑ.. ලබන සතියෙ ඒ දෙන්නා මේ රටින් පිටවෙලා යනවා.. අද ලබාගත්ත ඒ සතුට එහෙම ම තියාගෙන.. ඒ දෙන්නා ගියාවෙ දේවි.. මටත් උරුම දුක නම්.. ඒ දුක මම තනියම විඳ දරාගන්න ඕන.. මම කැමති නෑ මම රැවටුණා කියලා මගේ අම්මයි අප්පච්චියි හිතනවට.."

අනුපමා පැවසුවේ රළු ස්වරයකින් නොවුණත්, එවදන



The Reader's Place Novel

දේවකගේ ළයෙහි ඇනුණේ තියුණු යවුල් ලෙසිනි. දේවකගේ වදන් වලට මුසුව පැවති වේදනාව, අනුපමාගේ කැළඹුණු හදවතට පමණටත් වඩා විසල් වේදනාවක් විය.

"ජීවිත කාලයට ම.. මට ඔයාගෙන් සමාව ලැබෙන එකක් නැද්ද අනූ..?"

අනුපමා දේවක දෙස බැලුවේ ආයාචනාත්මක දැසිනි.

"මේ වෙලාවෙ.. මගෙන් මොකුත්ම අහන්න එපා දේවි.. ඔයා අහන එකම දේකටවත් උත්තර දෙන්න තරම් මගේ මනස මේ වෙලාවෙ නිරවුල් නෑ.. මේ මම මූණ දෙන්න වෙයි කියලා කිසිම දවසක හිතුවෙ නැති අත්දැකීමක්.. නොදන්න ලෝකෙකට ඇවිත්.. තවත් නොදන්නා දේවල් ඇස් ඉස්සරහා සිද්ධ වෙද්දි.. ඒවා විඳ දරාගන්න මම දන්නෙ නෑ දේවි.. ඔයාට හොඳ බිරිඳක් වෙන්න මම පොරොන්දු උනා.. ඒ හින්දා.. මේ බිත්ති හතරින් එළියට යන්න නොදී.. අපි අතර සිද්ධවෙන හැමදේ ම රැකගන්න මම පුළුවන් තරම් උත්සාහ කරන්නම්.. ඒත්.. ඔයාගෙ බිරිඳ විදියට.. හිතේ කිසිම බරක් නැතුව මේ ගෙදරට ආව මගේ හිත උඩට.. මොකක්දෝ වේදනාවක් කඩාගෙන වැටුණා දේවි.. හරියට.. හදිසියේ මහා විනාශයක් සිද්ධ උනා වගේ.. ඒ හින්දා.. මට මගේ හිත හදාගන්න කාලයක් ඕන වෙයි දේවි.."

අනුපමා, හිඳ උන් අසුනින් අසීරුවෙන් නැගිට ගත්තා ය.

"මම වේන්ජ් කරගෙන එන්නම් දේවි.. අපි පහළට යමු.."

අනුපමා කීවේ, ආරෝපණය කර ගත් ශක්තියකිනි. දේවක, උන් තැන ම ගල් ගැසී සිටියේ කිසිවක් කර කියා ගත නොහැකිව





ය. අනුපමා ඉදිරියේ සත්‍යය සහවා ගැනීමෙන් තමා කළ වරදෙහි බරපතලකම ඔහුගේ හදවතට මහා පරිමාණ වදයක් වෙමින් පැවතිණි.

"මං උදව් කරන්නද අනූ..?"

"එපා.. මට පුළුවන්.."

අනුපමා, බිඳුණු සිත සුවපත් කර ගැනීමට ආයාසයෙන් වෙර දරමින් ම, කාමරයට යාබද නාන කාමරය දෙසට ඇවිද ගියා ය.

වේලාව මධ්‍යම රාත්‍රී දොළහට ද ආසන්න වී පැවතුණ ද, අනුපමා දිය නා ගත්තා ය. කේශ කලාපයේ සිට පාදාන්තය දක්වා ම ගල්වා තිබූ කෘත්‍රිම ආලේපන, සෝදා හැර අබරණ ආදිය මුදා දමා නිදහස් වූ කලෙක දැනෙන සැහැල්ලුව සිතට කෙසේ වුවත්, ගතට නොමදව දැනෙමින් තිබිණි. ඇ, සහමුලින් ම දේවකට සමීප වීමට හෝ දුරස් වීමට හෝ නොහැකි අතරමැදි සිතකින් පසුවූවා ය. දිය නාගෙන පැමිණෙන අනුපමා දුටු මතින් දේවකගේ සිත තිගැස්සිණි.

"අනූ.. මේ රෑ නැවද..?"

"හෙයා ස්ප්‍රේවලට කොණ්ඩෙ ඇලිලා ගන්න දෙයක් නෑ දේවි.. නොනා බෑ.."

"ඔයා අසනීප උනොත්..? එහෙනම් අපි කෑම කාලා පැනඩෝල් දෙකක් බොමු.."

අනුපමා හෝරා ගණනාවකට පසු හිනැහෙන්නට උත්සාහ දැරුවා ය.



The Reader's Place Novel

"ගොඩක් හිතන්නෙපා දේව.. අපි එන විදියට මුණ දෙමු.."

සිදුවූ අනපේක්ෂිත සිදුවීම හමුවේ අනුපමා මනසින් අගාධයකට ම ඇද වැටී සිටියා ය. විවාහය යනු ගැහැනියකගේ ජීවිතය සහමුලින්ම කණු පිට හරවන බන්ධනයක් වග විවාහ වී සැමියාගේ නිවසට පැමිණෙ හෝරාවක් ගෙවී යන්නටත් මත්තෙත් අනුපමා අවබෝධ කර ගත්තා ය. දරා ගැනීමට අසීරු දෝමනස්සයන් අනන්තයක් ළයට තුරුළු කරගෙන අවසන සිතින් ඈ දේවක පසු පසින් ඇදී, පහත මාලයේ වූ ඥාති සමූහයා මැදට වූවා ය. අනුපමා දුටු මතින් දේවකගේ මව හඬන්නට වූවා ය.

"බොරුවක් කරලා ඔයාව රවට්ටන්න අපිට ඕන උනේ නෑ පුතේ.. ඒත්.. කටක් ඇරලා කියාගන්න බැරි ඒ අසරණකම හිත්ද ම.. අපේ අතින් මහ විශාල වැරැද්දක් දුවට සිද්ධ උනා.. ඒකට කොහොම සමාව ඉල්ලන්නද කියලා අපි කාටවත් තේරුමක් නෑ පුතේ.."

දුබල සඬින් තැගෙන දේවකගේ මවගේ වැළපිම, අනුපමාගේ මෘදු කාරුණික ළයට දරා ගැනීම පහසු වූයේ නැත.

"සිද්ධ උන කිසිම දෙයක් ගැන ආයෙමත් කතා කරන්න ඕන නෑ අම්මා.."

අනුපමාගේ තඩ නොසිතූ ම තැනෙකදී බිඳී ගොස්, ඇයට තවදුරටත් කතා කර ගැනීමට නොහැකි වී, දෑසේ කඳුළ ඉසපාර විය. මද්දකගේ ලොකු මාමාගේ බිරිඳ ද අනුපමාට පවීස වූයේ, විසල් පසුතැවීමක් දැමසේ ඇඳගෙන, සමාව අයදිමිනි. ඒ මෙදුව අනුපමාගේ නිස අතගැවා ය.





"අපි හැමෝම එකතු වෙලා දුවව රැවැට්ටුවා කියලා කවදාවත් හිතන්නෙපා පුතේ.. අපේ පුතා දුවට දක්වපු ආදරය ඉස්සරහා අපි හැමෝම අසරණ උනා පුතේ.."

අනුපමාට අවස්ථාවට උචිත වචන පවා තෝරා ගැනීම අපහසු වී තිබිණි.

"ඒ හැමදේ ම මෙහෙට එන්න කලින් මම දැනගෙන හිටියා නම් හොඳයි නැන්දෙ.. දැන් ඉතින් කරන්න දෙයක් නෑ.. මම විතරක් නෙමෙයි මගෙ අම්මයි අප්පච්චියි දෙන්නත් මේ හැම ඇත්තක් ම දැනගෙන ඉන්න තිබුණා.. කවද හරි දවසක දේව් එයාගෙ සල්ලි බලය පෙන්නලා.. මාව රැවැට්ටුවා කියලා ඒ දෙන්නට උනත් හිතුණොත්.. ඒක මහ අපරාධයක් නැන්දෙ.. ලොකද.. හිතාගන්නවත් බැරි තරම් ඒ දෙන්නා දේව්ට ආදරෙයි.."

අනුපමා, නැගෙන්නට ආ හැඬුම, වෙර දරා, නිහඬ කඳුළකට පමණක් සීමා කර ගත්තා ය.

"අම්මයි අප්පච්චියි මේ දේවල් දැනගත්තම ලොකු ප්‍රශ්නයක් වෙයි ද දුව..?"

ඒ පැනය විමසුවේ දේවකගේ පුංචි අම්මා ය. පහළොවක්, විස්සක් පමණ වූ ස්ත්‍රී - පුරුෂ නැදෑ පිරිවර අතරේ පැතිර පැවතියේ ගන නිහඬතාවයකි.

"අම්මයි අප්පච්චියි ලබන සතියෙ ඔස්ට්‍රේලියා යනවා පුංචි අම්මෙ.. ඒ දෙන්නා සතුටින් ඒ ගමන ගිහිල්ලා ආවාවෙ.."

අනුපමාගේ හඬ විටින් විට බිඳී යන්නට විය.



The Readers Place Novel

"මයාට ඒ තරම් ලොකු ආත්ම සංයමයක් තියෙනවා නම්, මයා තරි විසිනට ගැනැනියක් පුතේ.. අපි හැමෝම එකතු වුණා පේන් පුතාට මයාව තෝරගත්ත එක ගැන අපි කාටවත් කිව්වේවූ ම පප්පාවීමක් දැනෙන එකක් නෑ පුතේ.."

දේවකගේ ඇති පරදුර ම එකතු වී යළිත් අනුපමාගෙන් ඌ මත පැවරුණේ, හුදෙකලා හදවතකට තනිව ඉසිලිය හොත්තාම් තරමේ විසල් වගකීමකි. ඈ, ඒ භාර සවියක් සිතට කැරුණු ගන්නට ආයාස දැරුවා ය.

"කෝ.. දැන්.. නංගියි මල්ලියි...?"

අනුපමා, ඒ මොහොතේ විමසුවේ පිළිතුරු දීමට කිසිදේකුත් සූදානමින් නිදි පැනයක් නොවේ. උනුනට එකිනෙකාගේ ඇස් බලාගන්නට සිදුවූයේ එබැවිනි. අනුපමා, එතැන උන් සියල්ලන්ගේ ම මුහුණු දෙස බැලුවේ ප්‍රශ්නකාරී දෑසිනි.

"ඇයි කවුරුත් ම උත්තර නොදෙන්නෙ.. කෝ දැන් ඒ දෙන්නා..?"

අනුපමාගේ වේදනාබර හඬ අතිශය තීරණාත්මක විය.

"අර පිටිපස්සෙ කාමරේ මැණිකත් එක්ක ඉන්නවා දුව.."

දේවකගේ මව, මදක් කාලය ගෙන පිළිතුරු දුන්නා ය.

"ඒ දෙන්නා දේවිගෙ නංගියි මල්ලියි නම්.. ඇයි ඒ දෙන්නව කොණකට තල්ලු කරලා දාන්නෙ අම්මා..? ඒ දෙන්නව එක්ක එන්න.. ඒ දෙන්නා මේ ගෙදර සාමාජිකයො නම්.. මේ අවස්ථාවට ඒ දෙන්නත් සහභාගී වෙන්න ඕන.. දැන් මම ඒ දෙන්නව





දුකලා ඉවරයි.. ඒ හිත්දා දැන් ඒ දෙන්නව තවත් කාමරේකට ඇරලා කැඩලා තියන්න කිසිම උවමනාවක් නෑ පේද දේව්..?"

වේගයෙන් ගලා එන සිසිවිලි දහස් ගණනක් අනුපමාගේ සිත තුළ තැලියන්නට වූව ද, ඒ සියල්ල ඈ තම සිත තුළ ම ගුලි කොට තබා ගත්තා ය.

"අදින් පස්සෙ උනත්... අපි හැමෝගෙ ම ජීවිතවල සිරුයොත්මක කාරකය ඒ දෙන්නා.. ඒ හිත්දා ගිහිල්ලා නංගියි මල්ලියි දෙන්නා අම්ම ගනගෙන එන්න දේව්.."

දේවක, අනුපමාගේ දෑස දෙස බැලුවේ විසඳා ගත නොහැකි තරමේ දෙගිඩියාවෙනි.

"ඒ දෙන්නා මෙතන දෙවනත් කරයි අනු.."

"ඒකට කමක් නෑ.. එක්කරගෙන එන්න.."

අනුපමාගේ හඬට, ඉල්ලීමක ස්වරූපය ඉක්මවා ගිය විධානයක ස්වරූපයක් මුසුවී තිබිණි.



The Reader's Place Novel

"ඔයාට ඒ තරම් ලොකු ආත්ම සංයමයක් තියෙනවා නම්, ඔයා හරි විශිෂ්ට ගැහැනියක් පුතේ.. අපි හැමෝම එකතු වෙලා අපේ පුතාට ඔයාව තෝරගත්ත එක ගැන අපි කාටවත් කවදාවත් ම පසුතැවීමක් දැනෙන එකක් නෑ පුතේ.."

දේවකගේ හඬාකි පරපුර ම එකතු වී යළිත් අනුපමාගේ උර මත පැවරුවේ, හුදෙකලා හදවතකට තනිව ඉසිලිය නොහැකි තරමේ විපල් වගකීමකි. ඈ, යෝධ සවියක් සිතට කැන්දා ගත්තට අායාස දැරුවා ය.

"කෝ.. දැන්.. නංගියි මල්ලියි...?"

අනුපමා, ඒ මොහොතේ විමසුවේ පිළිතුරු දිගටි කිරීමේ පුදානමින් බිඳී පැනයක් නොවේ. උනුනට එකිනෙකාගේ සුසුම් බලාගෙන්නට සිදුවූයේ එබැවිනි. අනුපමා, එතැන උන් සියල්ලන්ගේ ම මුහුණු දෙස බැලුවේ ප්‍රශ්නකාරී දැසිනි.

"ඇයි කවුරුත් ම උත්තර නොදෙන්නෙ.. කෝ දැන් ඒ දෙන්නා..?"

අනුපමාගේ වේදනාකර හඬ අතිශය කිරුළාත්මක විය.

"අර පිටිපස්සෙ කාමරේ මැණිකත් එක්ක ඉන්නවා දුව."

දේවකගේ මව, මදක් කාලය ගෙන පිළිතුරු දුන්නා ය.

"ඒ දෙන්නා දේවිගෙ නංගියි මල්ලියි නම්.. ඇයි ඒ දෙන්නව සොරකමට කල්ලු කරලා දාන්නෙ අම්මා..? ඒ දෙන්නව එක්ක එන්න.. ඒ දෙන්නා මේ ගෙදර සාමාජිකයෝ නම්.. මේ අවස්ථාවේ ඒ දෙන්නත් සහනාධාර වෙන්න ඕන.. දැන් මම ඒ දෙන්නව





දැකලා ඉවරයි.. ඒ හින්දා දැන් ඒ දෙන්නව තවත් කාමරේකට දාලා හංගලා තියන්න කිසිම උවමනාවක් නෑ නේද දේවි..?"

වේගයෙන් ගලා එන සිතිවිලි දහස් ගණනක් අනුපමාගේ සිත තුළ නළියන්නට වුව ද, ඒ සියල්ල ඈ තම සිත තුළ ම ගුලි කොට තබා ගත්තා ය.

"අදින් පස්සෙ උනත්... අපි හැමෝගෙ ම ජීවිතවල තීරණාත්මක කාධකය ඒ දෙන්නා.. ඒ හින්දා ගිහිල්ලා නංගියි මල්ලියි දෙන්නා අඩ ගහගෙන එන්න දේවි.."

දේවක, අනුපමාගේ දැස දෙස බැලුවේ විසඳා ගත නොහැකි තරමේ දෙගිඩියාවෙනි.

"ඒ දෙන්නා මෙතන දෙවනත් කරයි අනු.."

"ඒකට කමක් නෑ.. එක්කරගෙන එන්න.."

අනුපමාගේ හඬට, ඉල්ලීමක ස්වරූපය ඉක්මවා ගිය විධානයක ස්වරූපයක් මුසුවී තිබිණි.



The Reader's Place Novel

# 07

The Reader's Place Voice

විවාහප්‍රාප්ත වූ නව යුවතිපතීන්ගේ සතුට, සැනසීම මුළුමනින් ම සෝදා පාළු කරමින්, දෙදෙනාගේ කඳුළු, සුසුම් අතරින්, මංගල රාත්‍රිය දෙදෙනා දෙපසක ම තබමින් ගෙවී ගොස් තිබිණි. නැවුම් පැතුම් සපිරුණු නැවුම් ලොවක අරුණළු දකින්නට ප්‍රාර්ථනා ඇතිලූ අනුපමාට සිදුවූයේ, නොපැතූ අඳුරු ම ලොවක හුදෙකලා වන්නට ය. සුසුම් හෙළමින් රැය ගෙවා දැමූ දේවකගේ දෑස පියවී ගොස් තිබුණේ අලුයම් යාමයේ ද අග භාගයේදී ය. ඒ කෙටි නින්ද හෝ අනුපමාට උරුම නොවිණි. අරුණ නැඟී ඇතැයි අනුමාන කළ අනුපමා, නිදන කාමරයට ඔබ්බෙන් පිනිටා තිබුණු සඳැල්ල දෙසට සෙමින් සෙමින් ඇවිද ගියා ය.

සියල් සැප සම්පතින් සපිරි වළව් භූමියේ වූ ශ්‍රී විභූතියෙන් අනුපමාට කිසිදු ඇලීමක් හෝ ගැටීමක් ඇති නොවිණි. භෞතික පරිසරයේ පවත්නා සම්පත් උපයෝගී වන්නේ එදිනෙදා ජීවිතය





පහසු කරවීමට විනා, ඒවායින් දියුණු ආධ්‍යාත්මික ජීවිතයක් ප්‍රාර්ථනා කරන්නෙකුට ඇති වැදගැම්මක් නැතැයි අනුපමා අවබෝධ කරගෙන උන්නාය. ඈ, දුරින් දුරට දිස්වන පොල් රුප්පාවට උඩින් නිස් අවකාශයේ දෑස රඳවාගෙන උන්නා ය.

"පුංචි නෝනා හාමු.. තේ ගෙනාවා.."

තමා අසල ම සිටගෙන උන් කාරුණික කටහඬේ හිමිකාරිය දෙස, අනුපමා, සෙමින් හිස හරවා බැලුවා ය.

"මැණිකම්මා.."

මැදිවිය ගෙවා දමා වෘද්ධභාවය දෙසට ගමන් කරමින් උන් අහිංසක ගැමි ගැහැනිය, අනුපමා දෙස බලා සිටියේ බයාදු නෙතිනි. ඇගේ බියපත් හඬ පමණටත් වඩා බැගෑබර විය.

"මට මැණිකම්මා නොකිව්වට කමක් නෑ පුංචි නෝනා හාමු.. කවුරුත් කියනවා වගේ මැණිකා කිව්ව ම හොඳට ම ඇති.."

වහල්භාවය උදෙසා ම ජීවිතය සින්න කළ ගැහැනිය දෙස, අනුපමා බැලුවේ, අනුකම්පාව පිරුණු දෑසිනි.

"මේ මමත් අයිති මැණිකම්මලාගෙ පැළැන්තියට.. ඊයෙ නීතියෙන් මාව මේ පැළැන්තියට ඇතුළු කළාට.. මගේ හදවතින් මම මේ වළව් පැළැන්තියට අයිති කෙනෙක් නෙමෙයි මැණිකම්මෙ.. ඒ වගේම.. මැණිකම්මට ඕනම නම් මට පුංචි නෝනා කිව්වට කමක් නෑ.. අර හාමු කියන කැල්ලට නම් මම පොඩ්ඩක්වත් ආස නෑ.."

මැණිකාගේ හදවත තුළ අනුපමා කෙරෙහි සැණෙන් විසල් සෙනෙහසක් පිළිසිඳුණ ද, එය වසාගෙන පැතිර ගිය බියක් දැසේ ඇඳී තිබිණි.

"අනේ පුංචි නෝනා හාමු.. එහෙම කොහොමද හාමු කියලා කතා කරන්නෙ එහෙමනෙ පුංචි නෝනා හාමු.. ලොකු හාමුට කියන්නෙ ලොකු නෝනා හාමු.. දේවක බේබිට කියන්නෙ ලොකු බේබි හාමු.. දිල්හාර බේබිට කියන්නෙ පොඩි බේබි හාමු.. සමනලී බේබිට කියන්නෙ පුංචි බේබි හාමු.. දැන් ඉතින් නෝනා හාමු.. අපේ පුංචි නෝනා හාමු.."

අනුපමාට සරදම් සහගත සිනාවක් මුවට නැගෙන්නට ඇවැද, ඈ එය අසීරුවෙන් වළකා ගත්තා ය.

"තේ එකට ගොඩක් ස්තුතියි මැණිකම්මෙ.. මැණිකම්මා යන්න.. දේව් නැගිට්ටට පස්සෙ මම පහළට එන්නම්.. කෝ නංගියි මල්ලියි.. නැද්දැයෝ කට්ටිය.. එයාලත් තාම නිදි ඇති නේද...?"

අනුපමා විමසුවේ මැදු හඬිනි. අලුත් ස්වාමි දුව, විභාඩි ගණනාවක කෙටි කාලයක් ගෙවී යන්නටත් මත්තෙන්, මැණිකාගේ හදවත තම මුළුමනින් ම පැහැර ගැනීමට සමත්ව සිටියා ය.

"බේබිලා තම් දවල් එකොළහෙත් මෙහා නැගිට්ටවා ගත්ත බෑ පුංචි නෝනා හාමු.. නැද්දෑ උදවියත් සේරෝම තවම බුදි-මහත්තියාට ගොත්තැති.. එහෙනං පුංචි නෝනා හාමුට මොහොඩා හරි උම්මනාවක් තම මට ටෙලිෆෝන් කරන්ඩ.. කුස්සියෙ





නොම්මරේ අංක දනය.. පැන්ට්‍රියෙ නොම්මරේ අංක එකොළහ.. ඔය තැන් දෙකෙන් එකක මං ඉන්නවා.."

අනුපමා, යළිත් මෘදු ලෙස හිනැහී හිස සැලුවා ය. ජීවිතය එක රැයක් තුළ නොසැහෙන සේ සංකීර්ණ වී ඇති බව දැනුණු මොහොතේ, අනුපමාගේ මුවින් දිගු සුසුමක් ගිලිහිණි. එසේම, නීත්‍යානුකූලව දේවකගේ බිරිඳ බවට පත් වුවද, අනපේක්ෂිතව උද්ගත වූ තත්වය හමුවේ සියල්ල උඩු යටිකුරු කළ දෛවය, පසු දා අරුණ නැගෙන විට ද මාපිය තුරුළෙන් නික්ම ආ පිවිතුරු යුවතිය ලෙසින් ම, අනුපමාට හිඳින්නට අවකාශ සලසා ද තිබිණි. අනුපමාගේ දැස තෝරා බේරා වෙන් කර ගත නොහැකි අනේතුක කඳුළු ගොන්නකින් පිරී පැවතිණි. දේවක තමා අසලට පැමිණෙන තුරු ම ඈ නුදුටුවේ, තමාගේ දෛවය පිළිබඳව වූ ඇගේ කල්පනාවලිය එතරම් ම ගැඹුරු වූ බැවිනි.

"අනූ.."

අනුපමා, නිගැස්සී හැරී බැලුවා ය. ඈ නිගැස්සුණු තරමට දැසේ රැඳී තිබුණු කඳුළු දෙපේළිය විසිරී ගියේ ය. දේවකගෙත් තම කඳුළු සහවාගෙන, සහවා ගන්නට තරම් රහසක් තමා සතුව නොමැති බැවින්, ඈ සෘජුව දේවකගේ මුහුණ දෙස බැලුවා ය.

"ඔයා නැගිට්ටද දේව්..?"

"ඔව්.. මට ටිකක් නිත්ද ගියා.. ඔයා නිදාගත්තෙ ම නැද්ද අනූ..?"

දේවකගේ වදන් තුළ සැනව ගත් වේදනාවේ තරම හඳුනා ගත් අනුපමාගේ ළය උණුසුම් වන්නට විය.



The Reader's Place Novel

"නෑ දේවි.. මට නින්ද ගියේම නෑ.."

දේවක, අනුපමා අසල වූ අසුනේ හිඳ ගත්තේ, අනුපමාගේ පානය නොකළ උදැසන කිරි කෝප්පය දෙස දැස රඳවාගෙන ය.

"මැණිකම්මා දීලා ගියා.. මට බොන්න අමතක උනා දේවි.."

දේවක, දීර්ඝ සුසුම් නොහෙළා හිඳීමට, හැකි තාක් ප්‍රවේසම් වූයේ ය.

"අපි මැණිකම්මට කතා කරලා ආයෙත් තේ ගෙන්න ගමු.."

සඳැල්ලේ වූ දුරකතනයෙන්, මැණිකාට ඇමතූ දේවක, යළි පැමිණ අනුපමා අසලින් අසුන් ගත්තේ ය. එවර ඔහු, ඇගේ වමත ගෙන දෝතට මැදි කර ගත්තේ ය.

"මට සමාවෙන්න අනූ.."

"මටත්.. දේවි.."

සමාව අයදිනුයේ කුමක් අරබයා දැයි මුවින් නොබිනූ මුත්, දෙදෙනා ම ඒ ඇයි දැයි දැන සිටියහ.

"නැලි පිළි අන්දලා.. මුදු පළන්දලා.. ලෝකෙම සාක්ෂි කරලා.. මගේ කරගෙන මම ඔයාව කැන්දගෙන ආවෙ.. ඒ විදියට ඇතින් තියාගන්න නෙමෙයි අනූ.."

දේවකගේ දැස කඳුළින් තෙත් වන්නට ගත වූයේ අසුරු සැණක කාලයකි.





"මට හැමදේම තේරුම් ගන්න පුළුවන් දේවි.. ඒත්.. ඒ වගේ අත්දැකීමකට මුණ දෙන්න සිද්ධ උනාම.. මනමාලියක් විදියට ගෙදරට පය ගහපු මම විතරක් නෙමෙයි.. සාමාන්‍ය පිටස්තරයෙක් උනත් අසාමාන්‍ය විදියට තිගැස්සෙන එක අහන්න දෙයක් නෙමෙයි.. ඒ වගේ අසාමාන්‍ය අත්දැකීමකට සාමාන්‍ය විදියට මුණ දෙන්න පුළුවන් වෙන්න මම අති විශේෂ කෙනෙක් නෙමෙයි.. ඔය වගේ අමුතුම කාරණා හින්දත්.. තමන්ගෙ මංගල රාත්‍රිය අහිමි කරගත්ත ගැනු ළමයි තවත් මේ ලෝකෙ ඕන තරම් ඇති දේවි.. මගේ අවාසනාවට මොනවා හරි මට නොලැබෙනවා නම්.. මම ඒ ගැන දුක් නොවී ඉන්න පුළුවන් තරම් උත්සාහ කරනවා.. ඒත්.. මං හින්දා ඊයෙ රෑ නැතිවෙලා ගිය ඔයාගෙ සතුට වෙනුවෙන්.. මං දුක් වෙනවා දේවි.."

දේවක, තම බිරිඳගේ දෑත, දැඩිව වැළඳ ගත්තේ, ඇගේ සෙනේවන්ත හදවතට කෘතවේදීත්වය පිරිනමන්නට අන් මගක් නොවූ බැවිනි.

"ප්ලීස්.. එපා අනූ ඔහොම කියන්න.. ඔයාට ඇත්ත නොකියා මං ඔයාව රැවැට්ටුවා.. ඔයා මට එහෙම චෝදනා නොකළත්.. ඒක තමයි ඇත්ත.. ඔයාගෙ ජීවිතේ ලස්සනම දවස අහිමි කරපු වැරැද්දෙ වගකීම මම බාර ගන්නම ඕන.. තාමත් ඔයා ඔයාගෙ අම්මගෙයි අප්පච්චිගෙයි චුට්ටි දුව මිසක්.. මට ඔයාව මගේ කරගන්න බැරි උනා අනූ.. මගේ දෙවය ඒ වගේ ලොකු දඬුවමක් මට දුන්නෙ.. මම ඔයාට බොරු කරපු හින්දා.. මම කරපු වැරැද්දට මට දඬුවම් ලැබෙන්න ම ඕන අනූ.."

දේවකගේ වදනක් වදනක් ගානේ ම අනුපමාගේ ළය උණු වන්නට විය.



The Reader's Place Novel

"ඔයා මාව රැවැට්ටුවා කියලා මං ආයෙ කවදාවත් හිතන එකක් නෑ දේව්.. ඔයා මට ගොඩක් ආදරය කරන්න ඇති.. ඒ ඇත්ත ඊයෙ රෑ ම මගේ හිත පිළිගත්තා.. තමන්ගෙ බිරිඳටත් බලහත්කාරකම් කරන පිරිමි ඉන්න ලෝකෙක.. ඊයෙ රෑ ඔයා මගෙන් ඇත් වෙලා මට මගේ පාඩුවේ ඉන්න ඇරියෙ.. හරිම සුවපත් වෙන්න.. ඔයාගෙ ඒ යහපත් මානුෂීය හැසිරීම ගොඩක් උදව් උනා වෙන්න ඇති දේව්.. ඒ වගේම.. මොන දේ සිද්ධ උනත්.. ඔයාගෙ නෑදෑයො උනත්.. මට සැලකුවෙ පුදුමාකාර ආදරේකින්.. සිද්ධ උන නරක දේ ගැන වගේම සිද්ධ උන හොඳ දේවල් ගැනත් මම දැන් හිතන්න ඕන.."

අනුපමා, පිටත්ලෙන් දැසට නැඟී තිබුණු කඳුළු පිසදා ගත්තා ය.

"ඔය කඳුළු පිහදා ගන්න දේව්.. දැන් මැණිකම්මා එනවා ඇති අපිට තේ අරගෙන.."

සැමියා-බිරිඳ අතර සිදුවන කිසිවක්.. බිත්ති හතරෙන් එහාට යා නොදී රැක ගන්නා බවට අනුපමා පෙරදා රැයේ දේවකට පොරොන්දු වූවා ය. දෙවය තමන් දෙදෙනා වෙත කවරාකාරයේ තීන්දු තීරණ රැගෙන ආවද, තමන් දෙදෙනාගේ පෞද්ගලිකත්වය රැකිය යුතු බව අනුපමා විශ්වාස කළා ය.

"දේව්..?"

"මි..."

"ඇයි ඔයාට හිතුණද නංගියි මල්ලියි ගැන දැන ගත්තම.. මම ඔයාව ප්‍රතික්ෂේප කරයි කියලා.."





අනුපමා, සෘජුවම විමසුවා ය. දේවක, පිළිතුරු සොයා ගත්තේ කල්පනාකරී ලෙසිනි.

"අපේ විවාහ යෝජනා ස්ථිර වෙලා.. හැමදේට ම අපිට ඉතිරි වෙලා තිබුණෙ ගොඩක් පුංචි කාලයක් අනු.. ඒ දේ දැනගෙන හදිසියේවත් ඔයාගෙ හිත බිඳුණොත් ආපනු නදාගන්න ඒ කාලය හොඳටම මදි කියලා මං දැනගෙන හිටියා.."

අනුපමා ළඟ සිනිවිලි මිස පිළිතුරු තිබුණේ නැත.

"හෙට දැන් ඔයාගෙ අම්මයි අප්පච්චියි ආවම.. නංගියි මල්ලියි දැක්කම.....???"

අනුපමා, දේවකට කියාගෙන ආ දෙය සම්පූර්ණ කිරීමට ඉඩ දුන්නේ නැත.

"මීට කලින් කළා වගේ.. හෙටටත් ඒ දෙන්නව අපේ කාටවත් නොපෙන්නා තියාගන්න දේව්.. අම්මයි අප්පච්චියි ලංකාවෙන් ගියාට පස්සෙ ඕන දෙයක්.."

අනුපමා ද කියාගෙන ආ දෙය සම්පූර්ණ නොකොට අතරමග නවතා දැමුවේ, දේවකටත්, අනුපමාටත් තේ කෝප්ප දෙක ද රැගෙන මැණිකා පැමිණි බැවිනි.

"පුංචි නෝනා හාමු.. මේ තේ කෝප්පෙවත් නිවෙන්ඩ කලියෙන් බීලා ඉන්ඩ.."

"මට තේ එක අමතක උනා මැණිකම්මෙ.."

අනුපමා දෙස අනුකම්පාවෙන් බැලූ මැණිකා හූමිටියක්



The Reader's Place Novel

පවා නොතබා, නිවී ගිය තේ කෝප්පය ද රැගෙන ඉක්මත් ගමනින් ආපසු යන්නට ගියා ය.

"දේව් ගෙදර උදව්වට ඉන්න අයත් ඊයෙ ඇති උන ප්‍රශ්නෙ ගැන දන්නවද..?"

දේවක හිස සැලුවේ දිගු බැල්මක් දැසේ ඇඳගෙන ය.

"අපේ ගෙදර වැඩට ඉන්න හතර දෙනා ම පවුලෙ ම අය වගේ තමයි අනූ.. මැණිකා තමයි නංගිගෙයි මල්ලිගෙයි වැඩ කරගෙන අපේ කෑම බීම වගේ දේවල් බලන්නෙ.. කමනිට තියෙන්නෙ උයන වැඩ ටිකයි ගෙදර දොර වැඩ ටිකයි.. සේනාරත්න අංකල් වතු පිටිවල වැඩ ටික බලනවා.. තරංග තමයි අපේ අම්මගෙ ඩ්‍රයිවර්.. එයා තියෙන අනිත් පුංචි පුංචි වැඩ ටික කරනවා.. එයාලා හැමෝ ම එක වගේ හොඳයි අනූ.. හරිම විශ්වාසවන්තයි.. මේ වෙනකල් කිසිම කෙනෙකුගෙන් කිසිම ප්‍රශ්නයක් වෙලා නෑ.."

"ඒකනෙ මිනිස්සු මිනිස්සු අතර තියෙන්න ඕන බැඳීම දේව්.. මේ මිනිස් සමාජය ඉදිරියට යන්නෙ මිනිස්සු මිනිස්සු අතර ඇතිවෙන විශ්වසනීය බැඳීමෙන්.. මට මූණ දෙන්න වෙලා තියෙන්නෙත්.. මට ඔප්පු කරලා පෙන්නන්න වෙලා තියෙන්නෙත් අන්න ඒ සත්‍යය නේද දේව්..?"

අනුපමා මිමිණුවේ, දෙදෙනාට පමණක් ඇසෙන සරිනි. දේවක, අනුපමාගේ අවධානය වෙනතක යොමු කළේ ය.

"අනූ.. මගේ ෆෝන් එක රිං වෙනවා.. මං හිතන්නෙ ඔයාගෙ අම්මා ගන්නවා ඇත්තෙ.."





"එහෙනම් ෆෝන් එක බලලා එනවද දේව්.. පව්.. ඊයෙ රෑ අම්මයි අප්පච්චියි දෙන්නා සාලෙ පුටු දෙකක් උඩට වෙලා ඔහේ කල්පනා කර කර ඉන්න ඇති.."

පටලවා ගෙන උන් සුරත අත හැර, දේවක පිටව ගියේ අනුපමාගේ හිස ද අතගා ගෙන ය. යළි පැමිණි දේවක මග හැරුණු ඇමතුම ප්‍රති අංකනය කොට, දුරකතනය අනුපමා වෙත දිගු කළේ ය.

"මම බාත්රූම් ගිහිල්ලා එන්නම් අනූ.. අම්මා තමයි අරන් තියෙන්නෙ.. ඔයා කතා කරන්න.."

අනුපමා, දේවකගේ දුරකතනය ගෙන සවනේ රුවා ගත්තා ය. මව්ගේ හඬ දෙසවනේ රැව් දෙද්දි, ඇගේ දෑස ඉබේට ම කඳුළින් තෙත් වී ගියේ ය.

"අම්මා.."

දියණියගේ හැඬුම්බර හඬ, සුභාෂිණී වර්ණවීර මහත්මියගේ මව්වත් හදවත සොවින් මුසපත් කළේ ය.

"පුතේ.. ඔයා හොඳින් නේද..?"

"ඔව් අම්මා.. මම හොඳින්.."

"මොකුත්ම ප්‍රශ්නයක් නෑ නේද පුතේ..?"

"නෑ අම්මා.. ඇයි..?"

"ඔයාගෙ කටහඬ හොඳටම වෙනස් වෙලා.. පැය ගාණක් අඬපු කෙනෙකුගෙ වගේ පුතේ.."



The Reader's Place Novel

අනුපමා, සිත යටින් අනේක වාරයක් තිගැස්සුණ ද, එයින් අංශු මාත්‍රයක් හෝ තම මවට නොඇහවීමට වග බලා ගත්තා ය.

"අනේ නෑ අම්මා.. ඊයෙ ගොඩක් රෑ වෙලාතෙ නෑවෙ.. ඊටත් වඩා ඔළුව කැක්කුමකුත් තියෙද්දිමනෙ නෑවෙ.. දැන් හෙම්බිරිස්සාව වගේ අම්මා.. ඒකයි කටහඬ වෙනස් වෙලා ඇත්තෙ.."

එහෙත්, වර්ණවීර මහත්මිය දියණියගේ පිළිතුරෙන් සෑහීමකට පත්වූයේ නැත. ඇගේ සිත, නොතේරෙන දෙගිඩියාවකින් වේදනාබර වී තිබිණි. දියණියක පතිකුල බන්දා දුන් ඕනෑම මවකගේ ළයෙහි ඇවිලෙන අනන්ත වූ තිගැස්ම මුසු වේදනාව අනුපමාගේ මවගේ ළය තුළ ද ඇවිලෙමින් තිබිණි.

"ඇත්ත කියන්න පුතේ.. නැන්දම්මාගෙන්වත්.. මොකක් හරි ප්‍රශ්නයක් උනාද..? ඔයාගෙ අම්මා විදියට මම මේ අහන්නෙ.. අපි අපේ දරුවව හැදුවෙ මලක් වගේ පරිස්සමින් හින්දයි.."

තම මවගේ වදන් තුළ සැඟව ගත් අරුත කුමක්දැයි වටහා ගත් මොහොතේ, අනුපමාගේ හදවතට අරක් ගත්තේ පහදාගත නොහැකි පශ්චාත්තාපයකි. බඹසර රැකි කුමරියක, පති කුල ගියදා.. ඒ මංගල රැයේ සුදෝ සුදු පිරුවට මත, සසර අත පැතූ කුමරුන් අතින්, රැක ගත් බඹසර බිඳිය යුතු බව ලෝක සම්මතයයි. එහෙත්, පෝරු මස්තකයේදී තැලි පිළි සමග දේවක ගත පැළැන්දූ සුදු පිරුවටය, සුදෝ සුදුවතින් තවමත් අනුපමාගේ විසල් ගමන් බෑගය පතුලේ ම සැඟව හිඳින බව දැන සිටියේ, අනුපමාත් - දේවකත් පමණි.





"අම්මා.. ඇයි මේ.. එහෙම මොකුත් නෑ.. අපරාධෙ අම්මා දුක් වෙන්නෙපා.. මට හම්බ වෙලා තියෙන නැන්දම්මා ලේලිගෙ පිරුවටය නරඹන ජාතියෙ නීච කුලයෙ නැන්දම්මා කෙනෙක් නම් නෙමෙයි.. දේවිගෙ අම්මා හරි හොඳයි අම්මා.. දේවිගෙ අම්මා මට ගොඩක් ආදරේ ඇති කියලා මට දැනෙනවා අම්මා.."

"එහෙනම් කමක් නෑ පුතේ.. දුවෙක් ඉපදුන දා ඉඳලම.. ආදරෙන් තමන්ගෙ දුවව හදාගන්න හැම අම්මා කෙනෙකුගෙම හිතේ අවිලෙන්නෙ කවදාවත් නිවන්න බැරි ගින්දරක්.. ඒ දුවව කසාද බන්දලා දුන්න දවසට, ඒ ගින්දර තවත් වැඩිවෙනවා.. තමන්ගෙ දරුවා සතුටින් හිටියොත්.. දවසින් දවස ජීවිතේ ගොඩ නගා ගන්නවා දැක්කොත්.. ඒ ගින්දර දවසින් දවස නිවිලා යනවා.. එහෙම නොවුණොත්.. තමන්ගෙ දරුවො දුක් විඳිනවා දැක්කොත්.. දරුවන්ව ආදරෙන් හදපු අම්මලාට.. දෙමව්පියන්ට.. සදාකාලික ගින්දරක පිච්චෙන්න සිද්ධ වෙනවා පුතේ.."

තමාගේ මව හඬමින් පවසන දෑ දරාගත නොහැකිව අනුපමා ඇයට අතරමගදී බාධා කළා ය.

"අනේ අම්මා.. අඬන්නෙපා.. එහෙම කිසිම ප්‍රශ්නයක් මට නෑ.. අම්මට කවදාවත් මේ මම හින්දා ඒ වගේ ගින්දරක පිච්චෙන්න වෙන්නෙ නෑ.. මම හොඳින් ඉන්නවා අම්මා.. අම්මයි අප්පච්චියි තවත් මාව ඔය විදියට හිතට බරක් කරගන්න එපා.. මේ මව් රට දාලා ගිහිල්ලා සතුටින් ජීවත්වෙන අය ඉන්නෙ බොහොම ටික දෙනයි.. ඒ හින්දා අම්මයි අප්පච්චියි ගිහිල්ලා අක්කගෙ බලාපොරොත්තුවත් ඉෂ්ට කරලා.. පුළුවන්



The Reader's Place Never

ඉක්මනට ආපහු අපේ හැම දෙයක් ම තියෙන අපේ රටට එන්න අම්මා.."

සිතේ සහසක් හැඟුමන් පොර බැදුව ද, තවත් කිසිවක් කියා ගත නොහැකිව අනුපමා ගොළු වූවා ය. මන්ද මානසික සොයුරෙකු හා සොයුරියක සමග, ප්‍රභූ පරම්පරාවක් අතර මැදට වී ගත කරන්නට සිදුවන ජීවිතය කවරාකාරයේ එකක් වේදැයි අනුපමා මොහොතකට කල්පනා කළා ය. එකදු හැඟීමක් හෝ ඇගේ සිත තුළට නොපිවිසිණි. එය, විසඳා ගත නොහැකි උභතෝකෝටිකයක් පමණක් ම බව අනුපමා දැන සිටියා ය.

"පුතේ.. ඇයි එක පාරට ම කතා නැතුව ගියේ..?"

අනුපමා මවගේ හඬින් පියවි ලොවට පිවිසියා ය.

"නෑ අම්මා.. කෝ අප්පච්චි..?"

"උදේම ගියා සුරවීර අංකල් හම්බවෙලා එන්න.. සුරවීර අංකල් වැඩට යන්න කලින් යන්න ඕන හින්දයි මේ තරම් උදෙන් ගියේ.. විශ්වාසවන්ත ම කෙනෙකුට ගෙදර බාර දීලා යන්න ඕනනෙ පුතේ.."

"ඔව් අම්මා.. ඒක ඇත්ත.. ජීවිත කාලෙ ම වෙහෙස මහන්සි වෙලා උපයා ගත්ත දේවල් විනාශ කරගෙන බෑ.. ඊටත් වඩා.. තමන්ගෙ ම ගෙදර තරම් සුවදායක තැනක් මේ ලෝකෙ මට නම් වෙන නෑ.. අම්මා සුරවීර අංකල්ට ගෙදර බලාගන්න කියන්න.. මම සති අන්තයෙ දවසක ඇවිත් ගෙදරයි වත්තයි පිරිසිදු කරලා මල් ගස් ටිකට වතුර ටිකක් එහෙම දාලා එන්නම් අම්මා.."





දීර්ඝ සංවාදයකින් අනතුරුව මවත්, දියණියත් සමුගත්තේ දේවකගේ ජංගම දුරකතනයේ බැටරිය නැගූ කෙඳිරිලි නඩිණි. දිය නාගෙන පැමිණි දේවක අනුපමා දිගු කළ ජංගම දුරකතනය අතට ගත්තේ මෘදු ලෙස හිනැහෙමිනි.

"ඇයි අනූ.. කතා කරලා ඉවරද..?"

"බැට්‍රි බැස්සනෙ දේව්.. චාජ් වෙන්න දාන්න වෙයි.."

"ඉතින් මම අනිත් ලයින් එකෙන් අරන් දෙන්නම්.."

"අනේ එපා දේව්.. පැය භාගයක් කතා කළා.. හොඳටම ඇති.."

පෙරදා රෑයේ හදවත මතින් ගලා ගිය බොර දිය දහර සෝදා හරින්නට මෙන්, අනුපමා එදින උදැසන ද යළිත් දිය නා ගත්තා ය. වළව් පෙළපතක අභිමානය කිසිසේත් ම හදවතට නොගත් ඇ, වාම් සායකින් හා හැට්ටයකින් සැරසී දේවක සමග පහත මාලයට පිවිසියේ උදැසන ආහාරය සඳහා ය. කිසිදු වෙනසක් වකිතයක් නොදක්වා දේවකගේ නැදෑයින් හා පවුලේ උදවිය අතර සැරිසරන්නට අනුපමා වෙර දැරුවා ය. උදැසන ආහාරයෙන් පසු ඇතුළත මුළුතැන්ගෙය කොටසේ දී දේවකගේ මව අනුපමා පිරිසෙන් වෙන් කොට තනිකර ගත්තා ය.

"දුවේ.. පුංචි කාරණයක් තියෙනවා කියන්න මට.."

ක්ෂණික නිගැස්මක් හදවතට දැනුණි ද, අනුපමා එය සහවාගෙන දේවකගේ මව දෙස බලා හිනැහෙන්නට වෙර දැරුවා ය.



The Reader's Place Novel

"ඇයි අම්මා.. මොකක්ද..?"

දේවකගේ මව, වටපිට බලා සෙමෙන් වචන අමුණා ගත්තා ය.

"ලොකු අම්මා එක්ක කතා කරනකොට ප්‍රවේසමෙන් කතා කරන්න පුතේ.. ලොකු අප්පච්චියි, ලොකු අම්මයි ගොඩක් වේදනාවෙන් ඉන්න දෙන්නෙක්.. ඒ දෙන්නටත් හිටියෙ එකම දරුවයි. සුරේන්ද්‍ර පුතා.. දේවක පුතාට වඩා අවුරුදු දෙකයි වැඩිමල්.."

රන්මුතුගල මහත්මියගේ හඬ බිඳී ගොස්, හැඩුම්බර වුව ද, ඈ කියාගත යුතු දේ කියා නිම කිරීමට ඉක්මන් වුවා ය.

"ඉතින් අම්මා.. ඇයි මොකක්ද ප්‍රශ්නෙ..?"

"සුරේන්ද්‍ර පුතත්.. අපේ චුටි පුතා වගේම දරුවෙක් පුතේ.. මීට අවුරුදු දෙකකට කලින්.. සුරේන්ද්‍ර පුතා නැති උනා පුතේ.."

අනුපමාගේ ළය මත මහ හඬින් පුපුරා ගිය අකුණේ සැරට, ඇගේ දෑසින් කඳුළු පිට පැන්නේ ය.

"ඇයි අම්මා.. ඒ අයියා අසනීපෙන් හිටියද..?"

"නෑ පුතේ.. ඒගොල්ලො මේ ලෝකෙට බිහිවෙන්නෙ ම සුවයක් නැතුවනෙ පුතේ.. කොහොමටත්.. ඒ වගේ දරුවන්ගෙ ආයුෂ අඩුයි පුතේ.."

අවසන් පේළිය නිමා වනවාත් සමඟ ම දේවකගේ මවට ඉකි බිඳිණි. ඈ, ඔසරි පොට මුවට තද කරගෙන නැගෙන





ඉකිය වළක්වා ගත්තා ය. අනුපමාට දැනුණේ තමාගේ හදවත පසාරු කරගෙන තියුණු හීයක් කිදා බැස්සාක් වැනි වේදනාවකි.

"ඒ කියන්නෙ අම්මා..?"

දේවකගේ බාල සොයුරාගේත්, සොයුරියගේත් ජීවිත පිළිබඳ යථාර්ථය අනුපමාගේ සිත මහා සානුකම්පිත බවකින් හිර වට්ටවා දැමුවේ ය.

"අපේ දුවට.. දැන් අවුරුදු විසි නයයි.. පුතාට අවුරුදු විසි තුනයි.. අපේ ජීවිතවල ඉරණම මොකක්ද කියලා දන්නෙ දෙවියොවිතරයි පුතේ.. අම්මා කෙනෙක් විදියට.. හිත වාවාගෙන කියන කතාවක් නෙමෙයි මේක.. ඒත්.. මේ ලෝකෙ තියෙන අනිත් හැම සැප සම්පතක් ම තිබුණත්.. හිතින් විඳව විඳවා.. හැම මොහොතක ම මැරි මැරී ජීවත් වෙන අම්මා කෙනෙක් මම.. මට මේ දුක බෙදා හදාගන්නවත් කාත් කවුරුවත් හිටියෙ නෑ.. මම පෙරුම් පුරාගෙන බලන් හිටියෙ දුව මේ ගෙදරට එනකල්.. මට ඒ සැනසීමවත් ලැබෙයි කියලා.. අවාසනාව නළලෙ කොටාගෙන ආව එක දරුවෙකුට නෙමෙයි දරුවො දෙන්නෙකුට ම මටත් අම්මා වෙන්න සිද්ධ උනේ මමත් ඒ හා සමාන ම අවාසනාවක් මිට මොළවාගෙන ආව නින්දා.. මට ආයෙ මේ ජීවිතේට ම තියෙන්නෙ එක ම එක බලාපොරොත්තුවයි.. මේ තාක් කල් මට සතුටකට කියලා ලැබුණෙ මගේ ලොකු පුතා විතරයි.. ඒ දරුවගෙ දරු පැටියෙකුගෙ මුණ බලලා.. මට ඇස් දෙක පියා ගන්න ඕන පුතේ.. දෙමව්පියො ජීවත්වෙලා ඉන්දැද්දි දරුවො මැරිලා යන හැටි දැකලා තවත් නිරයක පැහෙන්න මට බෑ පුතේ.. ඒ නින්දා.. මට ඉක්මනට ම මැරෙන්න ඕන.."



The Reader's Place Novel

දේවකගේ මවගේ ඉකිබිඳුම, අනුපමාගේ දෑසට ද කඳුළු වරුසාවක් රැගෙන ආවේ ය. පෙර දිනයෙන් උඩි යටිකුරු වූ ඇගේ ලෝකය තුළ වූයේ ම, මොහොතින් මොහොත උර මත පැවරෙන වගකීම් ම ය. ඈ, කුඩා මේසය අසල අසුතේ හිඳ උන් දේවකගේ මවගේ හිස අත ගැවේ, මවක මෙත් මැදුලෙසිනි.

"අම්මා අඬන්නෙපා.. ජීවිතේ අපිට ලැබෙන හැටියකට බාරගන්න ඕන අම්මා.. ලැබෙන ඕනම දුකක් සැපක් බෙදාගෙන හොඳ බිරිඳක් විදියට දේවක එක්ක ජීවත්වෙන්න හිතාගෙන තමයි මම දේවක එක්ක ආවෙ.. මගේ යුතුකම් වගකීම් නොපිරිහෙළා ඉටු කරන්න මම පොරොන්දු වෙනවා අම්මා.. අපි කාගෙත් ජීවිත කාලය අවිනිශ්චිතයි.. ඒ හින්දා මේ ලෝකෙන් සමුගෙන යන දවසෙදි අපි අතරින් කවුද ඉස්සර වෙන්නෙ කියලා අපි දන්නෙ නෑ.. අපි කරන්න ඕන ජීවත්වෙන මේ මොහොත පුළුවන් තරම් අර්ථවත්ව ගත කරන එකයි.. ලෝකෙ තියෙන උසස් ම සැප සම්පත් ලැබුණත් අම්මට ඒකෙන් කිසිම ප්‍රයෝජනයක් ලැබුණෙ නෑ වගේ ම.. මේ කිසිම දේකට අංශු මාත්‍රික ආසාවක් මගේ හිතෙත් නෑ අම්මා.. ඒ හින්දා.. මේ විවාහය මගේ ජීවිතේ එක එක විදියෙ පාරමිතා පුරන්න මට ලැබුණ වරමක් විදියට බාර අරගෙන.. මේ පවුලට සතුටයි සැනසීමයි පුළුවන් උපරිමයෙන් ගෙනල්ලා දෙන්න මම උත්සාහ කරන්නම් අම්මා.."

අනුපමා, දේවකගේ මවගේ හදවත තුළ පොරොන්දු පත්‍රයක් ම ලියා, කිසිදා නොමැකෙන බවට ඇගේ හදවත ඇයට ම සඵථ කළ විශ්වාසයකින් එයට අත්සන් තැබුවා ය. රන්මුතුගල





නිවස්නේ ගෘහ කටයුතු බාරව කටයුතු කළ කමනි එතැනට පැමිණියේ ඒ මොහොතේ ය.

"ලොකු නෝනා හාමු.. ලොකු බේබි හාමු, පුංචි නෝනා හාමු හොයනවා.. පන්සලට ගිහිල්ලා එන්න යන්නලු.."

"ආ.. දේවි මාව හෙව්වද කමනි අක්කෙ..? අම්මා එහෙනම් දවල්ට උයන දේවල් ටික කමනි අක්කට කියලා එන්නකො.. මං බලන්නම් දේවි කොහෙද කියලා.."

ආගන්තුක ආදරණීය ආමන්ත්‍රණයෙන් කමනිගේ හදවත ද මොහොතකට නිගැස්සිණි. රන්මුතුගල නිවසට ද අලුත් හිරක් පායාගෙන එන වග, කමනි, ඒ එකම ආමන්ත්‍රණයෙන් සහතික වශයෙන් ම දැන ගත්තා ය.

"ගේ පිටිපස්සෙ වතුසුද්ද ගස් ටිකේ මල් පිරිලා පුංචි නෝනා හාමු.. පන්සල් යනවා නම් මම මල් ටිකක් කඩලා දෙන්නද..?"

"මම දේවිගෙන් අහලා එන්නම්කො අක්කෙ.. අපි දෙන්නම ගිහිල්ලා කඩමු ඊට පස්සෙ.."

අනුපමා, දේවක සොයා යන විට දේවක සිටියේ ගෙළයනේ පසෙක නවතා තිබුණු ඔහුගේ රිය අබියස ය. තරංග, දේවකගේ මෝටර් රථය සෝදමින් සිටියේ ය.

"දේවි.."

"අනූ ඔයා කොහෙද හිටියෙ..?"

"මම කුස්සියට ගියා දේවි.. අම්මත් එක්ක ටිකක් කතා කර කර හිටියා.."



The Reader's Place Novel

"පන්සලට ගිහිල්ලා එමුද..? ලොකු හාමුදුරුවොට දැන් ටිකකට කලින් කෝල් එකකුත් දීලා විස්තර ඇහුවා.."

අනුපමා, මදහසින් යුතුව හිස සලා එකඟ වුවා ය. කිසිවකුට නොදැනෙන සේ දරා උන්නාට, සිත සන්සුන් කරන ඔසු බිඳ බීද සොයා ගන්නට අනුපමාට අවැසි වී තිබිණි.

"පන්සල ගොඩක් දුර ද දේවි..?"

"කිලෝ මීටර් කාලක් විතර අනූ.."

"එහෙනම් කාර් එක ඕන නෑ.. අපි පයින් ගිහිල්ලා එමු දේවි.. තරංග කලබලයෙන් වාහනේ හෝදන්න ඕනත් නැතෙ එතකොට.. අනිත් හැමෝම කෑම කෑවා.. තරංග කාලේ නෑ තාම.."

දේවකට දැනුණේ එකම රැයකින් සමස්ත ජීවිතයේ පැහැය හා හැඩය වෙනස් ව ගොස් ඇති බවකි. තරංගට පවා දැනුණේ පෙර කිසිදා වළව් භූමිය තුළදී නොදැනුණු අන්දමේ සුරක්ෂිත බවකි. අනුපමා, වළව් භූමියේ පිටුපස පෙදෙසෙහි පිහිටි වතුසුදු මල් නෙළුවේ කමනි සමගිනි.

"ඈත දුප්පත් ඉස්කෝලෙක උගන්නන ඉස්කෝලේ නෝනා කෙනෙක් අපේ පුංචි නෝනා හාමු වෙලා එන්නෙ කියලා දැනගත්තම.. ඒ වෙලාවෙ ම මට හිතුණා මේ වගේ කරුණාවන්ත නෝනා හාමු කෙනෙක් එයි කියලා.. මම හිතන දෙයක් ලේසියට වැරදිලා නෑ.. මට දැනුණ දේ හරියට හරි.."

කමනිගේ ප්‍රශංසාව නුවුවමනා එකක් යැයි අනුපමා සිතුවේ,





කිසිවෙකු දැන හඳුනා ගැනීමට ප්‍රථම වරිත සහතික නිකුත් කිරීම සාධාරණ වුවක් නොවන බැවිනි.

"කමනි අක්කා මාව හරියට අඳුනගත්තෙවත් නැතුව මම හොඳ කෙනෙක් කියලා හිතන එක වැරදියි.."

කමනි, අහිංසක ලෙස හිනැහුණා ය.

"මිනිස්සු කවුද කියලා අඳුනගන්න කලින් දැන අඳුනගෙන කතා බහ කරලා තියෙන්න ම ඕන නෑ පුංචි නෝනා හාමු.. කෙනෙක් ජීවත්වෙන විදිය.. හිතන පතන විදිය.. වගේ දේවල් දැන ගන්න ලැබුණ ම අපිට මිනිස්සු ගැන චිත්‍රයක් මවාගන්න පුළුවන්.. මේ ලෝකෙ කොච්චර හොඳ මිනිස්සු ජීවත් වෙනවද..? අපි ඒ මිනිස්සු හොඳයි කියලා අඳුනගන්නෙ කවදාවත් ආශ්‍රය කරලා නෙමෙයිනෙ පුංචි නෝනා හාමු.."

අනුපමා, කමනි දෙස බැලුවේ විස්මයෙන් හයා ගත් නෙතිනි.

"කමනි අක්කා මේ තරම් ගැඹුරු දේවල් දන්නවා කියලා සත්තකින් ම කවදාවත් මම හිතුවෙ නෑ අක්කෙ.. ඇත්තට ම අක්කා කොහොමද ඔය තරම් දේවල් දැන ගත්තෙ..?"

නෙළා ගත් මල් වට්ටියට ඉහළින් දිස්වන කමනිගෙ අවිහිංසක දෑසේ, දිදුලන කඳුළු කැට දෙකක් විය.

"පුංචි නෝනා හාමුගෙන් මං මොනවා හංගන්නද..? මං දික්කසාද වෙච්ච.. ජීවිතේ ඇතුළෙ යන එන මං නැතුව ගිය ගැනියෙක් පුංචි නෝනා හාමු.. කසාදයක් බැඳගෙන මං තරම් දස වද විඳ්ද ගැනියෙක් මේ තුන් ලෝකෙවත් නවත් නැතුව



The Reader's Place Novel

ඇති.. පුංචි නෝනා හාමු විශ්වාස කරයිද මංදා.. මේ ඊශ්
බුදුත් වැන්ද මම මේ කියන්නෙ ඇත්ත ම ඇත්ත.. කොච්චර බැ
විත්දද කිව්වොත්.. මගේ මිනිහා මාව එල්ලලා මරන්න බියා
දවසක් දා.. මගේ මොකක්දෝ වාසනාවකට මාව එල්ලන්න
ගිය කඹේ කඩාගෙන වැටුණා පුංචි නෝනා හාමු.. වෙනදට
ගම වටේ ගෙවල් ගානෙ දුවලා නැඟිලා බේරුණාට.. එදා මං
දිව්වෙ පොලිසියට.. අතර මැද කතා ඔක්කොම මං පස්සෙ
දවසක පුංචි නෝනා හාමුට කියන්නම්.. ලොකු බේබි හාමු
තමයි මගේ නඩුව කතා කරේ.. ඒ දවස්වල වලව්වෙ උයන
පිහන වැඩවලට කෙනෙක් නොයලා දෙන්න කියලා ලොකු
බේබි හාමු මට කිව්වා.. එහෙමයි මම මෙහෙට ආවෙ.."

අනුපමා, කමනි දෙස බැලුවේ බියෙන් තැති ගත් දැසිනි. ගැහැනියක වූ පාපයට ඇය විඳවා ඇති තරම කොතරම් වන්නට ඇත්දැයි අනුපමා අදහා ගන්නට වෙර දැරුවා ය.

"හිත කීරි ගැහෙන කතාවක් අක්කෙ.. එතකොට අක්කට දරුවො හිටියෙ නැද්ද..?"

"මගේ දුවයි පුතයි මගේ අම්මයි තාත්තයි ළඟ තියලයි මං මෙහෙ ආවෙ පුංචි නෝනා හාමු.. හම්බ වෙන පඩිය එහෙම පිටින් ම ගෙදරට දෙනවා.. මම හැම මාසෙම මාසෙ අන්තිමට නිවාඩු දවස් තුනක් තියෙනවා පුංචි නෝනා හාමු.. ඒ දවස් තුනට මම ගෙදර ගිහිල්ලා එනවා.."

අනුපමාගේ දෑසේ නළියන්නට වූයේ කමනි වෙනුවෙන් උපන් කදුළු ය. කමනිගේ අනුවේදනීය ජීවන පුරාවෘත්තය අතරින් දෙදෙනා මල් නෙළා අවසන් කළෝ ය.





"මමත් ඉස්සරහට කමනි අක්කට දරුවො දෙන්නගෙ වැඩ
ිත කරගන්න පුළුවන් විදියට උදව් කරන්නම්කො අක්කෙ.."

කමනි, කඳුළු රැඳි දෑසින් ම අනුපමා දෙස බැලුවා ය.

"පුංචි නෝනා හාමුට විශාකා සිටු දේවිත්නාත්සෙට වගේ
දන් පින් කරගන්න මේ හැම දොරක් ම ඇරෙයි පුංචි නෝනා
හාමු.. ඒ තරම් වස්තු සම්භාරයක් මේ සිටු මැදුරෙ තියෙනවා..
පුංචි හාමුලා දෙන්නගෙ අඩුව ඇරෙන්න අනිත් හැමදේ ම සර්ව
සම්පූර්ණයි පුංචි නෝනා හාමු.."

දෙවයේ තීන්දුවෙන් මුළුකැන්ගෙයකට තල්ලු වී ගිය ද, ජීවිත පරිඥානයෙන් පිරිපුන් ගැහැනිය දෙස අනුපමා බැලුවේ සැබෑම ගෞරවයෙනි.

"පුංචි නෝනා හාමුට පන්සල් යන ගමන් කල්පනා කරලා බලන්න මං තව කතාවක් කියන්නම්.. මගේ ජීවිත කතාව ඔහොමයි.. මැණිකා අම්මා.. එයා කවදාවක් විවාහ වෙලා ම නෑ.. ඒ කියන්නෙ එයාට කාත් කවුරුවත් ම නෑ.. සේනාරත්න මහත්තයගෙ නෝනා නැතිවෙලා තියෙන්නෙ ඒ මහත්තයා තරුණ වයසෙ මයි. ගොඩක් දුක් විඳලා විඳලා හදාගත්ත පුතා කසාද බැන්දට පස්සෙ ලේලිගෙ කීම් බස්වලට මුලා වෙලා.. දැන් පැත්තවත් බලන්නෙ නෑ පුංචි නෝනා හාමු.. ඔය තරංග ළමයගෙ දෙමව්පියො පුංචි කාලෙ ම ගංවතුරට ගහගෙන ගිහින්.. ලොකු බේබි හාමු තරංගව මෙහාට එක්ක ආවෙත් පරිවාසෙක ඉඳලා වයස සම්පූර්ණ උනාට පස්සෙ.. මං කතා කෙරුවා වැඩියි නම් මට දහස් වාරයක් සමාවෙන්න පුංචි නෝනා හාමු.."



The Reader's Place Novel

අනුපමා, මෘදු ලෙස කමනිගේ පිටත්ලට තට්ටු කළා ය.

"සමාව ඉල්ලන්න ඕන නෑ අක්කෙ.. අවුරුදු විසි අටක්.. ගෙවිලා ගිය ජීවිත කාලෙට ම ඉගෙන ගන්න නොලැබුණු පාඩම් ගොඩක්.. කසාද බැඳලා ගෙවිලා ගිය එකම එක දවසට මට ඉගෙන ගන්න ලැබුණා... අක්කත් මට කියලා දුන්නෙ එයින් පාඩම් කීපයක්.. හැදෙන කෙනෙකුට කවුරු ඉගැන්නුවත් ඒ හැම පාඩමක් ම වැදගත්.. අක්කා මගෙන් සමාව ඉල්ලන්න උවමනා නෑ.. මට දැනුණ විදියට මේ ගෙදර ඉන්න හැමෝ ම එකම පවුලක්.. මං ඇවිල්ලා තියෙන්නෙ ඒ පවුල ආරක්ෂා කරන්න වෙන්න ඇති අක්කෙ.."

කමනිගේ දෑස යළිත් කඳුළින් තෙත් විය.

"වෙන්න ඇති නෙමෙයි පුංචි නෝනා හාමු.. ඒකටම තමයි.."

# 08

දේවක හා අනුපමා විහාරස්ථානය බලා පිටත්ව ගියේ පා ගමනිනි. රියෙන් මිස ගමන් බිමන් නොමැති දේවකට එම ගමන පවා දැනුණේ වෙනස් ම අත්දැකීමක් ලෙසිනි. සී මැදුරු, සුව පහසු වාහන, ශීත කළ කාමර, විදුලි සෝපාන.. මේ ආදී අප්‍රාණික වස්තූන්ට වඩා මහ පොළොව මත සැබැවින් ම පය ගැසූ කල ගතට, සිතට, නෙතට, නාසයට දැනෙන.. සැබෑ සුව පහසුව කොතරම් ආනන්දජනකදැයි ඒ මොහොතේ දේවක කල්පනා කරන්නට වූයේ ය.

"අනූ.."

"ම්.."

"අපි මේ කොහෙද යන්නෙ අනූ..?"

දේවක විමසුවේ සරල පැනයක් නොවන බව අනුපමා



The Reader's Place Novel

දැන සිටියා ය. කවරාකාරයේ පිළිතුරක් ලබා දිය යුතුදැයි ඇය මදක් කල්පනා කළා ය.

"ජීවිතේ හොයාගෙන නේද දේව්.. අනිත් අයගෙත් ජීවිත හොයලා දෙන ගමන්.. ඒත්.. ඒක ගොඩක් අමාරු ගමනක් වෙයි දේව්.."

විහාරස්ථානයට පිවිසුණු දෙදෙනා බෝ මළුව අබියස හිඳ බුදුන් පුදා, දේවකගේ පවුලට අතිශය හිතෛෂීවන්තව කටයුතු කරන නායක ස්වාමීන් වහන්සේ හමුවීම සඳහා ආවාස ගෙය දෙසට ඇවිද ගියෝ ය.

"පන්සලේ දැන් ඉන්න ලොකු හාමුදුරුවො, සරණංකර හාමුදුරුවො අපේ අප්පච්චිලාගෙ පැත්තෙන් අපිට නෑදෑයොත් වෙනවා අනූ.."

"ඒ හින්දා වෙන්න ඇති පවුලට ඒ තරම් ලැදි නේද දේව්...?"

නව යුවතිපති යුවළට, බෝ මළුවේ හිඳ ආවාස ගෙය දෙසට දිවෙන දිගු පියගැටපෙළ පාමුලදී සරණංකර හිමියන් හමු වූහ. නව යුවළ දුටු මතින් සරණංකර හිමියෝ ඔවුන් පිළිගත්තේ අතිශය ළෙන්ගතු ලෙසිනි.

"දේවක මහත්තයා.. අලුත් ජීවිතේ ආරම්භ කරපු හැටියෙ ම නෝනා මහත්තයත් එක්ක පන්සලට ආව එක නම් බොහොම සන්තෝසයි.."

"අපේ හාමුදුරුවො අද කොහේවත් වඩින්නෙ නැතුව පන්සලේ වැඩ හිටිය එකත් අපිට ලොකු දෙයක් අපේ හාමුදුරුවනේ.."





දේවක-අනුපමා දෙදෙනා ම උන් වහන්සේට වැඳ එකත් පස් වූහ.

"මංගල්‍යයෙ කටයුතු ටික බොහොම ජයට කෙරුණා කියලා උදේ දානෙ අරගෙන ආව ගමනෙදි තරංග ළමයා කිව්වා.."

සරණංකර හිමියන් දෙදෙනා දෙස බලා කීවේ කාරුණික හඬිනි.

"ඒ වැඩ කටයුතු කිසිම දේකට මම මහන්සි උනේ නෑ අපේ හාමුදුරුවනේ.. ලොකු මාමයි, නැන්දයි තමයි සේරම බර කරට අරගෙන හැම දෙයක් ම කළේ.."

"ශ්‍රීවර සම්පත්තිය කියන්නෙ පුද්ගලයෙක් ලබන මහා ලාභයක්නෙ දේවක මහත්තයො.."

දේවක, සන්සුන් ලෙස හිනැහී අනුපමා දෙස බැලුවා විනා කිසිවක් කීවේ නැත. ආගිය තොරතුරු පිළිබඳව මදක් සාමීචියේ යෙදී හිඳීමෙන් අනතුරුව සරණංකර හිමියෝ දේවක ඇමතූහ.

"අපේ නාරද පොඩි උන්නාන්සෙත් වැඩලා ඉන්නෙ දේවක මහත්තයො.. උන්නාන්සෙ ආවාස ගෙයි පිටුපස්සෙ උන්නා දැන් ටිකකට කලින්.. දේවක මහත්තයා ගිහින් උන්නාන්සෙ බැහැ දැකලා එන්ටකො එහෙනම්.. මම මේ දරුවත් එක්ක ටිකක් කතා කරනකල්.."

නිරවුල්ව නිදහස්ව තමාගෙන් යමක් විමසීමට සරණංකර හිමියන්ට උවමනා වී ඇති බව අනුපමා මොහොතින් අවබෝධ කර ගත්තා ය.



The Reader's Place Novel

"එහෙනම් මම පොඩි හාමුදුරුවො හම්බවෙලා එන්නම් අපේ හාමුදුරුවනේ.. අනු මං ගිහිල්ලා එන්නම්.."

අනුපමා නිස සලා එකඟතාවය පළ කළා ය. දේවක පිටුපා යන දෙස මොහොතක් බලා උන් අනුපමා, ස්වාමීන් වහන්සේ වෙත හැරී මදහසක් නැගුවා ය.

"නෝනා මහත්තයට අසුනක් පනවන්ට කියන්ටද..?"

නායක ස්වාමීන් වහන්සේගේ ගෞරවය, ඇගේ හදවතට පමණට වඩා බෙහෙවින් බර විය. අතිශය සරල, නිහඬ, වාම්, සැහැල්ලු දිවි පෙවෙතක් ගෙවූ තමා, හදිසියේ ම ඇදගෙන වැටුණු සංකීර්ණ ලෝකයේ ස්වභාවය හා බරපතලකම් වටහා ගැනීමට ඇයට ඒ සියල්ල ම සාක්ෂි බවට පත්වී තිබිණි.

"අනේ එපා අපේ හාමුදුරුවනේ.. මම මෙහෙම වාඩි වෙන්නම්.."

අනුපමා, පියගැට පෙළෙහි පහත ම වූ පඩිය මතින් සරණංකර හිමියන්ට මදක් සම්මුඛව හිඳ ගත්තා ය.

"මේ දරුවා ගැන හැම විස්තරයක් ම මට දේවක මහත්තයයි ලොකු නෝනයි කියලා තියෙනවා.. මේ දරුවට දැන් ළඟ පාත ඉස්කෝලෙකට මාරුවීමක් හදාගන්ඩ වෙයි නේද..? ගමන් බිමන් අපහසුතා බොහොම වැඩියි නේද...?"

"එහෙමයි හාමුදුරුවනේ.. ගෙදර ඉඳන් ගිය කාලෙ බස් නුතක යන්න උනා.. දැන් බස් හතරක යන්න ඕන.. මේ ගමන සාමාන්‍ය පෙළට වාඩිවෙන දරුවො ටික විභාගෙට වාඩි උනාට





පස්සෙ මේ ළඟ පාත තියෙන ඉස්කෝලෙකට මාරුවීමක් හදා ගන්න බලනවා අපේ හාමුදුරුවනේ.."

විවාහයක බැඳී පැමිණි දිනයේ ම, අනුපමාට මුහුණ දෙන්නට සිදුවූ විපරීත දෛවය කවරාකාරයේදැයි අනුමානයෙන් දැන උන් සරණංකර හිමියන්ට අනුපමා සමඟ කතා කළ යුතු දෑ තෝරා බේරා ගැනීම පහසු වූයේ නැත.

"විවාහ වෙලා වළඳවට පය තියපු දවසෙ ම.. ජීවිතේ කිසිම දාක නොපැතූ ඉරණමකට මුණ දෙන්ට මේ දරුවට සිද්ධ උනා නේද..?"

අනුපමා, සැණෙකින් ගොළු වූවා ය. සියල්ල අමතක කොට හිත හදාගන්නට වෙර දැරුවාට, අහඹු දෛවයක් හමුවේ තමාට අහිමි වී ගිය නිදහස් නිවහල් ලෝකයේ වටිනාකම මිනිය නොහැකි තරම් අගනා බව අනුපමා දැන සිටියා ය.

"ජීවිතේ කියන්නෙ.. අපි ප්‍රාර්ථනා කරන.. හිතන.. අපේක්ෂා කරන සිදුවීම්වලට වඩා.. අහඹු සිදුවීම් ගොඩක එකතුවක් කියලා මම අවබෝධ කරගෙන තමයි ජීවත් උනේ අපේ හාමුදුරුවනේ.. ඒත්.. මම මේ තරම් වෙනසක් කවදාවත් බලාපොරොත්තු වෙලා නෑ.. ඒ ජීවිතවලට රූකවරණය, සෙනෙහස බෙදන්න ඕන මොන විදියටද, මොන ප්‍රමාණයෙන් ද කියලා මට තේරුමක් නෑ අපේ හාමුදුරුවනේ.."

අනුපමාගේ දෑසේ නළියමින් තිබුණේ කඩා වැටෙන්නට ඔත්ත මෙත්ත වූ කඳුළු කැට දෙකකි.

"මම මේ දරුවට පුංචි දෙයක් කියලා දෙන්නම්.. නිරවුල්



The Reader's Place Novels

මනසකින් ලෝකය දිහා බලන දරුවෙක් විදියට මේ දේ මම බොහොම කෙටියෙන් කිව්වා උනත්, වටහා ගන්ට මේ දරුවට බොහොම පහසු වෙයි.. යම් කෙනෙක් හින්දා හිරිහැරයක්, දුකක්, වේදනාවක්, පීඩාවක් විඳින්ට සිද්ධ වෙන කොට.. ඕනම කෙනෙකුට හිතෙන්නෙ මේ මොන කරුමයක්ද කරදරයක් ද කියලා.. මේ දරුවා කවදාවත් එහෙම හිතන්ට එපා.. අනුන්ගෙ සැපත, සුවය වෙනුවෙන් ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කරන්ට පුළුවන් වෙන්නෙ උසස් ම ගණයේ මනුෂ්‍ය ගුණාංග තියෙන කෙනෙකුට විතරයි.. නෝනා මහත්තයා හිතාගන්ට මේක නෝනා මහත්මයට උත්තම ගණයේ පාරමිතා ගණනාවක් ම පුරාගන්ට ලැබුණු වටිනා අවස්ථාවක් හැටියට.. බෞද්ධයෝ හැටියට අපේ අවසාන අරමුණ මේ සංසාර කතරින් එතෙරට යන එක හින්දා මේ දරුවට අප්‍රමාණ කුසල් ප්‍රමාණයක් රැස් කරගන්ට මේ ලැබුණෙ අමිල අවස්ථාවක්.. ගිලානෝපස්ථානය කියන්නෙ බුද්ධාදී උත්තමයන් පවා ක්‍රියාවෙන් ප්‍රගුණ කරපු විශිෂ්ට ගුණාංගයක්.. දේවක මහත්තයගෙ සොහොයුරයි සොයුරියයි කියන්නෙ බොහොම කෙටි ආයුෂ ප්‍රමාණයක් දරාගෙන මේ ලෝකෙට ආව සදාකාලික ගිලනුන් දෙදෙනෙක් දරුවො.. එහෙම අසරණ උදවියට අප්‍රමාණව සෙනෙහස, රැකවරණය බෙදන්ට ඕන නෝනා මහත්තයා.. ඒ දරුවො දෙන්නා මේ ලෝකෙට රැගෙන ආව ඒ කෙටි ජීවිත කාලෙ සතුටින් සුවයෙන් ගත කරන්ට අපි පුළුවන් ප්‍රමාණයක් උදව් උපකාර කරන්ට ඕනෑ.. නීති පොතේ අත්සන් කරලා විවාහ උනාට.. බැඳීම් ගැන හැඟීම් තියෙන්ට ඕන අපේ හිත තුළයි දරුවො.. මේ දරුවට වැටහෙනවද මම කියන දේවල්..?"

සරණංකර නිමියෝ දීර්ඝ අදහස් දැක්වීමකින් අනතුරුව, අනුපමාගෙන් විමසුවෝ ය.





"මට තේරෙනවා අපේ හාමුදුරුවනේ.. ඒත්.. ඒ මහා පරිත්‍යාගය මට ඒ තරම් පහසුවෙන් කරන්න පුළුවන් වෙයිද කියලා මම දන්නෙ නෑ.. මම බොහෝ ම සන්සුන්ව හුදෙකලාවේ ඡන්ද උන කෙනෙක්.. ඇත්ත ම කිව්වොත්.. මගේ ජීවිතේ ඇතුළෙ කවදාවත් මේ තරම් සංකීර්ණ වගකීම් තිබුණෙ නෑ අපේ හාමුදුරුවනේ.."

"මේ දරුවා මේ තරම් කාලයක් ප්‍රගුණ කරපු ඒ සන්සුන්කම.. ආධ්‍යාත්මික සුවය.. ඉදිරි ජීවිතේ වගකීම් යුතුකම් හරියාකාරව ඉෂ්ට කරන්න ලොකු උපකාරයක් වෙයි.. මේ දරුවට ඒ පුණ්‍ය මහිමය නොඅඩුව පිහිටලා තියෙනවා.."

අනුපමා, ඉහට උඩින් දිස්වන සිලි සිලි හඬ නගන බෝපත් වියන දෙස බැලුවා ය. නිහඬව ගෙවී ගිය මිනිත්තුවක දෙකක කාලය අවසානයේ ඈ, දීර්ඝ සුසුමක් මුදා හැර ළය සැහැල්ලු කර ගත්තා ය.

"මං උත්සාහ කරන්නම් අපේ හාමුදුරුවනේ.. සමහර විට ඒ උත්සාහයේදී.. මට මාවත් අමතක වෙලා යයි අපේ හාමුදුරුවනේ.."

අනුපමා සහ දේවක පන්සල් භූමියෙන් පිටව යන විට දෙහෝරාවක් පමණ ගතවී තිබිණි.

එදින සන්ධ්‍යා භාගය වන විටත් රැස්ව සිටි ඥාතී සමූහයා පිටවී නොගියේ, පසු දින අනුපමාගේ මව, පියා ඇතුළු ඥාතී පාර්ශවය දේවකගේ නිවස වෙත පැමිණීමට නියමිතව තිබුණු බැවිනි. දවසේ සූර්යාලෝකය බොඳ වී ගොස්, රෑ බෝවන්නට වන්නට අනුමාගේ සිත තුළ වූ අනියත බිය කෙමෙන් හිස



The Reader's Place Novels

ඔසවන්නට විය. රාත්‍රී අදුර ළඟ දේවක සමීපයට පැමිණෙන්න සෑම මොහොතක ම ඈ කුමක් හෝ හේතු කාරණාවක් සොයා දේවකගෙන් දුරස් ව පලා ගියා ය. වේලාව මධ්‍යම රාත්‍රියට ද ආසන්න වී තිබිණි. දේවක හා අනුපමා දෙදෙනෙකු ලෙස ම දෙපසක තබමින් ගෙවී යන දෙවන රැය ද එසේ ගෙවී යමින් තිබිණි. කදුළු උතුරා ගලා යන දැසින් යුතුව අනුපමා අවසානයේ දේවකගේ ළය මත හිස නොවාගෙන ඉකි බිඳින්නට වූවා ය.

"අපිට මේ මොකද වෙන්න යන්නෙ අනූ..? සදහටම අපි දෙන්නා මේ විදියට දෙපැත්තකට වෙලා දෙන්නෙක් වෙලා ම ඉන්නවද අනූ..?"

දේවකගේ දැසින් ද කදුළු අනුරක් ම රූරා වැටෙමින් තිබිණි.

"මට සමාවෙන්න දේව්.. ඒත්.. මට බෑ.. මම බයයි අපේ දරුවත් මල්ලියි නංගියි වගේ වෙයි කියලා.. මට බයයි දේව්.. ටිකක් නෙමෙයි.. මහ පුදුමාකාර බයක් මට දැනෙනවා දේව්.."

දේවක, තම බිරිඳ කිටි කිටියේ ළයට තුරුළු කර ගත්තේ ය. එහෙත්, හඬා හෙම්බත්ව උන් ඇගේ ගත මළ මිනියක මෙන් සිතලව තිබිණි. ඇගේ හද තුළ කැකෑරෙන භීතියේ ප්‍රමාණය වටහා ගන්නට එපමණක් ම සෑහිණි.

"අනූ.. මම කවදාවත් එච්චර දුරක් හිතුවෙ නෑ.. පරම්පරාවක බලාපොරොත්තු පැත්තකටම දාලා.. ඇත්තමයි මට තිබුණා කසාද නොබැඳ ඉන්න.. ඔයාව මේ වගේ දුකකට ඇදලා නොදා ඉන්න තිබුණා මට.."





වේදනාවෙන්, බියෙන් හඬා වැළපුණත්, දේවක හඬා වැටෙනු දකින ඇගේ ළය අසමාන වූ වේදනාවකින් ඇවිලෙන්නට විය.

"දේව්.. මගේ දෙවය මට දෙන දෙයක් බාරගත්ත මම කොහොම හරි හිත හදාගන්නම්.. ඒත්.. මට සමාවෙලා ඒකට මට කාලයක් ඉඩ දෙන්න දේව්..."

මධ්‍යම රාත්‍රිය ද ගෙවී ගොස් අලුයම් යාමය ද උදා වන්නට ආසන්න වන තෙක්, සුසුම් හෙළමින්, එකිනෙකාගේ ළය මත තෙරපෙන වේදනාවන් වවන බවට පත් කොට මුදා හරිමින්, දෙදෙනා උඩු මහලේ සඳැල්ලට වී කාලය ගත කළහ. නිදන කාමරය දැකීම පවා දෙදෙනාට ම මහත් චිත්ත වේදනාවක්, හිරිහැරයක් වී තිබිණි.

"එක අතකින්.. ඔයාට මේ දේවල් හංගලා මම කරපු වරදට මට ලැබෙන දඬුවම.. මේක වෙන්න ඇති අනූ.. ඔයාට දැනෙන ඒ බය සාධාරණයි.. ඔයාගෙ අතේ කිසිම වරදක් නෑ.. මටත් සමාවෙන්න අනූ.."

අනුපමාගේ පසුතැවීමෙන් හා වේදනාවෙන් පිරුණු සිත සුවපත් වීම ඇරඹෙන්නට වූයේ දේවකගේ ඒ ආයාචනයත් සමගිනි. එහෙත්, ඇගේ සිත තුළ උපදිමින් තිබුණු සෙනෙහස් පෙරළිය, දෙදෙනෙකු වූ ඔවුහු එක් අයෙකු බවට පත් කිරීමට තරම් නම් කෙසේවත් ප්‍රබල වූයේ නැත.

පසු දින අනුපමාගේ මව, පියා සහ තවත් ඥාතීන් කිහිප දෙනෙකු මනාලියක වී පතිකුල ගිය අනුපමා බැලීමට නැගම් පැමිණියෝ ය.



The Reader's Place Novel

"නංගියෙ.. මේ මොකද මේ.. මේ තරමට කද මළු බැඳගෙන.. ජීවිත කාලෙට ම ඇති වෙන තරමට දේවල් ගෙනල්ලා වගේ එක ගමනින් ම.."

දේවකගේ මව, අනුපමාගේ මවගෙන් ඉඩ ලද මොහොතක විමසුවේ සැබෑම පුදුමයෙනි. වර්ණවිර මහත්මිය, රන්මුතුගල මහත්මිය වෙත පැවේ වියළී ගිය සිනාවකි.

"ආයෙ ඉතින් මේ වගේ ගමනක් අපි කොහේ කියලා යන්නද..? කවුරු වෙනුවෙන් යන්නද අක්කෙ.. ඊටත් වැඩිය කවදා ආයෙ මේ විදියට එන්න ලැබෙයිද කවුද දන්නෙ අක්කෙ..?"

"ඇයි නංගියෙ ඒ හැටි අසුබවාදීව කතා කරන්නෙ.. මේ අපි ඉන්න කිලෝ මීටර විස්ස වීසි පහේ දුර මහ දුරක්යැ..?"

දේවකගේ මව අනුපමාගේ මවට පැවසුවේ ඇගේ අතකින් ද අල්ලා ගෙන ය.

"තව දවස් හතරකින්.. අපි මේ රටින් පිටවෙලා යන්න යනවනෙ අක්කෙ.. කවුද දන්නෙ ජීවිතේ ඇතුළෙ මොන මොන විපර්යාස සිද්ධ වෙයිද කියලා.. ඉක්මනට ම ආපහු එන්න හිතාගෙන ගියාට.. ඒවා කොයි හැටියට වෙයිද කියලා කාටද හිතන්න පුළුවන් අක්කෙ..?"

"ඒක නම් ඇත්ත තමයි නංගියේ.."

අනුපමාගේ මව සේ ම දේවකගේ මව ද ඒ මොහොතේ දීර්ඝ සුසුමක් හෙළුවා ය. අනුපමාගේ මව, දේවකගේ මව හා කතා බහේ නියැලී සිටින අතරවාරයේ, අනුපමා තම පියා සමඟ දොඩමලු වී සිටියා ය.





"අප්පච්චිටයි අම්මටයි මම මේ අන්තිම මොහොතෙ බොරු කියන්නෙ නෑ අප්පච්චි.. අම්මයි අප්පච්චියි ගියාට පස්සෙ.. මට පුදුමාකාර විදියෙ තනිකමක් දැනෙයි අප්පච්චි.. සමහර විට උහුලාගන්න බැරි තරමේ පාළුවක්.. තනිකමක්.. දුකක්.. වේදනාවක් මට දැනෙයි.."

අනුපමාගේ දෑසින් උණු කඳුළු දහරාවන් ගලා වැගිරෙන්නට විය. ඇගේ ඇතුළු හදවතට දැනෙන්නට වූයේ අප්‍රමාණික වේදනාවකි.

"මගේ ළඟ නොහිටියත්.. ලෝකෙ කොහේ හිටියත්.. කවුරු ළඟ හිටියත්.. මගේ අම්මටයි අප්පච්චිටයි සතුටින් ඉන්න ලැබෙන්න කියලා මම ප්‍රාර්ථනා කරනවා.. මගේ අම්මටයි අප්පච්චිටයි නිදුක් නීරෝගී සුව ලැබිලා.. මගේ ආයුෂත් අරන් ජීවත්වෙන්න ලැබෙන්න කියලමයි මම ප්‍රාර්ථනා කරන්නෙ.."

සමුගන්නා මොහොතේ අනුපමා නොසැහෙන සේ මවත්, පියාත් වැළඳගෙන හඬා වැළපුණාය. හදවතකට බද්ධ වී ජීවත් වූවන්ගෙන් සමු ගැනීමට සිදුවීම කෙතරම් තම වේදනාකාරීදැයි සියල්ලෝ ම ප්‍රත්‍යක්ෂයෙන් අවබෝධ කර ගත්හ.

එම සති අන්තයේ එළඹුණු සෙනසුරාදාවේ, අනුපමාගේ මාපියෝ ඇගෙන් සමුගෙන ඕස්ට්‍රේලියාව බලා පිටත්ව ගියෝ ය.

"පුතේ.. අපි ගිහිල්ලා ඉක්මනට ආපහු එන්නම්.. මගෙ පුතා පරිස්සමින් ඉන්න.."

"පරිස්සමින් ගිහිල්ලා එන්න අප්පච්චි.. මම බලන් ඉන්නවා මගෙ අම්මයි අප්පච්චියි ආපහු මාව බලන්න එනකල්.."



The Readers Place Novel

අනුපමා, ගුවන් තොටුපළ පරිශ්‍රයේදී ඒ මොහොතේ පියාගේ දෙපතුල හිස හොවා වැන්දා ය.

**"උද්දිකාරෝ අලිංගිත්වා**
**චුම්භිත්වා පියපුත්තකං**
**රාජ මජ්ජං සුපට්ඨිතං**
**පිතු පාදං නමා මහං..."**

දියණියගේ නැමදුම් හඬ සවනට මුසු වෙද්දී, වර්ණවීර මහතාට පවා ශෝකය වාවා ගත නොහැකිව ඉකිබිඳිණි. පියාගේ ළය මත හිස හොවාගෙන සැලකිය යුතු වේලාවක් හඬා වැටුණු ඈ, මවගේ දෙපා මුල දණ ඔබා ඇගේ දෙපතුල මත ද හිස හොවා ගත්තා ය.

**"දස මාසේ උරේ කත්වා**
**පෝසේසි උද්ධිකාරණං**
**ආයු දිඝං වස්ස සතං**
**මාතු පාදං නමා මහං.."**

තම මාපියන්ගේ දෙපා මත හිස හොවා වඳින්නට ඇගේ දෙවය ඉඩ කඩ සලසා දුන් අවසන් අවස්ථාව එය බව මෙලොව කිසිවකුත් ඒ මොහොතේ අංශු මාත්‍රිකව හෝ දැන සිටියේ නැත.

"ඔයාගෙ දරු පැටියව බලාගන්න මම ඉක්මනට ආපහු එනවා මගෙ රත්තරන් පුතේ.. මගෙ පුතා සාගරයක් විතර කඳුළු හලාගෙන මේ විදියට අඬනවා අම්මා දකින අන්තිම දවස අද වෙන්න ඕන පුතේ.. ආයෙ කවදාවත් මේ විදියට





අඬන්නෙපා මගෙ රත්තරන් පුතේ.. මගේ දුව මේ ලෝකෙ සතුටින් ම ජීවත්වෙන දරුවා වෙනවා මට බලන්න ඕන මගෙ පුතේ.. සියලු දෙවියෝ මගෙ දරුවා ආරක්ෂා කරයි.. ඔයා හොඳම හොඳ දරුවෙක් පුතේ.. මගෙ දුවට කවදාවත් වරදින්නෙ නෑ.. තෙරුවන් සරණයි මගෙ පුතේ.."

"ඇහිලි ගැන ගැන අම්මගෙ චූටි දුව මග බලන් ඉඳියි අම්මා.. පරිස්සමින් ගිහින් එන්න.. බුදු සරණයි අම්මා.."

මාපියන් හැරලවා යළි නිවස වෙත පැමිණි විගසම, අනුපමා, වාවා ගත නොහැකි සොවින් යහන මත පෙරළී හඬා වැළපෙන්නට වූවා ය.

"අනූ.. ප්ලීස් නැගිටින්න.. බත් කටක්වත් කලා නිදාගන්න.. ඔහොම අඩලා අඩලා ඔයා අසනීප උනොත්.. සති දෙකකට පස්සෙ ඉස්කෝලෙ යන්න හිටිය ඔයාට අනිද්දා ඉස්කෝලෙ යන්නත් බැරිවෙයි.. අම්මයි අප්පච්චියි ආපහු එන්නතෙ ගියේ.. කාලය ගොඩක් ඉක්මනට ගෙවිලා යනවා අනූ.. ඒ දෙන්නා ඉක්මනට ම ආපහු එයි.. ඔහොම අඬන්නෙපා අනූ.. ප්ලීස්.."

අනුපමා, කඳුළු වැකුණු දෑස් ඔසවා වරක් තම සැමියා දෙස බලා, ඔහුගේ උරහිසකට හිස වාරු කර ගත්තා ය.

"අම්මයි, අප්පච්චියි එක්ක මම මොන තරම් බැදිලා හිටියද කියලා හරියට ම දැනෙන්නේ දැන් දේවි.. ඒ දෙන්නට මම මොන තරම් ආදරේ කළා ද කියලා මම හරියට ම තේරුම් ගත්තෙ ඒ දෙන්නා මගෙන් ඈත් වෙලා යන්න ම යන්න ගිය අද දවසෙ.. දැන් මට මගේ ම කියලා මේ රටේවත් කවුරුවත් ම නෑ දේවි.."



The Reader's Place Novel

දේවක, අනුපමාගේ හිස දුරතින් ඔසවා ඇගේ දෑසට ම එබී බැලුවේ ය. ඔහුගේ දෑසේ ඇදී තිබුණේ ද වේදනාවත් අනන්තයකි.

"එතකොට.. මේ මම අනූ..? මම.. තවමත් ඔයාගෙ කවුරුවත් නෙමෙයිද අනූ..?"

අනුපමාගේ හැඩුම් හඬ යළිත් අලුත් විය. තමාගේ අප්‍රවේසම් සහගත වදන් පිළිබඳව ඇයට තමා ගැන ම දැනුණේ කලකිරීමකි.

"අනේ දේවි.. මම දුර දිග හිතලා කියපු කතාවක් නෙමෙයි.. මට සමාවෙන්න දේවි.."

අනුපමා, යළිත් වතාවක් දේවකගේ උරහිසෙහි හිස හොවා ගෙන, ළයෙහි තෙරපෙන වේදනාව සෝදා හරින්නට මෙන් බොහෝ වේලාවක් හඬා වැටුණා ය. ඒ රාත්‍රියේදී, දරාගත නොහැකි දණ හිසේ වේදනාව පවා නොතකා, දේවකගේ මව, පියගැට පෙළ නැග අනුපමා සොයා උඩු මහලට පැමිණියා ය.

"දුවේ.."

"එන්න අම්මෙ.. දොර වහලා නෑ.."

හැඬීමෙන් හෙම්බත්ව උන් අනුපමා, දේවකගේ මව පැමිණෙත්ම අසිරුවෙන් සිරුර වාරු කොට යහන කොණක හිඳ ගත්තා ය. දේවකගේ මව, උඩුමහලට පැමිණීමේ දෙපා වේදනාව දරාගන්නට දරන උත්සාහය දුටු අනුපමාගේ ළය යළි රිදුම් දෙන්නට විය.

"මේ තරම් අමාරුවෙන් අම්මා උඩට ආවෙ ඇයි අම්මෙ..





නංගියි මල්ලියි දෙන්නා බලන්නත් එක්ක මම තව ටිකකින් පහළට එන්න හිටියෙ අම්මෙ.."

අනුපමා, දේවකගේ මව දෙස බලා හිනැහෙන්නට වෙර දැරුවද, ඇගේ දෙතොලතර සිනාවක් අන්දන්නට සමත් සැහැල්ලුවක් අනුපමාගේ සිත තුළ ඉතිරිව තිබුණේ නැත.

"පුතේ.. අද දවසට ම වතුර උගුරක්වත් නැ කියලා පුතා කිව්වා.. යමු පුතේ.. බත් කටක් කාලා ඇවිල්ලා දුව ආපහු නිදාගන්න.."

අනුපමාගේ දෑස යළිත් කඳුළින් තෙත් වෙගෙන එනු දුටු රන්මුතුගල මහත්මිය වඩාත් කැළඹුණා ය.

"පුතේ.. මට ඔයාගෙ හිතේ තියෙන වේදනාව හොඳට තේරෙනවා.. දෙමව්පියන්ගෙන් දුරස් වෙන්න සිද්ධ වෙනවා කියන්නෙ.. දරාගන්න ලේසි පහසු වේදනාවක් නෙමෙයි කියලා මම දන්නවා.. අපි මොන තරම් තදින් බැඳිලා ජීවත් උනත්.. දෙමව්පියන්ගෙන් උනත් දවසක දුරස් වෙන්න සිද්ධ වෙනවා පුතේ.. දුවගෙ අම්මයි අප්පච්චියි වෙන්න මට බැරි උනත්.. මගෙ දුවට පුළුවන් නේද අම්මටයි අප්පච්චිටයි වගේම මේ අම්මටත් ආදරෙන් ඉන්න.. දුවෙකුගෙ සෙනෙහසක් විඳලා නැති මේ අම්මට ඔයා ගොඩක් වටිනවා පුතේ.."

අනුපමාගේ හඳවත නොසිතූ පරිමාණයකින් කිරි ගැහෙන්නට විය. අනුපමා, යහන මත හිඳ උන් තැනින් බිමට ලිස්සා ගොස්, දේවකගේ මවගේ දෙපා වැළඳගෙන, ඇයගේ දෙපයට හිස වාරු කොට නිඳ ගත්තා ය.



The Reader's Place Novel

"මම පවුලෙ බාල ම දරුවා හින්දා වෙන්න ඇති අම්මෙ.. අම්මයි අප්පච්චියි නැතුව මම කවදාවත් ඉඳලා නෑ.. ඒ හින්දා වෙන්න ඇති අම්මයි, අප්පච්චියි නැති අඩුව මේ තරම් ලොකු වේදනාවක් විදියට මට දැනෙන්නෙ.. මේ අලුත් ජීවිතේ.. මට තාමත් ආගන්තුකයි අම්මෙ.. මට මේ අලුත් ලෝකෙට හරියන විදියට හැඩ ගැහෙන්න ටික කාලයක් යයි .. මේ සාම්ප්‍රදායික සමාජය ඇතුළෙ තවත් සාම්ප්‍රදායික නැන්දම්මා කෙනෙක් නොවී.. මාව ලේලි විදියට නෙමෙයි.. අම්මගෙ ම දුවෙක් කියලා හිතන්න පුළුවන් නම්.. වැඩි කාලයක් ගත නොවී අම්මගෙ ම දුව වෙන්න මටත් පුළුවන් වෙයි අම්මෙ.."

වියෝගයේ කඳුළු කාලයක් සමග වියැකෙන බව දැන සිටියත්, තම මවත්, පියාත් සිහි වන ඒ මොහොතේ අනුපමාගේ දෑසින් අතොරක් නැතිව උණු කඳුළු වැගිරෙමින් තිබිණි. බොහෝ වේලාවක් දේවකගේ මවගේ දෙපා අද්දරට වී නිහඬව කඳුළු සලමින් උන් අනුපමා, හිඳ උන් තැනින් නැගිට, දේවකගේ මවගේ සුරතින් අල්ලාගෙන ප්‍රවේසමින් පිය ගැට පෙළ බැස්සා ය.

*අනුපමාගේ සහ දේවකගේ විවාහයෙන් දෙසතියකට පසු...*

කිසිදා නිමා නොවන භීතිකාවක් තුළ ගිලී හිඳින තම බිරිඳ පිළිබඳව දේවකගේ සිත අනුකම්පාවෙන් පිරී යන්නට විය. අඳුර මැද සුසුම් හෙලන අනුපමාගේ තළලත මෘදු ලෙස සිප ගත් දේවක, මෘදු හඬින් මුමුණන්නට වූයේ ය.





"අනූ.. කවදාවත් පරක් තෙරක් නොදකින ප්‍රශ්නෙක නේද අපි දෙන්නා මේ ගිලිලා ඉන්නෙ..? අපි මේ ප්‍රශ්නෙට මොකද කරන්නෙ..? හිතින් විතරක් බැඳිලා අපි දෙන්නා ලෝකෙට පේන්න සැමියා-බිරිඳ විදියට මේ යන ගමනට කිසිම අරමුණක්වත් අර්ථයක්වත් නෑ නේද අනූ..?"

අනුපමා, තවත් තදින් දේවකගේ ළයට ගුලි වූවා ය.

"මං දන්නවා දේව්.. අපිට මේ ගමන මෙහෙම යන්න බෑ.. ඒ විතරක් නෙමෙයි.. අපි දෙන්නගෙ දරුවෙක් දිහා මුළු පරම්පරාවක් එකතු වෙලා බලාපොරොත්තු ගොඩ ගහගෙන බලන් ඉන්නවා.. මට තේරෙන්නෙ නෑ දේව්.. පරම්පරාවකට ම පොදු උන ලක්ෂණයක් වෙනස් කරන්න තරම්.. ඔයාගෙයි මගෙයි දෛවය කරුණාවන්ත වෙයිද..? දෙවියො ඔයාගෙ අම්මට ඔයාව දීලා කරුණාවන්ත උනා වගේ.. මටත් මගේ දෛවය කරුණාවන්ත වෙයිද දේව්...?"

වෙනදා මෙන් දියාරු ගැහැනියක ලෙස කඳුළු සලමින් නොව, එදින අනුපමා දේවකගෙන් විමසුවේ දැඩි වගකීම් සහගත ස්වභාවයකිනි. ඒ පැනයත් සමගම දේවකගේ සිත තුළ අනුපමා කෙරෙහි ඉපදුණේ, පෙර කිසිදා නොදැනුණු තරමේ චමත්කාරජනක ආදරණීය සෙනෙහසකි.

"අපි ඩොක්ටර් කෙනෙක් ළඟට යමුද අනූ..?"

කණ්ණාඩි මේසය මත දැල්වෙන රාත්‍රී විදුලි පහනේ මන්දාලෝකයෙන්, අනුපමා, දේවකගේ දෑස මත දිදුලන සෙනෙහස කොපමණදැයි දැක ගත්තා ය. ඈ, තම සැමියාගේ දෑස දෙස



The Reader's Place Novel

බැලුවේ ද, ඔහු කෙරේ කෙමෙන් කෙමෙන් පිළිසිඳෙන සදාදරණීය ආදරය දෙනෙතෙහි රඳවාගෙන ය.

"මේ වගේ අගක් මුලක් නොපෙනෙන හිතේ ප්‍රශ්නවලට උත්තර දෙන්න ඔය කියන දොස්තරලට බෑ දේව්.. මේ වගේ ප්‍රශ්න පත්තරයකට හොඳ උත්තර ලැබෙනවා නම් කවදහරි ලැබෙන්නෙ දෙවයේ හාස්මකින් විතරයි.. හිත ඇතුළෙ ආත්ම විශ්වාසය ම වගා කරගෙන.. ඒ අධිෂ්ඨානයෙන් ම ප්‍රශ්නෙට මූණ දෙනවා ඇර.. මෙතෙක් කල් ගත කරපු යහපත් ජීවිතේ නාමයෙන්.. සත්‍ය ක්‍රියාවක් කරනවා ඇරෙන්න... වෙන මගක් නෑ දේව්.. ඉස්කෝලෙ ගිහිල්ලා දරුවන්ට උගන්නන පිරියඩි අටේදි ඇරුණම.. මගේ මුළු කාලයම ගත වෙන්නෙ.. මම කියපු ඒ පාර හොයාගන්න.. කවදහරි දවසක අපි ළඟට එන්න ඉන්න දරු පැටියගෙ නාමයෙන්.. මට සමාවෙලා තව ටික දවසක් මට දෙන්න දේව්.."

දේවක, තම බිරිඳ දැතේ උණුසුමට ගුලි කරගත්තේ අප්‍රමාණ වූ සෙනෙහසකිනි.

"සමාව ඉල්ලන්න ඕන වැරදි කරපු මම මිසක් කිසිම වරදක් නොකරපු ඔයා නෙමෙයි අනූ.. අපි කොහොම හරි හිත හදාගෙන මේ ප්‍රශ්නෙට මූණ දෙන්න මාර්ගයක් හොයාගමු.. මම ඔයාට.. ඔයාගෙ ඔය පුදුමාකාර හොඳ ගැහැනු ගතිගුණවලට.. මම ගොඩක් ආදරෙයි අනූ.. මගේ මේ ඉවසීම ඒ ආදරේ හින්දා ඉබේම ඉපදුන එකක්.. මොන දේ මොන විදියට සිද්ධ උනත්... ඔයා ගැන මගේ හිතේ එදා ඉපදුන ආදරේ එදා වගේමයි අනූ.."

විවාහයෙන් දෙසතියකට පසු, පළමු වතාවට, සිතේ බරට





ඔසවාගෙන උන් කිසියම් බරක් ඉවත හළ අනුපමා, පැය දෙක තුනක් සුවදායී නින්දකට පිවිස සිටියා ය. පසුදාට පහන් වන විට ඇය අවදි වූයේ දෙසතියක් පුරා සිත තුළ ගොඩ ගසාගෙන උන් දෝමනස්සයන් සියල්ල පළවා හැර, පුදුමාකාර අධිෂ්ඨානශීලී සිතකිනි. ඒ උදෑසන පටන් ඈ දාන, ශීල, භාවනාදී ප්‍රතිපදා පුරමින්, තමාගේ සත්‍ය ක්‍රියාවට පණ පෙවීමට වෙර දැරුවා ය. විශාඛා සිටු දේවියට සේ සම්පත් පහළව තිබූ බැවින්, දානාදී පාරමිතා පිරීමට ඇයට බාධකයක් තිබුණේ ද නැත.

## විවාහයෙන් මසකට පසු...

පාසල නිමවී නිවසට පැමිණි අනුපමා, එදින ද ආහාර ගැනීමක් හෝ නොකොට, ස්නානය කොට, පිරිසිදු වී, විහාරස්ථානය බලා යාමට වහාම සූදානම් වූවා ය.

"මැණිකම්මා.. කෝ පුංචි බේබිලා ලෑස්තිවෙලා ඉවරද..? අද මට පැයක ආෆ්ටර්ස්කූල් ක්ලාස් එකක් කරන්න උනා හෙට තරහෙකට යන්න ඉන්න ළමයි වගයකට.. ඒකයි පරක්කු උනේ.. පහත් පහු උනා.. අපි ඉක්මනට යමු මැණිකම්මා.."

"අනේ පුංචි නෝනා හාමු.. පොඩි බේබි කියනවා කාටුත් එක බලන්න ඕන හින්දා පන්සල් යන්න බෑ කියලා.."

අනුපමා, මැණිකා දෙස බැලුවේ ද කරුණාව වැහෙන දැසිනි.



The Reader's Place Novel

දිල්හාර කිසිදු විරෝධයකින් තොරව අනුපමා සමග ගමනට සූදානම් වූයේ ය. දිල්හාර තුළ ඒ වන විට පැවති සංයමය දැක මැණිකා පුදුම වූවා ය. පා ගමනින් මග ගෙවා යන අතර වාරයේදී, මැණිකා එම විසල් පුදුමය වචන බවට පත් කළා ය.

"ඇත්තටම මේක නම් පුදුමාකාර විස්ම කර්ම වැඩක් පුංචි නෝනා හාමු.. මෙහෙම කියන්නත් දුකයි.. ඉස්සර පුංචි බේබිලා දෙන්නා හීලෑ කරන්න බැරි සත්තු දෙන්නෙක් වගේ.. පුංචි නෝනා හාමු ආවා විතරයි දවසට දෙකට හැමදේම වෙනස් උනා.. තාම පුංචි නෝනා හාමු ඇවිත් යාත්තම් ගෙවිලා ගියෙත් මාසයයි.. ඒ පොඩි කාලෙට.. මේ තරමට ලොකු වෙනසක්.. මට නම් හිතාගන්නවත් බෑ පුංචි නෝනා හාමු.."

අනුපමාගේ දෙතොලතර ඇදුණේ මෘදු එහෙත් වේදනාබර හසරැල්ලකි.

"මැණිකම්මා.. පුංචි දරුවන්ට වගේ අපි එයාලට ආදරේ කරුණාව දක්වන්න ඕන.. මනසින් එයාලා සදාකාලික පුංචි දරුවො.. ඒ හින්දා අපි එයාලව පුදුමාකාර සෙනෙහසකින් රැක බලා ගන්න ඕන මැණිකම්මා.."

අනුපමා අතකින් දිල්හාර ද, අනෙක් අතින් සමනලී ද අල්ලාගෙන විහාරස්ථානය දෙසට සන්සුන් ගමනින් පිය මැන්නා ය. මග දෙපස දී දුටුවත් පවා, ඒ දසුන නැරඹුවේ, අද්භූත දසුනක් දකින කලෙක මෙන් විස්මයෙනි.





"බෑ කියලා බෑනෙ මැණිකම්මා.. මේක මගේ අධිෂ්ඨානයක්.. මාස තුනක් එක දිගට අපි මේ බෝධි පූජාව නොකඩවා කරන්න ඕන මැණිකම්මා.. ගෙනියන දේවල් ටික අරගෙන මැණිකම්මා එන්නකො.. මම මල්ලිව අඩ ගහගෙන එත්තම්.."

කාලය ගැන සලකා බැලූ අනුපමා, වහාම දිල්හාර රැදී උන් ආලින්දය දෙසට ඇවිද ගියා ය. ටයිල් කළ පොළොව මත ඉබාගාතේ වැතිර, රූපවාහිනියේ නෙතු රඳවාගෙන උන් දිල්හාර අබියස අනුපමා දණ ගසා ගත්තේ, ඔහුගේ හිස ද අතගාගෙන ය.

"මල්ලි.. කෝ නැගිටින්න.. හොඳ ළමයා වගේ ඉක්මනට ලෑස්තිවෙන්න.. අපි පන්සල් ගිහිල්ලා ඇවිල්ලා ආපහු කාටුත් බලමු හොඳේ..."

සොයුරාගේත්, සොයුරියගේත් අවිහිංසක දැස දකිය සෑම මොහොතකම අනුපමාගේ දැසට පිරුණේ කරුණාව උතුරා ගලා යන කඳුළු ය. අනුපමා, දිල්හාරගේ දෙතොලතරින් බේරී තිබුණු කෙළ පහරවල් දෙක, කමිසයේ අමුණා තිබූ ලේන්සුවෙන් පිස දමමින්, දිල්හාරට නැඟී සිටීමට වාරු දුන්නා ය.

"අක්කා.. ඇයි අපි හැමදාම පන්සල් යන්නෙ..? හැමදාම පන්සල් යන්නෙ හොඳ ළමයි ද අක්කා..?"

"ඔව් මල්ලි.. හොඳ ම හොඳයි ළමයි තමයි එහෙම හැමදාම පන්සල් යන්නෙ.. තව ගොඩක් දවස් අපිට පන්සල් යන්න තියෙනවා.. මගෙ මල්ලිත් ගොඩක් හොඳ ළමයෙක්නෙ.. ඒ හින්දා දැන් පන්සල් යමු හොඳේ.."

The Reader's Place Novel

## මාස දෙකකට පසු...

කාලය.. තටු සලා ඉගිළ යමින් තිබිණි.. ආමිෂ, ප්‍රතිපත්ති පූජාවන්හි නිරත වෙමින්, දේවකගේ රෝගී සොයුරාත් සොයුරියත් වෙනුවෙන් ආත්ම පරිත්‍යාගයෙන් කටයුතු කළ අනුපමා.. තමාගේ දෙවය ගැන ශෝකී වීම අතැර දමා ක්‍රමයෙන් සිත එකඟ කර ගත්තා ය. දේවකගේත්, අනුපමාගේත් ලෝකය වසා පැතිර ගත් අඳුර ඉරා දමන්නට, අනුපමාගේ එලෙස එකඟ වූ සිත තීරණය කොට තිබිණි. අනුපමාගේ මුවින් ගිලිහෙන වදන් අදහාගත නොහැකිව දේවක මද වේලාවක් ඇය දෙස බලා සිටියේ, සෙමින් දෑසට උනා ගෙන එන කඳුළු ද සමගිනි.

"අනූ.. ඔයා ඔය ඇත්තමද කියන්නෙ..?"

"ඔව් දේව්.. මගේ හිත දැන් හැදිලා.. දෙවයෙත් මට උරුම වෙලා තියෙන ජීවිතේ හැඩය මේක නම්.. මම ඒ ජීවිතය සතුටින් බාර ගන්න ඕන දේව්.. අපි.. අපේ ජීවිතේ මුල ඉඳන්ම පටන් ගනිමු.. අපි දෙන්නම.. මේ ජීවිත කාලයෙදි, කාටවත් ම වරදක් කරලා නෑ දේව්.. ලෝක පාලන ධර්මය.. අපිට අසාධාරණයක් කරන එකක් නෑ.. ඒ විශ්වාසය අපේ ප්‍රාර්ථනා ඉෂ්ට කරයි.."

දේවක, අනුපමා තම ළයට සිර කර ගෙන.. බොහෝ වේලාවක් දෑස පියාගෙන සිටියේ ය. තමාගේ ලෝකය ම වසා ගත් අඳුර ඉරා, ආලෝකය රැගෙන එන්නට සූදානම් වන තමාගේ ආදරණීය බිරිඳ දෙස දේවක බලා සිටියේ සිහිනයෙන් මෙනි.



"එකම එක ඉල්ලීමක් තියෙනවා දේව්.."

"ලෝකෙම හරි ඔයාට ගෙනත් දෙන්නම් අනූ.."

"හිස් අතින් ආව මට.. ඔයා ගොඩක් ලොකු ලෝකයක් අයිති කරලා දීලා ඉවරයි දේව්.. තවත් ඔයාගෙන් මට නිමිවෙන්න.. මේ භෞතික ලෝකයේ කිසිම දෙයක් නෑ.. අපි අද නවස.. අපේ ගෙදර යමුද දේව්.. අද ඉඳලා.. හෙට එමුද අපි..?"

දේවක, දැසින් හිනැහී හිස සලා එකඟ විය.

එදින සන්ධ්‍යාවේ අනුපමා හා දේවක අනුපමාගේ නිවස බලා පිටත්ව ගිය අතර, යාබද නිවසේ විසූ සුරවීර මහතාට තමා පැමිණි බව දන්වා ගේට්ටුව විවර කොට, මෝටර් රථය වත්තට ඇතුළු කරනු පිණිස ගේට්ටුව මුළුමනින් ම විවර කළා ය. මිනිස් පහසක් නොලබන නිවස හා විසල් ගෙවත්ත පුරා පැතිර තිබුණේ, උසුලාගත නොහැකි තරමේ පාළුවකි. විවාහයෙන් මතු මුහුණ දෙන්නට සිදුවූ අත්දැකීම් හමුවේ, ලෝකයේ පවත්නා ධර්මතාවයන් පිළිබඳව මනා අවබෝධයකින් පසු වූ අනුපමා පමණට වඩා ශෝක වන්නට ගියේ නැත. එහෙත්, ඇගේ මුවින් නොදැනුවත්ව ම පිටවූ සුසුම හමුවේ, දේවකගේ හදවත පවා සසැලිණි.

"දුකයි නේද අනූ..?"

"ඉර නිවුණම ලෝකෙම අඳුරු වෙනවා දේව්.. අම්මයි අප්පච්චියි නැතුව අඳුරු උන මගේ ලෝකෙ.. තියෙන ඒ අඳුර මට කවදාවත් ම හිතින් මකලා දාන්න බැරිවෙයි.. දෙවය කියන්නෙ මහ පුදුමාකාර දෙයක්.. එක අතකින් ඔයාව දීලා..

The Reader's Place Novel

අනිත් අතින් අම්මයි අප්පච්චියි උදුරාගෙන ගියා.. බුදු බණ ඇර වෙන කිසිම දෙයක් මට දැන් මතක් වෙන්නෙ නෑ දේවි.. මේ ලෝකෙ තියෙන.. හැමදේම අනියතයි.. ඒ සත්‍යය දරා ගන්න තරමට අපේ හිත් ශක්තිමත් උන දවසට.. මාර්ග ඵලයක් ලැබුවා හා සමාන සැනසීමක් අපිටත් දැනෙයි තේද දේවි..?"

"ඔයා පුදුමාකාර විදියට හිත දියුණු කරගෙන අනූ.. මට හිතාගන්නවත් බෑ.."

"කිසිම දේකට ලෝබ වෙන්න හොඳ නෑ දේවි.. අත්හැරීම කියන්නෙ පුදුමාකාර සහනශීලී හැඟීමක්.."

දේවක හා අනුපමා එකතුව, සන්ධ්‍යාවේ හෝරා දෙකක් පමණ ගත කොට නිවස හා ගෙවත්ත හැකි පමණින් පිරිසිදු කළහ. කලෙකින් ලිප ගිනි නොදැල්වූ මුළුතැන්ගෙය තුළ වූයේ අන් කවර තැනකවත් නොවූ තරමේ පාළුවකි. නොපෙන්වා හිඳින මුත්, තම බිරිඳගේ සිත පෙළන දරුණු වේදනාව කෙතරම්දැයි දේවක හොඳාකාරව ම දැන සිටියේ ය.

"අපි තුන්දෙනා.. සන්තෝසෙන් ම ගත කරපු තැන දේවි.. සමහරවිට ආයෙ කවදාවත්.. අපිට එහෙම දවසක් දකින්න ඉඩක් නොලැබෙන්නත් පුළුවන්.."

අනුපමාගේ දෑසින් කඳුළු ඉහිරිණි. දේවක, අනුපමාගේ උරහිස වටා දැත දමා ඈ තමා වෙතට සමීප කර ගත්තේ ය.

"ගොඩක් දුකයි නම් අපි ආපහු යමු අනූ..?"

අනුපමා, කඳුළු අතරින් ම හිස දෙපසට සැලුවා ය.



"මේ බිත්ති හතර ඇතුළෙ මගේ ජීවිතේ හැම ලස්සනක් ම නිබුණා දේවි.. මම ඇත්තට ම ඔයාගෙ මනමාලි වෙන අද දවස.. මේ වහල යට ගෙවෙන එක.. මැරෙනකල් ම මට ලොකු සැනසීමක් වෙයි දේවි..."

ශෝකාග්නීන් අනන්ත අප්‍රමාණයක් මැදින් උවත්, ඒ රැයේ සොඳුරු සඳක් පායා තිබිණි. දැනුම් තේරුම් ඇති දා පටන් හැඳී වැඩුණු, මල්වර වී යුවතියක වූ දා රැඳී උන්.. විවාහ වී පතිනියකව පිටව යන තෙක් රැකවරණය සැලසූ.. ඇගේ නිවසේ.. ඇගේ නිදහස් නිවහල් ලෝකය බිහි කළ ඇගේ ම කුඩා කාමරය තුළදී.. ඈ ඒ රාත්‍රියේ.. දේවකගේ සැබෑ ම පතිනිය බවට පත් වූවා ය. මහා නියහයක් හමාර කොට වට වරුසාවකින් සැනසෙන මහ පොළොව සේ, අඹු-සැමියෝ ඒ සොම්නස දරා ගත්තේ පිරුණු සිත්වලිනි. එසේම, ඈ ඒ ජීවිත කාලයට ම තමාගේ නිවසෙහි ගත කරන අවසන් රාත්‍රිය බව අංශු මාත්‍රයක් හෝ නොදැන සිටියා ය.

## මාස තුනකට පසු...

උවැසියක සේ පේ වී බුදුන් වදින අනුපමා දෙස දේවකගේ ලොකු අම්මා-ප්‍රමිතා බණ්ඩාරනිලක බලා සිටියේ අප්‍රමාණ ආදරයකිනි. දේවකගේ බිරිඳ වී පැමිණි අනුපමා, රන්මුතුගල පරපුරට සහසම්බන්ධ වූ ඥාති පාර්ශවයේ සියල්ලන්ගේ ම සිත් එක ලෙස ආකර්ෂණය කර ගැනීමට සමත් වීම ඇයට දෛවයෙන් අපූර්වත ම භාග්‍යයක් ම විය. සියල්ලෝ ම එක ලෙස ඈ කෙරෙහි බැඳී, ඇයට සෙනෙහස දැක්වූවෝ ය. ඈ කෙරෙහි

The Reader's Place Novel

අවධානය යොමු කළහ. ඈ පිළිබඳව සොයා බැලූහ. සෙනෙහස ලැබීම යනු පුදුමාකාර වාසනාවකි. ඒ වාසනා ගුණය අනුපමාට පමණටත් වඩා පිහිටා තිබිණි. සෑම දිනකම බුදුන් වැඳීම සඳහා අනුපමා හෝරා බාගයකටත් වඩා කාලය ගත කළා ය. ආගමික වතාවත් අවසන් කොට අනුපමා දෑස් අරින තුරු, ප්‍රමිතා ඉවසීමෙන් බලා සිටියා ය. තමා දෙස ම බලා හිඳින ඥාතිවරිය දෙස අනුපමා බැලුවේ ළතෙත් දැසිනි.

"ලොකු අම්මෙ.. ඇයි මං දිහා ඔහොම බලාගෙන ඉන්නෙ..?"

ප්‍රමිතා, අනුපමාගේ හිස අත ගෑවේ මෘදු ලෙසිනි.

"තවම දරු පැටියෙක් ගැන ආරංචියක් නැද්ද පුතේ..?"

පරපුරක් එකතුව දකින එකම සිහිනයක් වෙනුවෙන් පේවන්නට සිදු වීම, මුල් ම දින කිහිපයේදී අනුපමාගේ සිතට පමණටත් වඩා හිරිහැරයක් වුව ද, ක්‍රමයෙන් ඈ එය ද තමා ලද භාග්‍යයක් කොට සිතන්නට පුරුදු වූවා ය. ඈ, ඥාතිවරිය දෙස බැලුවේ සොදුරුත් නොවූ අඳුරුත් නොවූ සරල සිනාවක් දෙතොලතර තවරාගෙන ය.

"තාම නම් මොකුත් නෑ ලොකු අම්මෙ.."

"නෑ පුතේ.. මම නිකම් ඇහුවෙ.. තවම මහ කාලයක් ගියෙත් නැනෙ අපිට හදිස්සි තිබුණට.. හැමදේට ම නියම උන වෙලාවක් තියෙනවා.. ඒ දරු පැටියත් එන්න ඕන වෙලාවට එයි.. වැඩේ තියෙන්නෙ.. බලාපොරොත්තු වැඩිකමට.. ඒ දවස උදා වෙනකල් බලන් ඉන්න අපිට ඉවසීමක් නැති එකයි.."

අනුපමා සියල්ලන් වෙතින් තමා කරා පැමිණෙන සෙනෙහස,





අපේක්ෂාව, රැකවරණය ආදී වූ සුවිශේෂී වූ ආශිර්වාදයන් සියල්ල ම මැදිහත් සිතින් බාර ගත්තා ය. දෙවය තමා රැගෙන යන ඉසව්වකට, සාමකාමී සිතින් පිය මැන යන්නට ඈ සිත පහදවාගෙන උන්නා ය.

## මාස අටකට පසු..

පවුලේ වෛද්‍යවරයා හමුවූ පසු අනුපමාගේත්, දේවකගේත් දැසින් ගලා ගියේ ජීවිත කාලයක් මුළුල්ලේ හෙලූ ප්‍රීතිදායක ම කඳුළැලි ය.

"මිසිස් රන්මුතුගල.. අම්මා කෙනෙක් වෙන්නයි යන්නෙ.."

වෛද්‍යවරයාගේ වදන් අනුපමාටත්, දේවකටත් ලෝකයම දිනා දුන්න ද, ඒ සොම්නස සර්ව සම්පූර්ණත්වයට පත්වන්නේ, මතුයම් දිනයක දරුවා මෙලොව එළිය දකින දිනයක, නිදුක් නීරෝගී දාරක සම්පත්තියක් ලෙස තුරුළට පැමිණියහොත් පමණක් බව දෙදෙනා ම දැන සිටියෝ ය. සතුට සේ ම යථාර්ථය ද දරාගන්නට දැන සිටිය යුතු බව දෙදෙනා ම හොඳාකාරව ම අවබෝධ කරගෙන සිටියහ. වෛද්‍යවරයාගේ නිල කාමරයෙන් පිටතට පැමිණි අනුපමා හා දේවක, පෞද්ගලික රෝහල් පරිශ්‍රයේ එළිමහනේ පිනිටි අසුනක් මත හිඳ ගත්හ.

"අනූ.. ලෝකෙම ලැබුණා වගේ සතුටකුත්.. නොතේරෙන මහා දුකකුත් එකම වෙලාවෙ එකට දැනෙනවා මට.."

දේවක කියූවෙහි අරුත, අනුපමා සැණෙන් හැඳින්නා ය.



The Reader's Place Novels

"දේව්.. අපි පිරිසිදු හිතින් හැමදේ ම කළා.. මේ පටන් ගත්ත ගමනෙදි.. කොහේදිවත් අපි අපේ අධිෂ්ඨානය බිඳ ගත්තෙ නෑ.. අනිත් කිසිම දෙයක් නොහිතා.. හොඳ දරු පැටියෙක් මේ ලෝකෙට ගේන්න.. අපි මේ විදියට ම ආත්ම විශ්වාසය තියාගෙන හැමදේම කරමු දේව්.. අපිට නරකක් වෙන එකක් නෑ.."

දේවකගේ දෙතොලතර ඇදුණේ වියළී ගිය සිනාවකි.

"මොන තරම් හිතුවත්.. එක වෙලාවකට මට මහා බයක් දැනෙනවා අනූ.. සමහරු කියනවා ජානවලින් එන අඩුපාඩු වගේ ම.. සමහර වෙලාවට නංගියි මල්ලියි වගේ අය නිතර දකිනකොට උනත්.. ලැබෙන්න ඉන්න දරුවො ඒ වගේ වෙන්න පුළුවන්ලු.. මම මොකුත් හිතන්නෙ නෑ අනූ... ඔයාට ඕන නම් දරුවා ලැබෙනකල්.. අපි වෙන කොහේ හරි යමු..."

තම සැමියා කෙරෙහි අනුපමාගේ ළයෙහි උපන්නේ අප්‍රමාණ සානුකම්පිත බවකි.

"දේව්.. මේ ගෙවිලා ගිය ජීවිත කාලෙ තුළ.. කවදාවත්.. ඔයා ඔයාගෙ අම්මයි නංගියි මල්ලියි දාලා කොහේවත් ම ගියේ නෑ නේද..? මේ තරම් කාලයක් ගෙවිලා ගියාට පස්සෙ.. මේ අතරමගදි හම්බ උන මමයි දරු පැටියයි වෙනුවෙන්.. ඔයා කවදාවත් කඩ නොකරපු ඒ යුතුකම කඩ කරන්නෙපා දේව්.. අනික.. නංගියි මල්ලියි කියන්නෙ දැන් මගේ හිතේ ඇදුන බිතුසිතුවමක්.. එයාලගෙ රූපෙ නොපෙනෙන්න මගේ ඇස් හංගගන්න පුළුවන් උනාට.. මගේ හිත හංගන්න පුළුවන් තැනක් මේ ලෝකෙ කොහේවත් නෑ.. අපි ලැබෙන හැටියට ජීවිතේට මූණ දෙමු දේව්... කිසිම දෙයක් ගැන විශේෂ බලාපොරොත්තු ඕන නෑ අපිට.. අපි දැන් ගෙදර යමු දේව්.. අනික තමයි අපේ





දරුවා ගැන උනත්.. අපේ පවුල්වල ළඟ ම කීප දෙනා විතරක් දැනට දැන ගත්තම ඇති.. දරු පැටියා මේ ලෝකෙට ආව දවසක අපි අනිත් සේරම දේවල් ගැන හිතලා බලමු දේව්.. යමු.. තවත් කිසිම දෙයක් ගැන ඔයා හිත කරදර කරගන්න එපා.."

තම බිරිඳගේ තිර වදන් දේවකට අදහා ගත නොහැකි විය.

"අනූ.. මට ඔයා ගැන අදහගන්නවත් බෑ.. මේ වගේ සංකීර්ණ ප්‍රශ්නයක් ඉදිරියෙත්.. ඔය විදියට ශක්තිමත්ව හැසිරෙන්න ගැහැනියකට පුළුවන්ද අනූ..?"

අනුපමා තම සැමියාගේ දෝතම තම දෑතට මැදි කර ගෙන, ඔහුගේ දෑසට එබී බැලුවා ය.

"මගේ ලෝකෙ පුරවන්න.. ලෝකෙ තියෙන හැමදේම ගෙනත් දීලා.. ඔයා මගෙන් බලාපොරොත්තු උන එක ම එක දෙයක් තියෙනවා නේද දේව්.. ඔයා දුන්න හැමදේම වෙනුවෙන් මේ මට දෙන්න පුළුවන් එක ම දේ මගේ ආදරේ විතරයි.."

ජීවිතයට උදා වූ අපූර්ව අලෝකය ද රැගෙන, දේවක හා අනුපමා නිවසට යන මොහොත වනවිටත් සමීපතම ඥාතීන් සියල්ලෝ ම පාහේ ඒ සුභාරංචිය දැනගෙන උන්හ. නිවසට පැමිණි විගසම දේවක කළේ, අනුපමාගේ මාපියන්ට ඇමතුමක් ලබා ගැනීමට උත්සාහ කිරීම ය. ලද සුභාරංචියෙන් දේවකගේ මවගේ දෑසින් සෙනෙහසේ උණු කඳුළු වැගිරෙමින් තිබිණි. ඇය අනුපමාගේ හිස අතගාමින් හඬන්නට වූවා ය.

"අප්‍රමාණව සතුටුයි වගේ ම.. දරාගන්න බැරි තරම් දුකකුයි බයකුයි දැනෙනවා පුතේ මට.."



The Reader's Place Novel

දුක, වේදනාව කුමක් අරබයාදැයි අනුපමා හොඳින් ම දැන සිටියා ය.

"දුක් වෙන්නෙපා අම්මෙ.. දේව් හින්දා අම්මගේ ජීවිතේට ලැබුණා වගේ ම සතුටක් මටත් ලැබෙයි අම්මෙ..."

අනුපමාගේ මවටත්, පියාටත් ඇමතුමක් ලබා ගැනීමට දේවක, ගත් උත්සාහය සාර්ථක වූයේ ඒ මොහොතේ ය. මද වේලාවක් අනුපමාගේ මාපියන් සමඟ සංවාදයේ යෙදී උන් දේවක අනුපමාට රිසීවරය පිරිනැමුවේ ය. මාපියන්ගෙන් දුරස්ව ගෙවී ගිය කාලය අනුපමාගේ හදවතට විසල් වේදනාවක් වුවත්, කාලයත් සමඟ, එය කෙමෙන් තුනීවී ගොස් තිබිණි. තම මවගේ කටහඬ සවන් වැකෙත් ම, අනුපමාගේ දෑස, ළය බර කළ කඳුළු වරුසාවකින් තෙත් වූයේ නිරායාසයෙන් ම ය.

"අම්මා.."

"පුතේ.."

හදවතට දැනුණු සංවේදනාවන් දරාගත නොහැකිව මවත්, දියණියත් දෙදෙනා ම මද වේලාවක් ගොළු වූවන් මෙන්, දුරකතනයේ දෙපස රැඳී උන්හ.

"ඔයාගෙ පැටියව බලාගන්න මායි අප්පච්චියි එනවා පුතේ.."

පමණටත් වඩා වෙව්ලන තම මවගේ හඬ අබියස අනුපමාගේ හදවත දෙදරා යන්නට විය.

"පැටියව බලාගන්න නම් මෙහෙ ඕන තරම් අය ඉන්නවනෙ අම්මා.. ඒකට නෙමෙයි මට අම්මයි අප්පච්චියි ආපහු මෙහෙ





එනවා දකින්න ඕන.. හැමෝගෙන්ම ඇත්වෙලා ගිහිල්ලා අම්මයි අප්පච්චියි ඔහේ තනි උන එක ගැනයි මගේ හිත වේදනා විඳින්නෙ.."

අනුපමාගේ මව සැතපුම් දස දහස් ගණනක දුරින් හිඳ දුරකතනය දිගේ ඉකිබිඳින්නට වූවා ය. ස්වභාවයෙන් ම රළු ගති සොබා ඇති තම සොයුරිය හමුවේ, තමාගේ මවත් පියාත් මව් රටදී ගෙවූ සැනසීම වැනසී ඇති බව අනුපමා දැන සිටියා ය.

"අඬන්නෙපා අම්මා.. මට වාවගන්න බෑ.. අක්කට තාම ස්ර්වන්ට් කෙනෙක් හොයාගන්න බැරි උනාද අම්මා..?"

"අපි ඉන්න හින්දා ඒ ගැන උනන්දුවක් නෑ පුතේ.."

"අක්කා ගෙදර නැද්ද අම්මා..?"

"ටවුන් එකට ගියා.. නැත්නම් කොහෙද මෙහෙම නිදහසේ කතා කරන්නෙ පුතේ.."

අනුපමාගේ ළය අප්‍රමාණ වූ සොවකින් රිදුම් දෙන්නට විය.

"ඒ කියන්නෙ.. අම්මයි අප්පච්චියි තව කොච්චර කල් ඕස්ට්‍රේලියාවෙ ඉන්නද..?"

අනුපමා විමසුවේ පැටලී ගිය සිතිනි.

"අවුරුදු තුනෙන් ඩේ කෙයා දානවලු.. එතකල් ඉන්නවලු.

"මොනවා..! තව අවුරුදු දෙකක්..?"



The Reader's Place Novel

දැසින් නිදැල්ලේ ගලා යන කඳුළු පිස දමා ගැනීමට හෝ අනුපමා උනන්දු නොවුණා ය. තම සොයුරියගේ ආත්මාර්ථකාමීකම කෙරෙහි අනුපමාගේ සිත අනන්තයට ම බිඳී තිබිණි.

"ඔව් පුතේ.. එයත් අපේ දරුවනේ.. කොච්චර අමාරු උනත් විඳ දරාගෙන ඉන්න සිද්ධවෙලා තියෙනවා.."

"නිදහස් නිවහල් මිනිස්සු විදියට.. හැමදාම ජීවත් උන අම්මටයි අප්පච්චිටයි.. ඔය විදියට තව අවුරුදු දෙකක් විතර හිරවෙලා ජීවත්වෙන්න වෙනවා කියන්නෙ.. අම්මයි අප්පච්චියි හිතින් ලෙඩ වෙයි.. මට බය.. දුක.. ඒ ගැනයි.."

තම බාල දියණියගේ සෙනෙහසේ පරිමාණය ගැන දන්නා වර්ණවීර මහත්මියගේ ළය රිදුම් දෙන්නට වූයේ අසමාන බරකිනි.

"පුතේ.. ඔයා ඔය කිසි ම දෙයක් ගැන හිතන්නෙපා.. මගෙ දුව ඉන්නෙ කිසිම දෙයක් ගැන කල්පනා කරන්න හොඳ තත්වෙක නෙමෙයි.. දරුවෙක් ලැබෙන්න ඉන්න මුල් ම දවස් ටිකේ තමයි අම්මා කෙනෙක් මානසිකව සුවයෙන් ම ඉන්න ඕන පුතේ.."

තමාට අත් විඳින්නට සිදුව ඇති මානසික ව්‍යාකූලතාවයන් පිළිබඳව තවමත් තම මාපියන්ට ආරංචි නොවීම පිළිබඳව, ඇය අනේක වාරයක්, තමාගේ රැකවරණය සලසා හිඳින දෙව් දේවතාවුන් වහන්සේලාට ස්තුතිවන්න වූවා ය. තමා අරබයා තම මාපියන් අංශු මාත්‍රික හෝ වේදනාවන් විඳිනු දකින්නට අනුපමා නොරිසි වූවා ය.

"අම්මටයි අප්පච්චිටයි හිත හදාගෙන ඉන්න පුළුවන් නම්.. ලොකු දෙයක් අම්මා.. කෝ අම්මා අප්පච්චි..?"





බොහෝ වේලාවක් මව සමග සංවාදයේ යෙදී උන් අනුපමා මවගෙන් සමුගත්තේ රිදුණු තැවුණු හදවතිනි. නිවසේ රැඳී උන් කාලයේදී ඈ වඩාත් සමීපව හා හෘදයාංගම ලෙස හැඟීම් සමග ගණුදෙනු කළේ ඇගේ පියා සමගිනි. එබැවින්, පියා සමග කතාබහ කිරීම ඇයට වඩාත් වේදනාකාරී විය.

"අප්පච්චි..."

"පුතා සතුටින් නේද පුතේ..?"

"අම්මයි අප්පච්චියි ළඟ නැති අඩුව ඇරෙන්න හැමදේම තියෙනවා අප්පච්චි.."

මව් රටින් බැහැර වූ දා පටන් වර්ණවීර මහතාගේ වාග් කෝෂය ක්ෂය වී යමින් තිබිණි. ජීවිත කාලය මුළුල්ලේ වැඩිපුර ම දොඩමලු වූ, තමාගේ ආදරණීය දියණිය සමග දෙඩීමට වචන සොයා ගැනීමට අපොහොසත් වන තරමට, ඔහු, ජීවිතය තුළ පසුපසට තල්ලු වී, හුදෙකලා මිනිසෙකු වී සිටියේ ය.

"කල්පයක් වගේ දිග කාලයක් ගත වෙලා වගේ හිත දැනෙනවා වුටි දුව.."

"අප්පච්චි.. ගොඩක් හිතේ අමාරු තියාගෙන නම් ඔහේ වෙලා ඉන්න එපා.. ඉන්නම බැරි නම් එන්න අප්පච්චි.."

පියාගේ මුවින් පිට වූයේ, කල්පාන්ත මේඝය වන් සුසුමකැයි අනුපමාට දැනිණි.

"නැමෝම අපේ දරුවොනෙ කියලා හිත හදාගන්න හැදුව දරුවො නැමෝම එක වගේ නැනෙ පුතේ.. ජීවිතේ කිසිම දව



The Reader's Place Novel

මේ වගේ දෙගිඩියාවෙන් ජීවත්වෙන්න සිද්ධ උන කාලයක් තිබිලා නෑ පුතේ.."

තමාගේ මවටත්, පියාටත් මුහුණ දෙන්නට සිදුවූ දුක්ඛදායක ඉරණම පිළිබඳව කිසිදු සැනසීමක් අනුපමාගේ සිත තුළ ඉතිරිව තිබුණේ නැත. ගෙවී ගිය ජීවිත කාලය පුරා ම, ආදරණීය දියණියක ලෙස මා පිය ඇසුරේ දිවි ගෙවූ අනුපමාට, පියාගේ වදන් විද ගැනීම පහසු වූයේ නැත.

"මට හැම නිස්සෙ ම.. අපි තුන්දෙනා එක කරපු ලස්සන දවස් මැවිලා පේනවා වුටි දුව..."

අනුපමාගේ දෑසින් යළින් උණු කඳුළු වරුෂාවක් වැගිරෙන්නට විය. වර්ණවීර මහතා ද දහස් ගණනක් ගව් දුරින් හිද හඬන වග අනුපමාට දැනිණි.

"අප්පච්චි.. මම දන්නෙ නෑ මොනවද කියන්න ඕන කියලවත්.. අම්මටයි අප්පච්චිටයි ඔහොම දුක් විඳලා පුරුදුත් නෑ.. අක්කට එයාගෙ ප්‍රශ්න විසඳගන්න කියලා.. අම්මයි අප්පච්චියි ආපහු ලංකාවට එන්න.. අම්මයි අප්පච්චියි ලෙඩ්ඩු දෙන්නෙක් වෙලා අසරණ වෙනවා දකින්න මට බෑ අප්පච්චි.."

"පුතේ.. ඔයාගෙ ජීවිතේ සතුටු ම මොහොතක.. අපි වෙනුවෙන් අඩන්නෙපා පුතේ.. අපි ඉක්මනට ලංකාවට එන්න බලන්නම්.."

"මටත් දරුවෙක් කියලා දැනුණ මොහොතෙ තරම්.. මට මගෙ අම්මයි අප්පච්චියි ගැන දැනුණ තවත් මොහොතක් නෑ අප්පච්චි.. අම්මයි අප්පච්චියි ගැන ඒ මොහොතේ මගේ හිතට





පිරුණ සෙනෙහස කවදාවත් වචන කරන්න නම් බැරිවෙයි අප්පච්චි.."

ළඳාවට පත් නොවිය යුතු අවස්ථාවක පසුවන තම දියණිය තවදුරටත් වෙහෙස නොකරවා, ඇමතුම්න් සමුගෙන යන්නට වර්ණවීර මහතා තීරණය කළේ ය.

"නීරෝගී දරු සම්පත්තියක් මේ ලෝකෙට ගේන්න දැඩිව අධිෂ්ඨාන කරගන්න මගෙ පුතේ.. ගතින් දුරස් උනත්.. අම්මයි අප්පච්චියි ඔයා ළඟම ඉන්නවා පුතේ..."

එක් ජීවිතයක් ඇරඹීමේදී, තවත් ජීවිතයක් නැවතී තිබිණි. සොබා දහමේ සදා නොවෙනස් නියමය එය ය.

වසරකට පසු..

දුරකතනය ඔස්සේ සවනට වැටුණු වදන් අදහාගත නොහැකිව, ප්‍රකම්පනයෙන් අසල ම වූ අසුනක් මතට දේවක අවිඥානිකව මෙන් ඇද වැටෙනු සේනාරත්න මහතා දුටුවේ ය. අඩියට දෙකට දේවක අසලට ළංවූ සේනාරත්න මහතා, දේවක අත එල්ලෙමින් තිබූ රිසීවරය ගෙන දුරකතනය මත රුවා, දේවක දෙස බැලුවේ විමසා ගත නොහැකි ප්‍රශ්නාර්ථයෙනි.

"පුතා.. ඇයි මේ..?"

"ලොකු කරදරයක් මාමෙ.. මට හිතාගන්නවත් බෑ.."

දේවක, තම දැතම හිස කෙස් අතර දවටා, දැඩිව ඇද



The Reader's Place Novel

ගත්තේය. සේනාරත්න මහතා දේවක අසල ම වූ අසුනේ හිඳ ගෙන, දේවකගේ දෑත හිස මතින් ඉවත් කළේ ය.

"පුතා.. ඇයි මේ.. කියන්න පුතේ.. මොකක්ද මේ ප්‍රශ්නෙ..?"

"මාමෙ.. මම කොහොමද මේක කියන්නෙ..? අනුගෙ.. අම්මයි, අප්පච්චියි.. ඇක්සිඩන්ට් වෙලා මාමෙ.. ඒ විතරක් නෙමෙයි.. දෙන්නම.. එතන ම නැතිවෙලාලු මාමෙ.."

"මොං..නවා..!!!"

රන්මුතුගල වළව් භූමිය ම අසුරු සැණෙකදී එක ම මළ ගෙයක් බවට පත්විය.

රන්මුතුගල පරපුරේ උරුමය කුස දරා හිඳින, අනුපමා පාසලට කැඳවාගෙන යාමත්, ආපසු කැඳවාගෙන ඒමත් ඒ දිනවල තරංග වෙත පැවරී තිබිණි. පාසල නිමා වී පැමිණෙන තමා පිළිගන්නට, වෙනදාට, සිනාමුසු මුහුණින් බලා හිඳින තරංගගේ මුහුණේ ඇඳී තිබුණු කළු වලාකුළු, අනුපමාගේ සිත තුළ ඇති කළේ ඉමහත් ප්‍රශ්නාර්ථයකි.

"තරංග.. ඇයි මල්ලි.. මොකද මේ.. මොකුත් ප්‍රශ්නයක්ද..?"

අනුපමාගේ දෑසට දෑස දී, වෙනදා මෙන් කතා කරන්නට තරංගට සවි තිබුණේ නැත.

"මට ටිකක් සනීප නෑ පුංචි නෝනා හාමු.. අපි ගෙදර යමුකො.."

"ඉතින් ළමයො අසනීප නම් ඇයි ආවෙ..? ලොකු බේබි හාමුට කියන්න තිබුණනෙ.."





අනුපමාට රියට ගොඩවීමට දොර හැර දී, එකත්පස්ව බිම බලා හිඳින තරංගගේ දෑසින් ගිලිහී වැටුණු කඳුළ අනුපමා දුටුවේ නැත.

"සාරිය අල්ලගෙන පරිස්සමට නගින්න පුංචි නෝනා හාමු.. පුංචි නෝනා හාමුගෙ පරිස්සම කියන්නෙ.. දැන් මගෙ රස්සාව.. වාඩිවෙලා බෙල්ට් එකත් දාගන්න පුංචි නෝනා හාමු.."

තරංගගේ වදනක් වදනක් ගානේ ම වූ ආගන්තුක බව, අනුපමාට වටහා ගත නොහැකි තරමේ ව්‍යාකූල බවක් ගෙනැවිත් දී තිබිණි. වෙනදා මෙන් නොව, පැයක පමණ කාලයක මග ගෙවා පාසලේ සිට නිවසට පැමිණෙන තුරු ද, තරංග යළිත් වදනක් හෝ නොදෙඩීම ද අනුපමාගේ සිත තුළ ඇති කොට තිබුණේ උග්‍ර ප්‍රශ්නාර්ථයකි. නිවසට පැමිණෙන අවස්ථාවේදී, නිවස තුළ රැස්ව සිටි ඥාති සමූහයා දුටු මතින්, අනුපමාගේ සිත තුළට පිවිසුණේ පහදා ගත නොහැකි තරමේ ගුප්ත ගන අඳුරකි.

"තරංග.. ඇයි මේ හැමෝම ඇවිත්..?"

"පුංචි නෝනා හාමු පරිස්සමට බහින්නකො.."

වළව්වේ විශාල හිරු ආවරණය යට රිය නැවතෙත් ම, දේවක, රිය අසලට පැමිණ අනුපමාට බසින්නට දොර විවෘත කළේ ය. දේවකගේ රතුව ගිය දෑස දුටු අනුපමාගේ දෑස බියෙන් විසල් විය.

"දේවි ඇයි මේ..? ගෙදර මොකුත් ප්‍රශ්නයක්ද..?"



TheReaderPlace Novel

දේවක, උරහිස වටා දැත දමා, තම බිරිඳ සිරුරට වාරු කරගෙන නිවස තුළට කැඳවාගෙන ගියා විනා, වදනක් හෝ මුවින් පිට කර ගැනීමට ඔහු තුළ කිසිදු සවියක් තිබුණේ නැත. අම්බකු ම ලොවකට හඳිසියේ ඇද වැටුණාක් සේ අසරණව ඔය දැසින් අනුපමා දෙස බලාසීන් එකිනෙකාගේ මුහුණු දෙස බලාවෙලින් හිඳුවා ය.

"ලොකු මාමෙ.. මාමාවත් කියන්නකොට මොකද වෙලා තියෙන්නෙ.. ඇයි මේ හැමෝම මෙහෙම ඉන්නෙ..?"

දේවක, අනුපමා ආලින්දයේ වූ දිගු සෝපාවේ අසුන් ගැන්වූයේ ම ඇගේ ආරක්ෂාව උදෙසා ම ය.

"දේව්.. ඇයි මේ.. මට කියන්නකොට.. මට මොකුත්ම අමුත්තක් දැනෙනවා.. අනේ ඇයි මේ..?"

දේවකගේ දැසින් ද උණු කඳුළු දහරාවක් වැගිරෙන්නට විය. අසිරුවෙන් ඇවිද ආ දේවකගේ මව ද අනුපමා අසලින් සිට ගෙන, ඇගේ නිස තම සිරුරට වාරු කර ගත්තා ය. තමාගේ මුවින් මීළඟට පිටවන වදන් කිහිපය ඔස්සේ, තම බිරිඳගේ ජීවිත කාලීන සතුට ම අහිමි වී යන බව දැන සිටිය ද, එම අතිශය වේදනාබර ආරංචිය කෙසේ හෝ තම බිරිඳට දැන ගැනීමට සැලැස්විය යුතු බැවින්, දේවක ඊට පෙර කිසිදා නොවූ තරම් ජීවිතය ඉදිරියේ අසරණ වී සිටියේ ය.

"අනූ.. කවදහරි දවසක අපි හැමෝ ම මේ ලෝකෙ දාලා යන්න යනවා.. අපි හැමෝට ම නිතාගන්නවත් බැරි වෙලාවක.. මේ ලෝකෙන් යන්න සිද්ධ වෙනවා.. අමාරුවෙන් උනත් ඒ ඇත්තට අපි මූණ දෙන්න ඕන.. කොයි මොහොතක හරි මට





මේ ලෝකෙන් යන්න වෙලාව එනකල්.. මම මගේ ඇස් දෙක ාගේ ඔයාව බලාගන්නවා අනූ.."

අනුපමා ඉවෙන් මෙන් යමක් හඳුනා ගත්තා ය. ඇගේ ළය ක්‍රිර ගැහෙන්නට විය.

"අනේ.. ඇයි මේ දේව්.. මේ කිව්ව දේවල්... අනේ අම්මේ ට කියන්න.. මගෙ අම්මට හරි අප්පච්චිට හරි මොකක් හරි කරදරයක්ද දේව්.. අනේ අම්මෙ.. කියන්නකෝ...."

රැස්ව සිටි සියල්ලන්ගේ ම දැස් අගින් කඳුළු දහරාවන් ගලා යන්නට වූයෙන්, අනුපමාගේ ළය වඩාත් වේදනාවෙන් මොර දෙන්නට විය.

"අම්මට හරි අප්පච්චිට හරි නෙමෙයි අනූ.. දෙන්නට ම... කරදරයක්.."

"දෙ..න්නට..ම.. ඇයි දේව්.. මගෙ අම්මටයි අප්පච්චිටයි මොකද වෙලා තියෙන්නෙ..?"

"අම්මයි අප්පච්චියි දෙන්නා ඇක්සිඩන්ට් වෙලා අනූ.."

දේවක, අනුපමාගේ නිස දැතින් ම ගෙන පපුවේ හොවා ගත්තේ ය. තවදුරටත් ඇ වෙහෙසට පත් නොකර, ඉතිරි වචන කිහිපය ද කිව යුතු යැයි දේවක තීරණය කළේ ය.

"අම්මයි.. අප්පච්චියි දෙන්නම නැතිවෙලාලු අනූ.."

"මො..න..වා..!!!"

අනුපමාගේ විලාප හඬ වා තලයට මුසුවී යළි සැණෙන්



The Reader's Place Novel

අතුරුදන් ව ගියේ ය. සිහිසුන්ව ගිය තම බිරිඳගේ සිරුර දැතින් ම ගත් දේවක, ඈ ප්‍රවේසමින් නිදන කාමරයේ යහන වෙත රැ ගෙන ගියේ ය. හෝරා බාගයකට පමණ පසු අනුපමා පියවි ලොවට පැමිණියත්, එසැණින් ඈ යළිත් අසමාන වේදනාවකින් වැළපෙන්නට වූවා ය.

"අනේ මගෙ අම්මා.. ඇයි අප්පච්චි.. මේ විදියට මාව දාලා යන්නම යන්න ගියේ ඇයි මගෙ රත්තරන් අම්මයි අප්පච්චියි.. මාව බලන්න ඉක්මනට ම එනවා කියලා නේද කිව්වෙ අම්මා.. ආයෙමත් ඉස්සර වගේ සන්තෝසෙන් ඉන්න ඉක්මනට ම එනවා කියලා කිව්වා නේද අප්පච්චි.. අනේ එහෙනම් ඇයි මෙහෙම මාව දාලා ගියේ දෙයියනේ..???"

හෝරා දෙක තුනක් ම වේදනාවෙන් මුසපත්ව දේවකගේ තුරුළට වී හඬා වැළපෙමින් උන් අනුපමා, අවසානයේ දේවක දෙස බැලුවා ය.

"දේව්.. මට අම්මයි අප්පච්චියි බලන්න බැරිද දේව්..???"

වදන් පිට නොවන ගානට, අනුපමාගේ හඬ බිඳී ගොස් තිබිණි. දේවක, තම බිරිඳගේ හිස තවත් මෘදු ලෙස ගෙන ගෙළ පාමුල රඳවා ගත්තේ ය.

"ඔයාගෙ පාස්පෝට් එක නම් දවසින් හදාගන්න පුළුවන්.. ඒත් අනූ.. වීසා හදාගන්න එච්චර ලේසියෙන් බැරිවෙයි.. අසනීපයක් වගේ වෙලා මේ දේ සිද්ධ උනා නම්.. මම කොහොම හරි බොඩීස් ලංකාවට ගෙන්නනවා.. රිකී කිව්වෙ.. ඇක්සිඩන්ට් වෙලා හින්දා බොඩීස් එවන්න තත්වෙක නෑ කියලා අනූ.. අපි අමාරුවෙන් ලෑස්තිවෙලා ගියා උනත්.. අපි යනකල් ෆියුනරල්





එක පහු කරන්න බැරිවෙයිලු අනූ.. මේක ඇක්සිඩන්ට් එකක්.. ඒ හින්දා කිසිම දෙයක් සාමාන්‍ය විදියට අපිට කරගන්න අමාරුයි අනූ.."

දේවයේ සරදම් දරාගත නොහැකි වූ අනන්ත වේදනාවක නිහඬ කඳුළු වරුසාවක්, ඇගේ දෙනෙතින් නිසොල්මනේ ගලා හැලෙන්නට විය. අනුපමා වෙනුවෙන් පිළියෙළ කළ දොඩම් යුෂ විදුරුවක් ද රැගෙන, දේවකගේ මව ඔවුන් වෙත පැමිණියේ ඒ මොහොතේ ය. මව දුටු සැණින් අනුපමාගේ ඉකිය යළිත් වැළපීමක් බවට පත් විය.

"මේක බීලා ඉන්න පුතේ.. මගෙ දුව ඉන්න තත්වෙත් එක්ක ඔය විදියට අඩා වැළපෙන්න.. හුල්ලන්න හොඳ නෑ පුතේ.."

"මට මෙහෙම උනේ ඇයි අම්මා.. මගෙ අම්මයි අප්පච්චියි ගොඩක් උතුම් විදියට ජීවත් උන දෙන්නෙක්.. ඇයි අම්මා මේ වගේ අවසානයක් අපිට උරුම උනේ.."

දේවකගේ මව සිතිවිලි පෙරා, හොඳ ම පිළිතුරක් අනුපමා වෙනුවෙන් තෝරා ගත්තා ය.

"බුදු බණ ගැන මගෙ දුව අපි හැමෝටම වඩා හොඳට දන්නවා.. මේ ඉන්න අනිත් හැම කෙනෙකුට ම වඩා මගෙ දුව ඒ ධර්ම කරුණු පිළිපැදගෙන ජීවත්වෙනවා.. මේ ආත්මෙ අ මොන විදියට ජීවත් උනත්.. අපි සංසාරෙන් එක්කාදු කරගෙ ආව දේවල් ටිකක් තියෙනවා.. මගෙ දුව ජීවිතේ ඇතුළෙ සිද්ධ උන හැමදේම උපේක්ෂාවෙන් විඳ දරා ගන්න පුරුදු පුහුණු උ කෙනෙක්.. ඔය කුසේ දරාගෙන ඉන්න දරු පැටියා වෙනුවෙ



The Reader's Place Novel

මගෙ දුව මව්පිය වියෝගයක් දරාගන්න පුරුදු වෙන්න මගෙ පුතේ.."

හඬා හෙම්බත්ව උන් අනුපමා, දේවකගේ මවගේ උරහිසේ හිස හොවා ගත්තා ය.

"අම්මා.. එදා එයාපෝට් එකේදි.. අම්මගෙයි අප්පච්චිගෙයි කකුල් දෙකේ නළල තියලා වදින වෙලාව.. මගෙ යටි හිත කිව්වා ඒ මම අම්මටයි අප්පච්චිටයි වදින අන්තිම වැඳීම කියලා.. ඒ වෙලාවෙ මගෙ හිතට දැනුණා.. මම ඒ දෙන්නව ඒ දකින්නෙ අන්තිම වතාවට කියලා.. දේව්.. මට එහෙම දැනුණා.. මට ඒ දැනුණ දේවල් හැබෑවක් උනේ කොහොමද දෙයියනේ..?"

සමුගැනීමක් පවා නොකර, දර්ශන මාත්‍රයක් පවා නොදැක.. අනුපමා තම ප්‍රාණ සම මාපියන්ගෙන් සදහට ම දුරස් වූවා ය.

"එක අතකින්.. දැන්.. මගේ මැරෙන මොහොත වෙනකල් ම.. මගේ හිතේ ඇදිලා ඉන්නෙ මම අන්තිමට දැකපු මගෙ අම්මයි අප්පච්චියි.. දුකින් වේදනාවෙන් මේ ලෝකෙ අතැරලා ගිය මගෙ අම්මයි අප්පච්චියි දකින්න මගේ ඇස්වලටවත් මේ දරු පැටියටවත් උරුම නැතුව ඇති.. කමක් නෑ දේව්.. හෙට එහෙ පියුතරල් එක වෙන වෙලාවට.. මෙහෙ හාමුදුරුවො වඩම්මලා අම්මටයි අප්පච්චටයි පින් පමුණුවමු දේව්.."

දේවක, අනුපමා දැනිත්ම ගෙන ළයට තුරුළු කර ගත්තේ ය.

"ඔයා ඔහොම හිත හදාගත්ත එක තරම් මේ වෙලාවෙ වෙන එකම දෙයක්වත් වටින්නෙ නෑ අනූ.. ඔයාට ගොඩක් පින්.. අම්මයි අප්පච්චියි වෙනුවෙන් අපිට කරන්න පුළුවන් ඉහළම දේ අපි කරමු අනූ.. අපිට පැය කීපයයි ඉතුරු වෙලා තියෙන්නෙ.. මම ලොකු මාමලාව එකතු කරගෙන ඒ දේවල් ටික ලෑස්ති කරන්නම්.. ජීවත් වෙලා ඉන්න කාලෙ අම්මටයි අප්පච්චිටයි හැමු යුතුකමක් ම ඉටු කරලා.. ආදරෙන් සලකපු ඔයා.. ඒවා මතක් කරලා මේ මොහොතෙ සතුටින් ඉන්න.. අපේ දරු පැටියා ගැන හිතලා.. නාඩා ඉන්න උත්සාහ කරන්න අනූ.. මේ වගේ වෙලාවක ඔයාගෙ හිත හදන්න කිසිම විදියක් මම දන්නෙ නෑ අනූ.."

ජීවිතයේ හැඩය.. වර්ණය.. මේ සියල්ල ම ඒ දෙවෝපගත මොහොතේ වෙනස් වී ගියේ ඒලෙසිනි. අකම්පිතව ජීවිතය දරා ගන්නට, එතැන් පටන් ඇ යළි ඉගෙන ගත්තට වූවා ය.

## පසුවදන

★ මාපියන්ගේ දෛවෝපගත වියෝගයෙන් පසු, අනුපමා, මාපියන්ගෙන් දායාද ලෙස ඇයට හිමිවූ සියලු භෞතික වස්තූන් නිර්ලෝභීව අතහැර දැමුවා ය. කුඩා කල හිඳ මාපියන් සමඟ හැදී වැඩුණු, තමා යුවතියක බවට, පතිනියක බවට පත්වූ තමාගේ නිවස ඈ පුණ්‍යායතනයක් මගින් පවත්වාගෙන යනු ලබන වැඩිහිටි නිවාසයක් වෙත පැවරුවා ය.

★ ඔවුන්ගේ විවාහයෙන් වසරකුත් හෙමසක් ගතව ගිය කාලයේදී දේවකගේ මන්ද මානසික ස්ථාවරය දැඩිව රෝගාතුර වූවා ය. දෙමසක පමණ කාලයක් සිහි විසඳෙව





The Reader's Place Novel

මෙන් ගිලන් යහනක ගත කළ ඈ, එක්තරා දිනක උදෑසන මෙලොව හැර ගියා ය. මිය යන විට ඇගේ වයස අවුරුදු විසි අටක් පමණ විය. අල්පායුෂ රැගෙන, අර්ධ ජීවිතයක් රැගෙන මෙලොවට පැමිණ උන් ඈ, තමාගේ ලෝකය වසා පැතිර තිබූ අඳුර ඉරා දමා ඇතැම් විට ආලෝකය සොයා ගියා වන්නට ඇත. දිල්හාරගේ දෛවය ද එවැනි ම වූවක් විය හැකි බව සියල්ලෝ ම දැන සිටිය හ.

★ විවාහයෙන් වසර එක හමාරක පමණ කාලයක් සපිරෙන විට, අනුපමා ඇගේ දරු පැටියා මෙලොවට බිහි කළා ය. දෛවයේ සරදමකින් තොරව නිරෝගී දරු සම්පතක් ලෙස ඇගේ දියණිය මෙලොව එළිය දැකීම, පරපුරක සිත් සතන් වසා පැතිර තිබුණු අඳුර ඉරා දමන්නට කාරුණික වී තිබිණි. දියණිය ඉපදී වසර හතරකට පසු, අනුපමා යළිත් නිරෝගී පුතුන් දෙදෙනෙකු නිවුන් දරුවන් ලෙසින් බිහි කළා ය.

ජීවිතයක අඳුර නසාලිය හැක්කේ උත්තම ගණයේ හදවත් හා සිතිවිලි ලෝකයක් ගොඩ නගා ගත් සුවිශේෂී වූවන්ට ම පමණි. අනුපමා.. භෞතික ලෝකයෙන් අංශු මාත්‍රයක් හෝ ජීවිතය කෙරෙහි ලොබින් බදා වැළඳ නොගත් ඈ සතුව තිබුණේ ද, එවන් වූ අසිරිමත් සිතක් පමණි.

**- සමාප්තයි -**



# අඳුර ගුරා

දිල්නානි වික්‍රමරත්න

The Readers Place Novel

'ඒ පි එන බව කිවුවා ම.. ඒ ළමයගෙ විරුද්ධත්වයක් පෙන්නුවෙ නැත් ද පුතා..?'

'නෑ අම්මා.. මට දැනුන විදියට.. මොකක් හරි දේකින්.. අනුපමා හිත හදාගෙන..'

රන්මතුගල මහත්මියගේ මුවින් ගිළිහුණේ දිගු සුසුමකි. ඒ සුසුමේ අරුත දැන උන් දේවක, මවගේ පසුතැවීම කුමක් අරබයා දැයි විමසන්නට වෙහෙස දැරුවේ නැත.

'එහෙම හිත හදාගෙන නම්.. ඒ දරුවගෙ හිත අපි හින්දා කැඩෙයි ද පුතා..?'

චිත්තිකරුවකු වී වරදකරුවකු බවට පත් වන තමාගේ සේවාදායකයකු ඉදිරියේවත් දේවක කිසිදා ඒ ආකාරයෙන් අසරණ වී තිබුණෙ නැත. මවගේ ප්‍රකාශයෙන් ඔහුගේ සිත අන්තයට ම සසල වී තිබිණි.

'මම.. කසාදයක් නොබැඳ ම ඉන්න ද අම්මා.. එහෙම වුණොත් ඒ ප්‍රශ්න තුනම එකකට ම උත්තර ලැබෙයි. අම්ම අහපු ප්‍රශ්නෙ මට බරපතල වැඩියි. අනිත් මොන දෙයින් ශක්තිමත් වුණත් තවත් ගෑනු ළමයෙක්ගේ සම්පූර්ණ අනාගතයක් භාර ගන්න මොහොතෙ දී.. මේ තියෙන ප්‍රශ්න දිහා බැලුව ම.. ඒ වගකීම දරා ගන්න තරම් මම ශක්තිමත් නෑ අම්මා..'

තම වැඩිමහලු පුතුගේ වදන් තුළ තැවරී තිබුණු ආත්ම පරාජය දුරා ගැනීම රන්මුතුගල මහත්මියට පහසු වූයේ නැත. ඇගේ දෑස කඳුළු විලක් බවට පත් වූයේ මොහොතකිනි.

ශාක්‍ය පබ්ලිකේෂන්
223/8, ආසිරි මාවත,
නුවර පාර, යක්කල
077-3596233, 077-3847369

ISBN 978-955-0207-41-

මිල රු.390/=

RATHNA BOOK
011216
Rs 390.00